# මෑතකාලීන ආර්ථික ප්‍රවණතා

2022 සුවිශේෂ සිදුවීම් සහ

2023 අපේක්ෂා

ශ්‍රී ලංකා මහ බැංකුව
ඔක්තෝබර් 2022

# මෑතකාලීන ආර්ථික ප්‍රවණතා

## 2022 සුවිශේෂ සිදුවීම් සහ
## 2023 අපේක්ෂා

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**2022 ඔක්තෝබර්**

ප්‍රකාශනය: ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01
ශ්‍රී ලංකාව.

මුද්‍රණය: ශාප් ග්‍රැෆික් හවුස් (පුද්ගලික) සමාගම

ISBN 978-624-5917-20-4

# මූලික ආර්ථික දර්ශක

## මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 (අ) | ප්‍රථම භාගය (අ) | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2021 | 2022 |
| **ජනගහනය** | | | | | | |
| මධ්‍ය වාර්ෂික ජනගහනය (පුද්ගලයන් දහස්) (ආ)(ඇ) | 21,670 (අ) | 21,803 (අ) | 21,919 (අ) | 22,156 | - | - |
| මධ්‍ය වාර්ෂික ජනගහනයෙහි වර්ධන අනුපාතය (%) (ආ) | 1.1 (අ) | 0.6 (අ) | 0.5 (අ) | 1.1 | - | - |
| ජනගහන ඝනත්වය (වර්ග කි.මී. ට පුද්ගලයන්) (ආ) | 345.6 (අ) | 347.7 (අ) | 349.6 (අ) | 353.3 | - | - |
| ශ්‍රම බලකාය (පුද්ගලයන් දහස්) (ඈ) | 8,387.8 | 8,592.0 | 8,466.7 | 8,553 | 8,594 (ඉ) | 8,669 (ඉ) |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (%) (ඈ) | 51.8 | 52.3 | 50.6 | 49.9 | 50.4 (ඉ) | 50.6 (ඉ) |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ % ලෙස) (ඈ) | 4.4 | 4.8 | 5.5 | 5.1 | 5.4 (ඉ) | 4.5 (ඉ) |
| **නිමැවුම (ඊ)** | | | | | | |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (රුපියල් බිලියන) | 15,352 | 15,911 | 15,840 (අ) | 17,686 | 8,605 | 10,743 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.ජා.ආ. (රුපියල් බිලියන) | 14,962 | 15,470 | 15,417 (අ) | 17,279 | 8,413 | 10,513 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (එ.ජ.ඩොලර් බිලියන) | 94.5 | 89.0 | 85.4 (අ) | 88.9 | 43.8 | 38.0 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.ජා.ආ. (එ.ජ.ඩොලර් බිලියන) | 92.1 | 86.5 | 83.1 (අ) | 86.9 | 42.8 | 37.2 |
| ඒක පුද්ගල ද.දේ.නි. පවත්නා වෙළඳපොළ මිල අනුව (රුපියල්) (ඌ) | 708,442 | 729,761 | 722,668 (අ) | 798,242 | - | - |
| ඒක පුද්ගල ද.ජා.ආ. පවත්නා වෙළඳපොළ මිල අනුව (රුපියල්) (ඌ) | 690,463 | 709,516 | 703,367 (අ) | 779,890 | - | - |
| ඒක පුද්ගල ද.දේ.නි. පවත්නා වෙළඳපොළ මිල අනුව (එ.ජ.ඩොලර්) (ඌ) | 4,359 | 4,082 | 3,895 (අ) | 4,014 | - | - |
| ඒක පුද්ගල ද.ජා.ආ. පවත්නා වෙළඳපොළ මිල අනුව (එ.ජ.ඩොලර්) (ඌ) | 4,248 | 3,969 | 3,791 (අ) | 3,921 | - | - |
| **මූර්ත නිමැවුම (වෙනස්වීමේ %) (ඊ)** | | | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය | 2.3 | -0.2 | -3.5 (අ) | 3.3 | 9.3 | -4.8 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රධාන ආර්ථික කටයුතු | | | | | | |
| කෘෂිකර්මය | 6.3 | 0.5 | -1.4 (අ) | 2.5 | 8.8 | -7.6 |
| කාර්මික | -1.1 | -4.1 | -5.3 (අ) | 5.6 | 12.4 | -7.1 |
| සේවා | 4.3 | 2.9 | -1.9 (අ) | 3.3 | 5.6 | -0.6 |
| දළ ජාතික ආදායම | 2.2 | -0.5 | -3.3 (අ) | 3.7 | 10.1 | -4.7 |
| **සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් (ද.දේ.නි. % ලෙස) (ඊ)** | | | | | | |
| පරිභෝජනය | 68.9 | 71.7 | 72.4 (අ) | 72.1 | 73.6 | 74.1 |
| පෞද්ගලික | 60.3 | 62.7 | 62.1 (අ) | 62.7 | 64.0 | 65.0 |
| රජය | 8.6 | 9.0 | 10.3 (අ) | 9.4 | 9.6 | 9.1 |
| ආයෝජනය | 38.1 | 34.1 | 33.7 (අ) | 35.3 | 34.9 | 31.0 |
| භාණ්ඩ සහ සේවා ශුද්ධ අපනයන | -6.9 | -5.8 | -6.1 (අ) | -7.4 | -8.5 | -5.1 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 21.5 | 21.8 | 15.3 (අ) | 16.9 | 15.3 | 21.6 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 28.4 | 27.6 | 21.4 (අ) | 24.2 | 23.8 | 26.7 |
| දේශීය ඉතිරිකිරීම් | 31.1 | 28.3 | 27.6 (අ) | 27.9 | 26.4 | 25.9 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික සහ ද්විතීයික ආදායම | 4.0 | 3.7 | 4.6 (අ) | 3.6 | 5.1 | 3.1 |
| ජාතික ඉතිරිකිරීම් | 35.1 | 32.0 | 32.2 (අ) | 31.5 | 31.4 | 29.0 |
| **මිල සහ වැටුප් (වෙනස්වීමේ %)** | | | | | | |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික සාමාන්‍යය | 2.1 | 3.5 | 6.2 | 7.0 | 5.4 | 20.8 |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) | 0.4 | 6.2 | 4.6 | 14.0 | 6.1 | 58.9 |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික සාමාන්‍යය | 4.3 | 4.3 | 4.6 | 6.0 | 4.1 | 18.4 |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය (කාලපරිච්ඡේදය අවසානයට) | 2.8 | 4.8 | 4.2 | 12.1 | 5.2 | 54.6 |
| නිෂ්පාදකයාගේ මිල දර්ශකය (2018 4 වන කාර්තුව = 100) - වාර්ෂික සාමාන්‍යය | - | - | 5.8 | 10.9 | 7.8 | 31.1 |
| නිෂ්පාදකයාගේ මිල දර්ශකය (2013 4 වන කාර්තුව = 100) - වාර්ෂික සාමාන්‍යය (එ) | 6.3 | 2.9 | 5.8 | - | 7.8 | - |
| ද.දේ.නි. අවධමනකය (ඊ) | 4.3 | 3.9 | 3.1 (අ) | 8.1 | 6.2 | 32.6 |
| ද.ජා.ආ. අවධමනකය (ඊ) | 4.4 | 3.9 | 3.1 (අ) | 8.1 | 6.2 | 32.6 |
| නාමික වැටුප් ප්‍රමාණ දර්ශක | | | | | | |
| විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (1978 දෙසැ. = 100) - වාර්ෂික සාමාන්‍යය | 0.6 | 2.9 | 0.2 | 74.4 | 29.1 | 48.0 |
| රාජ්‍ය අංශයේ සේවකයන් (2016 = 100) - වාර්ෂික සාමාන්‍යය | 0.2 | 4.7 | 9.2 | 0.0 | 2.8 | 8.1 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2018 = 100) - වාර්ෂික සාමාන්‍යය (ඒ) | - | - | 6.4 | 9.2 | 5.8 | 17.4 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012 = 100) - වාර්ෂික සාමාන්‍යය | 13.2 | 6.2 | 3.3 | 9.2 | 4.1 | 18.2 |
| **විදේශ වෙළඳාම** | | | | | | |
| වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන) | -10,343 | -7,997 | -6,008 | -8,139 | -4,316 | -3,514 |
| අපනයන | 11,890 | 11,940 | 10,047 | 12,499 | 5,699 | 6,514 |
| ආනයන | 22,233 | 19,937 | 16,055 | 20,637 | 10,015 | 10,028 |
| වෙළඳ මිල අනුපාතය (වෙනස්වීමේ %) | 0.02 | -1.6 | 2.5 | -8.6 | -9.2 | -13.1 |
| අපනයන ඒකක වටිනාකම් දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ %) | 4.2 | -6.3 | -6.8 | 5.4 | -2.1 | 2.2 |
| ආනයන ඒකක වටිනාකම් දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ %) | 4.1 | -4.8 | -9.1 | 15.2 | 7.9 | 17.6 |
| අපනයන පරිමා දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ %) | 0.5 | 7.2 | -9.7 | 18.0 | 31.9 | 11.9 |
| ආනයන පරිමා දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ %) | 1.8 | -5.8 | -11.4 | 11.5 | 21.0 | -14.9 |
| **විදේශ මූල්‍ය (එ.ජ. ඩොලර් මිලියන)** | | | | | | |
| සේවා හා ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ) | 1,381 | 388 | -1,386 | -432 | -320 | 225 |
| ජංගම පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 6,155 | 5,757 | 6,194 | 5,221 | 3,195 | 1,459 |
| ජංගම නිල සංක්‍රාම (ශුද්ධ) | 8 | 9 | 13 | 6 | 3 | 2 |
| ජංගම ගිණුමේ ශේෂය | -2,799 | -1,843 | -1,187 | -3,343 | -1,437 | -1,828 |
| සමස්ත ශේෂය | -1,103 | 377 | -2,328 | -3,967 | -1,261 | -2,814 |
| ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි. % ලෙස) (ඊ)(ඔ) | -3.0 | -2.1 | -1.4 | -3.8 | - | - |
| මුළු විදේශීය වත්කම් (එම වර්ෂයේ ආනයන වටිනාකම අනුව මාස ගණන) (ඕ) | 5.2 | 6.3 | 6.4 | 3.6 | 4.5 | 3.2 |
| දළ නිල සංචිත (එම වර්ෂයේ ආනයන වටිනාකම අනුව මාස ගණන) | 3.7 | 4.6 | 4.2 | 1.8 | 2.6 | 1.1 |
| සමස්ත ණය සේවා අනුපාතය (ක) | | | | | | |
| භාණ්ඩ හා සේවා අපනයනයේ % ලෙස | 28.9 | 29.7 | 35.2 | 30.0 | 29.8 | 23.3 |
| ජංගම ලැබීම්වල % ලෙස | 21.3 | 21.8 | 22.6 | 21.8 | 19.8 | 19.3 |
| මුළු විදේශීය ණය (ද.දේ.නි. % ලෙස) (ඊ)(ඔ) | 55.3 | 61.6 | 57.4 | 57.0 | 56.4 | 57.4 |

(අ) තාවකාලික
(ආ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව
(ඇ) 2012 ජන හා නිවාස සංගණනය මත පදනම්ව ඇත
(ඈ) ශ්‍රම බලකාය ගණනය කිරීමේ දී වයස අවුරුදු 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය සලකා බලනු ලැබේ
(ඉ) පළමු කාර්තු දෙකෙහි සාමාන්‍යය
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නව පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත
(උ) සංශෝධිත
(ඌ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත
(එ) මෙම දර්ශකය ගණනය කිරීම 2021 නොවැම්බර් මස සිට අත්හිටුවා ඇත.
(ඒ) අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2012 සිට 2018 ලෙස වෙනස් කරන ලදී.
(ඔ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද ද.දේ.නි. මත පදනම් වේ.
(ඕ) විදේශීය සෘජු ආයෝජන සහ වෙළඳ ණය සහ අත්තිකාරම් ලෙස ලද විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ක) සමස්ත ණය සේවා අනුපාතය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ.) විදේශීය ණය සංඛ්‍යාන සංස්කරණය (2003) ට අනුරූප වන පරිදි ආපසු ගෙවීම් ඇතුළත් වන ලෙස ප්‍රතිවර්ගීකරණය කර ඇත.

## මූලික ආර්ථික දර්ශක (සම්බන්ධයි)

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 (අ) | ප්‍රථම භාගය (අ) 2021 | ප්‍රථම භාගය (අ) 2022 |
|---|---|---|---|---|---|---|
| **විනිමය අනුපාතික** | | | | | | |
| වාර්ෂික සාමාන්‍යය | | | | | | |
| එ.ජ. ඩොලරයකට රුපියල් | 162.5 | 178.8 | 185.5 | 198.9 | 196.5 | 284.2 |
| වි.ගැ.හි. ඒකකයකට රුපියල් (ඕ) | 229.9 | 247.0 | 258.6 | 283.2 | 282.0 | 388.6 |
| නා.ස.වි.අ. (2017 = 100) (ව්‍යවහාර මුදල් වර්ග 24 කින් සමන්විත පැස) (ක) | 94.1 | 88.2 | 85.9 | 78.6 | 78.8 | 60.7 |
| මූ.ස.වි.අ. (2017 = 100) (ව්‍යවහාර මුදල් වර්ග 24 කින් සමන්විත පැස) (ක)(ග) | 95.5 | 90.4 | 91.5 | 83.6 | 83.9 | 62.2 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී | | | | | | |
| එ.ජ. ඩොලරයකට රුපියල් | 182.7 | 181.6 | 186.4 | 200.4 | 201.1 | 359.9 |
| වි.ගැ.හි. ඒකකයකට රුපියල් (ඕ) | 253.5 | 251.2 | 268.5 | 280.5 | 286.9 | 477.8 |
| **රාජ්‍ය මූල්‍ය (ද.දේ.නි.යෙහි % ලෙස) (ඵ)(ට)(ඩ)** | | | | | | |
| ආදායම සහ ප්‍රදාන | 12.6 | 11.9 | 8.7 | 8.3 | 4.0 | 4.1 |
| ඉන්, ආදායම | 12.5 | 11.9 | 8.6 | 8.2 | 4.0 | 4.1 |
| ඉන්, බදු ආදායම | 11.2 | 10.9 | 7.7 | 7.3 | 3.6 | 3.5 |
| වියදම හා ශුද්ධ ණය දීම් | 17.5 | 21.0 | 19.2 | 19.9 | 8.5 | 8.1 |
| පුනරාවර්තන වියදම් | 13.6 | 15.2 | 16.1 | 15.5 | 7.4 | 7.0 |
| ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම් | 3.9 | 5.7 | 3.1 | 4.4 | 1.0 | 1.1 |
| වර්තන ගිණුමේ ශේෂය | -1.1 | -3.4 | -7.5 | -7.3 | -3.4 | -2.9 |
| ප්‍රාථමික ශේෂය | 0.6 | -3.4 | -4.3 | -5.7 | -1.5 | -1.1 |
| සමස්ත අයවැය ශේෂය | -5.0 | -9.0 | -10.5 | -11.6 | -4.4 | -4.0 |
| අයවැය හිඟය මූල්‍යනය | 5.0 | 9.0 | 10.5 | 11.6 | 4.4 | 4.0 |
| විදේශීය | 2.1 | 3.4 | -0.5 | -0.1 | 0.1 | -0.2 |
| දේශීය | 2.8 | 5.6 | 11.1 | 11.7 | 4.3 | 4.2 |
| මධ්‍යම රජයේ ණය (ත) | 78.4 | 81.9 | 95.4 | 99.5 | 93.7 | 122.4 (ද) |
| විදේශීය | 38.8 | 39.0 | 38.2 | 36.7 | 37.5 | 58.1 (ද) |
| දේශීය | 39.5 | 42.9 | 57.2 | 62.7 | 56.2 | 64.3 (ද) |
| **මුදල් සමස්ත (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස %)** | | | | | | |
| සංචිත මුදල් | 2.3 | -3.0 | 3.4 | 35.4 | 22.6 | 36.4 |
| පටු මුදල් ($M_1$) | 4.7 | 4.2 | 36.1 | 24.0 | 29.1 | 19.5 |
| පුළුල් මුදල් ($M_{2b}$) | 13.0 | 7.0 | 23.4 | 13.2 | 21.5 | 17.1 |
| බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම් | -155.1 | 250.3 | -308.0 | -368.8 | -4012.4 | -340.8 |
| බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම් | 16.3 | 4.6 | 27.8 | 20.9 | 27.1 | 31.7 |
| බැංකු ක්‍රමය මගින් සපයන ලද දේශීය ණය | | | | | | |
| රජයට (ශුද්ධ) | 16.1 | 11.1 | 62.7 | 28.2 | 42.4 (ද) | 30.7 |
| රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට | 40.7 | 8.3 | 22.5 | 18.6 | 19.0 | 52.7 |
| පෞද්ගලික අංශයට | 15.9 | 4.2 | 6.5 | 13.1 | 12.9 | 17.2 |
| $M_{2b}$ සඳහා මුදල් ගුණකය (කාලපරිච්ඡේදය අවසානයට) | 7.42 | 8.18 | 9.75 | 8.15 | 9.54 | 8.19 |
| $M_{2b}$ හි සංසරණ ප්‍රවේගය (වර්ෂය සඳහා සාමාන්‍යය) (ඊ) | 2.27 | 2.16 | 1.86 | 1.74 | - | - |
| **පොලී අනුපාතික (කාල පරිච්ඡේදය අවසානයේ දී වර්ෂයකට %)** | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | 8.00 | 7.00 | 4.50 | 5.00 | 4.50 | 13.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | 9.00 | 8.00 | 5.50 | 6.00 | 5.50 | 14.50 |
| බැංකු අනුපාතිකය (න) | 15.00 | 15.00 | 8.50 | 9.00 | 8.50 | 17.50 |
| නෛතික පොලී අනුපාතිකය / වෙළඳපොළ පොලී අනුපාතිකය (ප) | 9.08 | 11.50 | 11.64 | 10.12 | 10.12 | 7.48 |
| මුදල් වෙළඳපොළ පොලී අනුපාතික | | | | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය | 8.95 | 7.45 | 4.55 | 5.95 | 4.93 | 14.50 |
| භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික | | | | | | |
| දින-91 | 10.01 | 7.51 | 4.69 | 8.16 | 5.18 | 23.85 |
| දින-364 | 11.20 | 8.45 | 5.05 | 8.24 | 5.23 | 23.84 |
| තැන්පතු අනුපාතික | | | | | | |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 8.81 | 8.20 | 5.80 | 4.94 | 4.87 | 8.41 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය | 10.85 | 10.05 | 7.14 | 5.94 | 5.82 | 11.06 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය | 10.94 | 8.89 | 4.93 | 6.45 | 4.98 | 17.15 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය | 11.27 | 9.17 | 5.08 | 6.67 | 5.10 | 17.45 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතිරිකිරීමේ තැන්පතු අනුපාතිකය | 4.00 | 4.00 | 3.50 | 3.50 | 3.50 | 3.00 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මාස 12 ස්ථාවර තැන්පතු අනුපාතිකය | 10.50 | 9.83 | 5.25 | 5.50 | 5.00 | 12.00 |
| ණය පොලී අනුපාතික | | | | | | |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය-සතිපතා | 12.09 | 9.74 | 5.81 | 8.61 | 5.51 | 22.62 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 14.40 | 13.59 | 10.29 | 9.87 | 9.50 | 15.06 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 14.54 | 12.80 | 8.38 | 9.48 | 7.47 | 21.50 |
| **ප්‍රාග්ධන වෙළඳපොළ** | | | | | | |
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,052.4 | 6,129.2 | 6,774.2 | 12,226 | 7,837.8 | 7,342.3 |
| S&P SL20 දර්ශකය (2004 දෙසැ. = 1,000) | 3,135.2 | 2,937.0 | 2,638.1 | 4,233.3 | 2,968.3 | 2,334.4 |
| අලෙවි කළ කොටස් වටිනාකම (රුපියල් මිලියන) | 200,069 | 171,408 | 396,882 | 1,173,157 | 460,947 | 373,567 |
| ශුද්ධ විදේශීය මිලදී ගැනීම් (රුපියල් මිලියන) | -23,239 | -11,735 | -51,356 | -52,649 | -26,482 | -1,171 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රුපියල් බිලියන) | 2,839.5 | 2,851.3 | 2,960.6 | 5,489.2 | 3,470.2 | 3,184.2 |

(ග) ජා.මූ.අ. ගිණුම් ඒකකය වන විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)

(ච) විනිමය අනුපාතික, දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතික දර්ශකවල අගය ඉහළයෑම හෝ පහළයෑම මගින් සෘජුවම පිළිබිඹු වේ.

(ජ) මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කිරීම සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකය භාවිතා කර ඇත. මූ.ස.වි.අ. ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නාමික සඵල විනිමය අනුපාතිකයට (නා.ස.වි.අ.) ගැළපීම මගිනි.

(ට) 2022 වසරේ පළමු භාගය සඳහා මහ බැංකුවේ 2022 සඳහා වූ ද.දේ.නි. පුරෝකථන භාවිතා කර ඇත.

(ඩ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන කිහිපයක් සංශෝධනය කර ඇත.

(ත) 2014 වසරේ දී ජා.මූ.අ. විසින් ප්‍රකාශයට පත් කරන ලද රජයේ මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශයන්ට අනුව, අනේවාසික නොපියවූ ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ශ්‍රී ලංකා රජයේ ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කරවල සහ නොපියවූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැදුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත.

(ද) 2022 වසරේ අප්‍රේල් 12 වන දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය සම්බන්ධයෙන් අතුරු ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු නොපියවන ලද ඇතැම් ණය සේවාකරණ පිළිබඳ දත්ත තවමත් අවසන් වශයෙන් ප්‍රකාශයට පත් කර නොමැති බැවින්, 2022 වසරේ ජූනි මස අවසන් වන විට මධ්‍යම රජයේ ණය සංඛ්‍යාලේඛන බොහෝදුරට තාවකාලික වේ. තවද, 2021 වසරේ දෙවන භාගයේ සහ 2022 වසරේ පළමු භාගයේ ද.දේ.නි., 2022 වසරේ ජූනි අවසානය වන විට පැවති නොපියවූ ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, වාර්තා කිරීමට භාවිතා කර ඇත.

(න) අවසාන ණය ලබා දෙන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු ආයතනවලට සපයනු ලබන අත්තිකාරම් සඳහා අදාළ වන පොලී අනුපාතිකය වේ.

(ප) නෛතික පොලී අනුපාතිකය 1990 අංක 6 දරන සිවිල් විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයක දී අදාළ වේ. වෙළඳපොළ පොලී අනුපාතිකය 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වනය කර ඇති අතර, ණය දෙන ආයතන විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ගයක දී රුපියල් 150,000කට වඩා වැඩි ණය මුදලක් අය කර ගැනීමේ දී ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයක් නොමැති විටක අදාළ වේ. සෑම වසරක් සඳහා වූ නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර ඉදිරි වසර සඳහා අදාළ වන පොලී අනුපාතිකය පෙර වසරේ දෙසැම්බර් මාසයේදී රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

# පටුන

පිටුව

පරිච්ඡේද


1. ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ඉදිරි දැක්ම 1

2. ජාතික නිෂ්පාදිතය, වියදම සහ සේවා නියුක්තිය 19

3. ආර්ථික හා සමාජ යටිතල පහසුකම් 33

4. මිල සහ වැටුප් 49

5. විදේශීය අංශයේ ප්‍රවණතා 57

6. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කටයුතු 65

7. මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය 75

8. මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාව 85

**ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග** 99


**සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය** 125

# 1

# ආර්ථික ක්‍රියාකාරිත්වය සහ ඉදිරි දැක්ම

2022 වසරේ මුල් භාගයේ දී දැඩි බාධකවලට සහ ඉහළ අවිනිශ්චිතතාවලට මුහුණ දුන් ශ්‍රී ලංකා ආර්ථිකය, මැදි කාලීනව ස්ථාවර හා තිරසාර වර්ධන මාවතක් කරා මෙහෙය වීමේ අරමුණින් සිදු කළ බහුවිධ ආකාරයේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වල සහායයෙන්, වසරේ දෙවන භාගයේ මේ දක්වා කාල සීමාව තුළ ස්ථාවර වීමේ ලක්ෂණ පෙන්නුම් කළේය. කොවිඩ්-19 වසංගත තත්ත්වය සමනය වීමෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත්වෙමින් පැවතිය ද, දීර්ඝ කාලීනව පවතින රාජ්‍ය අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය යන ද්විත්ව හිඟයන් ඉහළ මට්ටමකට ළඟා වීම හේතුවෙන් ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය පසුබෑමකට ලක් විය. එබැවින්, ඉන්ධන හිඟය, විදුලිය විසන්ධි කිරීම්, ප්‍රධාන ආනයනික අමුද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල පුළුල් වශයෙන් පැවති හිඟය සහ ඉහළ ගිය නිෂ්පාදන පිරිවැය මෙන්ම, වෙනත් සාධක ද හේතුවෙන් හටගත් පෙර නොවූ අන්දමේ ආර්ථික අර්බුදය මගින් ආර්ථිකයේ අංශ ගණනාවකට ඇති කළ බලපෑම් හමුවේ 2021 වසරේ අග භාගයේ දී දක්නට ලැබුණු වර්ධන ප්‍රවණතාව ශීඝ්‍රයෙන් වියැකී ගිය අතර, 2022 වසරේ මුල් භාගයේ දී මූර්ත ආර්ථිකය සංකෝචනය විය. වසර ආරම්භයේ සිට අඛණ්ඩව ඉහළ ගිය උද්ධමනය ඉතිහාසයේ මෙතෙක් වාර්තා කළ ඉහළම මට්ටම් කරා ළඟා වෙමින්, කුටුම්භවල ක්‍රය ශක්තිය කෙරෙහි දැඩි බලපෑම් සිදු කළේය. උද්ධමනයෙහි මෙම අසාමාන්‍ය ඉහළ යෑම සඳහා දේශීය හා ගෝලීය වශයෙන් පැවති සැපයුම් අංශයේ අවහිරතා, දිගු කාලයක් තුළ නොවෙනස්ව පැවති පරිපාලිත මිල ගණන් සඳහා සිදුකළ සංශෝධන, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ මෑත කාලීනව සිදු කළ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමෙන් සිදු වූ පසු බලපෑම මගින් වර්ධනය වූ ඉහළ ඉල්ලුම මත පදනම් වූ පීඩන යනාදිය හේතු විය. තවද, 2019 වසරේ අග භාගයේ දී හඳුන්වා දුන් ලිහිල් බදු ක්‍රමයක් සහිත ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් සමස්ත ඉල්ලුම ඍජුව ඉහළ නැංවීම පමණක් නොව, ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම තුළින් ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ වෙත ප්‍රවේශය අහිමි වීම මධ්‍යයේ අයවැය හිඟය පියවීම සඳහා මහ බැංකුව හරහා මූල්‍ය පහසුකම් සැපයීමේ අවශ්‍යතාවක් මතු වීමෙන් උද්ධමනය තවදුරටත් ඉහළ නැංවිණි. උද්ධමන අපේක්ෂා ඉහළ යෑමට ඇති හැකියාව වැළැක්වීමට සහ ඉල්ලුම මත පදනම් වූ පීඩන දිගින් දිගටම පැවතීම අවම කිරීමට 2021 වසරේ අගෝස්තු මාසයේ ආරම්භ කළ දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, 2022 වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළ දී වේගවත් කර ඇත. මෙම ක්‍රියාමාර්ගවල සහාය මෙන්ම, සැපයුම් අංශයේ පීඩනය ලිහිල් වීම හේතුවෙන්, 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී, උද්ධමනය, අපේක්ෂිත අඩු උද්ධමනකාරී ගමන්මග හා අනුකූලව පහළ යෑම ආරම්භ විය. මේ අතර, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම මෙන්ම, අඛණ්ඩව පැවති දැඩි ද්‍රවශීලතා හිඟ තත්ත්ව හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස පහළ ගියේය. කෙසේ වෙතත්, රාජ්‍ය ආදායම පහළ යෑම සහ විදේශීය මූල්‍යන මූලාශ්‍ර සඳහා වන සීමිත ප්‍රවේශය මධ්‍යයේ බැංකු පද්ධතිය මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය පහළ යෑම සහ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහත වැටීම හේතුවෙන් රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු,

## ශ්‍රී ලංකාවේ ආර්ථිකය



ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කළේය...
බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය 17.83 ප්‍රතිශතාංක
බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය 15.61 ප්‍රතිශතාංක
බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය 15.45 ප්‍රතිශතාංක
බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය 7.71 ප්‍රතිශතාංක
බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය 6.69 ප්‍රතිශතාංක
2022 සැප්. අවසානය
දැඩි ද්‍රවශීලතා සහ මුදල් තත්ත්වයන් මධ්‍යයේ පොලී අනුපාතික වසරේ මේ දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය
ප්‍රතිපත්ති පොලී අනුපාතික 9.50 ප්‍රතිශතාංක
රජයේ ණය ගැනීම ඉහළ යෑම
වෙළඳපොළ තත්ත්වයන්හි අවිනිශ්චිතතා ඉහළ යෑම
දින 364 භාණ්ඩාගාර බිල්පත් 21.61 ප්‍රතිශතාංක (වසරේ මේ දක්වා)
වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය සහ මුදල් හා ණය සමස්තයන්හි පහළ යෑම
ණය ප්‍රසාරණය
185.9
511.7
108.0
810.5
632.7
(55.9)
2021
ජන.-අගෝ. 2022
ජන.-අගෝ. 2022 සිට අනුපාතික වෙනස
රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා සපයන ලද ණය
පෞද්ගලික අංශයට සපයන ලද ණය
රු. බිලි.
මුදල් සැපයුම ($M_{2b}$)
2021 දෙසැ. අවසානය
13.2
13.1
පෞද්ගලික අංශයට සපයන ලද ණය
(වාර්ෂික ලක්ෂ්‍යමය %)
14.0
12.0
2022 අගෝ. අවසානය
රජයට ලබා දුන් ශුද්ධ ණය
මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය
කෙසේ වෙතත්, 2022 වසරේ මේ දක්වා කාලය තුළ බැංකු පද්ධතියෙන් රජයට ලබා දුන් ශුද්ධ ණය ඉහළ මට්ටමක පවතී...
වසරේ මේ දක්වා
රු. බිලි. 1,141.5
රු. බිලි. 1,157.7
2022 ඔක්තෝබර් මාසයේ දී කො.පා.මි.ද. මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය පහළ යෑමත් සමග උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි...
TAX
66.0
වෙනත්
බලශක්ති හා ප්‍රවාහන
ආහාර හා මද්‍යසාර නොවන පාන වර්ග
වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (කො.පා.මි.ද., 2013=100, %)
ජන.-21
අප්‍රේ.-21
ජූලි-21
ඔක්.-21
ජන.-22
අප්‍රේ.-22
ජූලි-22
ඔක්.-22
ශ්‍රී ලංකා ආර්ථිකය මෙතෙක් වාර්තා වූ දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දෙමින් ඇත...
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය (කාර්තුමය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)
2021 දෙවන කාර්තුව 16.3%
2021 පළමු කාර්තුව 4%
2021 තෙවන කාර්තුව -5.8%
2021 සිව්වන කාර්තුව 2%
2022 පළමු කාර්තුව -1.6%
2022 දෙවන කාර්තුව -8.4%
දිගු කාලයක් මුළුල්ලේ පැවති සැපයුම් අවහිරතා හමුවේ ආර්ථික ක්‍රියාකාරකම් අඩාල වී ඇත...
විදුලි උත්පාදනය
2022 ජන.
2021 ජන.
2021 අගෝ.
2022 අගෝ.
විදුලි ඇල්ලීම කළමනාකරණය
විදුලි උත්පාදන සංයුතිය (ජන.-අගෝ. 2022)
ගල් අඟුරු 35%
ජල විදුලිය 29%
ද්‍රව ඉන්ධන 20%
සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව 17%
ගෝලීය අවපාතයක අවදානම හමුවේ ගෝලීය බලශක්ති මිල ඉහළ යෑම සීමා වී ඇත...
192%
51%
34%
එල්.පී. ගෑස්
ගල් අඟුරු
බොරතෙල් (බ්‍රෙන්ට්)
OIL
ගෝලීය බලශක්ති මිල ඉහළ යෑම (ජන.-සැප්. සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)
2022 වසරේ මේ දක්වා දේශීය බලශක්ති මිල ඉහළ යෑම
291% භූමිතෙල්
243% සුදු ඩීසල්
109% ඔක්ටේන් 92 පෙට්‍රල්
60% ගෘහස්ථ එල්.පී. ගෑස්
පවත්නා අර්බුදය කුටුම්භවල සුභසාධනය කෙරෙහි විෂම බලපෑමක් ඇති කළ හැකිය...
දිස්ත්‍රික්ක මට්ටමේ නිල දරිද්‍රතා රේඛාව (රුපියල් '000)
2019
2021
2022 මාර්. අවසානය
2022 ජූනි අවසානය
2022 අගෝ. අවසානය
කොළඹ
ගම්පහ
කළුතර
මහනුවර
මාතලේ
නුවරඑළිය
ගාල්ල
මාතර
හම්බන්තොට
යාපනය
මන්නාරම
වව්නියාව
මුලතිව්
කිලිනොච්චිය
මඩකලපුව
අම්පාර
ත්‍රිකුණාමලය
කුරුණෑගල
පුත්තලම
අනුරාධපුරය
පොළොන්නරුව
බදුල්ල
මොණරාගල
රත්නපුර
කෑගල්ල
15
10
5
45.0%
17.3%
රු. 7,913
රු. 9,284
රු. 13,460
2021
2022 මාර්.
2022 අගෝ.
සටහන: ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2013=100) භාවිතා කරමින් මිල වෙනස්කම්වලට ගළපන ලද නිල දරිද්‍රතා රේඛාව ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් මාසිකව ප්‍රකාශයට පත් කෙරේ.
ජාතික දරිද්‍රතා රේඛාව
බැංකු අංශය
මුළු වත්කම් (රු. ට්‍රිලි.)
16
19
මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)
16.3
15.2
සමස්ත ණය වලට තුන්වන අදියර යටතේ පවතින ණය (%)
5.0
10.6
වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) (%)
1.3
1.1
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය බැංකු ඒකක) (%)
36.1
27.3
බලපත්‍රලාභී මූල්‍ය සමාගම් අංශය
තුන්වන අදියරේ දළ ණය අනුපාතය (%)
10.8
18.0
සමස්ත අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)
16.6
21.8
වත්කම් මත ප්‍රතිලාභ (%)
4.5
2.4
2021 අගෝ. අවසානයට
2022 අගෝ. අවසානයට
2021 ජූනි අවසානයට
2022 ජූනි අවසානයට
2021 දෙසැ. අවසානයට

# සංක්ෂිප්තයක් ලෙස

වියදම් අඩු කරන අතරතුර ආදායම ඉහළ නැංවීම සඳහා 2022 වසරේ මේ දක්වා වන කාලය තුළ දී හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිලාභ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය තුළ ඉදිරි කාලයේ දී සම්පූර්ණයෙන්ම පිළිබිඹු වනු ඇත...


## ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්

(ද.දේ.නි.යෙහි % ලෙස, ජන. - ජූනි)




## මධ්‍යම රජයේ ණය

(රු. බිලි.)





2022 වසරේ මුල් කාලයේ දී, විදේශ විනිමය අනුපාතය දැඩි ලෙස අවප්‍රමාණය වීම නිසා මධ්‍යම රජයේ සමස්ත ණය ප්‍රමාණය* 37.9%කින් **වැඩි විය.**


විදේශ ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බවට 2022 වසරේ අප්‍රේල් 12 වන දින රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

*2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ දත්ත සකසා අවසන් නොමැති බැවින් 2022 වසරේ ජූනි මාසය අවසන් වන විට පැවති මධ්‍යම රජයේ නොපියවූ ණය පිළිබඳ දත්ත බොහෝ දුරට තාවකාලික වේ.

අධිභාර බද්ද පැනවීම, එකතු කළ අගය මත බදු අනුපාතිකය සහ විදුලි සංදේශ බද්ද වැඩි කිරීම, සහ උද්ධමනය ඉහළ යෑම නිසා 2022 වසරේ මුල් භාගය තුළ දී බදු ආදායම ඉහළ ගියේය.




සලකා බලන කාලපරිච්ඡේදයේ අග භාගය තුළ දී, වියදම් තාර්කිකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ ද, 2022 වසරේ පළමු භාගය තුළ දී, නාමික වශයෙන්, රජයේ වියදම් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.





## රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග

- ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග
  - එකතු කළ අගය මත බදු අනුපාතික ඉහළ නැංවීම
  - අධිභාර බද්දක් පැනවීම
  - විදුලි සංදේශ බද්ද ඉහළ නැංවීම
  - සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් පැනවීම
- වියදම් තාර්කිකරණ ක්‍රියාමාර්ග
  - ඵලදායි නොවන/අත්‍යවශ්‍ය නොවන වියදම් සීමා කරන අතරතුර විදුලිය හා ඉන්ධන භාවිතය අඩු කිරීම සඳහා රාජ්‍ය අංශයට මාර්ගෝපදේශ නිකුත් කිරීම
- පිරිවැය පිළිබිඹු වන මිල යාන්ත්‍රණ

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය කොවිඩ්-19 වසංගතය, විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සහ ගෝලීය වශයෙන් ඇති වූ අහිතකර ප්‍රවණතා මධ්‍යයේ මෑත වසරවල දී පෙර නොවූ ආකාරයේ අභියෝගවලට මුහුණ දී ඇත...

## 2022 වසර තුළ විදේශ වෙළඳාම










## සංචාරක අංශයේ ඉපැයීම්

(එ.ජ.ඩො. මිලි.)














*චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් අන්තර්ගත වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

## විනිමය අනුපාතිකයේ හැසිරීම



*පුළුල් මුදල් සැපයුමේ වර්ධනය ($M_{2b}$) 2022 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා කළ ඉහළ ම වර්ධන මට්ටමේ සිට පහළ යෑමක් වාර්තා කළේය. ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් අඛණ්ඩව පහත වැටීම් හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ වෙත ප්‍රවේශය අවහිර වීම සහ මන්දගාමී විදේශ විනිමය ලැබීම් මධ්‍යයේ විශාල විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණයක් එක්රැස් වීම හේතුවෙන් විදේශීය ණය සේවාකරණය වසර තුළ දී වඩාත් අභියෝගාත්මක විය. මෙම අභියෝගාත්මක තත්ත්වයන් මනාව සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින සිට ආරම්භ වන පරිදි ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සඳහා වන විදේශීය ණය සේවාකරණය තාවකාලික කාලසීමාවක් සඳහා අත්හිටුවන බව රජය නිවේදනය කළේය. ඉන් අනතුරුව එළැඹුණු කාලසීමාව තුළ, ආර්ථිකය ස්ථාවර සහ වඩාත් තිරසාර පදනමක් වෙත රැගෙන යෑමට සහාය සැලසීමේ අරමුණින් යුතුව, රජය විසින් බදු සහ බදු නොවන ආදායම් ඉහළ නැංවීම සඳහා පියවර රැසක් හඳුන්වා දීම හරහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ආරම්භ කළ අතර, අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් සීමා කිරීම හරහා වියදම් තාර්කීකරණය කිරීම තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. තවද, විස්තීරණ ණය පහසුකම යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය පහසුකමක් ලබා ගැනීමට රජය තීරණය කළේය. කෙසේ වෙතත්, දැනටමත් ඉහළ යන ණය මට්ටම්වලින් දැඩි ලෙස බලපෑමට ලක්ව ඇති රාජ්‍ය මූල්‍ය තත්ත්වයක් තුළ, ආර්ථිකය යථා තත්ත්වයට පත් කළ හැකි ක්‍රියාමාර්ග ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය අංශය සතු ඉඩ ප්‍රස්තා සීමා වී ඇත. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ විදේශීය අංශය ද දැඩි අභියෝගවලට අඛණ්ඩව මුහුණ දුන්නේය. ආනයන ඉල්ලුම පහළ මට්ටමක පැවතීම මෙන්ම, ණය ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බවට ප්‍රකාශ කර තිබෙන පසුබිමක වුව ද, විනිමය අනුපාතිකයට ඇති පීඩනය අවම කිරීම සඳහා ජංගම සහ මූල්‍ය ගිණුම් වෙත ලැබුණු සුළු විදේශ විනිමය ගලා ඒම් ප්‍රමාණවත් නොවීය. 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 වසරේ පළමු භාගයේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය පුළුල් විය. ආනයන පාලන ක්‍රියාමාර්ග, වෙළඳපොළ තුළ විදේශ විනිමය හිඟ වීම, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම හා දැඩි මුදල් තත්ත්වයන් හේතුවෙන් ආනයන පහළ යෑම සහ අපනයන ක්‍රියාකාරිත්වයෙහි ශක්තිමත් වර්ධනය හේතුවෙන් වෙළඳ හිඟය අඩු විය. පහළ මට්ටමක පැවති විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මෑත මාසවල දී යම් වර්ධනයක් පෙන්වූ අතර, සංචාරක ඉපැයීම්වල යම් ප්‍රගතියක් වාර්තා විය. විනිමය අනුපාතිකය මත පැවති දැඩි පීඩනය හේතුවෙන් විනිමය අනුපාතිකයෙහි නිසි ගැළපුමක් සිදු කිරීමේ අවශ්‍යතාවක් ඉස්මතු වීමෙන් 2022 වසරේ මාර්තු මාසයේ 7 වන දින ඒ සඳහා ඉඩ හැරිණි. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති ද්‍රවශීලතා හිඟයන් සහ අහිතකර වෙළඳපොළ සමපේක්ෂතා හේතුවෙන් විනිමය අනුපාතිකය අපේක්ෂා කළ මට්ටම අභිබවා සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. දිනයක් තුළ විනිමය අනුපාතිකයේ ඉහළ යෑම මෙන්ම, සමපේක්ෂණ විචලනයන් ඇති වීම අවම කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේ මැයි මස 13 වන දින සිට අන්තර් බැංකු බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයෙහි මධ්‍යය අනුපාතිකයක් සහ විචලන සීමාවක් ප්‍රකාශයට පත් කරමින් වෙළඳපොළ වෙත මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කළේය. මෙමගින්, විනිමය අනුපාතිකයේ ස්ථායීතාවය බොහෝ දුරට නැවත ස්ථාපනය කිරීමට මෙන්ම, විධිමත් සහ අවිධිමත් වෙළඳපොළ විනිමය අනුපාතික අතර පරතරය අවම කිරීමට හැකි විය. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ මුල් කාලයේ දී විස්තීරණ ණය පහසුකම් පිළිබඳ නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළඹීමත් සමඟ සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනක් සඳහා අදාළව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා එක්ව සිදු කරගෙන යනු ලබන කටයුතු බොහෝ අංශවලින් ප්‍රගතියක් පෙන්නුම් කළේය. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ද සාර්ථක අදියරකට ළඟා වී ඇත.*

*සමස්ත ආර්ථිකය ආවරණය කෙරෙන පරිදි කාර්යක්ෂම වූ ප්‍රතිසංස්කරණ දිගු කාලීන වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ පැවති දුර්වල කැපවීමෙහි අවසාන ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ගැඹුරින් මුල් බැසගත් ව්‍යුහාත්මක දුර්වලතා පදනම් කර ගෙන ශ්‍රී ලංකාවේ ආර්ථික ගැටලු උද්ගත විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන මගින් ඉතා අත්‍යවශ්‍ය වන සහ දිගු කාලයක් මුළුල්ලේ නොසලකා හරින ලද ව්‍යුහාත්මක වෙනස්කම් කාලෝචිතව හා වඩාත් විධිමත්ව සිදු කිරීමට අවස්ථාවක් ලබා දෙනු ඇති අතර, එය වඩාත් ස්ථාවර සහ තිරසාර වර්ධන මාවතක් කරා ආර්ථිකය යොමු කිරීම කෙරෙහි උපකාරී වනු ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දෙමින් සිටින පෙර නොවූ අන්දමේ ආර්ථික අර්බුදය සහ වර්ධනය වන විවිධ තත්ත්වයන් හමුවේ කඩිනම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අවශ්‍ය වන විවිධ අංශවල ඇතිවිය හැකි අවිනිශ්චිතතා හේතුවෙන්, කෙටි කාලීනව, ආර්ථිකය අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම කෙරෙහි අභියෝග රැසකට මුහුණ දෙනු ඇත. දේශීය වශයෙන් මුහුණ දෙන සැලකිය යුතු අන්දමේ ආර්ථික අභියෝග මධ්‍යයේ, ගෝලීය උද්ධමනය ඉහළ යෑමට ප්‍රතිචාර වශයෙන් ලෝකයේ  ප්‍රධාන මහ බැංකු විසින් ගනු ලබන මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ක්‍රියාමාර්ග, භූ-දේශපාලනික අර්බුද මගින් අනෙකුත් අංශවලට ඇති කෙරෙන බලපෑම් සහ එමගින් ලෝක ආර්ථිකය අවපාතයක් දක්වා වර්ධනය වීමට ඇති කරන බලපෑම් තුළින් මතුවන ගෝලීය අවිනිශ්චිතතාවලට මුහුණ දීමට ද දේශීය ආර්ථිකයට සිදුවනු ඇති අතර, එමගින් ආර්ථිකයෙහි යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය සඳහා බාහිර පරිසරය තුළින් යම් අභියෝගයන් ඇති විය හැකිය.*

*ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡාවලට අදාළව මේ දක්වා ලබා ඇති ප්‍රගතිය මෙන්ම දැනටමත් ක්‍රියාත්මක කර ඇති සහ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිසංස්කරණ පිළිබඳ සලකා බැලීමේ දී, 2023 වසරේ අග භාගයේ සිට ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ මාවතකට අවතීර්ණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, කාලෝචිත ලෙස, ආර්ථිකයෙහි සියලු අංශ ආවරණය කෙරෙන පරිදි කාර්යක්ෂම ලෙස මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් තුළ පවතින අප්‍රතිහත කැපවීම මත මෙම වැඩසටහනෙහි සාර්ථකත්වය පදනම් වන අතර, ඒ සඳහා දරන ප්‍රයත්න දේශපාලන සහ මැතිවරණ ක්‍රියාවලීන්ට අදාළ වෙනස්කම්වල බලපෑම්වලින් තොරව සිදුවීම සහතික කළ යුතුය. ඉදිරි තීරණාත්මක කාලපරිච්ඡේදය තුළ දී මෙලෙස ජාතික ප්‍රතිපත්තීන් නොවෙනස්ව පවත්වා ගැනීම, බාහිර කම්පනවලවලට ඔරොත්තු දීම සඳහා ආර්ථිකයට ඇති හැකියාව ශක්තිමත් කිරීමට සහ එමගින් මැදි කාලීනව ආර්ථිකයේ අඛණ්ඩ ප්‍රගතියක් අත්කර ගැනීමට අත්‍යවශ්‍ය වේ.*

## 1.1 ආංශික වර්ධනයන්

### මූර්ත අංශය සහ උද්ධමනය


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කරන ලද 9.3%ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ පළමු භාගය තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 4.8%කින් සංකෝචනය විය. කොවිඩ්-19 වසංගතය පහව යෑමත් සමඟ ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළ ආර්ථික ක්‍රියාකාරකම්, 2022 වසර ආරම්භයේ සිට ආර්ථික අර්බුදය තීව්‍ර වීමත්, විදේශ විනිමය ද්‍රවශීලතාවයේ හිඟය නිසා ඇති වූ අවිනිශ්චිතතා ඉහළ යෑමත් සමඟ නැවතත් අඩපණ වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මූර්ත ආර්ථිකය 2022 වසරේ පළමු භාගය තුළ දී සංකෝචනය විය. නිරන්තරයෙන් සිදුකළ විදුලිය විසන්ධි කිරීම්, සැපයුම් දාමයට බලපෑම් එල්ල කළ දිගු කාලයක් පුරා පැවතුණු ඉන්ධන හිඟය, අමුද්‍රව්‍ය හිඟතාවය සහ දේශීය හා විදේශීය වෙළඳපොළ මිල ඉහළ යෑම් මධ්‍යයේ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම යනාදී හේතු තුළින් ආර්ථිකයේ සෑම අංශයකම

> **2022 වසරේ පළමු භාගය තුළ දී, ශ්‍රී ලංකා ආර්ථිකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 4.8%ක සංකෝචනයක් වාර්තා කළේය...**

ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස අඩාල විය. විශේෂයෙන් පොහොර සහ කෘෂි රසායනවල හිඟය වැනි කෘෂිකාර්මික යෙදවුම්වල හිඟය, යෙදවුම්වල මිල ගණන් ඉහළ යෑම මෙන්ම ඉන්ධන හිඟය හේතුවෙන් සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 7.6%ක පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ පළමු භාගය තුළ, කෘෂිකර්මික කටයුතුවල සිදු වූ සමස්ත සංකෝචනය සඳහා වී, තේ, රබර් සහ එළවලු යන අංශයන්හි පසුබෑම ප්‍රධාන සාධකය වූ අතර, තෙල් සහිත පළතුරු වගාවේ වර්ධනයක් වාර්තා විය. 2022 වසරේ පළමු භාගය තුළ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කර්මාන්ත අංශය වාර්තා කළ 7.1%ක සංකෝචනය සඳහා අමුද්‍රව්‍ය හිඟය, යෙදවුම් පිරිවැය විශාල ලෙස ඉහළ යෑම, ඉන්ධන හිඟය සහ දිගුකාලීන විදුලිය විසන්ධි වීම් හේතුවෙන් ඉදිකිරීම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පැවති දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවිය. ඉදිකිරීම් හා පතල් සහ කැණීම් උප අංශයන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, 8.9%කින් සහ 13.1%කින් සංකෝචනය වූ අතර, අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදනය ද, පිළිවෙළින්, 56.6%ක සහ 9.9%ක කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කර ඇත. මේ අතර, නවාතැන් සැපයීම, ආහාර සහ පාන වර්ග ආශ්‍රිත කටයුතු වැනි සේවා ක්‍රියාකාරකම් කිහිපයක දක්නට ලැබුණු වර්ධනයත් සමග 2022 වසරේ පළමු භාගයේ දී සේවා අංශයෙහි 0.6%ක සුළු පහළ යෑමක් පමණක් සිදුවිය. මෙම අංශය ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වීම තුළින්, භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය, අනෙකුත් පෞද්ගලික සේවා ක්‍රියාකාරකම්, සහ මූල්‍ය සේවාවන් ඇතුළු උප අංශවල සිදුවූ සැලකිය යුතු සංකෝචනය හේතුවෙන් සමස්ත සේවා අංශයට ඇති වූ බලපෑම බොහෝ දුරට අවම වී ඇත.

ශ්‍රී ලංකා ආර්ථිකය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2022 වසරේ පළමු භාගයේ දී 24.8%කින් නාමික වශයෙන් වර්ධනය විය. ද.දේ.නි. ඇස්තමේන්තුගත කිරීමේ වියදම් ප්‍රවේශයට අනුව, 2022 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ ආර්ථික වර්ධනය සඳහා ඉහළ ගිය මිල මට්ටම්වල බලපෑම පිළිබිඹු කරමින් පරිභෝජන වියදමේ සිදු වූ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය. ද.දේ.නි.යෙන් 74.1%ක් වූ පරිභෝජන වියදම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා කරන ලද 14.5%ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ පළමු භාගයේ දී 25.7%ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයට දායක වෙමින්, 2022 වසරේ පළමු භාගයේ දී ගෘහස්ථ වියදම් 26.8%ක ඉහළ වේගයකින් වර්ධනය විය. තවද, 2022 වසරේ පළමු භාගයේ දී රජයේ පරිභෝජන වියදම, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 18.3%කින් වර්ධනය වූ අතර, ඉහළ ගිය ආර්ථික අවිනිශ්චිතතා මධ්‍යයේ අඩපණ වූ ආයෝජන මට්ටම් පිළිබිඹු කරමින්, 2022 වසරේ පළමු භාගය තුළ ආයෝජන වියදම්වල වර්ධනය 10.9%කට සීමා විය. නාමික ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, ආයෝජන වියදම, 2022 වසරේ පළමු භාගයේ දී 31.0%ක් විය. 2022 වසරේ පළමු භාගයේ

**1.1 රූප සටහන**
**කාර්තුමය මූර්ත ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (පදනම් වර්ෂය 2015 = 100)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දී, ආනයනවල වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සිදු වූ 40.4%ක වර්ධනයට සාපේක්ෂව, අපනයන 76.7%කින් සැලකිය යුතු අන්දමින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය වීම පෙන්නුම් කරමින්, පවත්නා මිල අනුව භාණ්ඩ හා සේවා සඳහා වන ශුද්ධ විදේශීය ඉල්ලුම කැපී පෙනෙන ලෙස වර්ධනය විය. ඒ අනුව, භාණ්ඩ හා සේවා සඳහා නාමික ශුද්ධ විදේශ ශේෂය, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, 2021 වසරේ පළමු භාගයේ පැවති -8.5%ක සිට 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ -5.1%ක් දක්වා වැඩි දියුණු විය.

2022 වසරේ පළමු කාර්තුව තුළ දී ශ්‍රම වෙළඳපොළ තුළ දක්නට ලැබුණු ක්‍රමික යථාතත්ත්වයට පත්වීම, රටෙහි ආර්ථික අර්බුදය උත්සන්න වීමත් සමග දුර්වලවිය. කොවිඩ්-19 වසංගතය ක්‍රමයෙන් පහව යෑම සහ ඒ ආශ්‍රිත සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීමත් සමඟ, ශ්‍රම වෙළඳපොළ සම්බන්ධ දර්ශක 2022 වසරේ පළමු කාර්තුව තුළ වර්ධනයක් පෙන්නුම් කළේය. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2021 වසරේ සිව්වන කාර්තුවේ සහ පළමු කාර්තුවේ, පිළිවෙළින්, වාර්තා වූ 49.5%ට සහ 50.9%ට සාපේක්ෂව 2022 වසරේ පළමු කාර්තුවේ දී 51.2%ක් දක්වා


> **ආර්ථික අර්බුදය ඇරඹීමත් සමග, සේවා වියුක්ති අනුපාතය 2022 වසරේ පළමු භාගය තුළ 4.5% දක්වා ඉහළ ගියේය...**

වර්ධනය විය. කෙසේ වෙතත්, පළමු කාර්තුව අවසානයේ සිට ආර්ථික කටයුතු අඩපණ වීමත් සමඟ වසරේ දෙවන කාර්තුවේ දී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 50.1%ක් දක්වා පහත වැටුණි. අඛණ්ඩ කාර්තු අටකට පසුව වාර්තා වූ අඩුම සේවා වියුක්ති මට්ටමක් වාර්තා කරමින්, 2022 වසරේ පළමු කාර්තුවේ දී සේවා වියුක්ති අනුපාතය 4.3%ක් දක්වා පහළ ගිය ද, 2022 වසරේ දෙවන කාර්තුවේ දී සේවා වියුක්ති අනුපාතය 4.6%ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, සේවා වියුක්ති අනුපාතය 2022 වසරේ පළමු භාගයේ දී 4.5%ක් විය.

දේශීය හා ගෝලීය වශයෙන් හට ගත් සැපයුම් අංශයේ අවහිරතා, පරිපාලන මිල සංශෝධන, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම මෙන්ම, කොවිඩ්-19 වසංගතය හමුවේ විශාල ලෙස සිදු කරන ලද මුදල් ප්‍රසාරණයේ පසු බලපෑම හේතුවෙන් වසර තුළ උද්ධමනය ඉතිහාසගත වැඩිම මට්ටම් වාර්තා කරමින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ඒ අනුව, කො.පා.මි.ද. (2013=100) මනිනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, අපේක්ෂිත උද්ධමන පරාසයෙන් සැලකිය යුතු ලෙස අපගමනය වෙමින් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී 69.8%ක අගයක් වාර්තා

**1.2 රූප සටහන**

**මතුපිට හා මූලික උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කළේය. කෙසේ වෙතත්, 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී කො.පා.මි.ද. (2013=100) මනිනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 66.0%ක් දක්වා පහළ යෑමත් සමඟ උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. ඒ අතර, ජා.පා.මි.ද. මනිනු ලබන වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී 73.7%ක් දක්වා ඉහළ ගියේය. ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහි ම උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය ඉන්ධන හා ගෑස් මිල ගණන් ඉහළ නැංවීම, විදුලි ගාස්තු සංශෝධන මෙන්ම නිෂ්පාදන ක්‍රියාවලිය හරහා ඒවායේ පසු බලපෑම් ඇතිවීම හේතුවෙන් මෑත කාලීනව උද්ධමනය ඉහළ යෑම සඳහා ආහාර නොවන කාණ්ඩයේ බලශක්ති හා ප්‍රවාහන අංශයේ සැලකිය යුතු බලපෑමක් ඇති විය. ඉහළ ගෝලීය වෙළඳ භාණ්ඩවල මිල ගණන් සහ 2022 වසරේ මාර්තු මාසයේ සිදුවූ සැලකිය යුතු ලෙස රුපියල අවප්‍රමාණය වීම කැපී පෙනෙන ලෙස භාණ්ඩ හා සේවා මිල ගණන් වෙත ගලා ඒම පිළිබිඹු කරමින් ආනයනික උද්ධමනය ද ඉහළ ගියේය. මෑතකාලීන උද්ධමන ප්‍රවණතා විශාල ලෙස සැපයුම් අංශයේ බලපෑම නිසා සිදු වුව ද, කොවිඩ්-19 වසංගතය හමුවේ සහ ඉන් අනතුරුව සිදු වූ සැලකිය යුතු මුදල් ප්‍රසාරණය හේතුවෙන් ඇති වූ ඉල්ලුම් පීඩන ද මෙම උද්ධමනය වැඩිවීම සඳහා අර්ධ වශයෙන් දායක විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා සමීක්ෂණය මගින් පෙන්නුම් කරන පරිදි 2022 වසර තුළ ආයතනික සහ ගෘහස්ථ අංශ දෙකෙහි ම උද්ධමන අපේක්ෂා මේ දක්වා වැඩි වුව ද, මෑත මාසවල එම අපේක්ෂාවල තරමක පහළ යෑමක් දක්නට ලැබිණි.

## විදේශීය අංශය

ගෝලීය සහ දේශීය වශයෙන් ඇති වූ අවහිරතා මධ්‍යයේ 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයෙහි අවදානම් උග්‍ර වීමෙන් පෙර නොවූ ආකාරයේ ගෙවුම් තුලන අර්බුදයකට යොමු විය. 2022 වසරේ පළමු


කාර්තුවේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති ආනයන වියදමට වඩා සැලකියයුතු ලෙස ඉහළ ගිය බැවින්, විශේෂයෙන් ම අත්‍යවශ්‍ය ආනයන සඳහා අවශ්‍ය විදේශ විනිමය ද්‍රවශීලතාවය වැඩි කිරීම සඳහා ආනයන වියදම් සීමා කිරීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හඳුන්වා දීම අවශ්‍ය විය. ප්‍රධාන වශයෙන්, ආනයන අඩු කිරීමට හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ බැංකු පද්ධතියේ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන්, 2022 වසරේ මාර්තු මාසයේ සිට ආනයන වියදම් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, අපනයන ආදායම වසර පුරා ඉහළ මට්ටමක පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය අඩු විය.

> ***ව්‍යුහාත්මක ගැටලු මග හරවා ගැනීම සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමෙහි සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙහි අපේක්ෂිත ප්‍රගතිය හේතුවෙන්, ගෝලීය සහ දේශීය වශයෙන් ඇති වූ බාධා මධ්‍යයේ දැනට මුහුණ දී ඇති පෙර නොවූ ආකාරයේ ගෙවුම් තුලන අර්බුදය යම් දුරකට සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ...***

2022 වසරේ මේ දක්වා කාලපරිච්ඡේදය තුළ සංචාරක ඉපැයීම් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2022 වසරේ පළමු භාගය තුළ අඩු මට්ටමක පැවති විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් මෑත මාසවලදී සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළේය. වෙළඳ ගිණුමේ හිඟය අඩුවීම මෙන්ම සේවා ගිණුමේ අතිරික්තය වැඩි වී තිබියදීත්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් අඩුවීම සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ඉහළ යෑමෙන් වූ බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ පළමු භාගයේ දී ජංගම ගිණුමේ හිඟය පුළුල් විය. ප්‍රාථමික වෙළඳපොළ තුළින් මිලදී ගැනීම් ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළ වෙත මෙන්ම රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් වාර්තා කළ ද, රජයට සහ පෞද්ගලික අංශයට සෘජු ආයෝජන ලෙස ලැබෙන විදේශීය ලැබීම් අඩුවීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු විය. මෙම ප්‍රවණතාවලට අනුව, දළ නිල සංචිත, 2021 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.1ට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 1.8ක් දක්වා අඩු විය.


දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති ද්‍රවශීලතාවයේ සැලකිය යුතු හිඟය විනිමය අනුපාතිකය මත අඛණ්ඩ බලපෑම් ඇති කිරීම හමුවේ, 2022 වසරේ මාර්තු මස මුල සිට විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමක් සඳහා ඉඩ හැරීමට සිදු වූ අතර, පසුව ඇති වූ අහිතකර සමපේක්ෂණ අපේක්ෂාවන් හමුවේ විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස අවසානය වන විට එ. ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 41.4%කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. විනිමය අනුපාතිකයේ සිදු වූ ඉහළ මෙන්ම අහිතකර සමපේක්ෂණ සැලකිල්ලට ගනිමින්, මහ බැංකුව 2022 වසරේ මැයි මස මැද භාගයේ සිට අවසර දෙනු ලැබූ ආන්තිකයක් සමඟ දෛනික විනිමය අනුපාතිකය පිළිබඳව වෙළඳපොළ මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කළේය. එතැන් සිට එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල යම් කිසි මට්ටමකට ස්ථාවරව පවත්වා ගැනීමට හැකි විය. ඒ අනුව, 2022 වසරේ ඔක්තෝබර් මස අවසානය දක්වා වසර තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 44.8%කින් අවප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියලේ විදේශීය අංශයේ තරඟකාරිත්වය තීරණය කරනු ලබන ව්‍යවහාර මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ හැසිරීම පිළිබිඹු කරන නාමික සඵල සහ මූර්ත

**1.3 රූප සටහන**
**වෙළඳ ශේෂය සහ ජංගම ගිණුමේ ශේෂය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**1.4 රූප සටහන**
**දළ නිල සංචිත සහ විනිමය අනුපාතිකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සඵල විනිමය අනුපාතික දර්ශක, 2022 වසරේ ඔක්තෝබර් මාසයෙන් අවසන් වූ මාස දහය තුළදී අඩු විය. මේ අතර, බැංකු පද්ධතියෙහි පැවති විදේශ විනිමය ද්‍රවශීලතාවයේ උග්‍ර හිඟය හේතුවෙන් ආර්ථිකයේ ඇති වූ අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය සමනය කිරීම සඳහා සහාය ලබාදීමට මහ බැංකුව අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා අඛණ්ඩව විදේශ විනිමය සැපයීම සිදු කළේය.

2022 වසරේ අප්‍රේල් මාසයේදී රජය විසින් තෝරාගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බව නිවේදන කිරීමත් සමග "පූර්ව දැනුම්දීමකින් යුතුව සිදු කළ ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීමෙන්" අනතුරුව ශ්‍රී ලංකාව 2022 වසරේ අප්‍රේල් මාසයේදී සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා ආරම්භ කිරීම මෙන්ම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ද ආරම්භ කළේය. 2022 වසරේ සැප්තැම්බර් මස මුල දී විස්තීරණ ණය පහසුකමට ආර්ථික ගැළපුම් වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළැඹුණු අතර, එම වැඩසටහන මැදි කාලීනව ආර්ථිකය තිරසාර වර්ධන මාවතකට යොමු කිරීම සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ද සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇති අතර, නිල ණය හිමියන් සමග මූල්‍යකරණ සහතික කිරීම් සම්බන්ධ සාකච්ඡා සිදු වෙමින් පවතී.

### රාජ්‍ය මූල්‍ය අංශය

රාජ්‍ය මූල්‍ය අංශයේ අයවැය හිඟය මූල්‍යනය සම්බන්ධයෙන් ඇතිවන පීඩනය තීව්‍ර වීම පිළිබඳව නිසි සැලකිල්ලක් යොමු කරමින්, 2022 වසර තුළ දී රජය විසින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙනු ලැබූ අතර, මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිලාභ රාජ්‍ය මූල්‍ය දර්ශක මගින් ඉදිරියේ දී පිළිබිඹු වනු ඇත. ඒ අනුව, අධිභාර බද්ද පැනවීම, මූල්‍ය සේවා මත පනවන එකතු කළ අගය මත බදු අනුපාතිකය ඉහළ නැංවීම, 2022 වසරේ ජූනි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බද්දෙහි සාමාන්‍ය අනුපාතිකය සහ විදුලි සංදේශ බද්ද ඉහළ නැංවීම ඇතුළුව, රජය විසින් 2022 වසරේ මුල් භාගය තුළ දී සැලකිය යුතු බදු ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වීම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග කිහිපයක් ද හඳුන්වා දෙන ලදී. හදිසි නොවන ප්‍රාග්ධන වියදම් සහ අතිකාල ගෙවීම් හා නව සේවක බඳවා ගැනීම් ඇතුළු අනෙකුත් පුනරාවර්තන වියදම් සීමා කිරීම මෙම වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 715.3ක (ද.දේ.නි.යෙන් 4.0%ක්) පහළ මට්ටමේ රාජ්‍ය ආදායම සහ ප්‍රදානවලට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගය තුළ දී රාජ්‍ය ආදායම සහ ප්‍රදාන රුපියල් බිලියන 919.5ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 4.1%ක්) විය. ඉහළ ගිය දේශීය සහ විදේශීය උද්ධමනය මෙන්ම විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම යනාදියෙන් අනෙක් අංශ මත සිදු වූ බලපෑමත් සමග සමාලෝචනයට ලක් කරනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ක්‍රියාත්මක කරන ලද ආදායම් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් රාජ්‍ය ආදායම ඉහළ ගියේය. වියදම් තාර්කීකරණ ප්‍රයත්නයන් ක්‍රියාත්මක කළ ද, ජනගහනයෙහි දිළිඳු සහ ආර්ථිකමය වශයෙන් අවදානමට ලක් විය හැකි කාණ්ඩ මත වසංගතයෙන් ඇති වූ බලපෑම් සමනය කිරීමට ගත් සහන ක්‍රියාමාර්ග සඳහා දරන ලද අතිරේක වියදම් ඉහළ යෑම, දේශීය පොලී අනුපාතික ඉහළ යෑම, අධික උද්ධමනය සහ විනිමය අනුපාතිකය විශාල වශයෙන් අවප්‍රමාණය වීම නිසා භාණ්ඩ සහ සේවා සඳහා වියදම ඉහළ යෑම ඇතුළු අනෙකුත් සාධක වැනි අහිතකර වෙළඳපොළ ප්‍රවණතා මූලිකව හේතුකර ගෙන රාජ්‍ය වියදම අඛණ්ඩව ඉහළ ගියේය. සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම්, නාමික වශයෙන් 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රුපියල් බිලියන 1,495.5ක (ද.දේ.නි.යෙන් 8.5%ක)


**1.5 රූප සටහන**
**රාජ්‍ය ආදායම සහ වියදම (අ)**




(අ) 2018-2021 වසරවලට අදාළ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කරන ලද 2015 පදනම් වර්ෂය සහිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වන අතර, 2022 වසරට අදාළ වන අගයන් මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ.

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

**1.6 රූප සටහන**
**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් (අ)**




(අ) 2018-2021 වසරවලට අදාළ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කරන ලද 2015 පදනම් වර්ෂය සහිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වන අතර, 2022 වසරට අදාළ වන අගයන් මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ.

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සිට 2022 වසරේ මුල් භාගය තුළ දී රුපියල් බිලියන 1,822.1ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 8.1%ක්) දක්වා 21.8%කින් ඉහළ ගියේය.

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ගවල බලපෑම තවමත් සම්පූර්ණයෙන් රජය වෙත ලැබී නොමැති බැවින්, නාමික වශයෙන් රාජ්‍ය ආදායමේ වර්ධනය වීම ඉක්මවා රාජ්‍ය වියදම් ඉහළ යෑම නිසා 2022 වසර මුල් භාගය තුළ දී සමස්ත අයවැය හිඟය සහ වර්තන ගිණුම් ශේෂය නාමික වශයෙන් පිරිහුණ ද, ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක පුරෝකථනය කරන ලද ද.දේ.නි.යෙන් ප්‍රතිශතයක් ලෙස ගත් කල යම් සාධනීය වර්ධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, අයවැය හිඟය නාමික වශයෙන්, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 780.2ට (ද.දේ.නි.යෙන් 4.4%) සාපේක්ෂව රුපියල් බිලියන 902.7ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 4.0%) දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ප්‍රාථමික හිඟය, 2021 වසරේ මුල් භාගයේ දී වාර්තා වූ රුපියල් බිලියන 273.2ක (ද.දේ.නි.යෙන් 1.5%ක) සිට සමාලෝචනයට ලක් කරනු ලබන කාලය තුළ දී රුපියල් බිලියන 244.8ක් (ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙන් 1.1%ක්) දක්වා අඩු විය. කෙසේ වෙතත්, ඉදිරි කාලය තුළ දී සැලකිය යුතු තරම් විශාල රාජ්‍ය ආදායම් ප්‍රවාහයක් ලැබීමකින් හැර, පසුගිය දෙවසර ඇතුළත සහ 2022 වසරේ මෙතෙක් කාලයක් සඳහා හිඟව පවතින රජය විසින් නුදුරු කාලයේ දී කළ යුතු කිසියම් ගෙවීම් පියවීමක් සිදු වේ නම්, රාජ්‍ය මූල්‍ය ශේෂයන් තවදුරටත් පිරිහීමට ලක් විය හැකිය.

> ***"රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වීම හේතුවෙන්, රජය කැපී පෙනෙන බදු ප්‍රතිසංස්කරණ සහ වියදම් තාර්කිකරණ ක්‍රියාමාර්ග 2022 වසරේ හඳුන්වා දුන්නේය...***

ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම සහ තෝරා ගත් විදේශ ණය සේවාකරණ ගෙවීම් රජය විසින් තාවකාලිකව අත්හිටුවීම නිසා ගෝලීය මූල්‍ය වෙළඳපොළ වෙත ඇති ප්‍රවේශය සීමා වීමේ ප්‍රතිඵලයක් ලෙස, අයවැය හිඟය මූල්‍යනය කිරීමේ දී, ශුද්ධ පදනම මත, රජය සම්පූර්ණයෙන් ම දේශීය මූලාශ්‍ර මත රඳා පැවතුණේය. 2022 වසරේ ජනවාරි මාසයේ සිට ජූනි මාසය අතරතුර කාලපරිච්ඡේදය තුළ දී, ශුද්ධ දේශීය මූල්‍යනය, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රුපියල් බිලියන 759.0ට සාපේක්ෂව රුපියල් බිලියන 947.1ක් වූ අතර, ශුද්ධ විදේශීය මූල්‍යනය, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 21.2ට සාපේක්ෂව රුපියල් බිලියන 44.4ක ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. වාණිජ බැංකු වෙත ආපසු ගෙවීම් සිදු කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස අයවැය හිඟය මූල්‍යනය සඳහා බැංකු පද්ධතියෙන් සිදු කළ ණය ගැනීම් පහළ ගිය ද, මහ බැංකුව හරහා කළ ශුද්ධ මූල්‍යනය 2021 වසරේ මුල් භාගයේ දී වාර්තා වූ රුපියල් බිලියන 310.0ට සාපේක්ෂව, 2022 වසරේ එම කාලය තුළ දී රුපියල් බිලියන 1,000.0ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ඉහළ ගිය අයවැය හිඟයත්, එමෙන්ම ශ්‍රී ලංකා රුපියලෙහි තියුණු අවප්‍රමාණය වීමත් හේතුවෙන් 2021 වසර අවසානයේ සිට 2022 වසරේ ජූනි මාසය අවසානය වන විට, මධ්‍යම රජයේ ණය 37.9%කින් පමණ සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. 2022 වසරේ අප්‍රේල් මාසයේ 12 වන දින ශ්‍රී ලංකාවේ විදේශීය රාජ්‍ය ණය

> ***"ඉහළ ගිය අයවැය හිඟයත් සමඟ එ. ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි සිදු වූ තියුණු අවප්‍රමාණය වීම හේතුවෙන්, 2022 වසරේ ජූනි මස අවසානය වන විට මධ්‍යම රජයේ ණය සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළේය...***

සේවාකරණය සම්බන්ධව අන්තර්කාලීන ප්‍රතිපත්තිය නිවේදනය කිරීමෙන් අනතුරුව ගෙවිය යුතුව තිබූ ණය සේවාකරණ ගෙවීම් කිහිපයක් පියවිය යුතු ආකාරය පිළිබඳ තීරණයට එළඹිය යුතුව ඇති පසුබිමක, මධ්‍යම රජයේ නොපියවූ ණය තොගය 2022 වසරේ ජූනි මාසය අවසානය වන විට රුපියල් බිලියන 24,264.4ක් දක්වා ළඟා වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2021 වසර අවසානයේ දී වාර්තා වූ ණය මට්ටම්වල සිට 2022 වසරේ ජූනි මාසය අවසානය වන විට, සමස්ත දේශීය ණය රුපියල් බිලියන 12,738.5ක් දක්වා රුපියල් බිලියන 1,641.3කින් ඉහළ ගිය අතර, විදේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 11,525.9ක් දක්වා රුපියල් බිලියන 5,033.7කින් ඉහළ ගියේය.


### මුදල් අංශය

රුපියල අවප්‍රමාණය වීම, ඛනිජ තෙල් සහ අනෙකුත් ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, දේශීය පරිපාලිත මිල ගණන් වෙනස්කිරීම් සහ දේශීය සැපයුම් අංශයේ අවහිරතා හේතුවෙන් උද්ධමන පීඩන අඛණ්ඩව ඉහළ ගිය අතර, උද්ධමන අපේක්ෂා ඉහළ යෑමට ඇති හැකියාව වළක්වාලමින් උද්ධමන පීඩන මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසර මුළුල්ලේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ඒ අනුව, 2021 වසරේ අගෝස්තු මාසයේ සිට ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම්

අනුපාතිකය, පිළිවෙළින්, 14.50%ක් සහ 15.50%ක් දක්වා ප්‍රතිශතාංක 10කින් 2022 වසරේ ඔක්තෝබර් මස අවසානය වන විට ඉහළ නැංවීය. ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන තවදුරටත් ඇති වීම වැළැක්වීම, අහිතකර උද්ධමන අපේක්ෂා ඇති වීම වැළැක්වීම, විනිමය අනුපාතිකය ස්ථායී කිරීමේ ක්‍රියාවලියට සහාය වීම සහ වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයේ නිරීක්ෂණය වූ විෂමතා නිවැරදි කිරීමේ අරමුණින් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පෙර නොවූ අන්දමින් ප්‍රතිශතාංක 7කින් ඉහළ නැංවීම ද මීට ඇතුළත් වේ. මේ අතර, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2කින් ඉහළ නැංවීම මෙන්ම රජයේ විදේශ ණය සේවාකරණ වගකීම් ආපසු ගෙවීමට දළ නිල සංචිත භාවිත කිරීම, මහජනතාව බැංකු පද්ධතියෙන් ව්‍යවහාර මුදල් ශුද්ධ වශයෙන් ආපසු ගැනීම, අඛණ්ඩව අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය සඳහා මහ බැංකුව විසින් ශුද්ධ වශයෙන් විදේශ විනිමය විකිණීම, මහ බැංකුව විසින් විකුණුම්-ගැණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (ශුද්ධ වශයෙන් කල් පිරෙන ණය) වෙත එළඹීම සහ මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ස්ථාවර පදනම මත විකිණීම වැනි 2022 වසරේ මේ දක්වා කාලය තුළ සිදු කළ අනෙකුත් ප්‍රවණතා සමඟ දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව සාපේක්ෂව හිඟ මට්ටම්වල අඛණ්ඩව පැවතුණි. ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම වෙළඳපොළ වෙත වේගයෙන් සම්ප්‍රේෂණය වීම සහ දේශීය බැංකු පද්ධතියේ හිඟ ද්‍රවශීලතා තත්ත්ව හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික මෑත ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මට්ටම් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යෑම මෙන්ම රජයේ ණය අවශ්‍යතාවය ඉහළ යෑම සහ ණය ප්‍රතිව්‍යුහගත

**1.7 රූප සටහන**

**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික**




*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

**1.1 සංඛ්‍යා සටහන**

**මෑතකාලීන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග**

| දිනය | ක්‍රියාමාර්ගය |
|---|---|
| 2021 අගෝස්තු 19 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.00% සහ 6.00% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 9.00% දක්වා වැඩි විය. |
| 2021 අගෝස්තු 19 | 2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින් 4.00% දක්වා වැඩි කරන ලදී. |
| 2022 ජනවාරි 20 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 9.50% දක්වා වැඩි විය. |
| 2022 මාර්තු 04 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 10.50% දක්වා වැඩි විය. |
| 2022 මාර්තු 07 | විනිමය අනුපාතිකය වෙනස් වීමකට ඉඩ සලසන ලදී. |
| 2022 අප්‍රේල් 08 | 2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 700කින්, පිළිවෙළින්, 13.50% සහ 14.50% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 17.50% දක්වා වැඩි විය. |
| 2022 ජූලි 07 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 14.50% සහ 15.50% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 18.50% දක්වා වැඩි විය. |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

සටහන: මහ බැංකුව විසින් පහත පරිදි පොලී අනුපාතික මත උපරිම සීමා පැනවීම/සංශෝධනය කිරීම සිදු කරන ලදී.

- 2021.08.24 : බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී.
- 2021.12.30 : බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම සීමා සංශෝධනය කරන ලදී (දින 364 භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික හා සම්බන්ධ කරන ලදී).
- 2021.12.31 : බලපත්‍රලාභී බැංකුවල දේපළ ඇපකර සහිත නිවාස ණය මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා සංශෝධනය කරන ලදී (බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය හා සම්බන්ධ කරන ලදී).
- 2022.03.04 : බලපත්‍රලාභී බැංකුවල තෝරාගත් ණය උපකරණ මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා වැඩි කරන ලදී.
- 2022.03.11 : බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලදී.
- 2022.04.21 : බලපත්‍රලාභී බැංකුවල තොරාගත් ණය උපකරණ මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලදී.

කිරීම පිළිබඳ සාකච්ඡා මධ්‍යයේ වෙළඳපොළ තත්ත්වයන්හි අවිනිශ්චිතතා ඉහළ යෑම හේතුවෙන් අනෙකුත් පොලී අනුපාතිකවල වෙනස්වීම්වලට අසමානුපාතිකව රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික ද සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළේය. ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් 2022 වසරේ මාර්තු-මැයි මාසවල දී බැංකු පද්ධතිය මගින් පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි ප්‍රසාරණයක් වාර්තා වුව ද, මුදල් තත්ත්වයන් දැඩි වීමත් සමඟ බැංකු පද්ධතිය මගින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය පහළ යෑම ආරම්භ වී 2022 වසරේ ජූනි මාසයේ සිට බැංකු පද්ධතිය මගින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රමාණය අඛණ්ඩව සංකෝචනය විය. ඒ අනුව, 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට, පෞද්ගලික අංශය වෙත ලබා දුන්


ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 12.0%ක් දක්වා පහළ ගිය අතර, රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු, එම වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනය 1.9%ක් පමණ දක්වා පහළ ගොස් ඇතැයි ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ආදායම අඩුවීම සහ විදේශීය මූල්‍ය ප්‍රභවයන් සඳහා වන ප්‍රවේශය සීමිත වීම මධ්‍යයේ රජය විසින් දේශීය මූල්‍යන මත, විශේෂයෙන් ම මහ බැංකු මූල්‍යන මත, අඛණ්ඩව රඳා පැවතීම පිළිබිඹු කරමින් බැංකු පද්ධතිය විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දුර්වල මූල්‍ය කාර්යසාධනය සහ

> **පෙර නොවූ අන්දමේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත වේගයෙන් සම්ප්‍රේෂණය වීම සහ දැඩි ද්‍රවශීලතා තත්ත්ව පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වර්ධනයේ කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා විය...**

විදේශීය මුදලින් නාමනය කරන ලද ණය රුපියල් වලින් ගණනය කිරීමේ දී සිදු වූ බලපෑම පිළිබිඹු කරමින් රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් පිරිහීම හේතුවෙන් බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් අඛණ්ඩව පහත වැටුණි. රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ විදේශීය මුදලින් නාමනය කරන ලද ණය රුපියල් වලින් ගණනය කිරීමේදී සිදු වූ බලපෑම මධ්‍යයේ වුවද පෞද්ගලික අංශයට ලබා දුන් ණය සංකෝචනය වීම සහ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහත

**1.8 රූප සටහන**

**පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) සහ දේශීය ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වැටීම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයේ සිට පුළුල් මුදල් සැපයුමේ වර්ධනය අඩු විය. පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 වසරේ අප්‍රේල් මාසයේ පැවති එහි ඉහළම අගය වන 20.0%ක සිට 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට 14.0%ක් දක්වා පහළ ගියේය. රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට 5.8%ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

### මූල්‍ය අංශය

2022 වසරේ මේ දක්වා කාලය තුළ ආර්ථිකයෙහි පැවති අර්බුදකාරී තත්ත්වයන් මධ්‍යයේ මූල්‍ය අංශයේ ස්ථායීතාව අභියෝගයට ලක් විය. බැංකු අංශය වත්කම් අනුව වර්ධනයක් වාර්තා කළද, විදේශ විනිමය අර්බුදය සහ දැඩි මුදල් ප්‍රතිපත්තිය, විශේෂයෙන් ම විදේශ විනිමය ද්‍රවශීලතාව සහ ණය කලඹේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන්, මූල්‍ය අංශය වෙත අභියෝග එල්ල කරනු ලැබීය. 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල කාර්යසාධනය වර්ධනය වූ අතර,

> **2022 වසරේ මේ දක්වා කාලය තුළ ආර්ථිකයේ පැවති අර්බුදකාරී තත්ත්වය මධ්‍යයේ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය අභියෝගයට ලක් විය...**

මෙම අංශයේ ණය කළඹේ ගුණාත්මකභාවයෙහි ඇති විය හැකි පිරිහීමක් පෙන්නුම් කරමින්, තුන්වන අදියරේ දළ ණයෙහි සැලකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබුණි. ප්‍රධාන වශයෙන් පවතින ආර්ථික අවිනිශ්චිතතා හේතුවෙන් ප්‍රාථමික අලෙවිකරුවන්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, රක්ෂණ සමාගම්, විශ්‍රාම අරමුදල් සහ අනෙකුත් උප අංශ මෙම කාල සීමාව තුළ මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. මූල්‍ය වෙළඳපොළ තත්ත්වය සැලකීමේ දී, නියමිත විදේශ ණය ආපසු ගෙවීම, මහජනතාව විසින් බැංකු පද්ධතියෙන් මුදල් ආපසු ගැනීම් මෙන්ම විදේශ විනිමය හුවමාරු ගිවිසුම් කල්පිරීම හේතුවෙන් 2022 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ තුළ ද්‍රවශීලතා හිඟයක් අඛණ්ඩව පැවති අතර, ගනුදෙනු ප්‍රමාණය අනුව දේශීය විදේශීය විනිමය වෙළඳපොළ අඛණ්ඩව පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. රාජ්‍ය මූල්‍ය අංශයේ සැලකිය යුතු මූල්‍යන අවශ්‍යතාව, ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සහ වෙළඳපොළ අවිනිශ්චිතතාවල ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ප්‍රාථමික

වෙළඳපොළ එලදා අනුපාතික ඉහළ යන ලදී. තවද, 2022 වසරේ පෙබරවාරි මස මුල සිට දැඩි ලෙස පහත වැටීමක් පෙන්නුම් කළ කොටස් වෙළඳපොළ 2022 වසරේ අප්‍රේල් මාසයේ සිට තරමක වර්ධනයක් පෙන්නුම් කළේය. මූල්‍ය වෙළඳපොළ තුළ පැවති අභියෝගාත්මක තත්ත්ව මධ්‍යයේ වුව ද, වසර තුළදී මූල්‍ය යටිතල පහසුකම් අංශය සුමට ක්‍රියාකාරිත්වයක් තහවුරු කළේය. මේ අතර, නව බැංකු පනත ඇතුළු ක්‍රියාත්මක කිරීමට නියමිත ක්‍රියාමාර්ග කිහිපයක් මගින් මූල්‍ය අංශයේ නෛතික සහ නියාමන රාමුව ද ශක්තිමත් කරමින් පවතී.

## 1.2 ජාත්‍යන්තර ආර්ථික පසුබිම

ඉහළ උද්ධමනය, දැඩි මූල්‍ය තත්ත්වයන්, භූ-දේශපාලන ආතතීන්ගේ අහිතකර බලපෑම්, කොවිඩ්-19 වසංගතයේ අඛණ්ඩ බලපෑම්, අපේක්ෂිත ගෝලීය අවපාතය මගින් මතුවන ගැටලු සහ ආහාර අනාරක්ෂිතභාවය වැනි සැලකියයුතු අභියෝග ගණනාවක් මගින් ගෝලීය ආර්ථිකය කෙරෙහි බලපෑම් එල්ල වී ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් කළ ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2021 වසරේ දී වාර්තා වූ 6.0%ක සිට 2022 වසරේ දී 3.2%ක් දක්වා සහ 2023 වසරේ දී 2.7%ක් දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2007/08 වසරවල ගෝලීය මූල්‍ය අර්බුදය සහ කොවිඩ්-19 වසංගතයේ උච්චතම අවධිය හැරුණු විට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද දුර්වලම ආර්ථික වර්ධන පුරෝකථනය මෙය වේ. ඒ අනුව, ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝ කලාපය සහ චීනය ඇතුළු ලෝකයේ විශාලතම ආර්ථිකයන්හි සිදු වුණු ප්‍රධාන ආර්ථික පසුබැම්වල බලපෑම් හේතුවෙන් දුර්වල ගෝලීය ආර්ථික වර්ධනයක් අපේක්ෂා කෙරේ. මේ වන විට ලෝක ආර්ථිකයන්ගෙන් තුනෙන් එකක් පමණ අඛණ්ඩව කාර්තු දෙකක් සඳහා සෘණ ආර්ථික වර්ධනයකට මුහුණ දී ඇති අතර, එය තාක්ෂණික වශයෙන් 'ආර්ථික අවපාතයක' තත්ත්වයක් පෙන්නුම් කරයි. මෙම වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, 2021 වසරේ දී 5.2%ක් වූ දියුණු ආර්ථිකයන්හි වර්ධනය 2022 සහ 2023 වසරවල දී, පිළිවෙළින්, 2.4%ක් සහ 1.1%ක් දක්වා මන්දගාමී වනු ඇතැයි ලෝක ආර්ථික ඉදිරි දැක්ම මගින් පුරෝකථනය කරනු ලබයි. ප්‍රධාන වශයෙන් වැය කළ හැකි මූර්ත ආදායම පහත වැටීම සහ නේවාසික ආයෝජන සඳහා වන අධික වියදම් හේතුවෙන්, ඇමෙරිකා එක්සත් ජනපදයේ ආර්ථික වර්ධනය 2021 වසරේ දී වූ 5.7%ක සිට 2022 සහ 2023 වසරවල දී, පිළිවෙළින්, 1.6%ක් සහ 1.0%ක් දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. යුරෝ කලාපය තුළ, ආර්ථික වර්ධන පුරෝකථනයන් 2021 දී පැවති 5.2%ක සිට 2022 වසරේ දී 3.1%ක් දක්වා සහ 2023 වසරේ දී 0.5%ක් දක්වා පහත දමා ඇත. සංවර්ධිත රටවලට සාපේක්ෂව නැගී එන වෙළඳපොළවල අඩු ආර්ථික වර්ධනයක් පිළිබිඹු කරමින්, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි වර්ධනය 2021 වසරේ දී වූ 6.6%ක සිට 2022 දී 3.7%ක් දක්වා මන්දගාමී වන අතර, 2023 වසරේ දී එම මට්ටමෙහි ම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් සංචරණ සීමා පැනවීම සහ පහළ යන දේපළ වෙළඳපොළ මිල ගණන් හේතුවෙන් චීනයේ ආර්ථික වර්ධනය පහත වැටීම පිළිබිඹු කරමින්, 2021 වසරේ දී 7.2%ක් වූ නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ ආර්ථික වර්ධනය, 2022 වසරේ දී 4.4%ක් සහ 2023 වසරේ දී 4.9%ක් වනු

**1.2 සංඛ්‍යා සටහන**

**තෝරාගත් මහ බැංකුවල ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල වෙනස්වීම්**

%

| රට | ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය | 2019 අවසානයේදී | 2020 අවසානයේදී | 2021 අවසානයේදී | 2022 ඔක්. අවසානයේදී |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.00 | 4.50 | 5.00 | 14.50 |
| | නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.00 | 5.50 | 6.00 | 15.50 |
| නැගී එන ආර්ථික | | | | | |
| ඉන්දියාව | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | 5.15 | 4.00 | 4.00 | 5.90 |
| මැලේසියාව | එක්දින ප්‍රතිපත්ති අනුපාතිකය | 3.00 | 1.75 | 1.75 | 2.50 |
| තායිලන්තය | එක්දින ද්විපාර්ශ්වික ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | 1.25 | 0.50 | 0.50 | 1.00 |
| චීනය | එක් අවුරුදු ප්‍රමුඛ ණය අනුපාතිකය | 4.15 | 3.85 | 3.80 | 3.65 |
| ඉන්දුනීසියාව | සත් දින ප්‍රතිවිකුණුම් අනුපාතිකය | 5.00 | 3.75 | 3.50 | 4.75 |
| පිලිපීනය | එක්දින ප්‍රතිවිකුණුම් අනුපාතිකය | 4.00 | 2.00 | 2.00 | 4.25 |
| දියුණු ආර්ථික | | | | | |
| ඇමරිකා එක්සත් ජනපදය | ෆෙඩරල් අරමුදල් අනුපාතිකය | 1.50 - 1.75 | 0.00-0.25 | 0.00-0.25 | 3.00-3.25 |
| එක්සත් රාජධානිය | බැංකු අනුපාතිකය | 0.75 | 0.10 | 0.25 | 2.25 |
| යුරෝපා මහ බැංකුව | ප්‍රතිමූල්‍යන අනුපාතිකය | 0.00 | 0.00 | 0.00 | 2.00 |
| ජපානය | එක්දින ඒක්ෂණ අනුපාතිකය | -0.10 | -0.10 | -0.10 | -0.10 |
| කැනඩාව | එක්දින අනුපාතිකය | 1.75 | 0.25 | 0.25 | 3.75 |
| ඕස්ට්‍රේලියාව | මුදල් අනුපාතිකය | 0.75 | 0.10 | 0.10 | 2.60 |
| ස්වීඩනය | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | -0.25 | 0.00 | 0.00 | 1.75 |

මූලය: අදාළ මහ බැංකුවල වෙබ් අඩවි

ඇතැයි පුරෝකථනය කර ඇත. චීන ආර්ථිකයේ වර්ධනය 2021 වසරේ දී වාර්තා වූ 8.1%ක සිට 2022 වසරේ දී 3.2%ක් දක්වා සහ 2023 වසරේ දී 4.4%ක් දක්වා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේ දී වාර්තා වූ 8.7%ක ආර්ථික වර්ධන වේගයට සාපේක්ෂව, 2022 සහ 2023 වසරවල දී ඉන්දියාවේ ආර්ථික වර්ධන අපේක්ෂාවන් 6.8%ක් සහ 6.1%ක් ලෙස සංශෝධනය කර ඇත.

> ***අඛණ්ඩව පවත්නා භූ-දේශපාලනික අර්බුද හේතුවෙන් භාණ්ඩ මිල මත වන බලපෑම්, ගෝලීය උද්ධමන පීඩන ඉහළ යෑම සහ ප්‍රධාන මහ බැංකු විසින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම යන කරුණු හේතුවෙන් ඉදිරියේ දී ආර්ථික අවපාත තත්ත්වයකට ගෝලීය ආර්ථිකය මුහුණ දිය හැකිය...***

පසුගිය දශක දෙක තුළ දක්නට ලැබුණු ඉහළ ම ගෝලීය උද්ධමනය වාර්තා වීම හේතුවෙන් වේගවත් ලෙස මුදල් ප්‍රතිපත්ති දෘඩි කිරීම අත්‍යවශ්‍ය විය. 2021 වසරේ සිට, උද්ධමනය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වේගයෙන් හා ස්ථාවර ලෙස වැඩි වී ඇති අතර, 2022 වසරේ දී දියුණු ආර්ථිකයන්හි උද්ධමනය 1982 වසරේ සිට වාර්තා වූ ඉහළ ම මට්ටමට ළඟා විය. ලෝක ආර්ථික ඉදිරි දැක්මෙහි පුරෝකථනයට අනුව, 2021 වසරේ දී 3.1%ක් වූ දියුණු ආර්ථිකයන්හි උද්ධමන අනුපාතිකය, 2022 වසරේ දී 7.2%ක් දක්වා වේගවත් වී, ඉන්පසුව 2023 වසරේ දී 4.4%ක් දක්වා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේ දී 5.9%ක් වූ නැගී එන වෙළඳපොළවල සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි උද්ධමනය 2022 වසරේ දී 9.9%ක් දක්වා වේගවත් වී 2023 වසරේ දී 8.1%ක් දක්වා තරමක් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ඉහළ උද්ධමන මට්ටම්වල බලපෑම ලොව පුරා සියලුම ආර්ථික පාර්ශ්වකරුවන්ට දැනුණ ද, පරිභෝජනයෙන් අඩක් ම ආහාර සඳහා වැය කරන අඩු ආදායම්ලාභී රටවලට මෙම මිල ගණන්වල වර්ධනයන් දැඩි බලපෑමක් ඇති කරනු ඇත. විශේෂයෙන් ම, මෙම ආර්ථිකයන්හි දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ජනගහනයෙන් සැලකිය යුතු කොටසකගේ සමාජ ආර්ථික යහපැවැත්මට සහ ජීවන තත්ත්වයන්ට දැඩි ලෙස බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, බොහෝ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් දැනටමත් සැලකිය යුතු බාහිර අභියෝගවලට මුහුණ දී සිටින අතර, එ.ජ. ඩොලරයෙහි වටිනාකම සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය වීම මගින් දේශීය මිල මත ඇති කරන පීඩනය උග්‍ර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ රටවල ජීවන වියදම වැඩි වී ඇත. මෙම ඉහළ යන මිල පීඩනයන් මූර්ත ඉපැයීම් අඩු වීම හෝ ප්‍රමාණවත් නොවීම සහ නුදුරු අනාගතයේ දී සාර්ව ආර්ථික ස්ථාවරත්වය තවදුරටත් දුර්වල කරනු ඇති බව ලෝක ආර්ථික ඉදිරි දැක්ම ප්‍රකාශනය මගින් අවධාරණය කර ඇත. ලොව පුරා මහ බැංකු මේ වන විට මිල ස්ථායීතාවය නැවත ළඟා කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇතත්, ආර්ථික අවපාත බලපෑම් සහ වේගවත් ලෙස ප්‍රතිපත්ති දැඩි කිරීමේ ප්‍රතිලාභ අතර සමතුලිතතාවය නිසි ලෙස සලකා බැලීමෙන් සමහර ප්‍රතිපත්ති සම්පාදකයින් දැනටමත් ඔවුන්ගේ ප්‍රතිපත්ති දැඩි කිරීම තරමක් දුරට ලිහිල් කිරීම හේතුවෙන්, ප්‍රතිපත්ති දැඩි කිරීම සිදුවන වේගය මතභේදයට තුඩු දෙන ප්‍රධාන කරුණක් ලෙස පවතී.

### 1.3 අපේක්ෂිත වර්ධනයන්

නිදහස ලැබීමෙන් පසුව ශ්‍රී ලංකාවේ වාර්තා වූ අඩු ම ආර්ථික වර්ධන මට්ටම් සහ ඉතිහාසයේ වාර්තාවන ඉහළ ම උද්ධමන මට්ටම් සමග තීව්‍ර වුණු ආර්ථික අවදානම්වලින් සහ සැලකිය යුතු මට්ටමේ ආර්ථික මන්දගාමීත්වයෙන් පසුව ශ්‍රී ලංකාවට ආර්ථික ස්ථායීතාව කෙටි කාලීනව නැවත ළඟා කරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්හට සමාජ මෙන්ම ආර්ථික වශයෙන් දුෂ්කර හැඩගැසීම්වලට මුහුණ දීමට සිදු වුව ද, රජය සහ මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම තවදුරටත් අත්‍යවශ්‍යව පවතී.

> ***කෙටි කාලීනව අතිශය දුෂ්කර සමාජ සහ ආර්ථික ගැළපීම් සිදු කිරීම අවශ්‍ය වුව ද, රජය සහ මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම ආර්ථිකය ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ...***

මෑත කාලීනව හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් කෙටි කාලීනව ආර්ථික වර්ධනය මන්දගාමී විය හැකි වුව ද, එමගින් උද්ධමනය පාලනය කිරීමට සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට සහාය සලසමින්, පාරිභෝගික ඉල්ලුම අඩු කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, එවැනි පියවර මගින් දිගු කාලයක් පුරා මුල් බැස ගත් ව්‍යුහාත්මක ගැටලු සඳහා පුළුල් හා සාර්ව මට්ටමින් කාර්යක්ෂම විසඳුම් ලබා දෙමින් මැදි කාලීනව ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහ වඩාත් තිරසාර වර්ධන මාවතක් කරා ගමන් කිරීමට සහාය සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථක ලෙස සහ නිසි

කලට සම්පූර්ණ කිරීම හා සමගාමීව, ජා. මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ සැලසුම් කරන ලද සාර්ථක ආර්ථික ගැළපීම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සමග පුළුල් ලෙස අනුකූල වන දැඩි ආර්ථික ස්ථායීකරණ රාමුවක් ක්‍රියාවට නැංවීම ආර්ථිකයේ ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙතෙක් වාර්තා වී ඇති විශාලතම ආර්ථික සංකෝචනය වාර්තා කරමින්, 2022 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය 8.0%කින් පමණ තියුණු ලෙස සංකෝචනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. දැඩි විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වයන් හමුවේ අමුද්‍රව්‍ය හිඟ වීම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම, විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ පවතින අවදානම් මෙන්ම, මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීම යනාදියෙහි ඒකාබද්ධ බලපෑම මගින් 2022 වසරේ දී සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය මත ඍණාත්මක බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ දැනට පවතින සාර්ව ආර්ථික දුර්වලතාවන්හි කල් පවත්නා බලපෑම්, බදු ඉහළ නංවමින් දේශීය බදු ව්‍යුහයෙහි සිදු කරන ලද සැලකිය යුතු ප්‍රතිසංස්කරණ සහ උද්ධමන පීඩන හා භූ-දේශපාලනික පීඩන මගින් වෙළඳ භාණ්ඩ මිල මත ඇති කෙරෙන දැඩි බලපෑම් වැළැක්වීම සඳහා ලොව පුරා ප්‍රධාන මහ බැංකු විසින් මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම පදනම්ව ගෝලීය ආර්ථිකයේ සිදු විය හැකි මන්දගාමී වීම හේතුකොටගෙන, 2023 වසරේ දී, ආර්ථික ක්‍රියාකාරකම් යථාතත්ත්වයට පත් වීම මධ්‍යස්ථ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන සමග, ආර්ථිකයට වර්ධනය වීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට මග පාදමින් 2024 වසරේ සිට ආර්ථික වර්ධන වේගය ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකය පිළිබඳ විශ්වාසය යළි ගොඩ නැංවීමට සහ මෙම තීරණාත්මක අවධියේ දී එහි විභවයන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමට රජය සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ ස්ථිර කැපවීම අත්‍යවශ්‍ය වේ. මැදි කාලීනව, ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා  දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රතිපත්තිමය පරිවර්තනයන් සහ ක්‍රියාමාර්ග දායක වනු ඇත. මේ සම්බන්ධයෙන් ගත් කල පිරිවැය කාර්යක්ෂම සහ තිරසාර ලෙස ආර්ථිකයේ බලශක්ති සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වැඩි වශයෙන් භාවිත කිරීම සඳහා රජය ගනු ලබන ප්‍රයත්නයන් ප්‍රධාන  මුලපිරීමක් වේ. එසේම, දකුණු ආසියානු කලාපය තුළ ඉහළ සුවිශේෂත්වයක් සහ ආකර්ෂණීය බවක් උසුලන කොළඹ වරාය නගරය සහ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයට අදාළව නීතිමය රාමුව ශක්තිමත් කිරීම සඳහා මෑත කාලීනව ගනු ලැබූ පියවර මගින්, ඉදිරි කාලය තුළ දී විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, රජය විසින් සැලසුම් කර ඇති සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යෝජනා කරන ලද ප්‍රතිසංස්කරණ ගණනාවක් මගින් පවතින මානව ප්‍රාග්ධනයේ හා ස්වාභාවික සම්පත් සම්භාරයෙහි විභවතාව උපයෝජනය කර ගැනීමට සහාය සැලසෙන පරිදි ආර්ථිකයේ ඵලදායී නිෂ්පාදන විභවය වැඩිදියුණු කිරීමට උපකාරී වනු ඇත.

ගෝලීය ආර්ථික තත්ත්වයන් තවදුරටත් අයහපත් වීමේ සම්භාවිතාව සමග ශ්‍රී ලංකාවට ණය දීමට ඉදිරිපත් විය හැකි ජාත්‍යන්තර ණය දෙන්නන් සහ ආයෝජකයින්ගේ තත්ත්වය දුර්වල කරනු ඇති බැවින් කෙටි කාලීනව ආර්ථිකයේ විදේශීය අංශයට බාධාවන්ට මුහුණ දීමට සිදු වනු ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම සමගින් ආර්ථිකයට බහුපාර්ශ්වික නියෝජිත ආයතන ගණනාවක් ඇතුළුව විවිධ පාර්ශ්වවලින් සැලකිය යුතු මූල්‍ය සහායයන් හිමිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, සාර්ථක ආර්ථික පුනර්ජීවන වැඩසටහනක් හා එක්ව, වෙළඳපොළ බලවේග මත පදනම්ව විනිමය අනුපාතිකය තීරණය වීම සඳහා වැඩි නම්‍යශීලීභාවයක් තහවුරු කිරීම තුළින් විදේශ විනිමය ගලා ඒම් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන, සංචාරක කර්මාන්තය, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශීය ඍජු ආයෝජන ආදී වූ විදේශීය අංශය තුළ දිගු කාලයක් මුළුල්ලේ ප්‍රධාන ගාමක ක්ෂේත්‍ර ලෙස පැවති අංශ මූලික කරගත් ආර්ථික වර්ධනයක් සහතික කිරීමෙහිලා මෙම වර්ධනයන් මූලාරම්භයක් වනු ඇත.

රාජ්‍ය මූල්‍ය අංශය සම්බන්ධයෙන් ගත් කල, රාජ්‍ය ණය තිරසාර මට්ටමකට ගෙන ඒම සඳහා දරන ප්‍රයත්නයන් හා සමාන්තරව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ නියම කෙරෙන ආර්ථික සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ දැඩිව ක්‍රියාත්මක කිරීම මගින්, කෙටි කාලීන සිට මැදි කාලීන කාල පරාසය තුළ ශ්‍රී ලංකාවෙහි රාජ්‍ය මූල්‍ය තිරසාරබව ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය ඉහළ නැංවෙනු ඇත. මේ හා සම්බන්ධව, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් දැනටමත් ක්‍රියාත්මක කර ඇති අතර, තවත් ක්‍රියාමාර්ග කිහිපයක් ඉදිරියේ දී ක්‍රියාත්මක වනු ඇත. ප්‍රධාන උපයෝගිතා සැපයුම්කරුවන් සඳහා පිරිවැය ආවරණය කෙරෙන මිල සූත්‍ර අනුගමනය කිරීම ඇතුළුව රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ක්‍රමෝපායන් සැකසීම අරමුණු කරගත් ප්‍රතිසංස්කරණ සහ බදු ව්‍යුහයේ සිදු විය යුතු ප්‍රතිසංස්කරණ කිහිපයක් ද,

මෙම පියවර අතරට ඇතුළත් වේ. 2022 වසරේ මෙතෙක් දුරට හඳුන්වා දුන් බදු ප්‍රතිසංස්කරණ තුළින් ඉහළ ආදායම් උත්පාදනයක් සිදු වනු ඇතැයි බලාපොරොත්තු වුව ද, මෙම ප්‍රතිපත්තිමය වෙනස්කම්වල සම්පූර්ණ ප්‍රතිලාභය අත් විඳීමට හැකිවනුයේ ඉදිරි වසරේ මුල් භාගයේ සිට වන අතර, එමගින් ද.දේ.නි.යෙන් 11%ක් පමණ දක්වා රාජ්‍ය ආදායම වර්ධනය වී ප්‍රාථමික ශේෂයේ යහපත් වර්ධනයක් සිදු වනු ඇතැයි අපේක්ෂිත ය. වර්තමානයේ දී ක්‍රියාත්මක වෙමින් පවතින, රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය මගින් සියලු ණයහිමියන්ගෙන් ලැබෙනු ඇතැයි අපේක්ෂිත සහාය ද සමඟ රජයේ ණය බර කළමනාකරණය කළ හැකි මට්ටමක් දක්වා අඩු වනු ඇත. කෙසේ වෙතත්, දැඩි රාජ්‍ය මූල්‍ය විනය, වැඩිදියුණු කළ බදු පරිපාලනය ඇතුළු ආදායම් ඉහළ නැංවීමේ දැඩි ක්‍රියාමාර්ග සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් තුළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම තුළින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු කාල සීමාව තුළ තවදුරටත් ණය එක්රැස් වීම අවම කිරීමටත් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ළඟා කර ගැනීමට අවශ්‍ය අවකාශ ලැබේ. ආයෝජකයන්ගේ විශ්වාසය යළි ගොඩනැඟීමට සහ ශ්‍රී ලංකාව සඳහා විදේශීය මූල්‍යන ප්‍රවේශ යළි විවෘත කර ගැනීමට ණය ප්‍රතිව්‍යුහගත කටයුතු අප්‍රමාදව සම්පූර්ණ කිරීම මෙන්ම, රාජ්‍ය මූල්‍ය විචක්ෂණභාවය සහතික කිරීම ඔස්සේ මැදි කාලීනව රාජ්‍ය මූල්‍ය හා ණය තිරසාරබව අත්කර ගැනීම ඉතා වැදගත් වේ. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස දේශීය මූල්‍ය වෙළඳපොළ තුළ ද්‍රවශීලතා පීඩනය ලිහිල් වනු ඇති අතර, මහ බැංකුව හරහා අයවැය හිඟය මූල්‍යනය කිරීම සීමා කළ හැකි වනු ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන ණයහිමියන් විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට එකඟ නොවීමේ ගැටලු මතු වුවහොත්, එමගින් ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ ක්‍රියාවලියට බාධා ඇති වනු ඇති අතර, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියට එය බලපානු ඇත. කෙසේ වෙතත්, මෑතක දී වාර්තා වූ ඉහළ උද්ධමන මට්ටම් සහ මන්දගාමී ආර්ථික කටයුතු අනෙකුත් අංශ කෙරෙහි විහිදුණු බලපෑමක් ඇති කර ඇති පසුබිමක, පෙර නොවූ මට්ටමේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න මගින් කුටුම්භයන්හි වැය කළ හැකි ආදායමට බලපෑම් එල්ල විය හැකි අතර, එමගින් කොවිඩ්-19 වසංගතයටත් පෙර සිට පැවති ආදායම් විෂමතා තවදුරටත් උග්‍ර කෙරෙනු ඇත. මැනවින් ඉලක්කගත කළ, ප්‍රමාණවත් මට්ටමේ සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග ඔස්සේ පිළියම් නොයෙදුවහොත්, ඉහත ප්‍රවණතා තුළින් ආදායම් විෂමතාවන්හි චක්‍රීය බලපෑම් නිර්මාණය විය හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කුටුම්භයන්හි ඵලදායී ධාරිතාව පිරිහීමටත්, එතුළින් දැනට පවතින අසමානතා තවදුරටත් උග්‍ර වීම හරහා දිගු කාලීන වශයෙන් කුටුම්භවල ජීවන තත්ත්වය කෙරෙහි අයහපත් බලපෑම් සිදු කරනු ඇත. බහුපාර්ශ්වික නියෝජිතායතන මගින් ලබා දෙන මූල්‍යමය සහාය සහ අනෙකුත් ණය දීමේ මූලාශ්‍රයන්ගෙන් නුදුරු අනාගතයේ දී ලැබීමට අපේක්ෂිත මූල්‍යමය සහාය මගින් එවැනි දරිද්‍රතාවන්ට අදාළ විෂම චක්‍ර නිර්මාණය වීම අවම කිරීමට උපකාරයක් වනු ඇත.

දැඩි මුදල් සහ ද්‍රවශීලතා තත්ත්ව පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික නුදුරු කාලීනව ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ස්ථායීකරණ ක්‍රියාමාර්ගවල බලපෑම තුළින් ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු වීමත් සමඟ වෙළඳපොළ පොලී අනුපාතික මැදි කාලීනව පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තරගකාරී ඉහළ තැන්පතු පොලී අනුපාතික මගින් බැංකු පද්ධතිය වෙත සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් නැවත ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරෙන අතර, ඉහළ වෙළඳපොළ ණය පොලී අනුපාතික හේතුවෙන් ණය ලබා ගැනීමට ඇති කැමැත්ත අඩු වීමත් සමඟ පෞද්ගලික අංශය වෙත ලබා දී ඇති සමස්ත ණය තොගය සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

> ***වෙළඳපොළ පොලී අනුපාතික නුදුරු කාලීනව ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ස්ථායීකරණ ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු වීමත් සමඟ වෙළඳපොළ පොලී අනුපාතික මැදි කාලීනව පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ...***

මේ අතර, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ මෙන්ම පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සූත්‍ර හඳුන්වාදීම ඇතුළු රජය සතු පාඩු ලබන වාණිජ ව්‍යාපාරවල ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග මගින් රාජ්‍ය අයවැය මත පීඩනය ක්‍රමානුකූලව අඩු කිරීමටත් එමගින් ඉදිරි කාලය තුළ දී රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු මූල්‍යන, විශේෂයෙන් ම මහ බැංකු මූල්‍යන මත අධික ලෙස රඳා පැවතීම අඩු කිරීමටත් අපේක්ෂා කෙරේ. ඒ අනුව, ඉදිරි කාලය තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම පාලනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශ සංචිත ක්‍රමානුකූලව නැවත ගොඩනගා ගැනීමට දරන ප්‍රයත්න මධ්‍යයේ, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඇතැම් විදේශීය වගකීම් අඩු කිරීමත් සමඟ ඉදිරි කාලය තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රමාණය වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගෝලීය ප්‍රවණතාවලට අනුකූලව ඇතැම් වෙළඳ භාණ්ඩවල පරිපාලිත මිල ගණන් පහළ යෑමත් සමඟ දේශීය වෙළඳ භාණ්ඩවල මිල ගණන් පහළ යෑමට ඇති

හැකියාව, කෘෂිකර්මාන්තයට අදාළව දේශීය සැපයුම් තත්ත්ව වැඩිදියුණු වීම සහ දැඩි මුදල් සහ රාජ්‍ය මූල්‍ය තත්ත්ව හේතුවෙන් සමස්ත ඉල්ලුම් පීඩන පහළ යෑම මෙන්ම, හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම මගින් මතුපිට උද්ධමනය ඉදිරි කාලය තුළ දී පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද බදු සංශෝධන මගින් නුදුරු කාලීනව උද්ධමන අපේක්ෂා ඉහළ යෑමේ අවදානමක් ඇති කළ හැකි වුව ද, එවැනි ප්‍රතිපත්තිවල මැදි කාලීන සහ දිගු කාලීන බලපෑම් මහ බැංකුවේ මිල ස්ථායිතා අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.


උද්ධමනය පහළ යෑමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා උද්ධමන අපේක්ෂා පාලනය කිරීම අත්‍යවශ්‍ය වන බැවින් මහ බැංකුව විසින් ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් සමග වත්මන් ආර්ථික තත්ත්වයන් පිළිබඳ මනා සම්බන්ධීකරණයක් සහිතව ඵලදායී සහ විනිවිදභාවයෙන් යුතු සන්නිවේදන ක්‍රියාවලියක අඛණ්ඩව නිරත වනු ඇත. කෙසේ වෙතත්, පහළ යන ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ප්‍රවණතාවලට අනුකූලව දේශීය මිල වෙනස් නොකළහොත් මිල පීඩන අඛණ්ඩව පැවතිය හැකිය. එමගින් ද උද්ධමනය පහළ යෑමේ ක්‍රියාවලිය ප්‍රමාද වනු ඇත. එබැවින්, උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට මෙන්ම රජය සතු වාණිජ ව්‍යාපාරවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා මූලික වශයෙන් පරිපාලිත බලශක්ති මිල සඳහා විනිවිදභාවයෙන් යුතු හා වෙළඳපොළ පදනම් කරගත් මිල වෙනස් කිරීම් සිදු කිරීම වැදගත් වේ.

> **සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ වෙළඳ භාණ්ඩ හා ආහාර මිල ගණන්හි අපේක්ෂිත පහළ යෑම් මගින් සහාය ලබමින් මතුපිට උද්ධමනය 2023 වසරේ මුල් කාලයේ සිට අපේක්ෂිත උද්ධමනය පහළ යෑමේ ක්‍රියාවලිය අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ...**

ආර්ථික ක්‍රියාකාරකම් සංකෝචනය වීම, ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ඉහළ පොලී අනුපාතික වාතාවරණය, බදු සංශෝධන සහ රජය සතු වාණිජ ව්‍යාපාර වෙත බැංකු අංශය මගින් ඉහළ ණය ලබාදීම් හේතුවෙන් වත්මන් ආර්ථික වාතාවරණය හමුවේ මූල්‍ය අංශය සැලකිය යුතු අභියෝගවලට මුහුණ දීමේ හැකියාවක් පවතී. වර්තමානයේ දී, පවතින අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ණය හානි සහිත ණය ඉහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබෙන අතර, අභියෝගවලට මුහුණ දීම සඳහා මූල්‍ය අංශය විසින් ණයගැතියන්ට සහන ලබා දීම සිදු කළ ද පවතින දුර්වල ආර්ථික තත්ත්වයන් හමුවේ අක්‍රීය ණය තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ බැංකුවල ප්‍රාග්ධන මට්ටම අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. 2022 වසර අවසානයේ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකි බලපත්‍රලාභී බැංකු සඳහා වැඩි දියුණු කළ අවම ප්‍රාග්ධන

**1.9 රූප සටහන**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනයේ කාර්තුමය සාමාන්‍යයේ පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

**සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.**

උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූප සටහනේ දැක්වෙන විශ්‍රම්භ ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන උද්ධමනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. විශේෂයෙන්, තද කොළ පැහැති ප්‍රදේශය සියයට 50 විශ්‍රම්භ ප්‍රාන්තරය දක්වන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ සියයට 50ක සම්භාවිතාවයක් පවතින බව පෙන්නුම් කරයි. විශ්‍රම්භ පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේ දී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.

2022 වසරේ ඔක්තෝබර් මාසයේ පුරෝකථන වාරයේ සිදුකළ උපකල්පන, විනිශ්චයන් සහ පවතින දත්ත පුරෝකථන මගින් පිළිබිඹු කෙරේ. ක්‍රමයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂිත ගෝලීය ඉන්ධන සහ ආහාර මිල පිළිබඳ වන වර්තමාන පුරෝකථන සහ එම අඩු වන මිල මට්ටම් දේශීය මිල ගණන් වලින් පිළිබිඹු වනු ඇතැයි වන අපේක්ෂාවන්; ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ විභව මට්ටමට වඩා පහත් වර්ධන මට්ටම්; සහ ඇමරිකා එක්සත් ජනපදයේ වත්මන් සහ අපේක්ෂිත මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් හැඟවෙනු ලබන ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති මගින් ලබාදෙන පොලී අනුපාත මාර්ගය අනුගමනය කිරීම සහ මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම පුරෝකථනය කර ඇති උද්ධමන මට්ටම් ළඟා කර ගැනීම සඳහා වන අත්‍යවශ්‍ය අංග වේ. එපමණක් නොව, 2023 වසරේ දී දේශීය ආහාර සැපයුම් තත්ත්වයන් යහපත් වනු ඇතැයි උපකල්පනය කෙරේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන් සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා බෙහෙවින් ඉහළ වේ. මෙම උපකල්පනවල ඕනෑම සැලකිය යුතු වෙනස්කමක් සැබෑ උද්ධමනය ඉහත සඳහන් මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. ආර්ථික නියෝජිතයන්ට දැනුවත් තීරණ ගැනීමට හැකිවන පරිදි උද්ධමන දැක්මෙහි අපේක්ෂිත වෙනස්කම් නිරන්තරව ඔවුන්ට සන්නිවේදනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කැපවී සිටියි.

මට්ටම් ළඟා කර ගැනීමට 2023 වසර අවසානය දක්වා කල් ලබාදෙන ලදී. කෙසේ වෙතත්, ප්‍රාග්ධන අනුපාත නියාමනය කරනු ලබන අවම මට්ටමට වඩා ඉහළින් පවත්වා ගෙන යෑමේදී ඇතිවන අභියෝග සහ අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්හි බලපෑම හේතුවෙන් ප්‍රාග්ධන ස්වාරක්ෂක සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ ස්ථායීතාවය තර්ජනයට ලක් විය හැකිය. 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ බැංකුවල ද්‍රවශීලතා තත්ත්වය අවම නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පැවතිය ද, ණය ගෙවීම අත්හිටුවීම ඇතුළු පවත්නා සුවිශේෂී ප්‍රවණතා බැංකුවල ද්‍රවශීලතා තත්ත්වයට බලපෑම් සිදුකර ඇත. බැංකුවල ද්‍රවශීලතා අවදානම් පිළිබඳ දැඩි ලෙස අධීක්ෂණය කරන අතරම, බැංකු අංශයේ ඔරොත්තු දීමේ

> **ආර්ථික ක්‍රියාකාරකම් සංකෝචනය වීම, ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ඉහළ පොලී අනුපාතික වාතාවරණය, බදු සංශෝධන සහ රජය සතු වාණිජ ව්‍යාපාර වෙත බැංකු අංශය මගින් ඉහළ ණය ලබාදීම් හේතුවෙන් වත්මන් ආර්ථික වාතාවරණය හමුවේ මූල්‍ය අංශය සැලකිය යුතු අභියෝගවලට මුහුණ දීමේ හැකියාවක් පවතී...**

හැකියාව සහ ස්ථායීතාව අඛණ්ඩව පවත්වාගෙන යෑම සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් මේ වන විට ද්‍රවශීලතා අවශ්‍යතා සම්බන්ධයෙන් දැනට අදාළ වන නියාමන සමාලෝචනය කරමින් සිටී. නව බැංකු පනත මගින් බලපත්‍රලාභී බැංකුවල නීතිමය හා නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කරනු ඇත. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය සඳහා වන ගැටලු නිරාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් මුදල් ව්‍යාපාර පනත සහ කල්බදු මූල්‍යකරණ පනත සංශෝධනය කරමින් පවතින අතර, එමගින් වර්තමාන වෙළඳපොළ ප්‍රවණතාවන්ට අනුකූලව පවතින විධානයන් සංශෝධනය කිරීම සහ බලපත්‍රලාභී බැංකු සමඟ නියාමන රාමුව අනුකූල කිරීම සිදු කෙරෙනු ඇත. යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරි පනත ද ඉදිරියේ දී බලාත්මක කිරීමට අපේක්ෂා කෙරෙන අතර, එමගින් ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා ම කැපවූ අධිකාරියක් යටතට එහි විෂය පථය ඇතුළත් කිරීම විධිමත් කෙරෙනු ඇත. ඒකාබද්ධ කිරීම සඳහාවන ප්‍රධාන සැලැස්ම සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීමත් සමඟ සමස්තයක් ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමගින් එම අංශයේ මෙන්ම සමස්ත මූල්‍ය පද්ධතියේම ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය වනු ඇත.

අපේක්ෂිත ප්‍රතිසංස්කරණ සහ දැනටමත් ක්‍රියාත්මක කර ඇති ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඵලදායී රැකියා අවස්ථා සහ ආදායම් උත්පාදන මාර්ග ශක්තිමත් ලෙස පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය හා ගෝලීය වශයෙන් ඇති වූ දැඩි බාධක මධ්‍යයේ, රජයේ ආර්ථික ස්ථායීකරණ වැඩසටහන මගින් බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික හවුල්කරුවන්ගෙන් ආධාර ලබා ගැනීමටත්, ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමටත් අපේක්ෂා කෙරේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීම සහ ණය තිරසාරබව ළඟා කර ගැනීම, ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී ආර්ථිකය ඉහළ ස්ථාවරත්වයක් කරා යොමු කරලීම සඳහා තවදුරටත් අත්‍යවශ්‍ය වන අරමුදල් සහතික කිරීම සඳහා උපකාරී වනු ඇත. විදේශීය අංශය යථා තත්ත්වයට පත් කිරීමට සහ දිගු කාලීනව ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා අපනයන ඉලක්ක කරගත් නිෂ්පාදන සහ අධි තාක්ෂණික සේවා අපනයන මූලික කරගත් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය කැපවීම ඉතා වැදගත් වේ. ආර්ථිකය මුහුණදී ඇති අභියෝගවලට මුහුණ දීමට රජය සහ මහ බැංකුව විසින් මෙතෙක් ක්‍රියාත්මක කළ පුළුල් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සාධනීය ප්‍රතිඵල පැවතිය ද, ඉදිරියේ දී පැවැත්වෙන ඕනෑම මැතිවරණ චක්‍රයක් තුළ ස්වාධීනව ක්‍රියාත්මකවන අධිකාරීන්ගේ සාමූහික ප්‍රයත්නයන් සහ ශක්තිමත්, ස්ථාවර සහ අප්‍රතිහත කැපවීම නුදුරු කාලයේ දී සිදු කිරීමට නියමිත දුෂ්කර ආර්ථික ගැළපුම් ක්‍රියාවලියට අවශ්‍ය වේ. දිගු කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක නොවන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා, ක්ෂුද්‍ර හා සාර්ව යන සියලු පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී මැදිහත්වීම, සහභාගීත්වය, දැනුම්වත්භාවය සහ ඔරොත්තුදීමේ හැකියාව ඉතා වැදගත් වේ. එමගින් දිගු කාලයක් මුළුල්ලේ මුල් බැස ගත් ව්‍යුහාත්මක ගැටලු විසඳමින්, පවතින අර්බුදයෙන් යථා තත්ත්වයට පත් වීමට පමණක් නොව, ඉදිරි කාලය තුළ එවැනි අර්බුද වළක්වා ගැනීම සහතික කිරීම සඳහා ද සහාය සැලසෙනු ඇති අතර, එමගින් මැදි කාලයේ සිට දිගු කාලීනව තිරසාරබව, ආර්ථික වර්ධනය සහ සෞභාග්‍ය කරා ගමන් කිරීමට ආර්ථිකයට හැකියාව ලැබෙනු ඇත.

2

# ජාතික නිෂ්පාදිතය, වියදම සහ සේවා නියුක්තිය

*ශ්‍රී ලංකා ආර්ථිකය, දේශීය මෙන්ම විදේශීය වශයෙන් පැන නැගුණු අභියෝග හමුවේ, 2022 වසරේ පළමු භාගයේ දී 4.8%ක පහත වැටීමක් වාර්තා කරන ලදී. ආර්ථිකයේ දක්නට ලැබුණු මෙම පහළ යෑම කෙරෙහි මූලික වශයෙන් බලශක්ති අර්බුදය සහ විදේශ විනිමය ද්‍රවශීලතාවය පහත වැටීම හේතුවෙන් අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ දී පැවති දුෂ්කරතා වැනි සැපයුම් අංශයේ දක්නට ලැබුණු අවහිරතා මෙන්ම, ගෝලීය වශයෙන් භාණ්ඩ මිල ඉහළ යෑම වැනි කරුණු ද බලපාන ලදී. ඒ අනුව, කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන ප්‍රධාන ආර්ථික කටයුතු ත්‍රිත්වයේම එකතුකළ අගයයන් වසරේ පළමු භාගයේ දී පහත වැටුණි. මේ අතර, පවත්නා මිල අනුව ආයෝජන මෙන්ම පරිභෝජන වියදම් ද වසරේ පළමු භාගය තුළ දී පැවති ඉහළ මිල ගණන් හේතුවෙන් වැඩි වීමක් වාර්තා කළ ද, ස්ථාවර මිල අනුව සැලකීමේ දී එම ද්විත්වයෙහිම පහත වැටීමක් දක්නට ලැබුණි. තවද, ආනයනවලට සාපේක්ෂව අපනයනවල දක්නට ලැබුණු ඉහළ වර්ධනය හේතුවෙන් පවත්නා මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි වැඩි දියුණුවීමක් දක්නට ලැබුණි. මේ අතරතුර දී, 2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව කොවිඩ්-19 වසංගත තත්ත්වය ක්‍රමයෙන් පහව යෑම 2022 වසරේ පළමු භාගයේ දී ශ්‍රම වෙළඳපොළෙහි දුෂ්කරතා සමනය වීමට උපකාරී වුවද, ආර්ථික කටයුතුවල දක්නට ලැබුණ පසුබෑම පිළිබිඹු කරමින් ශ්‍රම ඵලදායීතාවය පහත වැටුණි.*

## 2.1 නිමැවුම


දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.), 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ 9.3%ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ පළමු කාර්තුවේ දක්නට ලැබුණ පසුබෑස්ම මෙන්ම, විශේෂයෙන් දෙවන කාර්තුව තුළ දී ද වාර්තා කළ තියුණු පහත වැටීම හේතුවෙන්, වසරේ පළමු භාගය තුළ දී 4.8%කින් පහත වැටුණි. මේ කෙරෙහි විදුලි කප්පාදුව, ඉන්ධන සහ අමුද්‍රව්‍යවල හිඟතාවය මෙන්ම නිෂ්පාදන වියදම් ඉහළ යෑම ද ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම කාලසීමාව තුළ දී ප්‍රධාන ආර්ථික කටයුතු ත්‍රිත්වයෙහිම පහත වැටීමක් වාර්තා කරන ලදී. එහි දී, කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු 7.1%ක පහළ යෑම සමස්ත ආර්ථිකයේ පහත වැටීම කෙරෙහි ඉහළම දායකත්වයක් දැක්වූ අතර, කෘෂිකාර්මික සහ සේවා කටයුතු ද පිළිවෙළින් 7.6%කින් සහ 0.6%කින් පහත වැටුණි.

> **වසරේ පළමු භාගයේ දී ආර්ථිකයේ දක්නට ලැබුණු පහත වැටීම කෙරෙහි මූලික වශයෙන් කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු පසුබෑම මෙන්ම කෘෂිකාර්මික සහ සේවා කටයුතුවල පහත වැටීම ද බලපාන ලදී...**

### සේවා

සේවා කටයුතුවල සමස්තයක් ලෙස දක්නට ලැබුණු පසුබෑම කෙරෙහි මූල්‍ය සේවා, වෘත්තීයමය සේවා සහ වෙනත් පුද්ගලික සේවාවල දක්නට ලැබුණු සැලකිය යුතු පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. මෙයට අමතරව රක්ෂණය, ප්‍රවාහන සේවා, සෞඛ්‍ය සේවා සහ දේපළ වෙළඳාම් ආදී කටයුතු ද මෙම කාලසීමාව තුළ දී පහත වැටුණි. කෙසේ වුව ද, වසරේ පළමු භාගය තුළ දී නවාතැන් සැපයීමේ සේවා, තොග හා සිල්ලර වෙළඳාම, රාජ්‍ය පරිපාලනය, තොරතුරු තාක්ෂණ සේවා, විදුලි සංදේශ සේවා සහ අධ්‍යාපනය යන සේවා කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණි.

**2.1 රූප සටහන**
**2015 ස්ථාවර මිල අනුව පළමු භාගයේ ද.දේ.නි. (අ)**




(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහනය සහ නවාතැන් හා ආහාර පාන සැපයීමේ සේවා 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ 4.7%ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ පළමු භාගයේ දී, ප්‍රධාන වශයෙන් ප්‍රවාහන සේවාවල දක්නට ලැබුණු පසුබෑම හේතුවෙන්, 1.6%ක් දක්වා පහත වැටුණි. ඒ අනුව, විශේෂයෙන් ම වසරේ දෙවන කාර්තුව තුළ දී පැවති ඉන්ධන හිඟතාවය හේතුවෙන් ප්‍රවාහන සේවා වසරේ පළමු භාගය තුළ දී 0.9%කින් පහත වැටුණි. කෙසේ වුව ද, තොග හා සිල්ලර වෙළඳ කටයුතු මෙම කාලසීමාවේ දී 1.3%ක වර්ධනයක් වාර්තා කරන ලදී. එමෙන්ම, සංචාරක පැමිණීම්වල දක්නට ලැබුණු ක්‍රමික වර්ධනයත් සමග නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා ද වසරේ පළමු භාගයේ දී 28.4%කින් වර්ධනය විය.

2021 වසරේ පළමු භාගයේ දී 18.6%ක වර්ධනයක් වාර්තා කළ තොරතුරු සහ සන්නිවේදනය ආශ්‍රිත කටයුතු, 2022 වසරේ පළමු භාගයේ දී පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය ආශ්‍රිත සේවාවල දක්නට ලැබුණු මන්දගාමීත්වය හේතුවෙන් 3.8%ක සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. මෙම උප කාණ්ඩය තුළ, පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය ආශ්‍රිත සේවා වසරේ දෙවන කාර්තුව තුළ දී වාර්තා කළ පහත වැටීම ද සමග වසරේ පළමු භාගය තුළ දී 3.7%ක අඩු වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, විදුලි සංදේශ සේවා ද මෙම කාලපරිච්ඡේදය තුළ දී පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 8.3%ක අඩු වේගයකින් වර්ධනය විය. එමෙන්ම, ගුවන්විදුලි හා රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු ද මෙම වසරේ පළමු භාගය තුළ දී 8.6%කින් පහත වැටුණි.

> **වසරේ පළමු භාගය තුළ දී පැවති ඉන්ධන හිඟතාවය හේතුවෙන් සංචරණය සීමා වීම මෙන්ම විදුලි කප්පාදුව ද සේවා කටයුතුවල පසුබෑම කෙරෙහි මූලික වශයෙන් හේතු විය...**

2021 වසරේ පළමු භාගයේ දී 7.1%ක ඉහළ යෑමක් වාර්තා කළ මූල්‍ය, රක්ෂණය සහ දේපළ වෙළඳාම් කටයුතු, ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා කටයුතුවල දක්නට ලැබුණු සැලකිය යුතු පසුබෑස්ම හේතුවෙන්, 2022 වසරේ පළමු භාගයේ දී 6.6%කින් පහත වැටුණි. පැවති ඉහළ උද්ධමනකාරී වාතාවරණය මැඩපැවැත්වීම සඳහා අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි

බලපෑම හේතුවෙන් වසරේ පළමු භාගය තුළ දී මූල්‍ය සේවා ආශ්‍රිත කටයුතුවල 12.0%ක කැපී පෙනෙන පහත වැටීමක් වාර්තා විය. තවද, රක්ෂණය සහ, නිවාස අයිතිය ද ඇතුළත් දේපළ වෙළඳාම් කටයුතු ද 2022 වසරේ පළමු භාගය තුළ දී පිළිවෙළින් 10.5%කින් සහ 0.5%කින් පහත වැටුණි.

අනෙකුත් සේවා ආශ්‍රිත කටයුතු සැලකීමේ දී, 2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව, 2022 වසරේ පළමු භාගයේ දී, වෙනත් පුද්ගලික සේවා, වෘත්තීයමය සේවා සහ සෞඛ්‍ය සේවාවල පහත වැටීමක් වාර්තා වූ අතර, රාජ්‍ය පරිපාලනය සහ අධ්‍යාපන සේවා වර්ධනය විය. ඒ අනුව, මෙම වසරේ පළමු භාගය තුළ දී වෙනත් පුද්ගලික සේවා සහ වෘත්තීයමය සේවා පිළිවෙළින් 2.0%කින් සහ 7.5%කින් පහත වැටුණි. තවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී සෞඛ්‍ය සේවා ආශ්‍රිත කටයුතු ද 4.3%කින් පහත වැටුණි. කෙසේ වුවද, රාජ්‍ය පරිපාලනය සහ අධ්‍යාපන සේවා වසරේ පළමු භාගය තුළ දී වෙන් වෙන් වශයෙන් 2.9% බැගින් වර්ධනය විය.

### කර්මාන්ත

ආර්ථික අර්බුදය තුළින් පැන නැඟුණු අභියෝග හේතුවෙන්, 2022 වසරේ මේ දක්වා කාලය තුළ දී කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය දැඩි පසුබෑමකට ලක් විය. අඛණ්ඩව පැවති ආනයනික ද්‍රව්‍ය හිඟකම පමණක් නොව, විදුලිය හා ඉන්ධන සැපයීමට බාධා ඇතිවීම, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, සහ ඉහළ යන උද්ධමනය මධ්‍යයේ මූර්ත ආදායම පිරිහීම සමග සමස්තයක් වශයෙන් පාරිභෝගික ඉල්ලුමේ දක්නට ලැබුණු අඩුවීම හේතුවෙන් ද උප අංශවල කර්මාන්ත ක්‍රියාකාරකම් දැඩි ලෙස අඩාල විය.

> **බලශක්ති අර්බුදය මෙන්ම අමුද්‍රව්‍යවල හිඟතාවය සහ මිල ගණන් ඉහළ යෑම ද වසරේ පළමු භාගයේ දී කර්මාන්ත කටයුතුවල වර්ධනය අඩාල වීමට හේතු විය...**

වසරේ පළමු භාගය තුළ දී කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු පහළ යෑම කෙරෙහි කර්මාන්ත කටයුතු සඳහා ප්‍රධානතම දායකත්වය සපයන නිෂ්පාදන කර්මාන්තවල පහත වැටීම මූලික වශයෙන් හේතු විය. තවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු ද සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වුවද, විදුලිය ආශ්‍රිත කටයුතු මෙන්ම ජලය රැස් කිරීම හා බෙදාහැරීමේ කටයුතු ද සමස්ත කර්මාන්ත කටයුතු සඳහා හිතකර ලෙස දායක විය.


බලශක්ති අර්බුදය මෙන්ම අමුද්‍රව්‍ය හිඟතාවයෙහි ද අහිතකර බලපෑම් හේතුවෙන් වසරේ පළමු භාගය තුළ දී නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය 6.2%කින් පහත වැටුණි. මෙහිදී, ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදනය වසරේ පළමු භාගය තුළ දී වාර්තා කරන ලද 9.9%ක සැලකිය යුතු පහත වැටීම සමස්ත නිෂ්පාදන කර්මාන්තවල වර්ධනය අඩාල කිරීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ලෝහමය නොවන වෙනත් ඛනිජමය නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, රසායන ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මෙන්ම අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනයෙහි ද මෙම කාලපරිච්ඡේදය තුළ දී පහත වැටීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් ආශ්‍රිත නිෂ්පාදනවල මෙම වසරේ පළමු භාගය තුළ දී 9.1%ක වර්ධනයක් දක්නට ලැබුණි.

ගොඩනැගිලි ද්‍රව්‍ය සහ බලශක්ති හිඟතාවය, ඉහළ අමුද්‍රව්‍ය මිල ගණන්, දැඩි මුදල් ප්‍රවාහ ගැටලු මෙන්ම රජයේ අරමුදල් යොදවන ලද ඉදිකිරීම් ව්‍යාපෘති අත්හිටුවීම ද මෙම වසරේ පළමු භාගය තුළ දී ඉදිකිරීම් කටයුතුවල 8.9%ක පහත වැටීම කෙරෙහි හේතු විය. තවද, ඉදිකිරීම් කටයුතු සමග ඉහළ සහසම්බන්ධතාවයක් පවතින පතල් හා කැණීම් කටයුතු ද ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතුවල දක්නට ලැබුණු පසුබෑම හේතුවෙන් මෙම කාලපරිච්ඡේදය තුළ දී 13.1%කින් පහත වැටුණි.

### කාර්මික නිෂ්පාදන දර්ශකය

2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අටක කාලපරිච්ඡේදය තුළ දී කාර්මික නිෂ්පාදන දර්ශකය, පෙබරවාරි මාසයේ දී හැර, අඛණ්ඩව වාර්ෂික ලක්ෂ්‍යමය

**2.2 රූප සටහන**
**කාර්මික නිෂ්පාදන දර්ශකය**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පදනම යටතේ පහළ යෑම් වාර්තා කළේය. ඒ අනුව, සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ දී, කාර්මික නිෂ්පාදන දර්ශකයේ, ප්‍රධාන උප අංශවන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන, වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදන, රෙදිපිළි නිෂ්පාදන සහ මූලික ලෝහ වර්ග නිෂ්පාදන යන ප්‍රධාන උප අංශවල ක්‍රියාකාරිත්වය සැලකියයුතු අඩුවීමක් වාර්තා කළ අතර, අනෙකුත් බොහෝ සුළු උප අංශ ද මෙම කාලපරිච්ඡේදය තුළ දී සමස්තයක් ලෙස පහළ යෑම් වාර්තා කළේය. විශේෂයෙන් ම, බොරතෙල් ආනයනය සීමා වීම නිසා දිගු කාලයක් පුරා පිරිපහදුව වසා දැමීම හේතුවෙන්, 2022 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවල දී හැර අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය අනෙකුත් මාසවල දී සැලකිය යුතු ලෙස අඩු වීම ද, සමස්ත කාර්මික නිෂ්පාදන දර්ශකයේ කාර්යසාධනය අඩු වීමට හේතුවිය. කෙසේ වෙතත්, දර්ශකයෙන් 30%ක පමණ දායකත්වයක් දක්වන ඇඟලුම් නිෂ්පාදන, රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන, බීම වර්ග නිෂ්පාදන සහ දුම්කොළ නිෂ්පාදන ආදී සමහර උප අංශ ඇතැම් මාසවල දී දුර්වල ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ ද, සමස්තයක් ලෙස කාලපරිච්ඡේදය තුළ දී වර්ධනයක් පෙන්නුම් කර ඇත.

### කාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

කර්මාන්ත අංශයේ තිරසාර පැවැත්ම සහ වර්ධනය ඉලක්කගත කෙරුණු රජයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වසර තුළ දී මධ්‍යස්ථ අන්දමින් අඛණ්ඩව ක්‍රියාවට නැංවීය. කර්මාන්ත අංශයේ ප්‍රතිපත්ති ඉලක්කගත කිරීම සහ උපාය මාර්ගික දිශානතිය වැඩිදියුණු කිරීමේ අරමුණින්, කර්මාන්ත සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය වැඩි

**2.3 රූප සටහන**
**කාර්මික නිෂ්පාදන දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සඳහා ආංශික දායකත්වය**




සටහන: එක් එක් අංශයට අදාළ වන බර තැබීම් වරහන් තුළ දක්වා ඇත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දියුණු කිරීමේ ප්‍රයත්නයෙහි රජය අඛණ්ඩව නිරත විය. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ වාණිජකරණයට අදාළව දැනට පවතින දුර්වලතා හඳුනා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, නවෝත්පාදන මත පදනම් වූ කාර්මික සංවර්ධනය දිරිමත් කිරීම සඳහා වසර තුළ දී ජාතික නවෝත්පාදන නියෝජිතායතනය විසින් ද පියවර රැසක් ක්‍රියාත්මක කරමින් පවතින අතර, ලාංකික දේශීය නිෂ්පාදන සඳහා අනන්‍ය වෙළඳ නාමයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියක් ද ආරම්භ කරන ලදී.

පවතින ආර්ථික අර්බුදය මධ්‍යයේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ පැන නගින ගැටලු විසඳා ගැනීම සඳහා පෞද්ගලික සහ ජාත්‍යන්තර ආයතන සමඟ එක්ව රාජ්‍ය ආයතන විසින් පියවර කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, ආනයන සීමා කිරීම් සහ අපනයන අදායම් ලැබීම් අනිවාර්යය ලෙස රුපියල්වලට පරිවර්තනය කිරීම වැනි නියාමන සීමා ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර, විශේෂයෙන් ම, ආයෝජන මණ්ඩලයේ සමාගම්වල විදේශ විනිමය ගනුදෙනු මත නව විදේශ විනිමය පනතේ අදාළත්වය පිළිබඳව අවශ්‍ය මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබා ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කළේය. විවෘත ගිණුම් ගෙවීමේ පදනම යටතේ අමුද්‍රව්‍ය ආනයනය කිරීම සහ කාර්මික කර්මාන්ත ශාලා සඳහා අවශ්‍ය ඉන්ධන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ හරහා සැපයීම සඳහා ප්‍රමුඛතා නිර්ණායක මත පදනම්ව නිර්දේශ ලිපි නිකුත් කිරීමට කර්මාන්ත අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වැඩිදුර පියවර ගෙන ඇත. මේ අතර, සාර්ව ආර්ථික අභියෝග සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පීඩාවට ලක්වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ ඇතුළත්ව ණය ගැනුම්කරුවන්ට ඇති වූ බලපෑම් වෙන් වෙන්ව සිද්ධි වශයෙන් සැලකිල්ලට ගනිමින්, දැනට ලබා දී ඇති ණය පහසුකම් සඳහා 2022 වසරේ ජූලි මාසයේ සිට මාස හයක කාලයක් සඳහා, සුදුසු පරිදි සහන ලබා දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවලින් ඉල්ලීමක් කර ඇත.

උත්සන්නවන සාර්ව ආර්ථික අසමතුලිතතා මධ්‍යයේ, කාර්මික අංශයේ තිරසාර වර්ධනයක් සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් සහතික කිරීම ඉලක්ක කරගත් කඩිනම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව නැවත අවධාරණය කරමින්, 2022 වසරේ පළමු භාගය තුළ දී ආයෝජන මණ්ඩලය යටතේ සිදු කරන ලද විදේශ ආයෝජන, 34%කින් පමණ කැපී පෙනෙන ලෙස පහත වැටී ඇත. එබැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කර්මාන්ත අංශයට

සෘජු විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වූ සිය ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇඟලුම්, මැණික් හා ස්වර්ණාභරණ, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන, රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ බෝට්ටු හා බෝට්ටු තැනීම ඇතුළු ආර්ථිකයේ හඳුනාගත් අපනයන අංශ කිහිපයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික අපනයන සන්නාමයක් සහ වසර පහක ප්‍රවර්ධන සැලැස්මක් ද සකස් කර ඇත. දේශීය හා ජාත්‍යන්තර ව්‍යවසායයන් සම්බන්ධ කෙරෙන පොදු කේන්ද්‍රයක් ලෙස සමාගම්, පර්යේෂණ ආයතන හා නව ව්‍යාපාර ආයතන සඳහා සහාය වීමට සහ ඔවුන්ගේ ඉදිරි ව්‍යාපාර යෝජනා හෝ නවෝත්පාදන සඳහා සුදුසු හවුල්කරුවන් සොයා ගැනීමට පහසුකම් සැලසීම සඳහා, නව ව්‍යාපාර හවුල්කාරිත්ව පිළිබඳ දත්ත පද්ධතියක් (Partnership database) පිහිටුවීම හරහා ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග ද වසර තුළ දී ප්‍රගතියක් අත්කරගෙන ඇත. තවද, ආයෝජකයින්ට අදාළ නියෝජිතායතන වෙතින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා පහසුකම් සලසන පොදු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කෙරෙන විශේෂිත ඒකකයක් ද ස්ථාපිත කිරීම හරහා ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කරවීමට කටයුතු කර ඇත. තවද, අපනයන අරමුණු කරගත් ව්‍යාපාර ඉලක්ක කරමින් වෙළඳ ප්‍රදර්ශන, වෙළඳපොළ සම්බන්ධතා නිර්මාණය කර ගැනීමේ වැඩසටහන්, දැනුම්වත් කිරීමේ සැසි සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් ඇතුළු ප්‍රවර්ධන වැඩසටහන් ද පවත්වන ලද අතර, නව වෙළඳපොළ අවස්ථා හඳුනා ගැනීමේ ප්‍රයත්නයක් ලෙස පොදුරාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය, අප්‍රිකානු සහ මැදපෙරදිග රටවල් ආශ්‍රිත වෙළඳපොළ අධ්‍යයන කිහිපයක් ද සිදු කෙරිණි.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් මගින් ආර්ථිකයට දක්වන විශාල දායකත්වය පිළිබඳව නිසි සැලකිල්ල යොමු කරමින්, වත්මන් ආර්ථික අර්බුදය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මුහුණ දීමට සිදුවිය හැකි විෂමාකාර අන්දමින් බලපාන දුෂ්කරතා හමුවේ, එම ව්‍යවසායයන් අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳව අවධානය යොමු වී ඇත. ද්විපාර්ශ්වික නියෝජිතායතන හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍ය සහ මූල්‍ය නොවන සහාය ලබා දීමට පියවර ගෙන ඇතත්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන කාලීන අවශ්‍යතා සහ අභියෝග පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කිරීම, විශේෂයෙන් ම කෙටි කාලීනව ඔවුන්ගේ පැවැත්ම තහවුරු කිරීම සහ යථාතත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. ආර්ථිකය යථාතත්ත්වයට පත්කිරීමේ න්‍යාය පත්‍රයේ අත්‍යාවශ්‍ය අංගයක් විය යුත්තේ අපනයන වෙළඳපොළට පමණක් නොව, දේශීය වෙළඳපොළ තුළ ඇති හිඟය සපුරාලීමට හැකි වන පරිදි ඉහළ අගයක් එකතු කරන සහ විශේෂිත නිෂ්පාදන නිපදවීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ දිශානතිය යළි සකස් කිරීමයි. මේ සම්බන්ධයෙන් ගත් කල, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නවීකරණය කරවීම සහ ගෝලීය අපනයන වෙළඳපොළ වෙත ප්‍රවේශය පහසු කිරීම සඳහා ඩිජිටල් පහසුකම්වලට අනුගතවීම වේගවත් කිරීමට මෙන්ම, මැදි කාලීනව, ශ්‍රී ලංකාවට දැනටමත් නිෂ්පාදනය කරනු ලබන ඇඟලුම්, රෙදිපිළි, කෘෂිකාර්මික නිෂ්පාදන සහ සාම්ප්‍රදායික අත්කම් වැනි නිෂ්පාදන අදාළ ගෝලීය අගය දාම මත ස්ථානගත කරවීම සඳහා රජයේ ආයතන සාමූහිකව ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ. තව ද, ගෝලීය අගය දාම තුළ ඇති කාර්මික ඉල්ලුමට සමගාමීව දැනට පවතින කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශයේ විෂයමාලා සැලකිය යුතු ලෙස සංශෝධනය කිරීම ද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශයේ පවතින නිපුණතා පරතර අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශය සඳහා කාර්යසාධනය පදනම් කරගත් දිරිගැන්වීමේ යෝජනා ක්‍රම හඳුන්වා දීම කඩිනමින් සිදුකළ යුතු වන අතර, එමගින් මැදි හා දිගු කාලීනව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසෙනු ඇත.


### කෘෂිකර්මාන්තය

වගා කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි පොහොර නොලැබීමෙහි බලපෑමෙන්, ප්‍රධාන වශයෙන් වී, තේ සහ එළවළු වගාවන්ගේ එකතු කළ අගයෙහි දක්නට ලැබුණු සැලකිය යුතු පසුබෑස්ම හමුවේ 2022 වසරේ පළමු භාගයේ දී කෘෂිකාර්මික කටයුතු පහත වැටුණි. තවද, ධීවර කටයුතු, සත්ත්ව නිෂ්පාදන, අනෙකුත් ධාන්‍ය වගාව, රබර් වගාව සහ වන වගාව ආශ්‍රිත කටයුතු ද මෙම කාලපරිච්ඡේදය තුළ දී පහත වැටුණි. කෙසේ වුවද, තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි, පාම් ඔයිල්), කුළුබඩු භෝග වගාව, පැළ බෝ කිරීම සහ වෙනත් බහු වාර්ෂික භෝග වගාව ද වසරේ පළමු භාගය තුළ දී සමස්ත කෘෂිකාර්මික කටයුතු සඳහා හිතකර ලෙස දායක විය.

> ***වගා කටයුතු සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් ප්‍රධාන භෝග වගාවන්හි සැලකිය යුතු පහත වැටීමක් වාර්තා වූ අතර, එය වසරේ පළමු භාගය තුළ සමස්ත කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය අඩාල වීමට හේතු විය...***


විශේෂයෙන්ම, පොහොර වර්ග හා වෙනත් කෘෂි රසායනික ද්‍රව්‍ය වැනි කෘෂිකාර්මික යෙදවුම්වල පැවති හිඟය, නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම මෙන්ම ආර්ථික අර්බුදය මධ්‍යයේ බලශක්ති සැපයුම සඳහා ඇති වූ බාධා ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ දී කෘෂිකාර්මික කටයුතු මන්දගාමී ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. 2016/17 මහ කන්නයට පසුව වාර්තා වූ අඩුම වී නිෂ්පාදන මට්ටම වාර්තා කරමින්, 2021/2022 මහ කන්නයේ දී සමස්ත වී නිෂ්පාදනය, 2020/2021 මහ කන්නයේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් මිලියන 3.1ක ඉහළ අස්වැන්නට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 1.9ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 36.9%කින් පහත වැටුණි. තවද, 2022 වසරේ පළමු භාගය තුළ දී එළවළු නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 6.5%කින් පහත වැටුණු අතර, එම කාලපරිච්ඡේදයේ දී වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 37.8%කින් පහළ ගියේය. වැවිලි අංශය සලකා බැලීමේ දී, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ දී තේ හා රබර් නිෂ්පාදනය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 19.2%කින් සහ 13.8%කින් පහළ ගියේය. භූමියේ උස අනුව, උඩරට, මැදරට හා පහතරට ලෙස වර්ග කෙරෙන තේ වගා කාණ්ඩ තුනෙහිම නිෂ්පාදනය, ප්‍රධාන වශයෙන් පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය හිඟ වීම සහ ඉන්ධන හිඟය හේතුකොටගෙන පහළ ගියේය. රබර් වගා කරන ප්‍රදේශවල පැවැති අයහපත් කාලගුණික තත්ත්ව, දිලීර රෝගයක් වේගයෙන් ව්‍යාප්ත වීම සහ පොහොර හා වෙනත් යෙදවුම් හිඟ වීම යන සාධකවල ඒකාබද්ධ බලපෑම රබර් නිෂ්පාදනය පහත වැටීම සඳහා හේතු විය. මේ අතර, 2022 වසරේ මේ දක්වා වූ කාලපරිච්ඡේදය තුළ, තේ සහ රබර් වෙන්දේසි මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, වසරේ තෙවැනි කාර්තුව තුළ දී ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මිල ගණන් වාර්තා කළේය. 2021 වසර මුළුල්ලේ පැවති හිතකර කාලගුණික තත්ත්වයන්ගේ පසු බලපෑම හේතුවෙන් 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ දී පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 12.3%කින් ඉහළ ගිය අතර, වර්තමානයේ දී පොල් වගාව සඳහා යොදන පොහොර ප්‍රමාණය අඩුවීම හේතුවෙන් ඉදිරි වසරවල පොල් අස්වැන්න පහළ යනු ඇත. මේ අතර, ඉන්ධන හිඟය සහ විදුලිය කප්පාදු කිරීම හේතුවෙන් ධීවර සහ සැපයුම් දාම කටයුතුවලට සිදු වූ බාධා වීම් ධීවර අංශයෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. මේ අනුව, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ දී, සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 9.7%කින් පහත වැටුණු අතර, සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් 72%ක් පමණ වන මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය 15.5%කින් කැපී පෙනෙන ලෙස පහත වැටීම ඒ සඳහා හේතු විය. කෙසේ වෙතත්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 9.1%කින් ඉහළ ගියේය. ආනයනය කළ මෙන්ම දේශීයව නිෂ්පාදනය කරන සත්ත්ව ආහාර හිඟ වීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම හේතුවෙන් පශු සම්පත් අංශයේ වර්ධනයට බාධා එල්ල වීම හේතුවෙන් වසරේ පළමු භාගය තුළ දී එම අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී වූ අතර, එමගින් පශු සම්පත් නිෂ්පාදන සඳහා පැවති දේශීය වෙළඳපොළ සිල්ලර මිල ගණන් වාර්තාගත මට්ටමකට ඉහළ ගියේය.

**2.4 රූප සටහන**
**වී නිෂ්පාදනය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2.5 රූප සටහන**
**තේ නිෂ්පාදනය**




මූලය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

රට තුළ වර්ධනය වන ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අභියෝගය මධ්‍යයේ, ගොවීන්ගේ ජීවනෝපායන්ට සහාය දක්වන අතර ම, කෘෂිකාර්මික ආහාර සැපයුම අඛණ්ඩව පවත්වා ගැනීමට සහ දැරිය හැකි මිලකට ආහාර සැපයීම සහතික කිරීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. වී සහ සහල් මිල ගණන් උච්චාවචනය වීම පාලනය කිරීම මෙන්ම, අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සඳහා රජය විසින් වරින් වර වෙළඳපොළ වෙත මැදිහත්වීම සිදු කරන ලදී. ඒ අනුව, වී අලෙවි මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ නාඩු කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 90.00ක්, සම්බා කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 92.00ක් සහ කීරි සම්බා කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 95.00ක් යන මිල ගණන්වලට 2021/2022 මහ කන්නය සඳහා වී මෙට්‍රික් ටොන් 71,280ක් මිලදී ගන්නා ලදී. තවද, වී නිෂ්පාදන අංශයේ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, 2022 යල කන්නය සඳහා වී මිලදී ගැනීමේ සහතික මිල ගණන්, සම්බා කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 125.00ක්, නාඩු කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 120.00ක් සහ කීරි සම්බා කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 130.00ක් ලෙස ඉහළ දමන ලදී. මෙම සංශෝධිත සහතික මිල ගණන් යටතේ 2022 වසරේ යල කන්නයේ දී වී අලෙවි මණ්ඩලය විසින් වී මෙට්‍රික් ටොන් 30,000ක් පමණ මිලදී ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, වී අලෙවි මණ්ඩලය සතුව වී මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන සාර්ථක ප්‍රගතියක් අත්කරගෙන නොමැති අතර, 2022 යල කන්නය සඳහා මේ දක්වා මිලදී ගෙන ඇති වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 7,076ක් පමණක් වන අතර, මේ හේතුවෙන්, ගොවීන්ට ඔවුන්ගේ අස්වැන්න මහා පරිමාණ පෞද්ගලික මෝල් හිමියන්ට අඩු මිලකට විකිණීමට සිදු වී ඇත. මේ අතර, සහල් මිල ගණන් විශාල වශයෙන් ඉහළ යෑම වැළැක්වීම සඳහා 2022 වසරේ මැයි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි නාඩු, සම්බා සහ කීරි සම්බා කිලෝග්‍රෑමයක් සඳහා උපරිම සිල්ලර මිල, පිළිවෙළින්, රුපියල් 220.00ක්, රුපියල් 230.00ක් සහ රුපියල් 260.00ක් ලෙස නියම කරන ලදී. කෙසේ වෙතත්, උපරිම මිලක් නියම කළ ද, දේශීය වෙළඳපොළ මිල, උපරිම සිල්ලර මිලට වඩා ඉහළ මට්ටමක පැවතුණ අතර, මිල ඉහළ යෑම් සඳහා පැවති පීඩනය ද අඛණ්ඩව පැවතිණි. තවද, දේශීය නිෂ්පාදනය පහත වැටීම නිසා සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා සහල් හෝ වී විකිණීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදාහැරීම සහ මිලදී ගැනීම තහනම් කරමින් 2022 වසරේ ජූනි මාසයේ දී අති විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. මේ අතර, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අටක කාලපරිච්ඡේදය තුළ දී දේශීය වෙළඳපොළ තුළ මිල විචලනයන් අවම මට්ටමක පවත්වා ගනිමින් සහල් සුලබතාවය තහවුරු කිරීම සඳහා සහල් මෙට්‍රික් ටොන් 596,502ක් පමණ ආනයනය කර ඇත.

> **කෘෂිකාර්මික නිෂ්පාදිතවල සුලබතාවය සහ ඒවා දැරිය හැකි මිලකට මිලදී ගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත...**


විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් පොහොර ආනයනය සීමා වීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා රසායනික පොහොර වර්ග භාවිතය එක්වරම තහනම් කිරීම සමඟ ප්‍රමාණවත් ලෙස පොහොර නොලැබීමෙන් සිදුවන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ තෙවැනි කාර්තුව ආරම්භයේ සිට රසායනික පොහොර සැපයීම සඳහා රජය විසින් කඩිනම් පියවර ක්‍රියාවට නැංවීය. 2021 වසරේ අවසාන භාගයේ දී, අකාබනික පොහොර වර්ග සහ වෙනත් කෘෂි රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කළ ද, දේශීය වශයෙන් වූ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් පොහොර ආනයනය තවදුරටත් පහළ මට්ටමක පැවතීම මගින් සමස්ත කෘෂිකාර්මික නිෂ්පාදනයට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳ ගැටලු මතුකර ඇත. මෙම වාතාවරණය තුළ, 2022 වසරේ ජූලි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, ඉන්දීය ණය පහසුකම යටතේ රජය විසින් යූරියා මෙට්‍රික් ටොන් 65,000ක් මිලදී ගත් අතර, එයින් මෙට්‍රික් ටොන් 30,000ක් 2022 වසරේ යල කන්නයේ වී වගා කිරීම සඳහා දැනටමත් බෙදා දී ඇති අතර, ඉතිරි යූරියා ප්‍රමාණය 2022/2023 මහ කන්නය සඳහා ලබා දීමට අපේක්ෂා කෙරේ. 2022 වසරේ යල කන්නයේ දී කිලෝග්‍රෑම් 50ක යූරියා මල්ලක් රුපියල් 10,000ක සහන මිලකට ගොවීන්ට ලබා දෙන ලදී. තවද, 2022 වසරේ තෙවැනි කාර්තුවේ අග භාගයේ සිට මොණරාගල, කුරුණෑගල සහ අනුරාධපුර යන ප්‍රධාන වශයෙන් බඩ ඉරිඟු වගා කරන දිස්ත්‍රික්කවල ගොවීන්ට පොහොර ලබාදීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. මීට අමතරව, ඉන්දීය ණය පහසුකම යටතේ ලබාගත් යූරියා ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් 15,000ක් තේ වගාව සඳහා

ලබාදීමට කෘෂිකර්ම අමාත්‍යාංශය එකඟ වී ඇති අතර, ඒ අනුව එම යූරියා ප්‍රමාණය තේ වැවිලිකරුවන් වෙත ලබා දෙමින් පවතී. තවද, වැවිලි බෝග සඳහා ග්ලයිෆොසේට් ආනයනය කිරීම මත පනවා තිබූ සීමා ඉවත් කිරීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. කෙසේ වෙතත්, අඛණ්ඩව පවතින සාර්ව ආර්ථික අභියෝග සහ ඉහළ මට්ටමේ පවතින ගෝලීය පොහොර මිල ගණන් මධ්‍යයේ, කෘෂිකාර්මික අංශයේ වාර්ෂික පොහොර අවශ්‍යතාවයට සාපේක්ෂව පවතින රසායනික පොහොර ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතීම හේතුවෙන්, අස්වැන්න අඩු වීම, ගොවි ප්‍රජාවන්ගේ ජීවනෝපාය සහ මෙරට ආහාර සුරක්ෂිතතාවය යනාදිය පිළිබඳ ගැටලු තවදුරටත් වර්ධනය වනු ඇති අතර, එමගින් ජනගහනයේ දිගුකාලීන යහපැවැත්ම කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැක. එබැවින් ජනගහනය තුළ විශේෂයෙන් ම අවදානමට ලක්වීමට වැඩි ඉඩක් පවතින කාණ්ඩ අතර ආහාර සුරක්ෂිතතාවයට ඇති අවදානම් අවම කරමින්, ගොවි ජනතාවගේ ජීවනෝපායයන් සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව, විවිධ කම්පන සඳහා සාර්ථක ලෙස මුහුණ දිය හැකි තිරසාර කෘෂිකාර්මික අංශයක් නැවත ඇති කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වී ඇත. ඒ අනුව, මැදි කාලයේ සිට දිගු කාලය දක්වා ආර්ථික වශයෙන් ප්‍රතිලාභ ජනනය කරන, පාරිසරිකමය වශයෙන් හිතකර, සහ සමාජීය වශයෙන් සාධාරණ ලෙස ක්‍රියාත්මක වන තිරසාර කෘෂිකාර්මික පද්ධතියක් ගොඩනැගීම සඳහා සාමූහික ප්‍රයත්නයක් දැරීම අවශ්‍ය වේ.

## ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණ තුළින් පිළිබිඹුවන ප්‍රධාන ආර්ථික කටයුතුවල ප්‍රවණතා

නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සැපයුම් මෙන්ම ඉල්ලුම් අංශයේ පැවති අවහිරතා හේතුවෙන් දෙවන සහ තෙවන කාර්තුව තුලදී සමස්තයක් වශයෙන් පහත වැටීමක් පෙන්නුම් කරන ලද අතර, වසරේ ඉදිරි කාලය සඳහා වන ව්‍යාපාර පිළිබඳ අපේක්ෂාවන් ද අයහපත් මට්ටමක පවතී. කෙසේ වුවද, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මාසික වර්ධනයක් පිළිබිඹු කරමින්, සමස්ත දර්ශකය වසරේ පළමු මාස තුන තුළ දී ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. මේ කෙරෙහි, නව ඇණවුම්, නිෂ්පාදනය සහ සේවා නියුක්තිය යන උප දර්ශකයන්ගේ සිදු වූ ඉහළ යෑම හේතු විය. එසේ වුවද, බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය හිඟ වීම හේතුවෙන් ආනයනික අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා බාධා ඇති වීම, විදුලි කප්පාදුව සහ ඉන්ධන හිඟ වීම වැනි සැපයුම් අංශයේ අවහිරතා 2022

**2.6 රූප සටහන**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)**




(අ) ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදු වූ වර්ධනීය තත්ත්වයන් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත. 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාළ ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


වසරේ අප්‍රේල් මාසයේ සිට නිෂ්පාදන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑ අතර, ඒ අනුව දෙවන සහ තෙවන කාර්තුවලට අයත් වූ සියළුම මාසවල දී සමස්ත දර්ශකයේ පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. තවද, අවසන් මාස කීපයේ දී සැපයුම් අංශයේ අවහිරතා යම් තරමකට පහව ගිය ද අප්‍රේල් මාසයේ සිට නිෂ්පාදන උප දර්ශකය අඛණ්ඩව පහත වැටිණ. මේ අතර, රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන වැනි අපනයනාභිමුඛ කර්මාන්ත සමග සැසඳීමේ දී මූලික වශයෙන් දේශීය වෙළඳපොළ වෙත නිෂ්පාදනයන් සිදු කරනු ලබන කර්මාන්තකරුවන් බැංකු පද්ධතිය තුළ අවශ්‍ය තරම් විදේශ විනිමය නොමැති වීම හේතුවෙන් ආනයනික අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී වඩාත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන ලදී. තවද, විදුලි කප්පාදුව සහ ඉන්ධන හිඟය, සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන බොහෝ සමාගම්වලට අහිතකර ලෙස බලපා තිබූ අතර, විශේෂයෙන්ම අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයේ නිරත වී සිටින කර්මාන්තකරුවන් සඳහන් කරන ලද්දේ ඉහළ උද්ධමනකාරී පරිසරයක් තුළ පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ හැකියාව පහත වැටීම හේතුවෙන් ඉල්ලුමේ අඩු වීමක් පෙන්නුම් කළ බවය. සැප්තැම්බර් මාසයේ සමීක්ෂණයට අනුව, දේශීය වශයෙන් පවතින ගැටලුවලට අමතරව අපනයන ගමනාන්තයන්හි ආර්ථික අවපාතයක් ඇතිවීමට ඇති හැකියාව හා ඒ තුළ විදේශ ඉල්ලුමට ඇති විය හැකි බලපෑම පිළිබඳව

> ***පළමු කාර්තුව තුළ දී නිෂ්පාදන සහ සේවා අංශ ද්විත්වයෙහිම ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල දක්නට ලැබුණු වර්ධනය, සැපයුම් අංශයේ අවහිරතා හේතුවෙන් අප්‍රේල් මස සිට අඩාල විය. කෙසේවුවද, සේවා අංශයේ දර්ශකය අගෝස්තු මස සිට නැවත ඉහළ ගිය අතර නිෂ්පාදන අංශයේ දර්ශකය තවදුරටත් පහත වැටුණි...***

පවතින බිය හේතුවෙන් ද හතරවන කාර්තුවේ නිෂ්පාදන කර්මාන්ත කටයුතු සඳහා වන අපේක්ෂාවන්හි පහත වැටීමක් පෙන්නුම් කරන ලදී.

මේ අතර, පළමු කාර්තුවේ දී වර්ධනයක් පෙන්නුම් කළ සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සැපයුම් අංශයේ පැවති අවහිරතා හේතුවෙන් දෙවන කාර්තුවේ දී පහත වැටුණු අතර, තුන්වන කාර්තුවේ අවසාන භාගය වන විට හතරවන කාර්තුව සඳහා වන ධනාත්මක ව්‍යාපාර අපේක්ෂාවන් ද සමග යහපත් වර්ධනයක් වාර්තා කරන ලදී. පළමු කාර්තුවේ දී මෙම දර්ශකයේ මාසික වශයෙන් දක්නට ලැබුණු ඉහළ යෑම කෙරෙහි නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකවල වර්ධනය හේතු විය. මෙම කාලපරිච්ඡේදය තුළ ප්‍රවාහන සේවා, නවාතැන් හා ආහාරපාන සැපයීම සහ වෙනත් පුද්ගලික සේවා යන සේවා කටයුතුවල මාසික වශයෙන් වර්ධනයක් වාර්තා කරන ලදී. එසේ වුවද, සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙන් පිළිබිඹු වූ පරිදි දෙවන කාර්තුව තුළ දී සේවා අංශයේ ව්‍යාපාරික කටයුතු පහත වැටෙන ලදී. මේ අනුව, විදුලි කප්පාදුව මෙන්ම ඉන්ධන හා ගෑස් සපයා ගැනීමේ අපහසුව ද, විශේෂයෙන් නවාතැන් හා ආහාර පාන සැපයීම ඇතුළු සේවා අංශයෙහි බොහෝ ව්‍යාපාරික කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. තවද, දේශපාලන අවිනිශ්චිතතාව සහ ඉන්ධන හිඟය හමුවේ සමාජයේ ඇති වූ නොසන්සුන්තාව, ප්‍රවාහන සේවා, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා, වෙනත් පුද්ගලික සේවා, අධ්‍යාපනය සහ තොග හා සිල්ලර වෙළඳාම වැනි බොහෝ සේවා අංශයන්හි ක්‍රියාකාරකම් දුර්වල කරන ලදී. කෙසේ වුවද, ඉන්ධන සැපයුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමත් සමග සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අගෝස්තු මාසයේ සිට නැවත වර්ධනීය මාවතට පිවිසෙන ලදී. එසේ වුවද, ප්‍රධාන වශයෙන් පාරිභෝගිකයින්ගේ මිලදී ගැනීමේ හැකියාව හීන වීමත් සමග තොග හා සිල්ලර වෙළඳාම තවදුරටත් පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. මේ අතර, සැප්තැම්බර් මාසයේ සමීක්ෂණයට අනුව, සාපේක්ෂව යහපත් ඉදිරි දැක්මක් පිළිබිඹු කරමින් වසරේ සිව්වන කාර්තුව සඳහාවන ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා වැඩි දියුණු විය.

**2.7 රූප සටහන**
**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)**




(අ) ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදු වූ වර්ධනීය තත්ත්වයන් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත. 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාළ ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


## 2.2 වියදම

ආර්ථිකයේ පරිභෝජන සහ ආයෝජන වියදම්වලින් සමන්විත වන දළ දේශීය වියදම (ද.දේ.වි.) පවත්නා වෙළඳපොළ මිල අනුව 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා කරන ලද 18.4%ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ පළමු භාගය තුළ දී පැවති ඉහළ උද්ධමනකාරී වාතාවරණය තුළ 21.0%කින් වර්ධනය විය. මෙම වර්ධනය කෙරෙහි 2021 වසරේ පළමු භාගයේ දී 14.5%ක වර්ධනයක් වාර්තා කළ පරිභෝජන වියදම, මෙම වසරේ පළමු භාගයේ දී 25.7%ක ඉහළ වේගයකින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂයෙන්ම, ආහාර ද්‍රව්‍ය ඇතුළුව පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ යෑම, පරිභෝජන වියදමෙහි මෙම ඉහළ යෑම කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් සැපයීය. මේ අතර, 2021 වසරේ පළමු භාගයේ දී 27.4%කින් වර්ධනය වූ ආයෝජන වියදම මෙම වසරේ පළමු භාගයේ දී 10.9%කින් ඉහළ ගියේය. විශේෂයෙන්ම, ඉදිකිරීම් කර්මාන්තය හා සම්බන්ධ අමුද්‍රව්‍ය පිරිවැය ශීඝ්‍රයෙන් ඉහළ යෑම, පවත්නා මිල අනුව ආයෝජන වියදමෙහි දක්නට ලැබුණු මෙම ඉහළ වර්ධනයට මූලික වශයෙන් හේතු විය. තවද, 2022 වසරේ පළමු භාගයේ දී ආනයනවල දක්නට ලැබුණු

> **පවත්නා මිල අනුව දේශීය වියදමෙහි දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනය කෙරෙහි පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩවල මිල ඉහළ යෑම හේතු වූ අතර, අපනයනවල ඉහළ වර්ධනය ශුද්ධ විදේශීය ඉල්ලුම ශක්තිමත් කිරීමට හේතු විය...**

40.4%ක වර්ධනයට සාපේක්ෂව අපනයනවල දක්නට ලැබුණු 76.7%ක ඉහළ වර්ධනය හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි 24.7%ක වැඩි දියුණු වීමක් දක්නට ලැබුණි. ඒ අනුව, පවත්නා මිල අනුව ද.දේ.නි., 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ 16.1%ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ පළමු භාගයේ දී 24.8%කින් වර්ධනය විය. කෙසේ වුවද, ස්ථාවර මිල අනුව ඇස්තමේන්තු

**2.8 රූප සටහන**
**ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා වියදම් අනුව දායකත්වය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)**




(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.


මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සැලකීමේ දී, වසරේ පළමු භාගය තුළ දී පැවති ඉහළ උද්ධමනකාරී වාතාවරණය මධ්‍යයේ පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය පහළ යෑම හේතුවෙන් පරිභෝජනය 0.7%ක පහත වැටීමක් වාර්තා කරන ලදී. තවද, ආයෝජන වියදම ද ස්ථාවර මිල අනුව 30.7%කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වුවද, භාණ්ඩ හා සේවා ආනයන විශාල ලෙස පහත වැටීමෙහි මෙන්ම එම අපනයනවල වාර්තා කළ ඉහළ වර්ධනයෙහි ද සමස්ත ප්‍රතිඵලයක් ලෙස, ස්ථාවර මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම 77.2%කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඒ අනුව, ස්ථාවර මිල අනුව ද.දේ.නි. 2022 වසරේ පළමු භාගය තුළ දී 4.8%කින් පහත වැටුණි.

## ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය තුළින් පිළිබිඹු වන ඉල්ලුම් අංශයෙහි ප්‍රවණතා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්තුමය පදනමෙන් පවත්වනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව, විශේෂයෙන් සැපයුම් අංශයේ දක්නට ලැබුණු අවහිරතාවල බලපෑම හේතුවෙන්, වියදම් අංශය හා


**2.9 රූප සටහන**
**ඉල්ලුම සහ විකුණුම් දර්ශක (අ)**




(අ) ව්‍යාපාර මතය පිළිබඳ සමීක්ෂණයෙන් ව්‍යුත්පන්න කරන ලද මෙම දර්ශක 0 සිට 200 දක්වා ව්‍යාප්ත වන අතර, දර්ශකය 100ට වඩා විශාල නම් ව්‍යාපාරික මතය යහපත් බව ද, එය 100ට වඩා කුඩා නම් ව්‍යාපාරික මතය පිරිහී ඇති බව ද අර්ථ නිරූපණය වේ.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

**2.10 රූප සටහන**
**ආයෝජන සහ ධාරිතා උපයෝජන දර්ශක (අ)**




(අ) ව්‍යාපාර මතය පිළිබඳ සමීක්ෂණයෙන් ව්‍යුත්පන්න කරන ලද මෙම දර්ශක 0 සිට 200 දක්වා ව්‍යාප්ත වන අතර, දර්ශකය 100ට වඩා විශාල නම් ව්‍යාපාරික මතය යහපත් බව ද, එය 100ට වඩා කුඩා නම් ව්‍යාපාරික මතය පිරිහී ඇති බව ද අර්ථ නිරූපණය වේ.

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

සම්බන්ධ ප්‍රධාන දර්ශකයන්හි ක්‍රමික පහත වැටීමක් දක්නට ලැබුණි. ඒ අනුව, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදවලට සාපේක්ෂව 2022 වසරේ පළමු කාර්තුව තුළ දී ඉල්ලුම සහ විකුණුම් උපදර්ශක ඉහළ ගිය නමුත් දෙවන කාර්තුව තුළ දී පහළ යෑමක් වාර්තා කරන ලදී. වසරේ දෙවන කාර්තුව තුළ දී දක්නට ලැබුණු සැපයුම් ආශ්‍රිත අවහිරතා ඉල්ලුම සහ විකුණුම්වල දක්නට ලැබුණු මෙම පහත වැටීම කෙරෙහි බලපාන ලදී. තවද, ධාරිතා උපයෝජනය සහ ආයෝජන යන උපදර්ශක ද 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදවලට සාපේක්ෂව 2022 වසරේ පළමු කාර්තුව තුළ දී ඉහළ යෑමක් පෙන්නුම් කළ නමුත්, දෙවන කාර්තුව තුළ දී ඉල්ලුම සහ විකුණුම්වල දක්නට ලැබුණු පසුබෑමට අනුරූපව මෙම උප දර්ශකයන්හි ද පහත වැටීමක් වාර්තා කරන ලදී. ආයෝජනය සහ ධාරිතා උපයෝජනය යන උප දර්ශකයන්හි වසරේ දෙවන කාර්තුව තුළ දී දක්නට ලැබුණු පහත වැටීම කෙරෙහි මූලික වශයෙන් විදුලි කප්පාදුව, අමුද්‍රව්‍ය සහ ඉන්ධන හිඟය වැනි සැපයුම් අංශයේ අවහිරතා මෙන්ම රට තුළ පැවැති අවිනිශ්චිත වාතාවරණය ද හේතු විය. මේ අතර, පසුගිය වසරේ තෙවන කාර්තුවට සාපේක්ෂව, ඉල්ලුම, විකුණුම්, ආයෝජනය සහ ධාරිතා උපයෝජන යන උප දර්ශක මෙම වසරේ තෙවන කාර්තුව තුළ දී ද තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

> **සමාජයීය වශයෙන් පැන නැගුණු අසහනකාරී තත්ත්වය සහ දේශපාලනික අස්ථාවරත්වය මෙන්ම සැපයුම් අංශයේ ඇති වූ බොහෝ අවහිරතා ද ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ දර්ශක කෙරෙහි විශේෂයෙන්ම වසරේ දෙවන කාර්තුව තුළ දී බලපෑ අතර, තෙවන කාර්තුව පිළිබඳ අපේක්ෂාවන් ද පහළ මට්ටමක පවතී...**


## 2.3 සේවා නියුක්තිය

2022 වසරේ පළමු භාගයේ දී ශ්‍රම වෙළඳපොළ ආශ්‍රිත බොහෝ දර්ශක යහපත් අතට හැරීම කෙරෙහි 2021 වසරේ පළමු භාගයේ ශ්‍රමිකයන් වෙළඳපොළෙන් ඈත්වීමට හේතු වූ වසංගත ආශ්‍රිත අවහිරතාවන් ක්‍රමයෙන් පහව යෑම හේතු වුවද, ආර්ථික කටයුතුවල පහළ යෑමත් සමඟම ශ්‍රම ඵලදායීතාවය පහත වැටුණි. ඒ අනුව, ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය වන ශ්‍රම බලකාය, 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ මිලියන 8.594 සිට 2022 වසරේ පළමු භාගයේ දී මිලියන 8.699ක් දක්වා 0.9%කින් ඉහළ යන ලදී. එසේම, 2021 වසරේ පළමු භාගයේ දී මිලියන 8.465ක් වූ ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී මිලියන 8.447ක් දක්වා පහළ යන ලදී. තවද, ජනගහනයේ දක්නට ලැබුණු සුළු වර්ධනයට සාපේක්ෂව ශ්‍රම බලකායේ වාර්ෂික වර්ධනය ඉහළ අගයක් ගැනීම හේතුවෙන්, ශ්‍රම බලකාය සහ කුටුම්බ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ 50.4% සිට 2022 වසරේ පළමු භාගයේ දී 50.6%ක් දක්වා සුළු වශයෙන් ඉහළ යන ලදී. එසේම, විශේෂයෙන්ම 2022 වසරේ පළමු කාර්තුවේ දී, නව රැකියා අවස්ථාවල වර්ධනයක් පෙන්නුම් කරමින් සේවා නියුක්ත ජනගහනය 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ මිලියන 8.132 සිට 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී මිලියන 8.283ක් දක්වා 1.9%කින් ඉහළ යන ලදී. ඒ අනුව, සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ 5.4% සිට 2022 වසරේ පළමු භාගයේ දී 4.5%ක් දක්වා පහත වැටුණු අතරම, සේවා වියුක්ත ජනගහනය ද 2021

> ***වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවූ බාධාවන් ක්‍රමයෙන් පහව යාමත් සමඟම, ශ්‍රම වෙළඳපොළ දර්ශක යහපත් අතට පත්විය...***

වසරේ පළමු භාගයේ දී වාර්තා වූ මිලියන 0.462 සිට 2022 වසරේ පළමු භාගයේ දී මිලියන 0.386ක් දක්වා පහත වැටෙන ලදී. ආර්ථිකයේ නිමැවුම සහ වැඩ කරන ලද පැය ගණන අතර අනුපාතය වන ශ්‍රම ඵලදායීත්වය සළකා බලන විට, විශාලතම පසුබෑම කර්මාන්ත කටයුතුවල ද ඉන් පසුව පිළිවෙළින් සේවා සහ කෘෂිකර්මාන්ත කටයුතුවල ද පෙන්නුම් කෙරුණි. කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු සැලකිය යුතු පහත වැටීම මෙන්ම සේවක සංඛ්‍යාවෙහි ඉහළ යෑම ද හේතුවෙන්, කර්මාන්ත කටයුතුවල ශ්‍රම ඵලදායිත්වය මෙසේ විශාල ලෙස පහත වැටුණි. සේවා කටයුතුවල ඵලදායිත්වය අඩුවීම කෙරෙහි

**2.11 රූප සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සේවක සංඛ්‍යාව සුළු වශයෙන් වැඩි වන අතර, සේවා කටයුතුවල වර්ධනය පහත වැටීම හේතු විය. මේ අතර, කෘෂිකර්මාන්ත කටයුතුවල නිරත සේවක සංඛ්‍යාවෙහි යම් අඩු වීමක් දක්නට ලැබුනද, කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතු විශාල ලෙස පහත වැටීම කෘෂිකර්මාන්ත කටයුතුවලද ඵලදායිත්වය අඩු වීම සඳහා හේතු විය.

විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ 30,599 සිට 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී 151,336ක් දක්වා සැළකිය යුතු ලෙස ඉහළ යන ලදී. මේ සඳහා, වසංගත තත්ත්වය පහව යෑමත් සමගම විදේශීය වෙළඳපොළෙහි රැකියා අවස්ථා ක්‍රමයෙන් උත්පාදනය වීම සහ රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදය හේතුවෙන් වඩා යහපත් අනාගත අපේක්ෂාවන් උදෙසා ශ්‍රමිකයින් විදේශ රැකියා කෙරෙහි යොමු වීම බොහෝ දුරට හේතු වූවා විය හැක. 2022 වසරේ පළමු භාගයේ විදේශ රැකියා සඳහා සමස්ත පිටත්ව යෑම් කෙරෙහි පිරිමි සහ කාන්තා දායකත්ව පිළිවෙළින්, 60.7%ක් සහ 39.3%ක් ලෙස විය. මේ අතර, නිපුණතා කාණ්ඩ යටතේ

> ***සියළුම කාණ්ඩවලට අයත් විදේශ රැකියා සඳහා පිටත්ව යෑමට ආර්ථික අර්බුදය හේතුවෙන් ශ්‍රමිකයන් නැඹුරු වී ඇත...***

විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සළකා බැලීමේ දී, පුහුණු, නුපුහුණු සහ ගෘහ සේවිකා යන කාණ්ඩ, 2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමෙහි ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී.

**2.1 සංඛ්‍යා සටහන**

### වී සහ සහල් නිෂ්පාදන ප්‍රවණතා

| අංශය | ඒකකය | 2021 පළමු භාගය (අ) | 2022 පළමු භාගය (ආ) | වෙනස්වීම % |
|---|---|---|---|---|
| 1. වී නිෂ්පාදනය | මෙ.ටො. '000 | 3,061 | 1,931 | -36.9 |
| 2. අස්වැන්න නෙළා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර '000 | 682 | 685 | 0.5 |
| 3. හෙක්ටයාරයකට එලදාව (ඇ) | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 4,492 | 2,819 | -37.3 |
| | | 2021 ජන.-අගෝ. (අ) | 2022 ජන.-අගෝ. (ආ) | වෙනස්වීම % |
| 4. වී මිල ගණන් | | | | |
| සම්බා | කි.ග්‍රෑ./රුපියල් | 60.58 | 109.68 | 81.0 |
| නාඩු | කි.ග්‍රෑ./රුපියල් | 52.75 | 109.20 | 107.0 |
| 5. සහල් සිල්ලර මිල | | | | |
| සම්බා | කි.ග්‍රෑ./රුපියල් | 132.20 | 202.19 | 52.9 |
| නාඩු | කි.ග්‍රෑ./රුපියල් | 112.72 | 201.16 | 78.5 |
| 6. සහල් ආනයන | මෙ.ටො. '000 | 10 | 597 | 6,176.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුළු නිෂ්පාදනය අස්වැන්න නෙළාගන්නා ලද බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයකට එලදාව ගණනය කර ඇත.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
ශ්‍රී ලංකා රේගුව ශ්‍රී ලංකා මහ බැංකුව

**2.2 සංඛ්‍යා සටහන**

### එළවළු, සුළු අපනයන භෝග සහ සීනි නිෂ්පාදන ප්‍රවණතා

| අංශය | ඒකකය | 2021 පළමු භාගය (අ) | 2022 පළමු භාගය (ආ) | වෙනස්වීම % |
|---|---|---|---|---|
| **1. එළවළු** | | | | |
| 1.1 නිෂ්පාදනය | මෙ.ටො. '000 | 872 | 815 | -6.5 |
| 1.2 වගා කළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර '000 | 67 | 65 | -3.0 |
| **2. අනෙකුත් ක්ෂේත්‍ර භෝග** | | | | |
| 2.1 නිෂ්පාදනය | මෙ.ටො. '000 | 597 | 371 | -37.8 |
| 2.2 වගා කළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර '000 | 149 | 132 | -11.1 |
| **3. සීනි** | | | | |
| 3.1 නිෂ්පාදනය | මෙ.ටො. '000 | 38 | 43 | 13.0 |
| 3.2 වගා කළ බිම් ප්‍රමාණය (නිරි වගාව ඇතුළත්ව) (ඇ) | හෙක්ටයාර '000 | 14 | 15 | 2.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) කේන්ද්‍රීය වගාවන් සහ බිම් කට්ටිකරුවන් සතු වගාවන් ද ඇතුළත් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම - පැල්වත්ත ඒකකය
සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම - සෙවණගල ඒකකය
සීමාසහිත ගල්ඔය (හිඟුරාන) සීනි කර්මාන්තායතනය
සීමාසහිත ඇතිමලේ සීනි කර්මාන්තායතනය

**2.3 සංඛ්‍යා සටහන**

### පශු සම්පත් අංශයේ නිෂ්පාදන ප්‍රවණතා

| උප අංශය | ඒකකය | 2021 පළමු භාගය (අ) | 2022 පළමු භාගය (ආ) | වෙනස්වීම % |
|---|---|---|---|---|
| 1. ජාතික කිරි නිෂ්පාදනය | ලීටර් මිලියන | 203 | 185 | -9.1 |
| එළ කිරි | ලීටර් මිලියන | 177 | 159 | -9.9 |
| මී කිරි | ලීටර් මිලියන | 27 | 26 | -3.9 |
| 2. බිත්තර නිෂ්පාදනය | මිලියන | 1,345 | 1,248 | -7.2 |
| 3. කුකුළු මස් නිෂ්පාදන | මෙ.ටො. '000 | 115 | 123 | 6.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## 2.4 සංඛ්‍යා සටහන
## මත්ස්‍ය නිෂ්පාදන ප්‍රවණතා

| අංශය | ඒකකය | 2021 ජන.-අගෝ. (අ) | 2022 ජන.-අගෝ. (ආ) | වෙනස්වීම % |
|---|---|---|---|---|
| **නිෂ්පාදනය** | කි.ග්‍රෑ. මිලියන | **284** | **257** | **-9.7** |
| මුහුදු මත්ස්‍ය | කි.ග්‍රෑ. මිලියන | **217** | **184** | **-15.5** |
| වෙරළ හා කලපු ආශ්‍රිත | කි.ග්‍රෑ. මිලියන | 114 | 98 | -14.0 |
| ගැඹුරු මුහුදු මත්ස්‍ය | කි.ග්‍රෑ. මිලියන | 103 | 85 | -17.0 |
| **මිරිදිය මත්ස්‍ය** | කි.ග්‍රෑ. මිලියන | **67** | **73** | **9.1** |
| මිරිදිය ජලාශ | කි.ග්‍රෑ. මිලියන | 53 | 57 | 7.0 |
| ජලජීවී වගාව | කි.ග්‍රෑ. මිලියන | 4 | 5 | 31.1 |
| ඉස්සන් වගාව | කි.ග්‍රෑ. මිලියන | 10 | 11 | 12.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ධීවර අමාත්‍යාංශය

## 2.5 සංඛ්‍යා සටහන
## තේ, රබර් සහ පොල් නිෂ්පාදන සහ මිල ගණන්වල ප්‍රවණතා

| අයිතමය | ඒකකය | 2021 ජන.-අගෝ. (අ) | 2022 ජන.-අගෝ. (ආ) | වෙනස්වීම % |
|---|---|---|---|---|
| 1. තේ | | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 212 | 171 | -19.2 |
| උඩරට | කි.ග්‍රෑ. මිලියන | 48 | 39 | -18.1 |
| මැදරට | කි.ග්‍රෑ. මිලියන | 37 | 28 | -25.1 |
| පහතරට | කි.ග්‍රෑ. මිලියන | 128 | 105 | -17.8 |
| 1.2 මිලෙහි සාමාන්‍යය | | | | |
| කොළඹ වෙන්දේසිය | කි.ග්‍රෑ./රුපියල් | 620.20 | 1,156.68 | 86.5 |
| අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 925.90 | 1,470.54 | 58.8 |
| 2. රබර් | | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 56 | 48 | -13.8 |
| ෂීට් රබර් | කි.ග්‍රෑ. මිලියන | 28 | 24 | -14.6 |
| ක්‍රේප් රබර් | කි.ග්‍රෑ. මිලියන | 9 | 10 | 4.2 |
| අනෙකුත් | කි.ග්‍රෑ. මිලියන | 19 | 15 | -21.3 |
| 2.2 මිලෙහි සාමාන්‍යය | | | | |
| කොළඹ වෙන්දේසිය (RSS 1) | කි.ග්‍රෑ./රුපියල් | 448.60 | 618.65 | 37.9 |
| අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 511.46 | 813.85 | 59.1 |
| 3. පොල් | | | | |
| 3.1 නිෂ්පාදනය (ඈ) | ගෙඩි මිලියන | 2,035 | 2,285 | 12.3 |
| දිසිඳි පොල් (ඉ) | ගෙඩි මිලියන | 182 | 220 | 20.7 |
| පොල්තෙල් (ඉ) | ගෙඩි මිලියන | 148 | 300 | 102.4 |
| නොඉඳුල් පොල්තෙල් (ඉ) | ගෙඩි මිලියන | 130 | 148 | 13.9 |
| කොප්පරා අපනයන (ඉ) | ගෙඩි මිලියන | 2 | 5 | 151.7 |
| පොල් ගෙඩි (ඉ) | ගෙඩි මිලියන | 9 | 8 | -16.1 |
| පොල් ක්‍රීම්, පිටි කළ පොල් කිරි සහ පොල් කිරි (ඉ) | ගෙඩි මිලියන | 341 | 372 | 9.1 |
| දේශීය පොල් ගෙඩි පරිභෝජනය (ඊ) | ගෙඩි මිලියන | 1,223 | 1,232 | 0.8 |
| 3.2 මිලෙහි සාමාන්‍යය | | | | |
| සිල්ලර මිල | ගෙඩියකට රුපියල් | 84.74 | 88.59 | 4.5 |
| කොළඹ වෙන්දේසිය | ගෙඩියකට රුපියල් | 57.26 | 57.43 | 0.3 |
| අපනයන (නැ.වි.ස.) (උ) | ගෙඩියකට රුපියල් | 66.45 | 88.09 | 32.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) උස අනුව බිම් වර්ගීකරණය - පහතරට - මුහුදු මට්ටමේ සිට මීටර් 610 දක්වා
මැදරට - මුහුදු මට්ටමේ සිට මීටර් 610 සිට 1,220 අතර
උඩරට - මුහුදු මට්ටමෙන් මීටර් 1,220 ට ඉහළ
(ඈ) ඇස්තමේන්තුවකි (තොග වෙනස්වීම සඳහා ගැලපීම් කරන බැවින් ශීර්ෂ වල එකතුව මුළු නිෂ්පාදන හා නොසැසඳේ)
(ඉ) ගෙඩි ප්‍රමාණය ගණන් බැලීමේ දී යොදාගත් අනුපාතික
දිසිඳි පොල් මෙට්‍රික් ටොන් 1 - ගෙඩි 8,960
පොල්තෙල් මෙට්‍රික් ටොන් 1 - ගෙඩි 9,250
නොඉඳුල් පොල්තෙල් මෙට්‍රික් ටොන් 1 - ගෙඩි 13,700
කොප්පරා මෙට්‍රික් ටොන් 1 - ගෙඩි 5,500
පිටි කළ පොල් කිරි මෙට්‍රික් ටොන් 1 - ගෙඩි 16,000
පොල් ක්‍රීම් මෙට්‍රික් ටොන් 1 - ගෙඩි 8,960
පොල් කිරි මෙට්‍රික් ටොන් 1 - ගෙඩි 4,000
(ඊ) ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2019 මත පදනම්ව වාර්ෂික ඒක පුද්ගල පොල් පරිභෝජනය ගෙඩි 85.44ක් ලෙස ඇස්තමේන්තු කර ඇත (කර්මාන්ත අංශයේ පරිභෝජනය හැර).
(උ) පොල් මද ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදිත තුන සඳහා පමණි

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් සංවර්ධන අධිකාරිය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
කොළඹ තේ තැරැව්කරුවන්ගේ සංගමය
ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.6 සංඛ්‍යා සටහන

### කාර්මික නිෂ්පාදන දර්ශකය (2015=100)

| ජා.ස. කා.ව. කේතය | අංශය (අ) | 2022 පළමු කාර්තුව (ආ) | 2022 දෙවන කාර්තුව (ආ) | වෙනස්වීම % | |
|---|---|---|---|---|---|
| | | | | 2021/22 පළමු කාර්තුව (ආ) | 2021/22 දෙවන කාර්තුව (ආ) |
| 10 | ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය (35.2%) | 101.0 | 93.7 | -7.4 | -8.8 |
| 11 | බීම වර්ග නිෂ්පාදනය (3.8%) | 141.8 | 123.0 | 16.5 | 36.7 |
| 12 | දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදන (1.7%) | 83.5 | 87.9 | 3.7 | 45.9 |
| 13 | රෙදි නිෂ්පාදනය (3.3%) | 120.6 | 101.3 | -7.8 | -19.7 |
| 14 | ඇඟලුම් නිෂ්පාදනය (19.8%) | 101.7 | 102.7 | -10.9 | 41.8 |
| 15 | සම් සහ සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදනය (0.3%) | 96.1 | 77.9 | 0.1 | 23.7 |
| 16 | ගෘහ භාණ්ඩ හැර, දැව හා ලීයෙන් කරන ලද නිෂ්පාදන, පිදුරු වලින් හා ගොතන ලද ද්‍රව්‍ය නිෂ්පාදනය (0.2%) | 115.9 | 42.8 | 11.1 | -40.7 |
| 17 | කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය (1.7%) | 76.7 | 40.6 | -31.3 | -42.3 |
| 18 | මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය (1.4%) | 145.3 | 93.8 | -6.9 | 4.4 |
| 19 | අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය (7.4%) | 41.5 | 19.9 | -19.1 | -75.6 |
| 20 | රසායනික සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය (4.1%) | 107.0 | 112.8 | 16.9 | 30.4 |
| 21 | මූලික ඖෂධ සහ ඖෂධ හා සම්බන්ධ සැකසීම් නිෂ්පාදනය (0.1%) | 110.3 | 83.9 | -3.0 | -29.2 |
| 22 | රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය (5.7%) | 104.6 | 100.7 | 0.4 | 0.9 |
| 23 | වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය (7.8%) | 138.0 | 110.6 | 2.3 | -14.3 |
| 24 | මූලික ලෝහ වර්ග නිෂ්පාදනය (2.4%) | 129.5 | 88.9 | -10.3 | -28.0 |
| 25 | පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය (යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හැර) (1.3%) | 125.7 | 72.2 | -6.4 | -41.0 |
| 26-27 | විදුලි උපකරණ නිෂ්පාදනය (2.0%) | 91.0 | 61.1 | -7.9 | -10.9 |
| 28 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදනය (වෙනත් තැනක සඳහන් නොවන) (0.7%) | 151.4 | 138.5 | 27.0 | 13.3 |
| 31 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන (0.8%) | 79.9 | 69.0 | -13.5 | 3.0 |
| 29-30 32-33 | අනෙකුත් නිෂ්පාදන (0.3%) | 64.9 | 58.3 | -12.3 | -10.2 |
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | | **103.1** | **91.7** | **-5.4** | **-3.4** |

(අ) එක් එක් අංශයට අදාළ වන බර තැබීම් වරහන් තුළ දක්වා ඇත
(ආ) තාවකාලික
සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය 2015 වර්ෂය මත පදනම් වී ඇති අතර, දර්ශක අගයන් ජාත්‍යන්තර සම්මත කාර්මික වර්ගීකරණ (ජා.ස.කා.ව.) 4 වන සංශෝධනය අනුව වර්ගීකරණය කර ඇත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 2.7 සංඛ්‍යා සටහන

### පවත්නා වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය මත වියදම (අ)(ආ)

රුපියල් මිලියන

| ශීර්ෂය | 2020 | 2021 | | 2022 | වෙනස්වීම % | |
|---|---|---|---|---|---|---|
| | | පළමු භාගය | වාර්ෂික | පළමු භාගය | 2020/21 පළමු භාගය | 2021/22 පළමු භාගය |
| 1. පෞද්ගලික පරිභෝජන වියදම | 9,840,226 | 5,504,708 | 11,089,403 | 6,982,118 | 16.1 | 26.8 |
| 2. රජයේ පරිභෝජන වියදම | 1,626,883 | 830,318 | 1,660,737 | 982,433 | 5.2 | 18.3 |
| 3. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 5,339,030 | 3,001,347 | 6,236,763 | 3,328,925 | 27.4 | 10.9 |
| 4. භාණ්ඩ හා සේවා අපනයන | 2,418,542 | 1,312,659 | 2,980,263 | 2,318,909 | 10.4 | 76.7 |
| 5. අඩුකළා : භාණ්ඩ හා සේවා ආනයන | 3,384,516 | 2,043,782 | 4,281,313 | 2,869,204 | 23.0 | 40.4 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **15,840,164** | **8,605,251** | **17,685,854** | **10,743,181** | **16.1** | **24.8** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.8 සංඛ්‍යා සටහන

### ශ්‍රම බලකාය, සේවා නියුක්තිය හා සේවා වියුක්තිය

| අයිතමය | 2020 | 2021 | | 2022 (අ) |
|---|---|---|---|---|
| | | පළමු භාගය | වාර්ෂික | පළමු භාගය |
| කුටුම්බ ජනගහනය '000 (වයස අවුරුදු 15 හා ඊට වැඩි) | 16,739 | 17,059 | 17,134 | 17,116 |
| ශ්‍රම බලකාය '000 | 8,467 | 8,594 | 8,553 | 8,669 |
| සේවා නියුක්ත '000 | 7,999 | 8,132 | 8,114 | 8,283 |
| සේවා වියුක්ත '000 | 468 | 462 | 440 | 386 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) | 50.6 | 50.4 | 49.9 | 50.6 |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) | 5.5 | 5.4 | 5.1 | 4.5 |

(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# 3

# ආර්ථික හා සමාජ යටිතල පහසුකම්

*දේශීය හා විදේශීය ප්‍රවණතා මගින් පැන නැගුණු දුෂ්කරතා රැසකට ශ්‍රී ලංකා ආර්ථිකයට මුහුණ දීමට සිදුවීම හේතුවෙන් 2022 වසරේ පළමු භාගයේ දී රටේ ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් සැපයුම සැලකිය යුතු බාධාවලට ලක් වූ අතර, ඒ සමඟ ක්‍රියාත්මක කළ සැපයුම් සහ ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ග මගින් මෙම දුෂ්කරතා සඳහා කිසියම් සහනයක් සැලසිණි. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සහ ඉහළ මට්ටමක පැවති ගෝලීය බලශක්ති භාණ්ඩ මිල ගණන් හේතුවෙන් ආර්ථිකය පෙර නොවූ අන්දමේ විදුලිබල හා බලශක්ති අර්බුදයකට මුහුණ පෑවේය. දේශීය ඉන්ධන සැපයුම් හිඟය සහ 2022 වසරේ මුල් භාගයේ මැද වන විට සිදු කළ පැය 10 ඉක්මගිය දෛනික විදුලි කප්පාදු හේතුවෙන්, සැපයුම් සහ ප්‍රවාහන ජාල සැලකිය යුතු ලෙස අඩාල විය. කෙසේ වෙතත්, සතුටුදායක ලෙස ඉහළ ගිය ජලවිදුලිබල උත්පාදනය හේතුවෙන් විදුලිය විසන්ධි කිරීමේ කාලසීමාව අඩු කිරීමට කටයුතු කළ අතර, ඉන්ධන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුවලට (එල්.පී. ගෑස්) අදාළ ඉල්ලුම් සහ සැපයුම් අසමතුලිතතා විසඳීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් සාර්ථකව අනුගමනය කෙරිණි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.), ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යන ආයතනවල දීර්ඝ කාලයක් මුළුල්ලේ පවතින මූල්‍ය ගැටලු විසඳීමේ කඩිනම් අවශ්‍යතාව පිළිබඳව නිසි අවධානය යොමු කරමින්, රජය විසින් ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් සඳහා සංශෝධන ක්‍රියාත්මක කරන ලද අතර, විදුලිබල හා ජල ගාස්තු, පිළිවෙළින්, වසර 8කට සහ වසර 10කට පසුව 2022 වසරේ අගෝස්තු මාසයේ දී ඉහළ නංවන ලදී. ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් සංශෝධනවලට අනුකූලව බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු ඇතුළු තවත් ඇතැම් මහජන උපයෝගීතා සේවාවලට ද අදාළ ගාස්තු ඉහළ නංවන ලදී. මුදල් ප්‍රවාහ දුෂ්කරතා සහ අමුද්‍රව්‍ය සැපයීම ප්‍රමාණවත් නොවීම හමුවේ සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ යටිතල පහසුකම් ව්‍යාපෘති සුළු ප්‍රගතියක් වාර්තා කළේය. වසර ආරම්භයේ දී කොවිඩ්-19 වසංගතය නැවත ව්‍යාප්ත වීමක් පෙන්නුම් කළ ද, වයස අවුරුදු 12ට වැඩි ජනගහනයෙන් බහුතරයක් එන්නත් මාත්‍රා දෙකක මූලික අවශ්‍යතාව සම්පූර්ණ කර තිබීම සහ එම ජනගහනයෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් පළමු වර්ධක මාත්‍රාව ලබාගෙන තිබීම සැලකිල්ලට ගනිමින්, ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා නිරෝධායන රීති ආශ්‍රිත තීර්ණායක කිහිපයක්*


*සහ අනෙකුත් කොවිඩ්-19 ආශ්‍රිත නිර්ණායක ලිහිල් කරන ලදී. කෙසේ වෙතත්, මේ වන විට ඩෙංගු, මැලේරියාව සහ ඉන්ෆ්ලුවෙන්සා වැනි බෝවන රෝග ව්‍යාප්ත වීම පිළිබඳව අවදානමක් පවතී. 2022 වසරේ ජූලි මාසය අවසානයේ සිට අධ්‍යයන කටයුතු භෞතික වශයෙන් සාමාන්‍ය පරිදි නැවත ආරම්භ කෙරුණ ද, 2020 වසරේ දී කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිට දක්නට ලැබුණු පරිදි, අධ්‍යයන කටයුතු සාමාන්‍ය පරිදි සිදු කිරීමට වරින්වර බාධා සිදු වීම හේතුවෙන් සිදු වූ ඉගෙනුම් අවස්ථා අහිමිවීම් අඛණ්ඩව පැවති අතර, එය විවිධ ආර්ථික මට්ටම් සහ භූගෝලීය ප්‍රදේශ අනුව ළමුන් අතර අධ්‍යාපනික ප්‍රතිඵලවල අසමානතා පුළුල් වීමට හේතු විය හැකි බැවින්, මෙම ගැටලු විසඳීම සඳහා ඒකාබද්ධ ප්‍රතිපත්තිමය විසඳුමක අවශ්‍යතාව එයින් පෙන්නුම් කරයි. පසුගිය වසර දෙක තුළ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අඛණ්ඩව ඇති වූ දුෂ්කරතා මෙන්ම පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් නව දුගී කාණ්ඩයක් ලෙස ඉස්මතුවීමෙන් ඇති වන ගැටලුවලට මුහුණ දීමට ද ආර්ථිකයට සිදුවනු ඇත. 2022 වසර සඳහා ප්‍රකාශයට පත්කළ අතුරු අයවැයේ දක්වා ඇති පරිදි පුළුල් මූල්‍ය ආධාර වැඩසටහන් හරහා ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස් ආරක්ෂා කිරීමට රජය දක්වන කැපවීම සහ සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය හරහා සමාජ ආරක්ෂණ ජාලය වැඩි දියුණු කිරීමට දරන පැහැදිලි ප්‍රයත්නය ප්‍රශංසනීය වේ. දීර්ඝ කාලයක සිට රටේ ප්‍රධාන සම්පතක් වූ මානව ප්‍රාග්ධන පදනමේ ගුණාත්මකභාවය, ඵලදායිතාව සහ යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන සමාජ සුබසාධනය සහතික කිරීම පිණිස එවැනි ඒකාබද්ධ හා මනා ලෙස ඉලක්කගත ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වේ.*

## 3.1 බලශක්ති අංශයේ ප්‍රගතිය

### බොරතෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන

2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ ගෝලීය බොරතෙල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. 2022 වසරේ මේ දක්වා පැවති ඉහළ මිල මට්ටම්වලට මූලික වශයෙන්, නැගෙනහිර යුරෝපයේ සිදු වූ භූ දේශපාලනික අර්බුදය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ගෝලීය තෙල් සැපයුම් තත්ත්වයන් දැඩි වීම හේතු විය.

**3.1 රූප සටහන**
**ගෝලීය බොරතෙල් මිල ගණන්වල ප්‍රවණතාව**




මූලය: බ්ලූම්බර්ග් තොරතුරු සේවය

ලොව ප්‍රමුඛතම තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනකරුවෙකු වන රුසියාව වෙත පනවන ලද සම්බාධක හේතුවෙන්, 2008 වසරේ ජූලි මාසයෙන් පසු ප්‍රථම වතාවට 2022 වසරේ මාර්තු මාසයේ දී බොරතෙල් බැරලයක දෛනික මිල ගණන් එ.ජ. ඩොලර් 140ක් දක්වා කෙටි කාලයක් තුළ ඉහළ යෑමත් සමඟ, 2022 වසරේ පළමු භාගය තුළ බොරතෙල් මිල ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය නැවත හිස එසවීම සහ ලෝකයේ ප්‍රධාන මහ බැංකුවල මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ පියවර, ගෝලීය වශයෙන් බලශක්තිය සඳහා වන ඉල්ලුම පහළ දැමීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කිරීම හේතුවෙන්, 2022 වසරේ දෙවන භාගය ආරම්භයේ සිට බොරතෙල් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ අග භාගය වන විට බැරලයකට ඇමරිකානු එ.ජ. ඩොලර් 85ක් දක්වා මිල ගණන් පහළ ගියේය. කෙසේ වෙතත්, 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය සහ එහි පාර්ශ්වකරුවන් විසින් (OPEC+) නිෂ්පාදන කප්පාදුවක් නිවේදනය කිරීමත් සමග මිල ගණන් නැවතත් ඉහළ ගියේය. 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 61.7%ක ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, 2022 වසරේ පළමු භාගය තුළ බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය අගය එ.ජ. ඩොලර් 105.12ක් වූ අතර, 2022 වසරේ ජූලි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ බොරතෙල් මිල ගණන්, බැරලයකට එ.ජ. ඩොලර් 96ක පමණ අඩු සාමාන්‍යය අගයක් වාර්තා කළේය.

විදේශ විනිමය ද්‍රවශීලතා හිඟකම හමුවේ, ලං.බ.නී.සං. විසින් 2022 වසරේ ජනවාරි (බැරලයක සාමාන්‍යය මිල එ.ජ. ඩොලර් 84.09ක් විය), පෙබරවාරි (බැරලයක සාමාන්‍යය මිල එ.ජ. ඩොලර් 76.41ක් විය), මැයි (බැරලයක සාමාන්‍යය මිල එ.ජ. ඩොලර් 109.94ක් විය), අගෝස්තු (බැරලයක සාමාන්‍යය මිල එ.ජ. ඩොලර් 114.71ක් විය) සහ සැප්තැම්බර් (බැරලයක සාමාන්‍යය මිල එ.ජ. ඩොලර් 119.71ක් විය) යන මාසවල දී පමණක් බොරතෙල් ආනයනය කරන ලදී. මේ අතර, ගෝලීය වෙළඳපොළ තුළ බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිල ගණන් විචලනයවීම හේතුවෙන්, 2022 වසරේ දී ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් සඳහා සංශෝධන කිහිපයක් ම කිරීමට සිදු විය. ගෝලීය මිල ගණන් ඉහළ යෑම හා අනුකූලව ලං.බ.නී.සං. විසින් අලෙවි කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදිත කිහිපයක දේශීය මිල ගණන් 2022 වසරේ මාර්තු, අප්‍රේල්, මැයි සහ ජූනි මාසවල දී ඉහළ නංවන ලද අතර, අනතුරුව ගෝලීය වෙළඳපොළ තුළ දක්නට ලද මිල පහළ යෑම් හේතුවෙන් 2022 වසරේ ජූලි, අගෝස්තු සහ ඔක්තෝබර් මාසවල දී ඛනිජ තෙල් මිල ගණන් අවස්ථා හතරක දී පහළ දැමීය. මේ අතර, භූමිතෙල් අලෙවිය මගින් සිදුවන විශාල අලාභය අවම කරගැනීම සඳහා ලං.බ.නී.සං. භූමිතෙල් සිල්ලර මිල 2022 වසරේ අගෝස්තු මාසය අවසානයේ දී සැලකිය යුතු ලෙස ඉහළ නැංවීය. 2022 වසරේ ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ, ලංකා අයිඕසී පොදු සීමිත සමාගම (LIOC) විසින් අවස්ථා හතක දී දේශීය මිල ගණන් ඉහළ නංවන ලද අතර, පසුව 2022 වසරේ ජූලි, අගෝස්තු සහ ඔක්තෝබර් මාසවල දී අවස්ථා හතරක දී මිල ගණන් පහළ දැමීමත් සමඟ එම මිල ගණන් ලං.බ.නී.සං.හි මිල ගණන් සමග සමාන මට්ටමක පැවතිණි.

> **ගෝලීය මිල ගණන්වල ප්‍රවණතාවයන්ට අනුව ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය මිල ගණන් සඳහා සංශෝධන කිහිපයක් සිදු කරන ලදී...**

ඛනිජ තෙල් නිෂ්පාදිත මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ සලකා බලනු ලබන කාලපරිච්ඡේදය අවසාන භාගයේ දී ජාතික ඉන්ධන අවසර පත්‍ර කේතය (QR code) මත පදනම්ව, යම් සීමාවන්ට යටත්ව, ඉන්ධන විධිමත් වශයෙන් සැපයීම ක්‍රියාත්මක කිරීම මධ්‍යයේ, 2022 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ, දේශීය වෙළඳපොළෙහි ඛනිජ තෙල් නිෂ්පාදිතවල සමස්ත විකුණුම් පරිමාව පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ දී, ලංකා අයිඕසී පොදු සීමිත සමාගමෙහි අලෙවි පරිමාවේ කැපී පෙනෙන ඉහළ යෑම අභිබවමින්, ලං.බ.නී.සං. අලෙවි කළ ඉන්ධන පරිමාවෙහි පහත වැටීම හේතුවෙන්, සමස්ත ඛනිජ තෙල් අලෙවිය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 7.0%ක පහළ යෑමක් වාර්තා කළේය. ඒ අනුව, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ, ලං.බ.නී.සං. විසින් ප්‍රවාහන අංශය වෙත අලෙවි කළ ඉන්ධන ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 8.6%ක පහළ යෑමක් වාර්තා කළ අතර, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දක්නට ලැබුණු කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ පහළ පදනම් බලපෑම මූලිකව හේතු කරගෙන ගුවන් සේවා අංශය වෙත අලෙවි කළ ඉන්ධන ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 34.4%ක වර්ධනයක් වාර්තා කළේය. 2022 වසරේ පළමු කාර්තුව තුළ විදුලි උත්පාදන අංශයෙන් ඉන්ධන සඳහා වන ඉල්ලුම ඉහළ මට්ටමක පැවතිය ද, අඛණ්ඩව සිදු කෙරුණු විදුලි කප්පාදුව හා සමගාමීව ඉන් අනතුරුව ලැබුණු දැඩි වර්ෂාපතනයත් සමඟ ජලාශ මට්ටම් ඉහළ යෑමත් සමඟ ජලවිදුලි උත්පාදනය මත වැඩි වශයෙන් පදනම් වීම හේතුවෙන් 2022 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ විදුලි උත්පාදන අංශයෙන් ඉන්ධන සඳහා පැවති සමස්ත ඉල්ලුම පහත වැටුණි. ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ බලශක්ති උත්පාදනය සඳහා වන ඉන්ධන අලෙවිය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 1.2%ක පහළ යෑමක් වාර්තා කළේය.


රටේ විදේශ විනිමය ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් පැන නැගී ඇති ප්‍රසම්පාදන අවහිරතා හමුවේ, ලං.බ.නී.සං., විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමඟ එක්ව දේශීය වෙළඳපොළෙහි ඉන්ධන නිෂ්පාදිත සැපයුම විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා පියවර කිහිපයක් අනුගමනය කළේය. 2022 වසරේ මාර්තු මාසයේ සිට, ලං.බ.නී.සං., විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමඟ එක්ව ප්‍රධාන ඛනිජතෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් අවස්ථා කිහිපයක දී සංශෝධනය කරන ලද අතර, ඉදිරියේ දී මිල ගණන් නිරන්තරයෙන් සංශෝධනය වන බව ද අඟවන ලදී. තව ද, ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීමට 2022 වසරේ මැයි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවුණු අතර, සුදුසු පිරිවැය පිළිබිඹු කෙරෙන මිල සූත්‍රයක් සහ යාන්ත්‍රණයක් සැකසීම සඳහා කමිටුවක් පත් කරන ලදී. මේ අතර, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් නාවික කටයුතු වෙනුවෙන් ඉන්ධන ලබාදෙන සමාගම් කිහිපයක් සඳහා, ජයා බහාලුම් පර්යන්තයේ තෙල් ගබඩාව හරහා අපනයනකරුවන්ට, බලශක්ති උත්පාදන සමාගම්වලට,

සංචාරක සේවා සපයන්නන්ට, බලපත්‍රලාභී විදුලි සංදේශ සේවා සපයන්නන්ට සහ වෙනත් කර්මාන්තවලට නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා එ.ජ. ඩොලර්වලින් ගෙවීම් සිදු කිරීමේ පදනම මත තෝරාගත් ඉන්ධන නිෂ්පාදිත සැපයීමට අනුමැතිය ලබා දෙන ලදී. 2022 වසරේ ජූලි මාසය ආරම්භයේ දී, ලං.ඛ.නී.සං. විසින් ඉන්ධන මිලදී ගැනීම සඳහා එ.ජ. ඩොලර්වලින් ගෙවීම් සිදු කළ හැකි, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ලියාපදිංචි කළ පුද්ගලයින් සහ සමාගම් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලද අතර, එවැනි පාර්ශ්වයන්ට සහතික කළ ඉන්ධන කෝටාවක් ලබා දෙන ලදී. ලං.ඛ.නී.සං. විසින්, පැවති සීමිත ඉන්ධන තොග ප්‍රවාහන අංශය වෙත නිසි පරිදි සැපයීම සහතික කිරීම සඳහා 2022 වසරේ ජූලි මාසයේ අවසාන භාගයේ සිට වාහන අංක තහඩුවේ අවසාන අංකයට අනුව ලං.ඛ.නී.සං.ට අයත් පිරවුම්හල් හරහා ඉන්ධන නිකුත් කරන ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. පසුව, 2022 වසරේ අගෝස්තු 01 වන දින සිට දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් හරහා, අදාළ කෝටාව අනුව ඉන්ධන නිකුත් කිරීම සඳහා ජාතික ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, 2022 වසරේ ඔක්තෝබර් මාසය ආරම්භයේ දී සංචාරක ඉන්ධන අවසර පත්‍ර පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් එ.ජ. ඩොලර් අගයක් සහිත පෙරගෙවුම් කාඩ්පතක් භාවිතයෙන් දිවයින පුරා පිහිටි පිරවුම්හල් හරහා ඉන්ධන මිලදී ගැනීම සඳහා සංචාරකයින්ට අවස්ථාව හිමි වේ. තවද, ඉන්ධන නිෂ්පාදනය කරන රටවල ස්ථාපිත ඉන්ධන සමාගම්, දේශීය වෙළෙඳපොළ තුළ ඉන්ධන ආනයනය කර විකිණීම සඳහා සහභාගී කරවා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමේ මූලික පියවර ද ක්‍රියාත්මක වෙමින් පවතී. 2022 වසරේ ඔක්තෝබර් මාසයේ මැද භාගයේ දී, 2002 අංක 33 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කිරීම මගින් එවැනි නියාමනය කිරීමේ පියවර සඳහා තවදුරටත් සහයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම පියවර මගින් දේශීය වෙළඳපොළේ ඉන්ධන සැපයුම් ගැටලු විසඳීමට සහ ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ට ප්‍රයෝජනවත් විය හැකි හිතකර වෙළඳපොළ තරගකාරී තත්ත්වයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. ඉදිරියේ දී, මැදි කාලීනව, පෞද්ගලික ප්‍රවාහන අංශයෙන් පැන නගින ඉල්ලුම අඩු කිරීම සඳහා මූලිකව ම පොදු ප්‍රවාහනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වැඩිදියුණු කිරීම් හරහා ඉල්ලුම කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් ඉන්ධන ආනයන වියදම්වලට අදාළ අධික විදේශ විනිමය පිටතට ගලා යෑම වැළැක්වීමට රටට හැකියාව ලැබෙනු ඇත.

> **එලදායි හා තිරසාර ලෙස ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම සහතික කිරීම සඳහා ඛනිජ තෙල් ක්ෂේත්‍රය තුළ ප්‍රතිසංස්කරණ රැසක් ක්‍රියාත්මක කරමින් පැවතිය ද, ඉල්ලුම කළමනාකරණයෙහිලා පොදු ප්‍රවාහන අංශය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍යව ඇත...**

2022 වසරේ මැයි මාසයේ සිට එල්. පී. ගෑස් මිල ගණන්වල කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණ ද, ගෝලීය බලශක්ති මිල ගණන්වල සමස්ත ප්‍රවණතාවට අනුව 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ ගෝලීය වශයෙන් එල්.පී. ගෑස් මිල ගණන්වල සාමාන්‍යය ඉහළ මට්ටමක පැවතුණි. 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ගෝලීය වෙළඳපොළ තුළ එල්.පී. ගෑස් මෙට්‍රික් ටොන් එකක මිලෙහි සාමාන්‍යය (ප්‍රොපේන්:බියුටේන් 30:70 අනුපාතය මත පදනම්ව) එ.ජ. ඩොලර් 954ක් දක්වා ඉහළ ගිය අතර, ගෝලීය පරිභෝජන ඉල්ලුම පහළ යෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී එල්.පී. ගෑස් මෙට්‍රික් ටොන් එකක මිල එ.ජ. ඩොලර් 636ක් දක්වා 33%කින් පමණ පහළ ගියේය. විශේෂයෙන් ම, 2022 වසරේ මුල් භාගය තුළ, විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන්, දේශීය වෙළඳපොළෙහි එල්.පී. ගෑස් සැපයුම වෙත දැඩි ලෙස බාධා ඇති වූ අතර, එය නාගරික සහ අර්ධ නාගරික ප්‍රජාවට විශාල වශයෙන් බලපෑවේය. කෙසේ වෙතත්, මෙම ගැටලුව විසඳීමට ලැබුණු බහුපාර්ශ්වික සහාය සහ විදේශ විනිමය ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද ඉලක්කගත ක්‍රියාමාර්ග මගින් එල්.පී. ගෑස් නිසි කලට ආනයනය කිරීමට පහසුකම්

**3.2 රූප සටහන**
**ගෘහස්ථ එල්.පී. ගෑස් මිල සංශෝධන**




මූලයන්: ලිට්‍රෝ ගෑස් ලංකා සීමිත සමාගම
ලාෆ්ස් ගෑස් පොදු සීමිත සමාගම


සැලසීමටත් එමගින් දේශීය වෙළඳපොළෙහි එල්.පී. ගෑස් සැපයුම සාමාන්‍ය තත්ත්වයට පත් කිරීමටත් උපකාරී විය. මේ අතර, පිරිවැය පිළිබිඹු කෙරෙන දේශීය මිල ගණන් පැවතීම සහතික කිරීම සඳහා 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ දී එල්.පී. ගෑස්වල දේශීය මිල ගණන් අවස්ථා කිහිපයක දී සංශෝධනය කරන ලදී. ඒ අනුව, ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම විසින් දේශීය මිල ගණන් 2022 වසරේ අප්‍රේල් සහ ජූලි මාසවල දී ඉහළ නංවනු ලැබූ අතර, ඉන්පසුව 2022 වසරේ අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල දී අවස්ථා තුනක දී මිල ගණන් පහළ දැමීය. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම අනුගමනය කරමින්, ලාෆ්ස් ගෑස් පොදු සමාගම ද මාර්තු සහ ජූනි මාසවල දී අවස්ථා දෙකක දී දේශීය මිල ගණන් ඉහළ නැංවූ අතර, පසුව 2022 වසරේ අගෝස්තු සහ ඔක්තෝබර් මාසවල දී දෙවරක් මිල ගණන් පහළ දැමීමට කටයුතු කළේය.

### විදුලිබලය

විශේෂයෙන් ම තාප විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය වන ඉන්ධන සහ ගල් අඟුරු සැපයුමට සිදු වූ අවහිරතාවල බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්ත විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 10,744ක් දක්වා 3.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ යෑමක් වාර්තා කළේය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ජල, ඉන්ධන, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් තුළින් සමස්ත විදුලිබල උත්පාදනයට දක්වන ලද දායකත්වය, පිළිවෙළින්, 29%, 20%, 35% සහ 17%ක් විය. දේශීය වෙළඳපොළ තුළ පැවති විදේශ විනිමය අර්බුදය සහ ගෝලීය බලශක්ති භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හමුවේ, බලශක්ති උත්පාදනය සඳහා ඉන්ධන සහ ගල් අඟුරු සැපයුම සීමා වීමත් සමඟ ඉල්ලුම කළමනාකරණ උපාය මාර්ගයක් ලෙස ලං.වි.ම. විසින් 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට දෛනිකව විදුලි කප්පාදු කිරීම සිදු කරන ලදී. ඉන්ධන මිලදී ගැනීමේ දැඩි අසීරුතාවය සහ ජලාශවල ජල මට්ටම් පහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන්, 2022 වසරේ මාර්තු මාසය අවසන් වන විට විදුලිය සැපයීම විසන්ධි කිරීමේ කාලය දිනකට පැය 10කට වඩා වැඩි වූ අතර, එය දැඩි විදුලිබල හා බලශක්ති අර්බුදයකට මග පෑදුවේය. කෙසේ වෙතත්, ඉන්ධන හිඟය හේතුවෙන් ඉන්ධන මත පදනම් වූ බලාගාර කිහිපයක් මෙන්ම, නියමිත නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සඳහා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ඒකක නිතර වැසී යෑම හමුවේ, 2022 වසරේ මැයි, ජූනි සහ අගෝස්තු මාසවල දී පැවති දැඩි වර්ෂාපතන තත්ත්වය සහ ඉන් අනතුරුව ඔක්තෝබර් මාසයේ දී අඛණ්ඩව ලැබුණු මෝසම් වර්ෂාව ජල විදුලිබල උත්පාදනය වෙත වැඩි වශයෙන් යොමුවීම සඳහා උපකාරී විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ ඔක්තෝබර් මාසය මැද භාගය වන විට දෛනික විදුලි විසන්ධි කිරීම පැය එකත් තුනත් අතර කාලයක් දක්වා කෙටි කිරීමට හැකිවිය. කෙසේ වෙතත්, ජල විදුලිබල උත්පාදනය මත අධික ලෙස රඳා පවතින අතර, ඉන්ධන ප්‍රසම්පාදනයට අදාළව අඛණ්ඩව පවතින දුෂ්කරතා සහ ගෝලීය වෙළඳපොළ බලශක්ති මිල ගණන් නිරන්තරයෙන් විචලනයට ලක්වීම හේතුවෙන් ඉදිරි කාලය තුළ විදුලිය සැපයීම අවදානමට ලක්වීමේ හැකියාවක් පවතී.

> **පැවති හිතකර කාලගුණික තත්ත්වයන් පසුගිය මාසවල දී විදුලිය විසන්ධි කිරීමේ කාල සීමාව අඩුකිරීමට උපකාරී වුව ද, ඉන්ධන ප්‍රසම්පාදනයේ දුෂ්කරතා, උච්චාවචනය වන බලශක්ති මිල ගණන් සහ ජල විදුලි උත්පාදනය මත විශාල වශයෙන් රඳා පැවතීම හේතුවෙන් විදුලිය සැපයීම අවදානමට ලක්ව ඇත...**

**3.3 රූප සටහන**
**විදුලිබල උත්පාදන සංයුතිය**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

වසර අටක කාලයකට පසුව, විදුලිබල අංශයේ ඉහළ යන පිරිවැය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2022 වසරේ අගෝස්තු මාසයේ 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි විදුලිය ගාස්තු ඉහළ නංවන ලදී. ඒ අනුව, විදුලි උත්පාදනය සඳහා වැය වන පිරිවැය සමග බොහෝ දුරට අනුකූල වන පරිදි විදුලිය ගාස්තු සාමාන්‍ය වශයෙන් 75%කින් වැඩි කළ අතර, ගාස්තු සංශෝධන මගින්

අඩු ආදායම්ලාභී පවුල් ඒකක මත ඇතිවන බලපෑම පිළිබඳව නිසි අවධානය යොමු කරමින් ස්ථාවර ගාස්තු සංශෝධනය කරන ලදී. දිගුකාලයක් මුළුල්ලේ අවශ්‍යව පැවති විදුලිය ගාස්තු සංශෝධනයෙහි ප්‍රතිඵලයක් ලෙස, ඉදිරි කාලසීමාව තුළ ලං.වි.ම.යේ මූල්‍ය තත්ත්වය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එම අරමුණු සාක්ෂාත් කරගත හැක්කේ මිල සංශෝධනවලට සමගාමීව මූල්‍ය හා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කෙරෙන, අවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම හරහා පමණි. මේ සම්බන්ධයෙන්, දීර්ඝ කාලයක් මුළුල්ලේ ක්‍රියාවට නැංවිය යුතුව තිබූ ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇති අතර, 2002 අංක 28 දරන විදුලිබල ප්‍රතිසංස්කරණ පනත මගින් දැනටමත් සකස් කර ඇති ප්‍රතිසංස්කරණවල විෂය පථය මෙන්ම, ආයතනික රාමුව පිළිබඳ සමාලෝචනය කිරීමට සහ සුදුසු ආයතනික රාමුවක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කරන ලදී. මේ අතර, බලශක්ති උත්පාදනය සඳහා උපයෝගී කර ගත හැකි සූර්ය, සුළං, භූ තාප සහ සාගරය ආශ්‍රිතව පවතින උදම් රළ වැනි විශාල ස්වභාවික සම්පත් ශ්‍රී ලංකාව සතුව තිබීම සැලකිල්ලට ගනිමින්, විදුලිබල උත්පාදන සංයුතිය සඳහා පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමෙන් ලැබෙන දායකත්වය සහතික කිරීම සඳහා සාමූහික උත්සාහයන් අවශ්‍ය වේ. ගෝලීය බලශක්ති වෙළඳපොළ තුළ පවතින විචලනයන් සහ විදුලිය සඳහා වන ඉහළ යන දේශීය ඉල්ලුම මධ්‍යයේ මැදි කාලීනව රටේ බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ යාන්ත්‍රණයන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග ද වැදගත් වේ.

> **ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා විධිමත් ලෙස විදුලිය ගාස්තු සංශෝධන කිරීම, ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, සහ කාලීනව යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යන ක්‍රියාමාර්ග අත්‍යාවශ්‍ය වේ...**

### 3.2 අනෙකුත් ආර්ථික යටිතල පහසුකම්වල ප්‍රගතිය

#### ප්‍රවාහන අංශය


2022 වසරේ පළමු භාගය තුළ, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම.) මගින් ධාවනය කළ බස් රථවල මගී කිලෝමීටර ගණන සහ ධාවන කිලෝමීටර ගණන, පිළිවෙළින්, 86.3%ක සහ 27.9%ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ ද, ඉන්ධන හිඟය හමුවේ නියමිත වේලාවට ඉන්ධන ලබා ගැනීමට අපහසු වීම හේතුවෙන් 2022 වසරේ පළමු භාගය තුළ දී පෞද්ගලික අංශය මගින් ධාවනය කළ බස් රථවල මගී කිලෝමීටර් ගණන සහ ධාවන කිලෝමීටර ගණන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, 34.3%කින් සහ 30.5%කින් පහළ ගියේය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, ඉන්ධන මිල ගණන් ඉහළ යෑමට අනුකූලව, 2022 වසරේ මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල දී, පිළිවෙළින්, 15%ක්, 35%ක් සහ 19%ක් ලෙස ප්‍රධාන වශයෙන් අවස්ථා තුනක දී බස් ගාස්තු ඉහළ නංවන ලද අතර, 2022 වසරේ අගෝස්තු මාසයේ දී ඉන්ධන මිල ගණන් පහළ යෑමට අනුරූපීව බස් ගාස්තු 11%කින් පහළ දමන ලදී. තවද, 2022 වසරේ පළමු භාගයේ දී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ඇස්තමේන්තුගත මගී කිලෝමීටර් ගණන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 138.4%කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, භාණ්ඩ කිලෝමීටර් ගණන, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 6.4%කින් පහළ ගියේය. මේ අතර, මගී, භාණ්ඩ සහ තැපැල් ප්‍රවාහනය සඳහා වන දුම්රිය ගාස්තු වසර හතරකට පමණ පසුව 2022 වසරේ ජූලි මාසයේ 12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහළ නංවන ලදී.

2022 වසරේ පළමු භාගය තුළ දී, ශ්‍රීලංකන් ගුවන් සේවයේ මගී කිලෝමීටර් ගණන කිලෝමීටර් බිලියන 5.0ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 743.3%කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ගුවන් ගමන් කටයුතු සැලකිය යුතු ලෙස පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ දක්නට ලැබුණු පහළ පදනම් බලපෑම මේ සඳහා බොහෝ දුරට හේතු වී ඇත.

#### වරාය සේවා

2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වරාය ක්‍රියාකාරකම් පහළ යෑමක් වාර්තා කළේය. වසරේ පළමු කාර්තුව තුළ හිතකර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ ද, ආනයන සීමා හේතුවෙන් දේශීය ආනයන පරිමාව පහළ යෑම මෙන්ම, කාලපරිච්ඡේදයේ අවසාන භාගය තුළ උත්සන්න වූ වත්මන් ආර්ථික අර්බුදය හා සම්බන්ධ අවිනිශ්චිතතාවල බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවයක කාලපරිච්ඡේදය තුළ වරාය ක්‍රියාකාරකම් සමස්තයක් ලෙස පහළ ගියේය. ඒ අනුව, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය

**3.4 රූප සටහන**
**වරාය සේවා ක්‍රියාකාරීත්වය**




මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සමස්ත බහාලු මෙහෙයුම් සහ භාණ්ඩ හැසිරවීම්, පිළිවෙළින්, 2.5%ක සහ 4.7%ක සෘණ වර්ධන වේගයන් වාර්තා කළ අතර, නැව් පැමිණීම් 5.7%කින් පහළ ගියේය. 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී ලං.ව.අ.) (ජය බහාලුම් පර්යන්තය, යුනිටි බහාලුම් පර්යන්තය සහ නැගෙනහිර බහාලුම් පර්යන්තයේ පළමු තොටුපොළ බැම්ම ඇතුළත්) සහ දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (ද.ආ.පි.ප.) විසින් සිදු කළ බහාලු මෙහෙයුම්, පිළිවෙළින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 9.0%කින් සහ 1.9%කින් පහළ ගිය අතර, කොළඹ ජාත්‍යන්තර බහාලු පර්යන්තයෙහි (කො.ජා.බ.ප.) බහාලු මෙහෙයුම්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 1.7%ක වර්ධනයක් වාර්තා කළේය. මෙහෙයවනු ලැබූ සමස්ත බහාලු ධාරිතාව සඳහා කො.ජා.බ.ප., ශ්‍රී ලං.ව.අ. සහ ද.ආ.පි.ප. පිළිවෙළින්, 46%ක, 29%ක සහ 25%ක දායකත්වයක් සැපයීය. තවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී දේශීය රථ වාහන මෙහෙයුම් පහළ ගිය ද, ප්‍රතිනැව්ගත කිරීම්වලට අදාළ සඳහා රථ වාහන මෙහෙයුම් ඉහළ යෑම හේතුවෙන්, හම්බන්තොට වරායේ සමස්ත රථ වාහන මෙහෙයුම් ප්‍රමාණය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 4.2% වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, නැගෙනහිර බහාලුම් පර්යන්තයේ දෙවන අදියරට අදාළ ඉදිකිරීම් කටයුතු 2022 වසර මුලදී ආරම්භ කරන ලද අතර, විවිධ බලපත්‍ර සහ අනුමැති ලබා ගැනීම්, සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම ඇතුළුව බටහිර බහාලුම් පර්යන්තයට අදාළ මූලික කටයුතු ද මෙම කාලපරිච්ඡේදය තුළ දී ක්‍රියාත්මක විය. තවද, ගාලු වරාය කලාපීය වාණිජ වරායක් ලෙස සිදු කරන මෙහෙයුම්වලට සමගාමීව, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත වරායක් ලෙස ද සංවර්ධනය කිරීමට අදාළ අභිමතය විමසීමේ යෝජනා ඇගයීමට ලක් කිරීම ද සිදු කෙරිණි.


### නාගරික සංවර්ධනය

කොළඹ වරාය නගර ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම් 2022 වසරේ පළමු භාගයේ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒ අනුව, සමස්ත ව්‍යාපෘතිය සඳහාම අදාළ සංවර්ධන පාලන නියාමන මාලාව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ගැසට් කරන ලද අතර, තීරුබදු රහිත සාප්පු සංකීර්ණයෙහි (Downtown Duty-Free Mall) යටිතල පහසුකම් ඉදි කිරීම් සම්පූර්ණ කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශය සමග එකඟතාවයකින් යුතුව, අදාළ සියලු නියාමන සහ පූර්ව මෙහෙයුම් අවශ්‍යතාවලට අනුකූලව මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා රාජ්‍ය බැංකු දෙකක් ඇතුළු බැංකු හතරක් සඳහා බලපත්‍ර අනුමත කරන ලදී. ආර්ථික අර්බුදය තවදුරටත් අයහපත් වෙමින් පැවතිය ද, කොළඹ වරාය නගරය ආකර්ෂණීය මූල්‍ය මධ්‍යස්ථානයක් සහ ජාත්‍යන්තර මට්ටමේ නගරයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ පූර්වෝපායික ප්‍රයත්නයන්, විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමෙහිලා වඩාත් අත්‍යාවශ්‍යව පවතී. තවද, 2022 වසරේ සැප්තැම්බර් මාසයේ මැද භාගයේ සිට කොළඹ නෙළුම් කුලුන මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කළ අතර, මෙම පරිශ්‍රය තුළ විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීමට පෞද්ගලික ආයෝජකයින් කිහිප දෙනෙකු සමග සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය හමුවේ, රජයේ ව්‍යාපෘති ගණනාවක කටයුතු දැනට ඇණහිට ඇති බැවින්, හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීම උදෙසා රටේ යටිතල පහසුකම් පදනම ඵලදායි හා කාර්යක්ෂම ලෙස තවදුරටත් පුළුල් කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් යටතේ නව යටිතල පහසුකම් ව්‍යාපෘති සහ දැනට ක්‍රියාත්මක යටිතල පහසුකම් ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට රජය විසින් පූර්වෝපායික වශයෙන් ප්‍රයත්න දැරීම අත්‍යවශ්‍ය වේ.

### විදුලි සංදේශ සේවා

කොවිඩ්-19 වසංගත කාලපරිච්ඡේදය තුළ රැකියා, අධ්‍යාපනය සහ අනෙකුත් දෛනික කටයුතු සඳහා අන්තර්ජාලය භාවිතයට වැඩි වශයෙන් අනුවර්තනය වීමත්, 2022 වසරේ මේ දක්වා කාලය තුළ දක්නට ලැබුණු ප්‍රවාහන කටයුතුවල ඇති වූ අවහිරතා මධ්‍යයේ ද මෙම අනුගතවීම් නොකඩවා පැවතීමත් පෙන්නුම් කරමින්, 2022

**3.5 රූප සටහන**
**බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය**




සටහන: පෙටාබයිට් 1 = ගිගාබයිට් මිලියන 1


මූලයන්: ඩයලොග් ඇක්සියාටා පොදු සීමිත සමාගම
ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගම
මොබිටෙල් (පෞද්) සමාගම
භාර්ති එයාර්ටෙල් ලංකා (පෞද්) සමාගම

වසරේ පළමු භාගය තුළ විදුලි සංදේශ අංශය අඛණ්ඩව පුළුල් විය. 2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2022 වසරේ පළමු භාගය තුළ දී සමස්ත අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව සහ බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය, පිළිවෙළින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 9.1%කින් සහ 24.4%කින් වර්ධනය විය. තවද, 2022 වසරේ පළමු භාගය තුළ දී ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව සහ ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව, පිළිවෙළින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 5.6%කින් සහ 1.8%කින් ඉහළ ගියේය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය (2021-2024) යටතේ සිය ක්‍රියාමාර්ග අඛණ්ඩව කරගෙන යන ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් *ගමට සන්නිවේදනය* ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා ඩිජිටල් සේවාවන් වෙත බාධා වලින් තොර ප්‍රවේශයක් සහතික කිරීම උදෙසා, දීප ව්‍යාප්ත සිව්වන පරම්පරාවේ (4G) සම්බන්ධතා ආවරණය වැඩිදියුණු කිරීම සඳහා වන විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රයත්නයන් අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ තවත් ප්‍රමුඛ පෙළේ පෞද්ගලික අංශයේ විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ සමාගම් දෙකක් විසින් සංවර්ධනය කරන ලද ජාතික ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය ක්‍රියාවට නැංවීම, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් විය. එමෙන්ම, ජාතික ඉන්ධන අවසර පත්‍ර කේත ක්‍රමය හඳුන්වාදීම මගින්, අනෙකුත් පොදු සේවාවන් කිහිපයක් මේ හා සමාන ක්‍රමවේදයක් වෙතට යොමුකිරීම සඳහා මග පෑදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, 2022 වසරේ මාර්තු මාසයේදී 2022 අංක 09 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත නීතිගත කිරීමත් සමග විස්තීර්ණ දත්ත ආරක්ෂණ නීති සම්පාදනය කළ පළමු දකුණු ආසියානු රට බවට ශ්‍රී ලංකාව පත් විය. මේ අතර, මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ 05 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර්ජාල, දුරකථන සහ මුදල් ගෙවා නරඹන රූපවාහිනී සේවා ගාස්තු ඉහළ නංවන ලද අතර, 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම හේතුවෙන් 2022 වසරේ ඔක්තෝබර් 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙම ගාස්තු නැවත වරක් ඉහළ නැංවිණි.

### ජල සම්පාදනය

2022 වසරේ පළමු භාගය අවසන් වන විට සමස්ත නල ජල පහසුකම් ආවරණය 55.4%ක් වූ අතර, ශ්‍රී ලංකාවේ පිරිසුදු පානීය ජලය සඳහා වන ප්‍රවේශය ජනගහනයෙන් 95.5%ක් විය. දශකයකට ආසන්න කාලයක් පුරා ජල ගාස්තු වල සංශෝධනයක් සිදු නොවීම මධ්‍යයේ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පිරිවැය වැඩිවීම සහ ඒ ආශ්‍රිතව සිදු වූ මූල්‍ය අලාභ සැලකිල්ලට ගනිමින්, 2022 වසරේ සැප්තැම්බර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ජල හා ජලාපවහන ගාස්තු ඉහළ නැංවීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලැබිණි. ඒ අනුව, සියලුම කාණ්ඩ සඳහා අදාළ වන ජල ගාස්තු සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලද අතර, ගෘහ ඒකක සඳහා අය කෙරෙන පරිභෝජන ජල ගාස්තුවල සිදු වූ ඉහළ යෑම 70%ක් පමණ විය. කෙසේ වෙතත්, පාසල්, ආගමික සහ පුණ්‍ය ආයතන සඳහා අදාළ වන ගාස්තු මෙන්ම සමෘද්ධිලාභීන් ඇතුළුව අඩු ආදායම්ලාභී

**3.6 රූප සටහන**
**ජල සැපයුම් තත්ත්වය**




මූලය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

පාරිභෝගිකයින්ට අදාළ වන ගාස්තු බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි. තවද, 2022 ඔක්තෝබර් 17 වන දින සිට බලපැවැත්වෙන පරිදි නව ජල සබඳතා සඳහා අයකරනු ලබන ගාස්තු ද ඉහළ නැංවිණි. මේ ආකාරයෙන් සිදුකළ ජල ගාස්තු හා අනෙකුත් ගාස්තු සංශෝධනයන් සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මැදි කාලීනව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තිරසාර බව සහතික කිරීම සඳහා පූර්ව නිශ්චිත කාල පරාස තුළ ජල ගාස්තු සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක් වෙත යොමුවීම සහතික කිරීම ද අවශ්‍ය වනු ඇත.

### 3.3 සමාජ යටිතල පහසුකම්වල ප්‍රගතිය

#### සෞඛ්‍ය


2022 වසරේ ඔක්තෝබර් මාසය අවසානය වන විට, රට තුළ කොවිඩ්-19 ව්‍යාප්ත වීම බොහෝ දුරට පාලනය වී තිබිණි. 2021 වසර අවසානයේ දී *ඔමික්‍රෝන්* ප්‍රභේදය හඳුනා ගැනීමෙන් පසුව, 2022 වසරේ අප්‍රේල් මාසය අවසානය දක්වා කාලසීමාව තුළ කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාවේ අඛණ්ඩ ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, 2022 වසරේ ජූලි මාසයෙන් අනතුරුව වාර්තා වන කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව ක්‍රමයෙන් පහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ දෙවන කාර්තුව තුළ කොවිඩ්-19 සම්බන්ධව පනවා තිබූ සීමාවන් සහ මාර්ගෝපදේශ කිහිපයක් ලිහිල් කරන ලදී. කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස පහත වැටීම හේතුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2022 වසරේ ජූනි මාසයේ 10වන දින මුහුණු ආවරණ පැළඳීමේ අනිවාර්ය අවශ්‍යතාවය ලිහිල් කරන ලදී. කෙසේ වෙතත්, *ඔමික්‍රෝන්.බීඒ.5* නව ප්‍රභේදය වර්ධනය වීමත් සමඟ, වෛරසයෙහි ව්‍යාප්තිය 2022 වසරේ ජූලි මාසයේ මැද භාගය වන විට තීව්‍ර වූවත්, පසුව කොවිඩ්-19 එන්නතේ දෙවන වර්ධක මාත්‍රාව ලබා ගැනීම ඉහළ යෑම හා සමගාමීව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ මැද භාගය වන විට වෛරසයේ ව්‍යාප්තිය පහළ ගියේය. 2022 වසරේ ඔක්තෝබර් මාසයේ මැද භාගය වන විට, ශ්‍රී ලංකාව තුළ තහවුරු කරන ලද කොවිඩ් රෝගීන් සංඛ්‍යාව 670,918ක් ලෙසත් වෛරසය හේතුවෙන් මියගිය සංඛ්‍යාව 16,769ක් ලෙසත් වාර්තා වූ අතර, වයස අවුරුදු 12ට වැඩි ජනගහනයෙන් එක් එන්නත් මාත්‍රාවක් හෝ ලබා ගත් සංඛ්‍යාව ජාතික මට්ටමින් 97.0%ක් වූ අතර, එන්නත් මාත්‍රා දෙකක මූලික අවශ්‍යතාව සම්පූර්ණ කළ සංඛ්‍යාව 83.2%ක් විය. මූලික එන්නත් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති පුද්ගලයින් අතරින් 55.7%ක් පළමු වර්ධක මාත්‍රාව ලබාගෙන ඇති අතර, පළමු වර්ධක මාත්‍රාව සම්පූර්ණ ඇති පුද්ගලයින් අතරින් 2.4%ක් දෙවන වර්ධක මාත්‍රාව ලබා ගෙන ඇත. දෙවන වර්ධක මාත්‍රාවක් ලබා දීමේ කටයුතු 2022 වසරේ මැයි මාසයේ දී ආරම්භ කරන ලදී. මූලික වශයෙන්, දීප ව්‍යාප්ත පාසල් පාදක වැඩසටහනක් ලෙස 2022 වසරේ ජනවාරි මාසයේ සිට වයස අවුරුදු 12ට වැඩි දරුවන්ට වර්ධක එන්නත් මාත්‍රාව ලබාදීමට පියවර ගෙන ඇත. විශේෂයෙන් ම, ශ්‍රී ලංකාව සාපේක්ෂ වශයෙන් දකුණු ආසියාව තුළ වැඩිම කොවිඩ්-19 එන්නත් ආවරණයක් සහිත රට වන අතර, එන්නත් කිරීමේ ප්‍රතිශතය ද ගෝලීය සාමාන්‍යයට වඩා ඉහළ මට්ටමකින් පවතී.

> **දශක කිහිපයක් පුරා සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පැවති සාධනීය තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා දේශීය ඖෂධ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රසම්පාදනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නිසි ක්‍රියාමාර්ග අත්‍යාවශ්‍ය වන අතර, සීමිත විදේශ සංචිත වෙන් කිරීමේදී සෞඛ්‍ය අංශයට අඛණ්ඩව ප්‍රමුඛත්වය ලබා දීම අත්‍යවශ්‍ය වේ...**

කෙසේ වෙතත්, 2022 වසර තුළ දී තවදුරටත් උත්සන්න වූ ඩෙංගු වැනි බෝවන රෝගවලින් රට අඛණ්ඩව පීඩාවට පත් විය. වසරේ මුල් භාගය තුළ පළිබෝධනාශක සහ ඉන්ධන හිඟය හේතුවෙන් ඩෙංගු වැළැක්වීමේ ක්‍රියාමාර්ග කෙරෙහි ඇති වූ අයහපත් බලපෑම පිළිබිඹු කරමින්, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ 9,448ක ඩෙංගු රෝගීන් සංඛ්‍යාවට සාපේක්ෂව 2022 වසරේ ජූනි මාසය වන විට රෝගීන් සංඛ්‍යාව 35,424ක් ලෙස වාර්තා වී ඇත. තවද, පිට රටකදී මැලේරියාව වැළඳීමෙන් පසුව ශ්‍රී ලංකාවේ දී හඳුනාගත් මැලේරියා රෝගීන් සංඛ්‍යාව, 2021 වසර තුළ දී වාර්තා වූ රෝගීන් 26ට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසයේ සිට ජූලි මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ දී රෝගීන් 25ක් ලෙස වාර්තා විය. විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය මධ්‍යයේ, සෞඛ්‍ය ක්ෂේත්‍රය ඖෂධ සහ අනෙකුත් වෛද්‍ය සැපයුම් ගණනාවක හිඟතාවකට අඛණ්ඩව මුහුණ දීම හේතුවෙන්, විශේෂයෙන් ම, දුප්පත් සහ ජනගහනයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා අවශ්‍ය වන ඖෂධ සහ අනෙකුත් වෛද්‍ය සේවාවන් ඇතුළු අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සැපයීම් සීමා කිරීමට සිදුවිය. රජයේ සාර්ථක සහ වේගවත් එන්නත්කරණ වැඩසටහන මගින් අනාගතයේ දී කොවිඩ්-19 පැතිරීමේ අවදානම

**3.7 රූප සටහන**

**කොවිඩ්-19 රෝගීන් සහ මරණ සංඛ්‍යාව (2022 ඔක්තෝබර් 15 දිනට)**





දෛනිකව වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව
දෛනිකව වාර්තා වූ මරණ සංඛ්‍යාව (දකුණු අක්ෂය)

මූලය: සෞඛ්‍ය අමාත්‍යාංශය

**3.8 රූප සටහන**

**වර්ධක මාත්‍රාව ලබාදීමේ ප්‍රගතිය (2022 ඔක්තෝබර් 15 දිනට)**




පළමු වර්ධක මාත්‍රාව
දෙවන වර්ධක මාත්‍රාව (දකුණු අක්ෂය)

මූලය: සෞඛ්‍ය අමාත්‍යාංශය

බොහෝ සෙයින් වළක්වා ඇතත්, රට තුළ පවතින වෛද්‍ය සහ ඖෂධ සැපයුම් හිඟය මධ්‍යයේ ඕනෑම අවස්ථාවක දී වෛරසයේ නව සහ ප්‍රබල ප්‍රභේදයක් ඉස්මතු වුවහොත් එමගින් දැනට පවතින සෞඛ්‍ය සේවා සැපයුම් සැලකිය යුතු ලෙස අඩාල වීමට ඉඩ ප්‍රස්ථාව ඇත. මෙවැනි තත්ත්වයක් තුළ, සෞඛ්‍ය ක්ෂේත්‍රය සහ ජනගහනයේ සෞඛ්‍ය තත්ත්වය සහතික කිරීමෙහිලා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති හැකියාව සුරක්ෂිත කිරීම සඳහා, දේශීය වශයෙන් ඖෂධ සහ අනෙකුත් වෛද්‍ය සැපයුම් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් ආයෝජන අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීම මෙන්ම, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව වැඩි දියුණු කරමින්, සීමිත විදේශ සංචිත වෙන් කිරීමේ දී සෞඛ්‍ය අංශයට අඛණ්ඩව ප්‍රමුඛත්වය ලබා දීම අත්‍යවශ්‍ය වේ.

### අධ්‍යාපනය

2021 වසරේ දී කොවිඩ්-19 වසංගතය හේතුවෙන් වරින්වර වසා දැමීමෙන් අනතුරුව, පාසල් සහ විශ්වවිද්‍යාල 2022 වසර ආරම්භයේ දී නැවත විවෘත කළ ද, ඉන්ධන හිඟය සහ විදුලිය කප්පාදු කිරීම් හේතුවෙන් 2022 වසරේ දෙවන කාර්තුවේ මුල් භාගයේ දී අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යෑම සඳහා නැවත බාධා සිදු විය. ඉන්ධන අර්බුදය මධ්‍යයේ ඇති වූ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ජූනි මාසයේ මැද භාගයේ සිට අධ්‍යාපන කටයුතු නැවත වරක් මංගත ක්‍රමවේද හරහා සිදු කරන ලදී. ඉන්ධන සැපයීමට අදාළ ගැටලු යම්තාක් දුරකට සමනය වීමත් සමඟ, 2022 වසරේ ජූලි මාසයේ අවසන් සතියේ සිට මිශ්‍ර ඉගෙනුම් ක්‍රම හරහා අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කරන ලද අතර, 2022 වසරේ අගෝස්තු මාසයේ මැද භාගයේ සිට සාමාන්‍ය පරිදි භෞතික වශයෙන් අධ්‍යයන කටයුතු සිදු කිරීම පූර්ණ වශයෙන් නැවත ආරම්භ කරන ලදී. මංගත ක්‍රමවේද හරහා සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යෑම සහතික කිරීම සඳහා වන අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ කැපවීම ඉතා ප්‍රශංසනීය වුවද, කුටුම්භ විසින් මුහුණදෙන ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ බොහෝ දුරට තාක්ෂණය ආශ්‍රිත යටිතල පහසුකම් වෙත ප්‍රවේශ වීම සඳහා පවතින විෂමතා හේතුවෙන්, ඉගෙනුම් ප්‍රතිඵලවල පවතින අසමානතා උග්‍ර කිරීමට මෙවැනි මංගත අධ්‍යාපන ක්‍රියාකාරකම් හේතු විය හැකි බව මනා ලෙස හඳුනා ගැනීම වැදගත්ය. තවද, ආහාර අනාරක්ෂිතතා ගැටලු හේතුවෙන් අවදානමට ලක්විය හැකි කුටුම්භ අතර ඉගෙනුම් ප්‍රතිඵලවල දුර්වලතා වර්ධනය වීමට ද ඉඩ ඇත. 2020 වසරේ සිට අධ්‍යයන කටයුතුවලට විවිධ බාධා ඇති වූවත්, රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ සෑම මට්ටමකම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල කෙරෙහි ඇති වූ බලපෑම හඳුනා ගැනීම සඳහා, දීප ව්‍යාප්තව ක්ෂුද්‍ර මට්ටමේ විධිමත් තක්සේරුවක් තවමත් සිදු කළ යුතුව ඇත. විභාග සඳහා ආවරණය කෙරෙන විෂය නිර්දේශයට අදාළව, සැලකිය යුතු සහනයක් ලබාදීමකින් තොරව සහ ඇගයීම් ක්‍රමවල කිසිදු වෙනසක් නොමැතිව 2021 වසරේ පැවැත්වීමට නියමිතව තිබූ සියලුම ජාතික මට්ටමේ විභාග, 2022 වසරේ මුල් භාගයේ දී රජය විසින් අඛණ්ඩව පවත්වන ලදී. කෙසේ වෙතත්, 2022 වසර සඳහා පැවැත්වීමට නියමිත ප්‍රධාන ජාතික මට්ටමේ විභාග කිහිපයක් 2023 වසර දක්වා කල් දමා ඇත. අධ්‍යාපන ක්‍රමයේ සියලුම පාර්ශ්වකරුවන් සෑම අංශයකින්ම මුහුණ දෙන අභියෝග ගණනාවක් සැලකිල්ලට ගනිමින් නව්‍ය හෝ වඩාත් සුදුසු

ඇගයීම් ක්‍රම අනුගමනය කරනවා වෙනුවට, මෙවැනි අයුරින් විභාග කල් දැමීම මගින්, කෙටි කාලීනව සිසුන්ගේ අධ්‍යයන ප්‍රගතියට බාධා ඇති කරනවා පමණක් නොව,

> **පසුගිය වසර දෙක තුන තුළ ඉගෙනුම් කටයුතු සැලකිය යුතු ලෙස අඩාල වූ සිසුන්ගේ ඉගෙනුම් මට්ටම් වඩාත් යෝග්‍ය ලෙස තක්සේරු කළ හැකි නව අධ්‍යයන ඇගයීම් ක්‍රම අනුගමනය කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී...**

එය අධ්‍යාපන ක්‍රමයේ සඵලතාව සහ ඵලදායී මානව ප්‍රාග්ධන පදනමක් නිර්මාණය කිරීමේ දිගුකාලීන අරමුණ සාක්ෂාත් කර ගැනීමට ඇති හැකියාවට ද බාධා ඇති කරයි. මෙම ජාතික මට්ටමේ විභාග මගින් උසස් අධ්‍යාපනය සහ රැකියා අවස්ථා ආදිය සම්බන්ධයෙන් ජීවිත කාලය පුරා පවතින බලපෑම් ඇති කරනු ලබයි. ඒ අනුව, පසුගිය වසර තුන තුළ දී ඉගෙනුම් ක්‍රියාවලි සැලකිය යුතු ලෙස අඩාල වූ සිසුන්ගේ අධ්‍යයන මට්ටම මෙම විභාගවලින් නිසි ලෙස තක්සේරු නොවන බැවින්, මෙතරම් දීර්ඝ අර්බුදකාරී කාලපරිච්ඡේදයක් තුළ අධ්‍යයන ඇගයීම් ක්‍රම ප්‍රමාණවත් ලෙස වෙනස් නොවීම ගැටලුකාරී තත්ත්වයක් උද්ගත කරයි. සිසුන් මුහුණදෙන ලද අභියෝගවල දිගුකාලීන ස්වභාවය සහ ඒවායේ බලපෑම් සැලකිල්ලට ගනිමින් පසුගිය වසර තුන තුළ අහිමි වූ ඉගෙනුම් අවස්ථා සිසුන්ට යළි ලබා දීමට පමණක් නොව මෙම අභියෝගාත්මක තත්ත්ව සැලකිල්ලට ගනිමින් සාධාරණ ඇගයීම් ක්‍රියාවලියක් සහතික කළ හැකි විස්තීර්ණ ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමට රජය පියවර ගත යුතුය.

### දිළිඳුකම සහ සමාජ ආරක්ෂණ ජාල


2012/13 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකසන ලද යාවත්කාලීන කළ නිල දරිද්‍රතා රේඛාවට අනුව, 2019 වසරේ දී දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන ජනගහනය 14.3%ක් විය. ඒ අනුව, යාවත්කාලීන කරන ලද දරිද්‍රතා රේඛාවට පහළින් පුද්ගලයන් මිලියන 3.04ක් ජීවත් වන අතර මෙය 2002 වසරේ දී දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන බවට ඇස්තමේන්තු කළ පුද්ගලයින් සංඛ්‍යාවට වඩා 4.4 ගුණයකින් වැඩිවීමකි. ග්‍රාමීය අංශයේ 15.0%ක් සහ නාගරික අංශයේ 6.0%ක් ලෙස පවතින දරිද්‍රතා මට්ටම් හා සැසඳීමේදී වතු අංශයේ දරිද්‍රතා මට්ටම 33.8%ක් ලෙස වාර්තා වන මෙම නව දත්ත මගින් මෙම ක්ෂේත්‍ර අතර සැලකිය යුතු විෂමතා පවතින බව අඛණ්ඩව අවධාරණය කරයි. 2019 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය අනුව, දළ වශයෙන් ශ්‍රී ලාංකිකයන් හය දෙනෙකුගෙන් එක් අයෙකු දරිද්‍රතාවයට අදාළ බහුවිධ මානයන්ට අනුව දරිද්‍රතාවයෙන් පෙළෙන (Multidimensionally Poor) අතර, එම දරිද්‍රතා ජන කොට්ඨාශය, බර තැබූ එම බහුමාන දර්ශකවලට අනුව සාමාන්‍යයෙන් 42%ක් පමණ විහිනතාවයක් අත්දකින බව ද අනාවරණය වේ. ජාතික බහුමාන ජනගහන දරිද්‍රතා දර්ශක, ග්‍රාමීය අංශයේ 16.6%ක් ලෙස ද, වතු අංශයේ 51.3%ක් ලෙස ද සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතී. වතු අංශයේ ජනතාව ඉහළම මට්ටමේ විහිනතාවයකට මුහුණ දී ඇත. දිස්ත්‍රික්ක අතර, බහුමාන දරිද්‍රතාවයේ පහළම මට්ටම් කොළඹ (3.5%) සහ ගම්පහ (5.1%) යන දිස්ත්‍රික්කවලින් වාර්තා වූ අතර, ඉහළම දරිද්‍රතා අනුපාතය නුවරඑළිය (44.2%) දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. දිස්ත්‍රික්ක අතර සැලකිය යුතු මට්ටමේ විෂමතාවක් පැවතිය ද, ජනගහනය අධික නාගරික ප්‍රදේශවල ජන ඝනත්වය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් බහුමාන වශයෙන් දිළිඳු පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන් හි ඉහළ අගයක් ගත්තේය. කොවිඩ්-19 වසංගතයට පෙර සිටම ජනගහනයෙන් සැලකියයුතු කොටසක් දරිද්‍රතා අවදානමට මුහුණ දෙමින් සිටි බව 2019 වසරේ මෙම දරිද්‍රතා සංඛ්‍යාලේඛන මගින් අවධාරණය කෙරේ. දරිද්‍රතාවය පිළිබඳ වඩාත් මෑතකාලීන ජාතික මට්ටමේ දත්ත අදාළ ආයතනවලින් ලබා ගත නොහැකි වුවද, 2012/13 වසරවල ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික දරිද්‍රතා රේඛාවේ විතැන් වීම මගින් ජනගහනය වර්තමානයේ මුහුණදෙන අවදානම යම් ප්‍රමාණයකට පිළිබිඹු කෙරේ. වසර ගණනාවක් පුරා දිස්ත්‍රික් දරිද්‍රතා රේඛාවල මට්ටමේ විතැන් වීමක් සිදුවී ඇති

> **කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තියට පෙර පවා සෑම ශ්‍රී ලාංකිකයන් හය දෙනෙකුගෙන් එක් අයෙකු බහුවිධ මානයන්ට අනුව දරිද්‍රතාවයෙන් පෙළුණු අතර, එමගින් අවධාරණය කරන්නේ වත්මන් ආර්ථික අර්බුදය මධ්‍යයේ ජනගහනයේ ජීවන තත්ත්වයෙහි සිදුවිය හැකි තියුණු පිරිහීම මැඩපැවැත්වීම සඳහා ඒකාබද්ධ ප්‍රතිපත්තිමය මුලපිරීම්හි අවශ්‍යතාවක් ඇති බවයි...**

අතර, සියලුම ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යෑමත් සමඟ 2022 වසරේ මාර්තු මාසයේ සිට 2022 වසරේ ජූනි මාසය දක්වා කාලය තුළ දරිද්‍රතා රේඛාව සැලකිය යුතු ප්‍රමාණයකින් විතැන් වී ඇත. මෑතකාලීන දරිද්‍රතා රේඛා දත්ත සලකා බැලීමේදී, 2022 වසරේ අගෝස්තු මාසයේ දී ජාතික දරිද්‍රතා රේඛාව රුපියල් 13,460ක් ලෙස පැවති අතර, එය 2021 වසරට සාපේක්ෂව 70.1%ක සැලකිය යුතු ඉහළ යෑමකි. මේ අතර, කිලිනොච්චිය සහ මොණරාගල වැනි ග්‍රාමීය දිස්ත්‍රික්කවල, පිළිවෙළින්, දක්නට ලැබුණු රුපියල් 13,004ක් හා රුපියල් 12,870ක් වූ දරිද්‍රතා රේඛා අගයයන් හා සාපේක්ෂව, නාගරික ප්‍රදේශවල ජීවන වියදම කෙරෙහි උද්ධමනය මගින් ඇති කෙරෙන විෂමාකාර බලපෑම පිළිබිඹු කරමින් කොළඹ, ගම්පහ, කළුතර, කෑගල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් දරිද්‍රතා රේඛාව 2022 වසරේ අගෝස්තු මාසයේ දී රුපියල් 14,000 ඉක්මවා ගියේය.

2020 සහ 2021 වසර පුරා දක්නට ලැබුණු වසංගතයේ බලපෑම් මෙන්ම ජීවනෝපායන් හා යහපැවැත්ම යන දෙඅංශයටම බොහෝ දුරට බලපෑම් සිදු කර ඇති වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන්, ජනගහනය තුළ දරිද්‍රතා මට්ටම ආසන්නයේ සිටින කණ්ඩායම් තුළින් නව දුගී කාණ්ඩයක් නිර්මාණය වීමේ හැකියාවක් පවතී. වර්තමාන ආර්ථික අර්බුදය ගෘහ ඒකකවල මූල්‍ය ස්ථායීතාවට පමණක් නොව ඔවුන්ගේ පෝෂණ තත්ත්වයට ද බලපෑම් ඇති කළ හැකිය. ආහාර හා කෘෂිකර්ම සංවිධානය (Food and Agriculture Organisation) සහ ලෝක ආහාර වැඩසටහන (World Food Programme) විසින් ආහාර අනාරක්ෂිතභාවය පිළිබඳ සිදු කරන ලද පූර්ව අනතුරු ඇඟවීම් තක්සේරුවල දී, උග්‍ර ආහාර අනාරක්ෂිතභාවය තවදුරටත් අයහපත් වීමේ සම්භාවිතාව අවධාරණය කරමින් *කුසගින්නෙන් පෙළෙන රටවල්* (Hunger Hotspot) ලෙස නම් කරන ලද රටවල් 48ක ලැයිස්තුවට ශ්‍රී ලංකාව ද එක් කර ඇත. තවද, වතු, නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ ඇතුළත් වන ලෙස පළාත් නවයම ආවරණය කරමින් සිදු කළ සමීක්ෂණ මත පදනම්ව, 2022 වසරේ අගෝස්තු මාසය අවසානයේ, ලෝක ආහාර වැඩසටහන සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් නිකුත් කරන ලද *භෝග සහ ආහාර සුරක්ෂිතතා තක්සේරු මෙහෙයුමේ වාර්තාව* (Crop and Food Security Assessment Mission) මගින්, දැනටමත් මිලියන 6.3ක ජනතාවක් ආහාර අනාරක්ෂිතභාවයෙන් පෙළෙන බවත් දළ වශයෙන් පුද්ගලයන් තුන් දෙනෙකුගෙන් එක් අයෙකු ආහාර අනාරක්ෂිතභාවයෙන් පෙළෙන බවත් ඇස්තමේන්තු කර ඇත. 2016 වසරේ සිටම මන්දපෝෂණයට අදාළ ගැටලු, විශේෂයෙන් ම වයස අවුරුදු 5ට අඩු ළමුන්ගේ, වයසට සරිලන උස නොතිබීම, කෘෂ බව සහ අඩු බර පිළිබඳ නිල සංඛ්‍යාලේඛන මගින් දැනටමත් අනාවරණය කර ඇති තත්ත්වයක් තුළ, පෝෂණ තත්ත්වයන් සැලකිය යුතු ලෙස අයහපත් වන බව මෙම වාර්තා මගින් අවධාරණය කරයි. පෝෂණ තත්ත්වයට අමතරව, වර්තමාන ආර්ථික අර්බුදය මගින් සෞඛ්‍ය හා අධ්‍යාපන යටිතල පහසුකම් සඳහා වන ප්‍රවේශය සහ ගෘහ ඒකකවල වත්කම් පදනම වැනි කොවිඩ්-19 වසංගතයට පෙර සිට පැවති අනෙකුත් විෂමතා තවදුරටත් අයහපත් කිරීමට ඉඩප්‍රස්ථාව ඇත. මැදි කාලීනව ගෘහ ඒකකයන්හි ඵලදායී ධාරිතාව ආරක්ෂා කර ගැනීමට සහ වැඩිදියුණු කරවීමට සහාය ලබාදීම සඳහා මනාව ඉලක්ක කරගත් ප්‍රමාණවත් සහ ගුණාත්මක මැදිහත්වීම් අතිශයින් වැදගත් වේ.

**3.9 රූප සටහන**
**දිස්ත්‍රික්ක මට්ටමේ නිල දරිද්‍රතා රේඛාව (රුපියල් '000)**




සටහන: ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2013=100) භාවිතා කරමින් මිල වෙනස්කම්වලට ගලපන ලද නිල දරිද්‍රතා රේඛාව ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් මාසිකව ප්‍රකාශයට පත්කෙරේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

> **වත්මන් අර්බුදකාරී වාතාවරණය හමුවේ ජනතාවට ආහාර අනාරක්ෂිතභාවය පමණක් නොව වත්කම් හිමිකාරීත්වය සහ යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය හා සම්බන්ධ වෙනත් ගැටලුකාරී තත්ත්වයන්ගෙන් ද පීඩා විඳීමට සිදු වී තිබේ...**

වත්මන් ආර්ථික අර්බුදයෙන් දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජන කොටස් සඳහා ඇති කෙරෙන බලපෑම අවම කිරීම ඉතා වැදගත් බැවින්, ගෘහ ඒකක කෙරෙහි ඇතිවන පීඩනය අඩු කිරීම සඳහා රජය විවිධ ආකාරයේ ආධාර සැපයීමේ කටයුතුවල නිරතව සිටී. මේ

සම්බන්ධයෙන් සැලකූ විට, බහුපාර්ශ්වික මූල්‍ය ආධාර උපයෝගී කරගනිමින් 2022 වසරේ මැයි සිට දෙසැම්බර් දක්වා වන කාලපරිච්ඡේදය සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන්හට රුපියල් 3,000 සිට රුපියල් 5,000ක් දක්වා දීමනා ලබා දීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හදිසි මුදල් ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. 2022 වසර සඳහා වන අයවැයෙන් යෝජිත පරිදි, 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට ප්‍රතිලාභී පවුලකට ලබා දෙන මාසික සමෘද්ධි සහනාධාර මුදල ද 28%කින් පමණ වැඩි කරන ලදී. ඒ අනුව, එක් පවුලකට රුපියල් 3,500ක්, රුපියල් 2,500ක් සහ රුපියල් 1,500ක් බැගින් වූ පවුල් ඒකක දීමනා, පිළිවෙළින්, එක් පවුලකට රුපියල් 4,500ක්, රුපියල් 3,200ක් සහ රුපියල් 1,900ක් දක්වා ඉහළ නංවන ලදී. වත්මන් ආර්ථික අර්බුදයේ දීර්ඝකාලීන බලපෑම හඳුනා ගනිමින්, සිය ජීවනෝපාය අහිමි වූවන්ට, ගැබිනි මව්වරුන්ට සහ ආහාර අනාරක්ෂිතභාවයෙන් පෙළෙන පවුල්වලට මූල්‍ය ආධාර මෙන්ම, ධීවර කර්මාන්තයේ නියැලී සිටින කුඩා බෝට්ටු හිමියන්ට සහ විදුලිය නොමැති වතුකරයේ ජීවත්වන පුද්ගලයන්ට භූමිතෙල් සහනාධාරයක් ලබා දීම අරමුණු කරගත් සුවිශාල සමාජ සුබසාධන පැකේජයක් ද 2022 වසර සඳහා ඉදිරිපත් කරන ලද අතුරු අයවැය මගින් හඳුන්වා දී ඇත. විශේෂඥ දැනුමැති බහුපාර්ශ්වික නියෝජිතායතනවල තාක්ෂණික සහාය ඇතිව, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සහනාධාරලාභීන්ගේ නාම ලේඛනයක් සකස් කිරීම තුළින් සමෘද්ධි ආරක්ෂණ ජාලයේ අරමුණු වැඩිදියුණු කිරීමට ද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. සමාජ සුභසාධන ආධාර ලබන්නන්ගේ ඊට ඇති සුදුසුකම් අඛණ්ඩව තක්සේරු කිරීමට හැකි වන අතර, මෙමගින්, සාධාරණ කාල සීමාවක් තුළ සමාජ සුබසාධන වැඩසටහන්වලින් ඵලදායී ලෙස ඉවත් වීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම සහතික කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව, පොරොත්තු ලේඛනවල සිටින පවුල්වලට/පුද්ගලයන්ට මෙන්ම, වත්මන් ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වූ සහ රජයෙන් සුබසාධන ප්‍රතිලාභ අපේක්ෂා කරන්නන් දක්වා ආවරණය පුළුල් කිරීමේ අරමුණින් *කිසිවෙක් අතහැරෙන්න දෙන්න එපා* (Leave no one behind) සුබසාධන වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් ලියාපදිංචි කිරීම කඩිනම් කරන ලදී. මන්දපෝෂණය පිළිබඳ ඇති

> **"වත්මන් තත්ත්වය තුළ, සමාජයේ පවතින අවදානම් පිළිබඳ කඩිනමින් හා කාර්යක්ෂමව තක්සේරු කිරීම සහතික කිරීම සඳහා අදාළ ආයතන විසින් විස්තීර්ණ හා කාලෝචිත දත්ත සැපයීම අත්‍යවශ්‍ය වේ...**

අවධානය ඉහළ යෑම සැලකිල්ලට ගනිමින් සහ එම ගැටලුවේ දිගුකාලීන බලපෑම් හඳුනා ගනිමින්, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන මධ්‍යස්ථාන සවිබල ගැන්වීම සඳහා විවිධ අංශ ඒකාබද්ධ කරන ලද යාන්ත්‍රණයක් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන මගින් දරුවන්ගේ මන්දපෝෂණ ගැටලු විසඳීම පමණක් නොව, වැඩිහිටියන්ගේ ආහාර සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම ද සිදුකරන අතර ම දේශීය කෘෂිකාර්මික සැපයුම ශක්තිමත් කිරීම සහ එමගින් සමස්ත ආහාර සුලබතාව ඉහළ නංවා ගැනීම ද අපේක්ෂා කෙරේ. දරිද්‍රතාව සහ සමාජ සුබසාධනය සම්බන්ධ විස්තීරණ සහ මෑතකාලීන දත්ත කාලානුරූපීව හා විධිමත් ලෙස ලබා ගැනීමට නොහැකිවීම නිසා ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට, විශේෂයෙන් සමාජ අවදානම් සම්බන්ධයෙන් කාර්යක්ෂමව මැදිහත් වීමට ඇති හැකියාව අතිශයින් සීමා වී ඇති බව නැවත අවධාරණය කළ යුතුය. කොවිඩ්-19 මෙන්ම ඒක පුද්ගල ආදායමේ සැලකිය යුතු අඩුවීමකට මග පාදමින් තවදුරටත් දීර්ඝ විය හැකි වත්මන් ආර්ථික අර්බුදය වැනි පෙර නොවූ අන්දමේ ආර්ථිකමය වශයෙන් පීඩාකාරී කාලපරිච්ඡේද වල දී, අදාළ ආයතන විසින් උචිත සහ කාලානුරූපී දත්ත සැපයීම හෝ ක්ෂණික ඇගයීම් සිදුකිරීම මගින්, සමාජ අවදානම් කඩිනමින් තක්සේරු කළ හැකි වීම පමණක් නොව, කාර්යක්ෂම ලෙස ඒවා විසඳීම සඳහා ඉමහත් දායකත්වයක් ලබා දිය හැක. පවත්නා සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය හමුවේ, එවැනි අත්‍යවශ්‍ය ප්‍රවේශයන්ට අදාළ විශාල පරිමාණයේ මූල්‍ය අවශ්‍යතා සලකා බැලීමේදී, ඉහත සඳහන් තොරතුරු හා ඇගයීම් විශේෂයෙන් වැදගත් වේ.

**3.1 සංඛ්‍යා සටහන**

## ප්‍රවාහන අංශයේ ක්‍රියාකාරිත්වය

| ශීර්ෂය | 2021 ජන-ජූනි (අ) | 2022 ජන-ජූනි (ආ) | වෙනස්වීම % |
|---|---|---|---|
| මාර්ගස්ථ මගී ප්‍රවාහනය | | | |
| ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම.) | | | |
| ධාවන කිලෝමීටර (මිලියන) | 136 | 174 | 27.9 |
| මගී කිලෝමීටර (මිලියන) | 3,393 | 6,322 | 86.3 |
| සතු බස් රථ සංඛ්‍යාව | 7,015 | 6,699 | -4.5 |
| ධාවනයේ යෙදුණු සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව | 1,353 | 3,966 | 193.1 |
| පෞද්ගලික අංශය | | | |
| ධාවන කිලෝමීටර (මිලියන) | 364 | 253 | -30.5 |
| මගී කිලෝමීටර (මිලියන) | 16,292 | 10,701 | -34.3 |
| සතු බස් රථ සංඛ්‍යාව | 20,021 | 20,057 | 0.2 |
| ධාවනයේ යෙදුණු සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව | 9,053 | 8,973 | -0.9 |
| පළාත් අතර බස් රථ ධාවනය සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | 3,132 | 3,114 | -0.6 |
| පළාත තුළ බස් රථ ධාවනය සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | 16,922 | 16,938 | 0.1 |
| ශ්‍රී ලංකා දුම්රිය සේවය | | | |
| ධාවන කිලෝමීටර (මිලියන) | 4.2 | ලැ.නො. | - |
| මගී කිලෝමීටර (මිලියන) | 1,211 | 2,887 | 138.4 |
| භාණ්ඩ ටොන් කිලෝමීටර (මිලියන) | 78.1 | 73.1 | -6.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
ලැ.නො. - ලැබී නොමැත

මූලයන්: ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය
ජාතික ගමනාගමන කොමිසම
ශ්‍රී ලංකා දුම්රිය සේවය

**3.2 සංඛ්‍යා සටහන**

## බලශක්ති උත්පාදන අංශයේ ක්‍රියාකාරිත්වය

| විදුලි බල උත්පාදනය හා ස්ථාපිත ධාරිතාවය | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 2021 ජන-අගෝ | 2022 ජන-අගෝ (අ) | වෙනස්වීම % |
| **ස්ථාපිත ධාරිතාව (මෙ.වො. - කාලපරිච්ඡේදය අවසානයට)** | **4,199** | **4,354** | **3.7** |
| ලං.වි.ම. | 3,040 | 3,075 | 1.2 |
| පෞද්ගලික | 1,158 | 1,279 | 10.4 |
| **මුළු විදුලිබල උත්පාදනය (ගි.වො.පැය)** | **11,107** | **10,744** | **-3.3** |
| ජල විදුලිබලය (ආ) | 3,215 | 3,122 | -2.9 |
| ද්‍රව ඉන්ධන | 2,063 | 2,125 | 3.0 |
| ගල් අඟුරු | 4,020 | 3,707 | -7.8 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඇ) | 1,810 | 1,790 | -1.1 |
| **සමස්ත විදුලිබල උත්පාදනයට ජල විදුලිබලයේ දායකත්වය (%)** | **29** | **29** | **0.4** |
| විදුලි බල අලෙවිය (ගි.වො.පැය) | | | |
| **මුළු අලෙවිය - ලං.වි.ම.** | **10,062** | **9,854** | **-2.1** |
| ගෘහස්ථ | 3,458 | 3,435 | -0.7 |
| ආගමික | 54 | 55 | 1.2 |
| කාර්මික | 3,178 | 2,957 | -6.9 |
| පොදු සේවා | 1,933 | 1,987 | 2.8 |
| රජය | 143 | 139 | -2.4 |
| හෝටල් | 143 | 163 | 13.9 |
| ලංකා විදුලි පෞද්ගලික සමාගම (LECO) | 1,085 | 1,053 | -2.9 |
| විදි ආලෝකකරණය | 68 | 64 | -5.4 |
| සාමාන්‍ය විදුලිබල පිරිවැය සහ සාමාන්‍ය විදුලිබල ගාස්තු (රු./ඒකකයකට) | | | |
| **ලං.වි.ම.** | **8.54** | **16.73** | **96.0** |
| ලං.වි.ම. - ජල විදුලිබලය | 1.83 | 1.84 | 0.9 |
| ලං.වි.ම. - ගල් අඟුරු | 9.13 | 18.41 | 101.6 |
| ලං.වි.ම. - ද්‍රව ඉන්ධන | 29.40 | 54.60 | 85.7 |
| ලං.වි.ම. - සුළං | ලැ.නො. | 4.20 | - |
| **පෞද්ගලික** | **22.46** | **32.75** | **45.8** |
| **සමස්ත සාමාන්‍ය පිරිවැය (ජනන අවස්ථාවේ දී)** | **11.74** | **20.74** | **76.6** |
| **සමස්ත සාමාන්‍ය පිරිවැය (විකුණුම් අවස්ථාවේ දී)** | **17.29** | **29.17** | **68.7** |
| **සමස්ත සාමාන්‍ය ගාස්තු** | **16.22** | **17.47** | **7.7** |

(අ) තාවකාලික
(ආ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත් නොවේ.
(ඇ) සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය යටතට සුළු පරිමාණ ජල විදුලිය සහ වහල මත සූර්ය විදුලිබල උත්පාදනය ද ඇතුළත් වේ.
ලැ.නො. - ලැබී නොමැත

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

**3.3 සංඛ්‍යා සටහන**

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන විකුණුම් අංශ අනුව වර්ගීකරණය

| අංශයන් | 2021 ජන-අගෝ | | | 2022 ජන-අගෝ (අ) | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (ලීටර මිලි.) | දායකත්වය % | වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය % | ප්‍රමාණය (ලීටර මිලි.) | දායකත්වය % | වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය % |
| විදුලිබල උත්පාදන | 491 | 14.9 | -29.6 | 486 | 16.5 | -1.2 |
| ප්‍රවාහන | 2,287 | 69.2 | 8.6 | 2,090 | 71.0 | -8.6 |
| ගුවන් කටයුතු | 149 | 4.5 | -22.2 | 200 | 6.8 | 34.4 |
| කර්මාන්ත | 100 | 3.0 | 63.9 | 63 | 2.1 | -36.7 |
| වෙනත් (ආ) | 279 | 8.5 | -10.1 | 106 | 3.6 | -62.2 |
| **එකතුව** | **3,307** | | **-1.8** | **2,945** | | **-11.0** |

(අ) තාවකාලික
(ආ) ගෘහස්ථ ගොවි, අපනයන සහ නැව් සඳහා ඛණිජ තෙල් අලෙවිය ඇතුළත් වේ.

මූලය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**3.4 සංඛ්‍යා සටහන**

## ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය

| ශීර්ෂය | 2021 ජන-ජූනි | 2022 ජන-ජූනි (අ) | වෙනස්වීම % |
|---|---|---|---|
| **මගීන් (ගණන)(ආ)** | **323,754** | **2,754,508** | **750.8** |
| ශ්‍රීලංකන් ගුවන් සේවය | 182,869 | 1,538,153 | 741.1 |
| විදේශ ගුවන් සේවා | 140,885 | 1,216,355 | 763.4 |
| **භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො.)** | **79,310** | **94,904** | **19.7** |
| ශ්‍රීලංකන් ගුවන් සේවය | 39,425 | 45,858 | 16.3 |
| විදේශ ගුවන් සේවා | 39,885 | 49,046 | 23.0 |
| **ගුවන්යානා ගමනාගමනය (ගණන)(ඇ)** | **9,462** | **21,549** | **127.7** |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ | 9,119 | 21,160 | 132.0 |
| මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ | 337 | 184 | -45.4 |
| යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ | 6 | 205 | 3,316.7 |

(අ) තාවකාලික
(ආ) සංක්‍රමණික මගීන් ඇතුළත් වේ.
(ඇ) දේශීය ගුවන් ගමන් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

4

# මිල සහ වැටුප්

*2022 වසරේ පළමු භාගයේ දී කැපී පෙනෙන ඉහළ යෑමක් පිළිඹිබු කළ පොදු මිල මට්ටම, ඉන් අනතුරුව ජූලි සිට සැප්තැම්බර් දක්වා යම් ස්ථාවරත්වයක් පෙන්නුම් කළ ද තවමත් ඉහළ මට්ටමක පවතී. මහජනතාවට සහන සැලසීමේ අරමුණින් සැලකිය යුතු කාලයක් පුරා ස්ථාවරව පවත්වාගෙන ගිය පරිපාලිත මිල ගණන් ඉවත් කිරීම 2022 වසරේ දී පොදු මිල මට්ටම මෙලෙස ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, දේශීය වෙළඳපොළෙහි පවත්නා විදේශ විනිමය හිඟය, ඉන්ධන මිල නිතර ඉහළ දැමීම හේතුවෙන් ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම මෙන්ම විදුලිය හා ජල ගාස්තු ඉහළ දැමීම ද, පොදු මිල මට්ටම ඉහළ යෑම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. එමෙන්ම, දේශීය වෙළඳපොළෙහි පැවති පොහොර හිඟය නිසා ආහාර සැපයුම සීමාවීම හේතුවෙන්, ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යන ලදී. ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් සහ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම සහ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමද, ආනයනික අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑමට හේතු විය. කෙසේ වුවද, යල කන්නයේ අස්වැන්න දේශීය වෙළඳපොළට ලැබීම, මෑත කාලීනව විනිමය අනුපාතිකය ස්ථාවර වීම මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි සිදු වූ මිල පහළ යෑම්, මෑත මාසවල දී දේශීය මිල මට්ටම කෙරෙහි යම් සහනදායී බලපෑමක් ඇති කරන ලදී. එලෙස මිල පීඩනය ලිහිල් වුවද, මතුපිට උද්ධමනය 2022 වසරේ සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. වැටුප් සම්බන්ධයෙන් සලකා බලන විට 2021 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ මාස අට සමඟ සැසඳීමේ දී, 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී, රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්වල යම් වර්ධනයක් දක්නට ලැබුණ ද උද්ධමනය ඉහළ යෑම මධ්‍යයේ, මූර්ත වැටුප්හි අඩුවීමක් සිදුවිය. ඉදිරි කාලයේ දී, සැපයුම් තත්ත්වයන්ගේ යම් යහපත් වර්ධනයක් ඇතිවීම හා සමස්ත ඉල්ලුම තවදුරටත් සීමාවීම හේතුවෙන් පොදු මිල මට්ටම මත ඇතිවිය හැකි පීඩනයේ අඩුවීමක් ද, එමඟින් උද්ධමනයේ අඛණ්ඩ පහළ යෑමක් ද අපේක්ෂා කෙරේ.*

## 4.1 මිල

2022 වසරේ පළමු භාගයේ දී නිතර මිල උච්චාවචන[1] සහිත ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන් අනතුරුව ජූලි සිට සැප්තැම්බර් දක්වා කාල පරාසයේ දී යම් ස්ථාවරත්වයක් පෙන්නුම් කළේය. ගොවිතැන් කටයුතු කාබනික පොහොර භාවිතයෙන් පමණක් සිදු කිරීමට උත්සාහ ගැනීම මෙන්ම රසායනික පොහොර වර්ග වෙළඳපොළෙහි හිඟවීම හා පැවති රසායනික පොහොරවල මිල ගණන් ඉතා ඉහළ යෑම හේතුවෙන් 2021/2022 මහ කන්නයේ අස්වැන්න සීමාවීම ද, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑමට හේතු විය. මීට අමතරව, වරින්වර සැලකිය යුතු ලෙස ඉන්ධන මිල ඉහළ දැමීම් හේතුවෙන් ඉහළ ගිය ප්‍රවාහන ගාස්තු සහ අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් සැපයුම ආශ්‍රිතව ඇති වූ ගැටළු ද නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල මත ඉතා ඉහළ පීඩනයක් ඇති කළේය. 2021/2022 මහ කන්නයේ අස්වැන්න අඩුවීම සහ ප්‍රමාණවත් පරිදි විදේශ විනිමය නොපැවතීම හේතුවෙන් දේශීය සහ ආනයනික සහල් මිල ගණන් 2022 වසරේ ජූලි මස දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සහල් මිල ඉහළ යෑම හේතුවෙන් ඇති වූ පීඩනය අවම කර පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් දේශීය සහල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් පැනවීමට කටයුතු කරනු ලැබූ අතර, ඒ අනුව, 2022 මැයි 02 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය සම්බා හා නාඩු සහල් කිලෝග්‍රෑමයක් සඳහා පිළිවෙළින් රුපියල් 230ක් සහ රුපියල් 220ක් ලෙසත්, 2022 ජූනි 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය රතු කැකුළු හා සුදු කැකුළු කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 210ක් ලෙසත් උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. ඉන් අනතුරුව, යල කන්නයේ වී අස්වැන්න ලැබීමත් සමග දේශීය සහල් වර්ගවල මිල ගණන් 2022 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, විදේශ ආධාර වශයෙන් ලැබුණු සහල් අඩු ආදායම්ලාභී පවුල් සඳහා බෙදාදීමත් සමග සහල් සඳහා පැවති ඉල්ලුම අඩුවීම හේතුකොට ගෙන ආනයනික සහල් වර්ගවල මිල ගණන් ද පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2022 වසරේ සැප්තැම්බර් දක්වා වූ මාස නවයක කාලපරිච්ඡේදය තුළ, මාර්තු, ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් හැර අනෙකුත් මාසවල දී, එළවළු මිල ගණන් සමස්තයක් වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, එළවළු අස්වැන්න වෙළඳපොළට ලැබීම, ඉහත සඳහන් මාසවල දී එළවළු මිල ගණන් පහළ යෑම සඳහා හේතු විය. එසේ වුවද, 2022 අප්‍රේල් සිට ජූනි දක්වා එළවළු මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ සඳහා ඉන්ධන හිඟය හේතුවෙන් සැපයුම් ජාල අවහිර වීම, ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම, අහිතකර කාලගුණ තත්ත්වයන් සහ කෘෂිරසායන ද්‍රව්‍යවල පැවති හිඟය බලපාන ලදී. මේ අතර, 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කුකුළු මස් මිල අඛණ්ඩව ඉහළ ගිය අතර, නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම සහ කුකුළු ආහාර, විටමින් හා බෙහෙත් ද්‍රව්‍ය හිඟවීම මේ සඳහා හේතු විය. මීට අමතරව, 2022 අප්‍රේල් දක්වා ස්ථාවරව පැවති නැවුම් මත්ස්‍ය මිල ගණන්, ඉන්ධන හිඟය මෙන්ම අහිතකර කාලගුණ තත්ත්වයන් හේතුවෙන් ධීවර කටයුතු සීමාවීම සහ ඉන්ධන මිල ඉහළ යෑම හේතුකොට ගෙන සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී, නැවුම් මත්ස්‍ය මිල ගණන්වල යම් පහළ යෑමක් දක්නට ලැබුණු අතර මේ සඳහා භූමිතෙල් සැපයුම යම්තාක් දුරකට යථා තත්ත්වයට පත්වීම හේතු විය. මේ අතර, සීනි, පරිප්පු, ලොකු ළූණු, වියළි මිරිස් සහ අර්තාපල් වැනි සමහර අත්‍යවශ්‍ය ආනයනික ආහාර වර්ගවල මිල ගණන් සලකා බලනු ලබන කාලපරිච්ඡේදය අවසානය වන විට පහළ ගිය අතර, ඒ සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි එම ආහාර වර්ගවල සිදු වූ මිල අඩුවීම් යම් දායකත්වයක් දක්වන ලදී. මීට අමතරව, දේශීය ලොකු ළූණු ගොවීන් ආරක්ෂා කිරීමේ අරමුණින්, 2022 සැප්තැම්බර් 23 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් ආනයනික ලොකු ළූණු කිලෝග්‍රෑමයක් මත රුපියල් 50ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. ඒ අනුව, ආනයනික ලොකු ළූණු මිලෙහි ඒ දක්වා දක්නට ලැබූ අඩුවීමේ ප්‍රවණතාව වෙනස් වී, 2022 සැප්තැම්බර් අවසානයේ සිට ආනයනික ලොකු ළූණු මිලෙහි වැඩිවීමක් දක්නට ලැබුණි.

> ***සැපයුම අඩුවීම සහ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම හේතුවෙන්, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය...***

2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ ආනයනික අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් නිතර මිල උච්චාවචනය නොවන ආහාර සහ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද ඒවායේ වැඩිවීමේ වේගය, සලකා බලනු ලැබූ කාලපරිච්ඡේදය අවසානයේ දී පහළ ගියේය. මෙම මිල ගණන් ඉහළ යෑම සඳහා විදේශ විනිමය හිඟය, ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩවල

1 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූනු සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

### 4.1 සටහන
### 2022 වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී තෝරා ගත් අයිතමවල සිදු වූ පරිපාලිත මිල සංශෝධන

| අයිතමය | ඒකකය | සංශෝධිත මිල (රුපියල්) | බලපැවැත්වෙන දිනය |
|---|---|---|---|
| කිරි පිටි | | | |
| ආනයනික | | | |
| ඇන්කර් | ග්‍රෑම් 400 | 790.00 | 2022.03.19 |
| | ග්‍රෑම් 400 | 1,020.00 | 2022.04.05 |
| | ග්‍රෑම් 400 | 1,160.00 | 2022.06.16 |
| | ග්‍රෑම් 400 | 1,240.00 | 2022.10.05 |
| දේශීය | | | |
| හයිලන්ඩ් | ග්‍රෑම් 400 | 625.00 | 2022.04.12 |
| | ග්‍රෑම් 400 | 850.00 | 2022.06.23 |
| | ග්‍රෑම් 400 | 950.00 | 2022.10.05 |
| පැලවත්ත | ග්‍රෑම් 400 | 685.00 | 2022.04.19 |
| | ග්‍රෑම් 400 | 880.00 | 2022.06.01 |
| | ග්‍රෑම් 400 | 980.00 | 2022.10.05 |
| එල්.පී. ගෑස් | | | |
| ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම | කි.ග්‍රෑ. 12.5 | 4,860.00 | 2022.04.27 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,910.00 | 2022.07.11 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,664.00 | 2022.08.09 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,551.00 | 2022.09.06 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,280.00 | 2022.10.06 |
| ලාෆ්ස් ගෑස් සමාගම | කි.ග්‍රෑ. 12.5 | 4,199.00 | 2022.03.20 |
| | කි.ග්‍රෑ. 12.5 | 6,850.00 | 2022.06.05 |
| | කි.ග්‍රෑ. 12.5 | 5,800.00 | 2022.08.18 |
| | කි.ග්‍රෑ. 12.5 | 5,300.00 | 2022.10.11 |
| ඉන්ධන | | | |
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | | | |
| ලංකා IOC | ලීටර් 1 | 184.00 | 2022.02.07 |
| ලංකා IOC | ලීටර් 1 | 204.00 | 2022.02.26 |
| ලංකා IOC | ලීටර් 1 | 254.00 | 2022.03.11 |
| සිපෙට්කෝ | ලීටර් 1 | 254.00 | 2022.03.12 |
| ලංකා IOC | ලීටර් 1 | 303.00 | 2022.03.26 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 338.00 | 2022.04.18 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 420.00 | 2022.05.24 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 470.00 | 2022.06.26 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 450.00 | 2022.07.17 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 410.00 | 2022.10.02 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 370.00 | 2022.10.17 |
| සුදු ඩීසල් | | | |
| ලංකා IOC | ලීටර් 1 | 124.00 | 2022.02.07 |
| ලංකා IOC | ලීටර් 1 | 139.00 | 2022.02.26 |
| ලංකා IOC | ලීටර් 1 | 214.00 | 2022.03.11 |
| සිපෙට්කෝ | ලීටර් 1 | 176.00 | 2022.03.12 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 289.00 | 2022.04.18 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 400.00 | 2022.05.24 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 460.00 | 2022.06.26 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 440.00 | 2022.07.17 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 430.00 | 2022.08.01 |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 415.00 | 2022.10.17 |
| අවම බස් ගාස්තුව | | 17.00 | 2022.01.05 |
| | | 20.00 | 2022.03.15 |
| | | 27.00 | 2022.04.20 |
| | | 32.00 | 2022.05.25 |
| | | 40.00 | 2022.07.01 |
| | | 38.00 | 2022.07.20 |
| | | 34.00 | 2022.08.05 |
| අවම දුම්රිය ගාස්තුව | | 20.00 | 2022.07.25 |
| විදුලි ගාස්තු - ස්ථාවර | | | |
| ඒකක 60ට අඩු | 0-30 | 120.00 | 2022.08.10 |
| | 31-60 | 240.00 | 2022.08.10 |
| | | | |
| ඒකක 60ට වැඩි | 0-60 | - | 2022.08.10 |
| | 61-90 | 360.00 | 2022.08.10 |
| | 91-120 | 960.00 | 2022.08.10 |
| | 121-180 | 960.00 | 2022.08.10 |
| | 180ට වැඩි | 1,500.00 | 2022.08.10 |

*(සම්බන්ධයි)*

### 4.1 සටහන (සම්බන්ධයි)
### 2022 වසරේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී තෝරා ගත් අයිතමවල සිදු වූ පරිපාලිත මිල සංශෝධන

| අයිතමය | ඒකකය | සංශෝධිත මිල (රුපියල්) | බලපැවැත්වෙන දිනය |
|---|---|---|---|
| විදුලි ගාස්තු - ඒකක | | | |
| ඒකක 60ට අඩු | 0-30 | 8.00 | 2022.08.10 |
| | 31-60 | 10.00 | 2022.08.10 |
| | | | |
| ඒකක 60ට වැඩි | 0-60 | 16.00 | 2022.08.10 |
| | 61-90 | 16.00 | 2022.08.10 |
| | 91-120 | 50.00 | 2022.08.10 |
| | 121-180 | 50.00 | 2022.08.10 |
| | 180ට වැඩි | 75.00 | 2022.08.10 |
| ජල ගාස්තු - ගෘහස්ත | | | |
| ඒකක ගාස්තුව | 0-5 | 20.00 | 2022.09.01 |
| | 6-10 | 27.00 | 2022.09.01 |
| | 11-15 | 34.00 | 2022.09.01 |
| | 16-20 | 68.00 | 2022.09.01 |
| | 21-25 | 99.00 | 2022.09.01 |
| | 26-30 | 150.00 | 2022.09.01 |
| | 31-40 | 179.00 | 2022.09.01 |
| | 41-50 | 204.00 | 2022.09.01 |
| | 51-75 | 221.00 | 2022.09.01 |
| | 75ට වැඩි | 238.00 | 2022.09.01 |


*මූලයන්:* පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ජාතික ගමනාගමන කොමිෂන් සභාව
ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

මිල සහ නැව් ගාස්තු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂයෙන්, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමත් සමඟ 2022 වසරේ මේ දක්වා කාලය තුළ දේශීය වෙළඳපොළ තුළ ආනයනික ආහාර අයිතමවල මිල ගණන් විශාල ලෙස ඉහළ ගොස් තිබීම සැලකිය යුතු කරුණකි. තිරිඟු පිටි, පාන්, කිරිපිටි, ඉන්ධන, එල්.පී. ගෑස් වැනි ප්‍රධාන ආනයනික අයිතමවල මිල ගණන් සහ විදුලි, ජල, බස්, දුම්රිය, සන්නිවේදන හා තැපැල් ගාස්තු වැනි අත්‍යවශ්‍ය සේවාවල මිල ගණන් සැලකිය යුතු සංශෝධනවලින් තොරව මහජනතාවට සහනයක් වන ලෙස රජය විසින් ස්ථාවර මට්ටම්වල පවත්වාගෙන යෑම, රටේ වත්මන් ආර්ථික තත්ත්වය අනුව අසීරු කාර්යයක් බවට පත්ව තිබේ. එබැවින්, 2022 වසරේ මේ දක්වා තිරිඟු පිටි, පාන් සහ කිරිපිටි මිල ගණන් වෙළඳපොළ හැසිරීම අනුව තීරණය වීමට ඉඩහැරීමත් සමඟ ඒවායේ මිල ගණන් නිතර සංශෝධනයන්ට ලක්විය. මේ අතර, 2022 සැප්තැම්බර් මස අග භාගය වන විට විදේශ විනිමය අනුපාතිකය ස්ථාවර වීමත් සමඟ ආනයනික ආහාර අයිතමවල මිල ගණන්හි යම්කිසි අඩුවීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල අඛණ්ඩව අවස්ථා තුනක දී රුපියල් 30 බැගින් සහ ඉන් අනතුරුව රුපියල් 20කින් ඉහළ යෑම සඳහා තිරිඟු පිටි මිල ඉහළ යෑම හේතු විය. 2022 වසර ආරම්භයේ දී රුපියල් 80ක් වශයෙන් පැවති ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල 2022 ඔක්තෝබර් මාසය වන විට රුපියල් 170 සිට රුපියල් 220 දක්වා මිල පරාසයක පැවතුණි.

එමෙන්ම, 2022 වසරේ මේ දක්වා කාලය තුළ අනෙකුත් බේකරි අයිතමවල මිල ගණන් ද අවස්ථා කිහිපයක දී සංශෝධනයට ලක් විය. කෙසේ වෙතත්, ඉතාමත් මෑතක දී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීමත් සමඟ තිරිඟු පිටි මිල රුපියල් 13කින් ඉහළ ගිය ද, එයට අනුකූලව පාන් සහ අනෙකුත් බේකරි අයිතමවල මිල ගණන් ඉහළ යෑමක් දක්නට නොලැබිණි. තවද, ජාත්‍යන්තර වෙළඳපොළේ කිරිපිටි මිල ඉහළ යෑම සහ නැව් ගාස්තු ඉහළ යෑම හේතුවෙන් ආනයනික කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල අවස්ථා හතරක දී ඉහළ දමන ලදී. එමෙන්ම, නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම, ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම සහ බදු පැනවීම හේතුවෙන් දේශීය කිරි පිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල ද අවස්ථා කිහිපයක දී ඉහළ දමන ලදී. පරිප්පු, සුදු සීනි සහ කරවල මිල ගණන් 2022 පළමු භාගයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද ජාත්‍යන්තර වෙළඳපොළේ අදාල මිල ගණන් පහළ යෑම හේතුවෙන් සලකා බලනු ලැබූ කාලපරිච්ඡේදයේ අග භාගය වන විට ඒවායෙහි දේශීය මිල ගණන් ද පහළ ගියේය. මේ අතර, සාධාරණ නොවන අයුරින් බිත්තර මිල ඉහළ දැමීම හේතුවෙන් පාරිභෝගිකයන් අපහසුතාවයට පත්වීම වැළැක්වීම සඳහා 2022 අගෝස්තු 19 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සුදු බිත්තර මත රුපියල් 43ක උපරිම සිල්ලර මිලක් රජය විසින් පනවන ලදී. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමත් සමඟ ආහාර නොවන කාණ්ඩයේ ප්‍රධාන අයිතම කිහිපයක මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ ගොස් දේශීය වෙළඳපොළ තුළ ඒවායෙහි මෙතෙක් වාර්තා වූ ඉහළම මිල ගණන් වාර්තා කළේය. ඉන්ධන මිල (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව), එල්.පී. ගෑස් මිල (ලිට්‍රෝ) සහ බස් ගාස්තු තවදුරටත් රජය මගින් තීරණය කරනු ලැබුව ද, රුපියල අවප්‍රමාණය වීම ඇතුළුව අනෙකුත් පිරිවැය ඉහළ යෑම් නිසා 2022 වසරේ මේ දක්වා එම මිල ගණන් කිහිප අවස්ථාවක දී ඉහළ ගියේය. ඒ අනුව, පෙට්‍රල් (ඔක්ටේන් 92) සහ සුදු ඩීසල් යන දෙවර්ගයෙහිම මිල ගණන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම විසින් අවස්ථා කිහිපයක දී ඉහළ දමන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම විසින් මෑතක දී සිදුකරන ලද ඉන්ධන මිල සංශෝධන කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද නව මිල සූත්‍රය මත පදනම් විය. ඉන්ධන මිල ඉහළ නැංවීමත් සමඟ 2022 වසරේ මේ දක්වා අවස්ථා කිහිපයක දී පාසල් වෑන් රථ, කුලී රථ සහ ත්‍රීරෝද රථ ගාස්තු ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, සුදු ඩීසල් මිල පහළ යෑමත් සමග බස් ගාස්තු 2022 ජූලි 20 වැනි දින සහ 2022 අගෝස්තු 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවස්ථා දෙකක දී සියයට 2.23කින් සහ සියයට 11.14කින් පහළ ගියේය. 2022 ඔක්තෝබර් මස 17 වැනිදා සිට ක්‍රියාත්මක වූ නවතම ඉන්ධන මිල සංශෝධනයේ දී පෙට්‍රල් (ඔක්ටේන් 92) මිල රුපියල් 40කින් පහළ ගිය අතර සුදු ඩීසල් මිල රුපියල් 15කින් පහළ ගියේය. වසර හතරකට පමණ පසු 2022 ජූලි 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි දුම්රිය ගාස්තු ද ඉහළ දමන ලදී. තවද, රුපියල අවප්‍රමාණය වීම සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීම මගින් ඇතිවුණු බලපෑම පිළිබිඹු කරමින් සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ වාහන අමතර කොටස් මිල සහ වාහන සේවා ගාස්තු ද ඉහළ ගියේය. මීට අමතරව, සමස්ත වශයෙන් වැඩිවීමක් පෙන්නුම් කරමින් කිලෝග්‍රෑම් 12.5 බරැති එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල අවස්ථා කිහිපයක දී සංශෝධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ මේ දක්වා කාලය තුළ සකස් කළ ආහාරවල මිල ගණන් අඛණ්ඩව ඉහළ ගියේය. වසර අටකට ආසන්න කාලයක් නොවෙනස්ව පැවති විදුලි ගාස්තු එහි ජනන පිරිවැය සහ බෙදා හැරීමේ පිරිවැය පියවා ගැනීම සඳහා, 2022 අගෝස්තු 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 75කින් සැලකිය යුතු ලෙස ඉහළ දමන ලදී. මීට අමතරව, වසර 10කට ආසන්න කාලයක් සංශෝධනය නොවූ ජල ගාස්තු ද 2022 සැප්තැම්බර් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සැලකිය යුතු ලෙස ඉහළ දමන ලදී. රුපියල අවප්‍රමාණය වීම, ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම සහ ප්‍රවාහන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2022 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ ගෘහ නඩත්තු ආශ්‍රිත උපකරණවල අඛණ්ඩ මිල වැඩිවීමක් වාර්තා විය. මීට අමතරව, 2022 අප්‍රේල් මාසයේ දී නිවාස කුලිය ද සුළු වැඩිවීමක් වාර්තා කළේය. තවද, 2022 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ ඖෂධ මිල, පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර ගාස්තු සහ පෞද්ගලික රෝහල් ගාස්තු සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, සියයට 11.25ක් වශයෙන් පැවති විදුලි සංදේශ බද්ද, 2022 ජූනි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 15ක් දක්වා ඉහළ දමන ලදී. තවද, සියයට 8ක් වශයෙන් පැවති එකතු කළ අගය මත බද්ද 2022 ජූනි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 12 දක්වා ඉහළ දැමූ අතර ඉන් අනතුරුව 2022 සැප්තැම්බර් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 15ක් දක්වා ඉහළ දමන ලදී. 2022 ඔක්තෝබර් 01 වැනි දින සිට


> ***විදේශ විනිමය හිඟය, ජාත්‍යන්තර වෙළෙඳපොළේ භාණ්ඩවල මිල සහ නැව් ගාස්තු ඉහළ යෑම් හේතුවෙන් නිතර මිල උච්චාවචනය නොවන ආහාර සහ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය...***

රූප සටහන 4.1
කො.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 4.2
ජා.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

බලපැවැත්වෙන පරිදි පැන වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, ඉදිරි මාසවල දී ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම මිල ගණන් ඉහළ යෑම කෙරෙහි යම් බලපෑමක් ඇති කළ හැකිය.

විදුලි ගාස්තු සහ ජල ගාස්තු ඉහළ යෑම බොහෝ භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යෑම කෙරෙහි බලපානු ඇති අතර එමඟින් පොදු මිල මට්ටම තවදුරටත් ඉහළ යා හැකිය. මිල ඉහළ දැමීම් මගින් ඇති වූ බලපෑම, මෑතකාලීන මිල පහළ දැමීම් මගින් මිල මත ඇති වූ බලපෑමට වඩා වැඩි බැවින්, පාරිභෝගික මිල දර්ශකවල වැඩිවීමේ මන්දගාමීත්වයක් ඉදිරියේ දී අපේක්ෂා කිරීමට අපහසු වේ.

## පාරිභෝගික මිල දර්ශක

පොදු මිල මට්ටම මනිනු ලබන නිල පාරිභෝගික මිල දර්ශක වන කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද.,[2] 2022 වසරේ ජනවාරි සිට මේ දක්වා කාලපරිච්ඡේදයේ දී ඉහළ ගියද, ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දී එම ඉහළ යෑම මන්දගාමී විය.

> සලකා බලනු ලැබූ කාලපරිච්ඡේදයේ දී නිල පාරිභෝගික මිල දර්ශක ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය...

## කොළඹ පාරිභෝගික මිල දර්ශකය

2022 ජනවාරි මාසයේ දී දර්ශකාංක 158.4ක් සහ සැප්තැම්බර් මාසයේ දී දර්ශකාංක 244.7ක් වාර්තා කළ කො.පා.මි. දර්ශකයෙහි දක්නට ලැබුණු ඉහළ යෑමේ වේගය, 2022 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ මාස නවයක කාලපරිච්ඡේදයේ අග භාගයේ දී මන්දගාමී විය. එම කාලපරිච්ඡේදය තුළ සිදු වූ මාසික ඉහළ යෑම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල විචලන දායක විය. ආහාර කාණ්ඩයෙන් වැඩි දායකත්වයක් ලැබුණු 2022 වසරේ ජූනි මාසය හැරුණු කොට, කො.පා.මි. දර්ශකයෙහි මාසික විචලන සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම් වැඩි දායකත්වයක් සපයන ලදී. මාසික වෙනස සලකා බැලීමේ දී, කො.පා.මි. දර්ශකයෙහි මෑතකාලීනව වාර්තා වූ ඉහළම මාසික වෙනස, 2022 වසරේ ජූනි මාසයේ දී සියයට 12.8ක් ලෙස වාර්තා විය.


> 2022 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ මාස නවයක කාලපරිච්ඡේදය තුළ කො.පා.මි. දර්ශකය පෙන්නුම් කළ ඉහළ යෑමේ ප්‍රවණතාව සඳහා ආහාර නොවන කාණ්ඩයේ මිල ඉහළ යෑම් වැඩි දායකත්වයක් සපයන ලදී...

## ජාතික පාරිභෝගික මිල දර්ශකය

2022 වසරේ ජනවාරි මාසයේ දී දර්ශකාංක 166.0ක් සහ සැප්තැම්බර් මාසයේ දී දර්ශකාංක 256.2ක් වාර්තා කරමින් වේගවත් ඉහළ යෑමක් පෙන්නුම් කළ ජා.පා.මි. දර්ශකය, එම කාලපරිච්ඡේදය අවසානයේ දී එම ඉහළ යෑමේ වේගයෙහි යම් අඩුවීමක් පෙන්නුම් කරන ලදී. සලකා බලනු ලැබූ කාලපරිච්ඡේදය තුළ ජා.පා.මි. දර්ශකයෙහි විචලන සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි ඉහළ යෑම දායක විය. එහි දී, 2022 වසරේ මාර්තු, ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් හැර අනෙකුත් මාසවල දී ජා.පා.මි. දර්ශකයේ විචලන සඳහා ආහාර කාණ්ඩයේ අයිතම වැඩිම දායකත්වය සපයන ලදී. තවද, ජා.පා.මි. දර්ශකය ගණනය කිරීමේ ආරම්භයේ සිට මේ දක්වා කාලය තුළ වාර්තා වූ ඉහළම මාසික වෙනස 2022 වසරේ ජූනි මාසයේ දී වාර්තා විය.


2 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013 = 100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013 = 100) මාසිකව සම්පාදනය කරනු ලබයි.

**රූප සටහන 4.3**
**කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූප සටහන 4.4**
**ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

> ***2022 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ මාස නවයක කාලපරිච්ඡේදය තුළ ජා.පා.මි. දර්ශකය පෙන්නුම් කළ ඉහළ යෑමේ ප්‍රවණතාව සඳහා ආහාර කාණ්ඩයේ මිල ඉහළ යෑම් වැඩි දායකත්වයක් සපයන ලදී...***

### මතුපිට උද්ධමනය

කො.පා.මි. දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2022 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ මාස නවයක කාලපරිච්ඡේදය තුළ දී ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ ජනවාරි මාසයේ දී සියයට 14.2ක් ලෙස වාර්තා වූ කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, සැප්තැම්බර් මාසයේ දී සියයට 69.8ක් වාර්තා කරමින් වේගයෙන් ඉහළ ගියේය. මීට අමතරව, කො.පා.මි.ද. මත පදනම් වූ ආහාර උද්ධමනය සහ ආහාර නොවන උද්ධමනය ද සලකා බලනු ලැබූ කාලපරිච්ඡේදය පුරා සමස්ත වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, 2022 සැප්තැම්බර් මාසයේ දී පිළිවෙළින්, සියයට 94.9ක් සහ සියයට 57.6ක් වාර්තා කරන ලදී. 2022 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ මාස නවයක කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, කො.පා.මි.ද. මත පදනම්ව වාර්තා වූ මතුපිට උද්ධමනයට වඩා ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, 2022 වසරේ ජනවාරි මාසයේ දී සියයට 16.8ක් වාර්තා කළ ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7 දක්වා වැඩි වේගයකින් ඉහළ ගියේය. ජා.පා.මි.ද. මත පදනම් වූ ආහාර උද්ධමනය සහ ආහාර නොවන උද්ධමනය ද සලකා බලනු ලැබූ කාලපරිච්ඡේදය තුළ දී සමස්ත වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, 2022 සැප්තැම්බර් මාසයේ දී පිළිවෙළින්, සියයට 85.8ක් සහ සියයට 62.8ක් වාර්තා කරන ලදී.

**රූප සටහන 4.5**
**අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

> ***2022 වසරේ මේ දක්වා මතුපිට උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය...***

## 4.2 වැටුප්

අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100),[3] මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදයේ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ජීවන වියදම සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් දෛනික වැටුප් ලබන්නන් වැඩි වැටුප් ඉල්ලීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, එල්.පී. ගෑස්, ඉන්ධන සහ විදුලිය වැනි

3 අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් සහ රැකියා ව්‍යුහයෙහි මෑතකාලීනව සිදු වූ වෙනස්කම් පිළිබිඹු වන පරිදි අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2012 සිට 2018 දක්වා යාවත්කාලීන කරන ලදී.

උපයෝගිතා සේවාවල විටින් විට පැවති සැපයුම් හිඟයන් මඟහරවා ගැනීම සඳහා, විකල්ප උපයෝගිතා භාවිතා කිරීමටත්, සේවා මුර වලට අදාල කාලපරාසයන්ගේ විවිධ වෙනස්කම් කිරීමටත් සිදු වූ අතර, මෙවැනි තත්ත්වයන් ද, දෛනික වැටුප් ලබන්නන් විසින් වැඩි වැටුප් ඉල්ලීම කෙරෙහි යම් බලපෑමක් ඇති කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100), 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සියයට 24.4කින් ඉහළ ගියේය. එහි උප ක්‍රියාකාරකම්, එනම් කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා අනුව අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ 2021 වසරේ අනුරූප කාලයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 25.3කින්, සියයට 23.8කින් සහ සියයට 25.1කින් ඉහළ ගියේය. නාමික වැටුප්වල සැලකිය යුතු වැඩිවීමක් සිදු වුවද පවතින ඉහළ උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සියයට 10.6කින් පහළ ගියේය.

***අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2022 අගෝස්තු දක්වා වූ මාස අටක කාලපරිච්ඡේදයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය...***

පඩි පාලක සභා මගින් පාලනය වන සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය[4] (1978 දෙසැම්බර් = 100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදයේ දී සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, මෙම සේවා නියුක්තිකයන්ගේ අවම නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය, 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සියයට 15.3කින් ඉහළ ගිය අතර, මේ සඳහා 2021 වසරේ පළමු මාස දෙක තුළ පැවති පහළ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතු විය. තේ සහ රබර් වගා කිරීම හා නිෂ්පාදනය සඳහා අදාළ පඩි පාලක සභා හරහා, තේ සහ රබර් වතු කම්කරුවන්ගේ අවම දෛනික වැටුප, 2021 මාර්තු 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 1,000 දක්වා වැඩි කෙරිණි. තවද, 2016 අංක 03 දරන ජාතික අවම සේවක වැටුප් පනතට සිදු කළ සංශෝධනය මගින් පෞද්ගලික අංශයේ අවම මාසික වැටුප 2021 අගෝස්තු 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 10,000 සිට රුපියල් 12,500ක් සහ අවම දෛනික වැටුප රුපියල් 400 සිට රුපියල් 500ක් දක්වා ඉහළ දමන ලදී. මේ අතර, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය, 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සියයට 13.9කින් පහළ ගියේය.

***විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2022 අගෝස්තු දක්වා වූ මාස අටක කාලපරිච්ඡේදයේ දී ඉතා සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය...***

රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, වසර දෙකකට පසු 2022 ජනවාරි මාසයේ දී වැඩිවීමක් පෙන්නුම් කළ අතර ඉන් අනතුරුව, 2022 අගෝස්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ නොවෙනස්ව පැවතුණි. ඉහළ යන ජීවන වියදමට සහනයක් ලෙස රාජ්‍ය අංශයේ සියලුම සේවා නියුක්තිකයන්ට මුදල් අමාත්‍යාංශය විසින් ලබා දුන් රුපියල් 5,000ක විශේෂ දීමනාව හේතුවෙන් 2022 ජනවාරි මාසයේ දී වැටුප් ඉහළ යෑමක් වාර්තා විය. එපමණක් නොව, වැටුප් විෂමතා ඉවත් කිරීමේ අරමුණින් විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ වැටුප් 2022 ජනවාරි මාසයේ දී ඉහළ දැමීම ද, මේ සඳහා දායක විය. ඒ අනුව, රාජ්‍ය අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100), 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සියයට 16.1කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ඉහළ උද්ධමනකාරී තත්ත්වය මධ්‍යයේ, 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් සියයට 15.9ක පහළ යෑමක් පෙන්නුම් කළේය.

***රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2022 ජනවාරි මාසයේ දී ඉහළ ගිය අතර, එතැන් පටන් අගෝස්තු දක්වා කාලයේ දී නොවෙනස්ව පැවතුණි...***

4 පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර් = 100) මගින් ගණනය කරනු ලබයි.

# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා

මෑත වසරවල දී ගෝලීය සහ දේශීය වශයෙන් ඇති වූ බාධාවන් මධ්‍යයේ තීව්‍ර වූ විදේශීය අංශයේ අභියෝග, 2022 වසරේ දී පෙර නොවූ ආකාරයේ ගෙවුම් තුලන අර්බුදයක් දක්වා වර්ධනය විය. දළ නිල සංචිත ඉතිහාසයේ අවම මට්ටමකට පහත වැටීම, 2022 වසරේ මාර්තු මාසයේ දී ක්‍රමානුකූල ගැළපීමකට ඉඩ හැරීමෙන් අනතුරුව විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණයකට ලක් වූ අතර, ආනයන සඳහා සීමාවන් පැනවීම සහ ඇතැම් මූල්‍ය ගිණුම් ගනුදෙනු සඳහා පනවන ලද සීමා කිරීම් 2022 වසරේ දී ද අඛණ්ඩව පැවතුණි. තවද, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් අතුරු කාලසීමාවක් සඳහා ණය ගෙවීම් අත්හිටුවීමක් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද අතර, මූල්‍යන පහසුකමක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා. මූ. අරමුදල) සමග සාකච්ඡා ආරම්භ කිරීමෙන් අනතුරුව, 2022 වසරේ සැප්තැම්බර් මස මුල දී ඒ සඳහා නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළැඹුණි. මූල්‍ය හා නීති උපදේශකයන්ගේ සහාය ඇතිව ආරම්භ කළ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය වර්ධනීය මට්ටමකට පැමිණ ඇති අතර එහි දී, නිල ණය හිමියන්ගේ මූල්‍යකරණ සහතික කිරීම් නුදුරු අනාගතයේ දී අපේක්ෂා කෙරේ. මේ අතර, 2022 වසරේ මේ දක්වා ඉහළ ගිය අභියෝග මධ්‍යයේ වුව ද, අපනයන ක්‍රියාකාරීත්වය අඛණ්ඩව ශක්තිමත්ව පැවතිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වෙළඳ ගිණුමේ හිඟය 2022 වසරේ අගෝස්තු මාසය දක්වා අඩු විය. සංචාරක ඉපැයීම්, වසර තුළ මේ දක්වා සැලකිය යුතු වර්ධනයක් පිළිබිඹු කර තිබෙන අතර, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2022 වසරේ පළමු භාගයේ දී මධ්‍යස්ථ මට්ටමක පැවතිය ද, මෑත මාසවල සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් වීමක් වාර්තා කර ඇත. වෙළඳ ගිණුමේ හිඟය අඩු වීම සහ සේවා ගිණුමේ අතිරික්තය වර්ධනය වීම හමුවේ වුව ද, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මධ්‍යස්ථ වීම සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ඉහළ යෑම පිළිබිඹු කරමින් 2022 වසරේ පළමු භාගයේ දී ජංගම ගිණුමේ හිඟය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පුළුල් විය. රජයට සහ සෘජු ආයෝජන වශයෙන් පෞද්ගලික අංශය වෙත වූ විදේශීය ලැබීම් අඩු වීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් මධ්‍යස්ථව පැවති අතර, ප්‍රාථමික වෙළඳපොළ මිලදී ගැනීම් ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් වාර්තා කළේය. මේ අතර, විනිමය අනුපාතිකයේ සැලකිය යුතු අන්තර් දින විචලනය සීමා කිරීමේ අරමුණින්, මහ බැංකුව 2022 වසරේ මැයි මස මැද දී අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළ තුළ මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කළ අතර ඉන් පසුව විනිමය අනුපාතිකයෙහි වඩා වැඩි ස්ථාවර වීමක් නිරීක්ෂණය විය. මූලික වශයෙන්, විදේශ විනිමය ලැබීම් සීමිත වීම සහ අත්‍යවශ්‍ය ආනයන යම් ප්‍රමාණයක් මූල්‍යකරණය කිරීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය අඛණ්ඩව සැපයීම හේතුවෙන් දළ නිල සංචිත සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පැවතුණි. ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් විස්තීර්ණ ණය පහසුකම අනුමත කිරීමෙන් පසුව, අපේක්ෂිත මූල්‍ය ප්‍රවාහයන් සාක්ෂාත් කර ගැනීමත් සමග ඉදිරි කාලය තුළ දී ගෙවුම් තුලනය වෙත වන පීඩන ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5.1 ගෙවුම් තුලනය


### ජංගම ගිණුම

2022 වසරේ පළමු භාගයේ දී වෙළඳ ගිණුමේ හිඟයෙහි අඩු වීමක් සහ සේවා ගිණුමේ වර්ධනය වූ අතිරික්තයක් පැවතිය ද, ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් වීම හා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල මන්දගාමීත්වය හමුවේ ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය මධ්‍යස්ථ වීම හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය පුළුල් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජංගම ගිණුම 2021 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් බිලියන 1.4ක හිඟයට සාපේක්ෂව 2022 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් බිලියන 1.8ක හිඟයක් වාර්තා කළේය.

### වෙළඳ ගිණුම


2022 වසරේ ජනවාරි-අගෝස්තු කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 5.5ක සිට එ.ජ. ඩොලර් බිලියන 3.9ක් දක්වා පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ අපනයන ආදායම, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියනයකින් පමණ ඉහළ ගිය අතර, ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 611කින් පහළ ගියේය. අපනයන හා ආනයනවල පරිමා සහ ඒකක මිල දර්ශකයන්හි විචලනයන් මගින් පෙන්නුම් කරන පරිදි, අපනයන ඉහළ යෑමට මෙන්ම ආනයන පහළ යෑම සඳහා මිල ගණන්වල බලපෑමට වඩා පරිමා බලපෑම හේතු විය. ඉහළ ඉන්ධන

**5.1 රූප සටහන**
**විදේශ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි. ඕ. සී. සමාගම
අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

**5.2 රූප සටහන**
**වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මිල ගණන් හේතුවෙන් ආනයන මිල දර්ශකය, අපනයන මිල දර්ශකයේ ඉහළ යෑම අභිබවමින් ඉහළ යෑම නිසා වෙළඳ මිල අනුපාතය පහළ ගියේය.

> ***අපනයන ඉහළ යෑම සහ හදිසි නොවන ආනයන අධෛර්යමත් කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මගින් ආනයන පහළ යෑම හේතුවෙන් වෙළඳ ගිණුමේ හිඟය පහළ ගියේය...***

2022 වසරේ ජනවාරි-අගෝස්තු කාලපරිච්ඡේදය තුළ වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 7.9ට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 8.9ක් විය. අපනයන ආදායම ඉහළ යෑම සඳහා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත

**5.3 රූප සටහන**
**2022 ජන.-අගෝ. කාලපරිච්ඡේදය තුළ ද්විපාර්ශ්වික වෙළඳ ශේෂයන්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.1 සංඛ්‍යා සටහන**

## විදේශ වෙළඳාමේ ප්‍රවණතා

එ.ජ.ඩො. මිලියන

| කාණ්ඩය | 2020 | 2021(අ) | 2021 ජන.-අගෝ. (අ) | 2022 ජන.-අගෝ. (අ) | වාර්ෂික වෙනස්වීම % ජන.-අගෝ. 2021/2022 | දායකත්වය % ජන.-අගෝ. 2022 |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,336.2** | **2,729.5** | **1,765.5** | **1,708.5** | **-3.2** | **19.2** |
| තේ | 1,240.9 | 1,324.4 | 882.4 | 819.3 | -7.2 | 9.2 |
| පොල් | 345.2 | 425.2 | 276.9 | 284.3 | 2.7 | 3.2 |
| පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත | 163.1 | 200.9 | 125.6 | 128.1 | 2.0 | 1.4 |
| වෙනත් | 182.1 | 224.3 | 151.3 | 156.2 | 3.3 | 1.8 |
| කුළුබඩු | 333.5 | 454.8 | 282.4 | 233.5 | -17.3 | 2.6 |
| මුහුදු ආහාර | 189.8 | 274.1 | 165.5 | 188.4 | 13.8 | 2.1 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 134.7 | 148.8 | 91.1 | 120.4 | 32.0 | 1.4 |
| රබර් | 30.1 | 42.2 | 27.3 | 29.4 | 7.9 | 0.3 |
| එළවළු | 36.6 | 28.5 | 18.4 | 17.5 | -4.6 | 0.2 |
| සකස් නොකළ දුම්කොළ | 25.5 | 31.6 | 21.4 | 15.7 | -26.8 | 0.2 |
| **කාර්මික අපනයන** | **7,672.0** | **9,702.0** | **6,094.3** | **7,157.8** | **17.5** | **80.4** |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,423.1 | 5,435.1 | 3,434.8 | 4,095.6 | 19.2 | 46.0 |
| රබර් නිෂ්පාදිත | 786.1 | 1,050.4 | 681.7 | 676.3 | -0.8 | 7.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 373.6 | 506.4 | 294.9 | 409.8 | 39.0 | 4.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 337.5 | 500.9 | 329.1 | 375.9 | 14.2 | 4.2 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 464.0 | 586.9 | 354.0 | 366.0 | 3.4 | 4.1 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 181.5 | 276.7 | 179.1 | 278.7 | 55.7 | 3.1 |
| රසායනික නිෂ්පාදිත | 172.7 | 223.2 | 143.7 | 150.8 | 5.0 | 1.7 |
| මූල ලෝහ හා උපාංග | 110.9 | 156.4 | 100.1 | 120.2 | 20.1 | 1.4 |
| සත්ත්ව ආහාර | 102.9 | 149.4 | 77.5 | 109.2 | 40.9 | 1.2 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 99.3 | 129.9 | 82.6 | 95.7 | 15.9 | 1.1 |
| වෙනත් කාර්මික අපනයන | 620.5 | 686.8 | 417.0 | 479.5 | 15.0 | 5.4 |
| **ඛනිජමය අපනයන** | **25.1** | **44.5** | **30.7** | **21.1** | **-31.3** | **0.2** |
| **වර්ග නොකළ අපනයන** | **14.1** | **22.6** | **13.6** | **14.8** | **8.8** | **0.2** |
| **මුළු අපනයන** | **10,047.4** | **12,498.6** | **7,904.0** | **8,902.2** | **12.6** | **100.0** |
| **ආනයන** | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,401.7** | **3,848.7** | **2,579.3** | **1,945.7** | **-24.6** | **15.2** |
| ආහාර හා පාන වර්ග | 1,554.4 | 1,666.5 | 1,151.9 | 1,106.2 | -4.0 | 8.6 |
| සහල් | 10.5 | 73.0 | 8.4 | 229.5 | 2,618.0 | 1.8 |
| කිරි නිෂ්පාදිත | 333.8 | 317.7 | 231.2 | 174.5 | -24.5 | 1.4 |
| සීනි | 276.0 | 287.5 | 210.5 | 147.9 | -29.7 | 1.2 |
| පරිප්පු | 96.9 | 143.0 | 105.7 | 81.0 | -23.4 | 0.6 |
| වෙනත් | 837.2 | 845.2 | 596.1 | 473.3 | -20.6 | 3.7 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1,847.3 | 2,182.2 | 1,427.3 | 839.4 | -41.2 | 6.6 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 595.5 | 882.5 | 532.0 | 347.5 | -34.7 | 2.7 |
| රෙදිපිළි හා උපාංග | 200.7 | 221.3 | 138.7 | 158.6 | 14.4 | 1.2 |
| ගෘහ උපකරණ | 174.2 | 257.1 | 179.8 | 71.3 | -60.3 | 0.6 |
| විදුලි සංදේශ මෙවලම් | 268.4 | 382.9 | 283.1 | 49.9 | -82.4 | 0.4 |
| පෞද්ගලික රථවාහන | 282.9 | 12.8 | 7.8 | 5.7 | -26.5 | 0.04 |
| වෙනත් | 325.6 | 425.7 | 286.0 | 206.5 | -27.8 | 1.6 |
| **අන්තර් භාණ්ඩ** | **9,076.5** | **12,308.9** | **7,942.4** | **8,584.0** | **8.1** | **67.1** |
| ඉන්ධන | 2,542.6 | 3,742.9 | 2,395.9 | 3,317.9 | 38.5 | 25.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,335.1 | 3,066.9 | 1,943.7 | 2,175.7 | 11.9 | 17.0 |
| රසායනික නිෂ්පාදිත | 831.5 | 1,074.4 | 732.6 | 682.1 | -6.9 | 5.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 540.2 | 765.7 | 518.6 | 464.9 | -10.4 | 3.6 |
| කඩදාසි, සන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 383.1 | 468.9 | 319.4 | 325.5 | 1.9 | 2.5 |
| මූල ලෝහ | 460.3 | 866.4 | 499.2 | 270.0 | -45.9 | 2.1 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 218.7 | 400.7 | 265.8 | 257.6 | -3.1 | 2.0 |
| රථවාහන හා යන්ත්‍රෝපකරණ කොටස් | 239.4 | 349.4 | 235.5 | 188.1 | -20.1 | 1.5 |
| තිරිඟු හා ඉරිඟු | 384.4 | 418.3 | 265.9 | 170.3 | -36.0 | 1.3 |
| පොහොර | 258.9 | 158.2 | 104.0 | 98.2 | -5.5 | 0.8 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 882.3 | 997.1 | 661.9 | 633.8 | -4.3 | 5.0 |
| **ආයෝජන භාණ්ඩ** | **3,563.2** | **4,462.7** | **2,882.3** | **2,263.5** | **-21.5** | **17.7** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,176.1 | 2,809.5 | 1,822.5 | 1,462.4 | -19.8 | 11.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,035.6 | 1,248.9 | 803.9 | 689.2 | -14.3 | 5.4 |
| ප්‍රවාහන උපකරණ | 348.3 | 398.5 | 252.1 | 109.2 | -56.7 | 0.9 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 3.2 | 5.8 | 3.7 | 2.7 | -27.8 | 0.02 |
| **වර්ග නොකළ ආනයන** | **14.0** | **17.1** | **7.6** | **7.7** | **2.2** | **0.1** |
| **මුළු ආනයන** | **16,055.4** | **20,637.4** | **13,411.5** | **12,800.9** | **-4.6** | **100.0** |

(අ) තාවකාලික

*මූලයන්:* ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ ආදි කාර්මික අපනයන ප්‍රධාන වශයෙන් දායක විය. අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යැමෙහි හිතකර බලපෑම හේතු විය. 2022 වසරේ ජනවාරි-අගෝස්තු කාලපරිච්ඡේදය තුළ ඇමෙරිකා එක්සත් ජනපදය (26%), යුරෝපා සංගමය (23%), එක්සත් රාජධානිය (8%) සහ ඉන්දියාව (6%) ප්‍රධාන අපනයන ගමනාන්තයන් විය.

> **ඉහළ උද්ධමනය, දැඩි මූල්‍ය තත්ත්ව සහ ආර්ථික අවපාතය ආශ්‍රිත ගැටලු හේතුවෙන් ප්‍රධාන අපනයන ගමනාන්තවල පාරිභෝගික වියදම් රටාවේ වෙනස්වීම් හමුවේ ඉදිරි කාලයේ දී අපනයන අංශයට අභියෝගවලට මුහුණ දීමට සිදු විය හැකිය...**


2022 වසරේ ජනවාරි-අගෝස්තු කාලපරිච්ඡේදය තුළ ආනයන වියදම, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 13.4ට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 12.8ක් දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, 2022 වසරේ පළමු කාර්තුවේ දී ආනයන වියදම, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති ආනයන වියදමට වඩා ඉහළ ගිය අතර, අත්‍යවශ්‍ය ආනයන සඳහා විදේශ විනිමය ලබා ගැනීමේ අරමුණින් ආනයන වියදම් සීමා කිරීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හඳුන්වා දීම අවශ්‍ය විය. මීට අමතරව, බැංකු පද්ධතියේ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය, විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් ආනයන මිල ගණන් ඉහළ යෑම සහ සැලකිය යුතු ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම හේතුවෙන් ඉල්ලුම අඩු වීම ද, 2022 වසරේ මාර්තු මාසයේ සිට ආනයන වියදමෙහි පහළ යෑමට හේතු විය. 2022 වසරේ ජනවාරි-අගෝස්තු කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන ආනයන ප්‍රභව වූයේ, ඉන්දියාව (27%), චීනය (20%), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (5%) සහ මැලේසියාව (5%)යි. නැගී එමින් පවතින ගෝලීය ආර්ථික අවපාත තත්ත්වය සහ භූ දේශපාලනික පීඩන හේතුවෙන් වර්තමානයේ දී ගෝලීය ආර්ථික පරිසරය අවිනිශ්චිතතාවයන්ට මුහුණ දෙමින් සිටින බැවින්, ඉදිරි කාලය තුළ වෙළඳ භාණ්ඩ මිල ගණන්වල උච්චාවචනයන් ඇති විය හැකි අතර, 2022 වසරේ ඉදිරි කාලය තුළ සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සහ අනෙකුත් බහුපාර්ශ්වික නියෝජිතායතනවලින් අපේක්ෂිත මූල්‍ය ආධාර සමඟ විදේශ විනිමය ගලා ඒම් නැවත ආරම්භ වන තුරු ආනයන වියදම් දැඩි ලෙස සීමා කිරීම අවශ්‍ය විය හැකිය.

### සේවා ගිණුම

2021 වසරට සාපේක්ෂව තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශයෙහි මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පැවතිය ද, සංචාරක අංශය යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය 2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව, 2022 වසරේ පළමු භාගයේ දී වර්ධනය විය. 2022 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සංචාරක පැමිණීම් මිලියන භාගයකට වඩා වාර්තා කරමින් වසර තුළ මේ දක්වා සංචාරක ඉපැයීම් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර, එම කාලපරිච්ඡේදය තුළ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 946ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඉන්ධන හිඟය, විදුලිය ඇනහිටීම් සහ ඇතැම් රටවල් විසින් මෙරට සංචරණය පිළිබඳ නිකුත් කළ අනතුරු ඇඟවීම් යනාදිය වැනි අහිතකර තත්ත්වයන් වසර ආරම්භයේ දී සංචාරක පැමිණීමේ විභවතාවය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. කෙසේ වෙතත්, මෑතක දී එම අංශවල යම් හිතකර වර්ධනයන් ඇති වූ අතර, එමගින් ඉදිරි කාලය තුළ සංචාරක ක්ෂේත්‍රය වේගවත් ලෙස යථා තත්ත්වයට පත්වීමේ අපේක්ෂාව ඉහළ නැංවී ඇත.

> **සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වයෙහි බලපෑම මූලික වශයෙන් පිළිබිඹු කරමින් සේවා වෙළඳාමේ අතිරික්තය කැපී පෙනෙන වර්ධනයක් පිළිබිඹු කළේය...**

**5.4 රූප සටහන**
**ගෙවුම් තුලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.2 සංඛ්‍යා සටහන**

**ජංගම සහ ප්‍රාග්ධන ගිණුම**

එ.ජ.ඩො. මිලියන

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) | 2021 පළමු භාගය (ආ) | 2022 පළමු භාගය (ආ) |
|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | **-6,008** | **-8,139** | **-4,316** | **-3,514** |
| අපනයන | 10,047 | 12,499 | 5,699 | 6,514 |
| *වර්ධනය (%)* | -15.9 | 24.4 | 29.1 | 14.3 |
| ආනයන | 16,055 | 20,637 | 10,015 | 10,028 |
| *වර්ධනය (%)* | -19.5 | 28.5 | 30.5 | 0.1 |
| | | | | |
| **සේවා (ශුද්ධ)** | **819** | **1,586** | **597** | **1,336** |
| ලැබීම් | 3,035 | 2,475 | 985 | 1,766 |
| එයින්, | | | | |
| ප්‍රවාහන (ශුද්ධ) | 114 | 352 | 158 | 211 |
| *වර්ධනය (%)* | -81.8 | 207.8 | 8.8 | 33.2 |
| සංචාරක ඉපැයීම් | 682 | 507 | 44 | 740 |
| *වර්ධනය (%)* | -81.1 | -25.7 | -93.5 | 1,578.9 |
| තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම | 971 | 1,168 | 574 | 567 |
| *වර්ධනය (%)* | 8.0 | 20.4 | 17.9 | -1.1 |
| ගෙවීම් | 2,216 | 889 | 387 | 430 |
| | | | | |
| **ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ)** | **-2,205** | **-2,018** | **-918** | **-1,111** |
| ලැබීම් | 198 | 116 | 69 | 109 |
| ගෙවීම් | 2,404 | 2,134 | 987 | 1,220 |
| | | | | |
| **ද්විතීයික ආදායම් ගිණුම (ශුද්ධ)** | **6,207** | **5,228** | **3,199** | **1,461** |
| එයින්, | | | | |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,104 | 5,491 | 3,324 | 1,610 |
| *වර්ධනය (%)* | 5.8 | -22.7 | 11.6 | -51.6 |
| | | | | |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-1,187** | **-3,343** | **-1,437** | **-1,828** |
| | | | | |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **28** | **25** | **12** | **7** |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,159** | **-3,318** | **-1,425** | **-1,821** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

පරිගණක සහ තොරතුරු සේවා උප අංශය 2022 වසරේ පළමු භාගය තුළ සේවා වෙළඳාමේ ඉපැයීම් සඳහා දායක වුව ද, 2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව එහි දායකත්වය මධ්‍යස්ථව පැවතුණි. මීට අමතරව, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය මගී ගාස්තු සමඟ ප්‍රවාහන අංශයෙන් ලැබෙන ශුද්ධ ආදායම ද මෙම කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය වී ඇත.

### ප්‍රාථමික ආදායම් සහ ද්විතීයික ආදායම් ගිණුම්

සෘජු ආයෝජන ව්‍යාපාරවල ලාභාංශ සහ සේවක වැටුප් ආකාරයෙන් වන ගෙවීම්, 2021 වසරේ පළමු භාගයට සාපේක්ෂව වඩා ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, 2022 වසරේ මුල් භාගයේ දී පුළුල් විය.[1]

1 ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ද්විපාර්ශ්වික ව්‍යාපෘති ණය සහ වාණිජ ණය මත වන විදේශීය ණය ආපසු ගෙවීම් තාවකාලිකව අත්හිටුවා තිබියදීත්, ගෙවුම් තුලන සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්ව අත්පොතෙහි හයවන සංස්කරණයට (BPM6) අනුව උපචිත කූපන/පොලී ගෙවීම් ප්‍රාථමික ආදායම් ගිණුමේ සටහන් කර ඇත.

> ***සංක්‍රමණික ශ්‍රමිකයින් සංඛ්‍යාව ඉහළ යෑම සහ නිල සහ අවිධිමත් වෙළඳපොළ විනිමය අනුපාතික අතර පරතරය සාපේක්ෂව අඩු වීම හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මෑතක දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පිළිබිඹු කළේය...***

2021 වසර තුළ පැවති විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීමේ ප්‍රවණතාව නිරූපණය කරමින් 2022 වසරේ පළමු භාගයේ දී මෙන්ම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල කැපී පෙනෙන අඩු වීමක් පිළිබිඹු කිරීම හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය අඩු විය. කෙසේ වෙතත්, සංක්‍රමණික සේවක සංඛ්‍යාවේ ස්ථාවර ඉහළ යෑමත්, නිල සහ අවිධිමත් වෙළඳපොළ විනිමය අනුපාතික අතර පරතරය සාපේක්ෂව පහළ යෑමත් හේතුවෙන් මෙම වසරේ දෙවන භාගයේ සිට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑමක් පිළිබිඹු කළේය.

### මූල්‍ය ගිණුම

2022 වසරේ පළමු භාගය තුළ දී මූල්‍ය ගිණුම වෙත ලැබීම් මන්දගාමී විය. වසරේ පළමු භාගය තුළ ප්‍රධාන මූල්‍ය ලැබීම් වූයේ, දකුණු ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානය යටතේ ඉන්දියානු සංචිත බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකම සහ සුළු වශයෙන් ඉහළ ගිය විදේශීය සෘජු ආයෝජන ලැබීම්ය. මේ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ යන දෙඅංශයේම විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් සුළු වශයෙන් වාර්තා විය. මෙම සීමිත ලැබීම් තිබියදීත්, මූල්‍ය ගිණුමෙහි ගෙවීම් සැලකිය යුතු මට්ටමක පැවතුණි. තවද, 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම ප්‍රකාශ කිරීමට පෙර 2022 වසරේ මුල් භාගයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීම ඇතුළුව සැලකිය යුතු විදේශීය ණය සේවාකරණ ගෙවීම් සිදු කරන ලදී. මේ අතර, සීමිත විදේශ විනිමය ලැබීම් මධ්‍යයේ වුව ද, දළ නිල සංචිත යොදා ගනිමින් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය යම් ප්‍රමාණයක් සඳහා මූල්‍යන සැපයීම් අඛණ්ඩව සිදුකරන ලදී. ඒ අනුව, 2021 වසරේ අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 3.1ක පැවති දළ නිල සංචිත මට්ටම 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 1.8ක් දක්වා අඩු විය. 2021 වසර අවසානයේ සහ 2022 වසරේ සැප්තැම්බර් මස අවසානයේ පැවති දළ නිල සංචිත මට්ටම්වල චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම, පිළිවෙළින්, එ.ජ. ඩොලර් බිලියන 1.6ක් සහ එ.ජ. ඩොලර් බිලියන 1.4ක් අන්තර්ගත වන අතර එය භාවිතය පිළිබඳ කොන්දේසිවලට යටත් වේ.

**5.3 සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**

එ.ජ.ඩො. මිලියන

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) | 2021 පළමු භාගය (ආ) | 2022 පළමු භාගය (ආ) |
|---|---|---|---|---|
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-394** | **-4,816** | **-1,802** | **-1,840** |
| **මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්** | **-2,113** | **-2,122** | **-1,535** | **-355** |
| සෘජු ආයෝජන | 15 | 17 | 9 | 8 |
| අනෙකුත් ආයෝජන | -136 | 387 | 37 | 813 |
| මුදල් සහ තැන්පතු | 64 | 306 | -52 | 488 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -224 | 257 | 100 | 132 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 24 | -176 | -11 | 193 |
| සංචිත වත්කම් | -1,992 | -2,526 | -1,581 | -1,176 |
| **මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම්** | **-1,718** | **2,694** | **267** | **1,485** |
| සෘජු ආයෝජන | 434 | 598 | 258 | 297 |
| විවිධ ආයෝජන | -2,383 | -906 | -89 | -62 |
| හිමිකම් | -217 | -236 | -127 | 135 |
| ණය සුරැකුම් | -2,166 | -670 | 37 | -197 |
| අනෙකුත් ආයෝජන | 231 | 3,003 | 99 | 1,250 |
| මුදල් සහ තැන්පතු | -15 | 4,016 | -177 | 455 |
| ණය | 174 | -1,552 | 25 | -340 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 185 | -428 | 133 | -302 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | -114 | 180 | 118 | 1,398 |
| **වැරදීම් සහ අත්හැරීම්** | **765** | **-1,498** | **-377** | **-19** |
| **සමස්ත ශේෂය** | **-2,328** | **-3,967** | **-1,261** | **-2,814** |
| **දළ නිල සංචිත** | **5,664** | **3,139** | **4,060** | **1,854** |
| ආනයනික මාස | 4.2 | 1.8 | 2.6 | 1.1 |
| **මුළු විදේශීය සංචිත** | **8,521** | **6,122** | **6,824** | **5,521** |
| ආනයනික මාස | 6.4 | 3.6 | 4.5 | 3.2 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.2 සමස්ත ශේෂය සහ දළ නිල සංචිත

2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු හිඟයක් වාර්තා කළේය. මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු වීම සහ සැලකිය යුතු ලෙස ඉහළ ණය

**5.5 රූප සටහන**

**දළ නිල සංචිත සහ ආනයනික මාස**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවාකරණ ගෙවීම් හේතුවෙන් දළ නිල සංචිත 2021 වසර අවසානයේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.1ට සාපේක්ෂව 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 1.8ක් දක්වා අඩු විය. සංචිත ශක්තිමත් කිරීම සඳහා 2022 වසරේ ජනවාරි-සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන ලැබීම වූයේ ඉන්දියානු සංචිත බැංකුව වෙතින් ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකමයි. මේ අතර, 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට දළ නිල සංචිත ආනයනික මාස 1.1කට සමාන වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

## 5.3 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

අනේවාසිකයින් සමග සිදු කෙරුනු ගනුදෙනුවලට අදාළ ශ්‍රී ලංකාවේ මුළු විදේශීය වත්කම් සහ වගකීම් තත්ත්වයන් අතර ඇති වෙනස, එනම් ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි ශුද්ධ වගකීම් තත්ත්වය, 2021 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් බිලියන 55.7ක සිට 2022 වසරේ ජූනි මස අවසානය වනවිට එ.ජ. ඩොලර් බිලියන 48.9ක් දක්වා අඩු විය. 2021 වසර අවසානයට සාපේක්ෂව 2022 වසරේ ජූනි මස අවසානය වන විට මූලික වශයෙන් දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 1.3කින් පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශීය වත්කම්වල තත්ත්වය අඩු විය. 2021 වසර අවසානයට සාපේක්ෂව 2022 වසරේ ජූනි මස අවසානය වන විට අනේවාසිකයින් වෙත වූ ශ්‍රී ලංකාවේ මුළු වගකීම් තත්ත්වය ද අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සෘජු ආයෝජන වගකීම් අඩු වීම, විවිධ ආයෝජන වගකීම් අඩු වීම සහ තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වගකීම් අඩු වීමයි. ප්‍රධාන වශයෙන් 2022 වසරේ ජනවාරි මස ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීමත් සමග, රජයේ නොපියවා ඉතිරිව ඇති වගකීම් අඩු විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ද්විපාර්ශ්වික හා වාණිජමය ස්වභාවයේ ණයවලට අදාළ ව්‍යාපෘති ණය මත වන විදේශීය ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇතත්, ගෙවුම් තුලන සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්ව අත්පොතෙහි හයවන සංස්කරණයට (BPM6) අනුව, මෙම ණය උපකරණවල නොපියවා ඉතිරිව ඇති වගකීම් තීරණය කිරීමේ දී උපචිත කූපන/පොලී ගෙවීම් එකතු කර ඇත. තවද, පෞද්ගලික අංශයට සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ලද වෙළඳ ණයවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය සුළු වශයෙන් වැඩි විය. ඉන්දියානු සංචිත බැංකුව සමග ඇතිකරගත් විදේශ විනිමය හුවමාරු පහසුකම හේතුවෙන් මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති වගකීම් වැඩි විය.

## 5.4 විදේශීය ණය තත්ත්වය

ප්‍රධාන වශයෙන් 2022 වසරේ ජනවාරි මාසයේ කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ආපසු ගෙවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය තත්ත්වය 2021 වසරේ අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 50.7ක සිට 2022 වසරේ ජූනි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 48.7ක් දක්වා සුළු වශයෙන් අඩු විය. තවද, ප්‍රධාන වශයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගැටලු පිළිබිඹු කරමින් නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම අඩු විය. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය යටතේ ඉන්දියානු සංචිත බැංකුව වෙතින් එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකම ලැබීමත් සමඟ, 2021 වසර අවසානයට සාපේක්ෂව මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය 2022 වසරේ ජූනි මස අවසානය වනවිට වැඩි විය. මහ බැංකුවේ ආසියානු නිෂ්කාශන සංගමයට අදාළ වගකීම් ද වසර ආරම්භයට සාපේක්ෂව 2022 වසරේ ජූනි මස අවසානය වනවිට වැඩි විය. මුදල් හා තැන්පතුවල වැඩිවීමක් තිබියදීත්, නොපියවා ඉතිරිව ඇති කෙටි කාලීන ණය සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් බැංකු අංශයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය අඩු විය. රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ලැබුණු වෙළඳ ණය සහ අත්තිකාරම් සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය අඩු වීමත් සමඟ 2022 වසරේ පළමු භාගය තුළ දී පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය අඩු විය. කෙසේ වෙතත්, සෘජු ආයෝජන ව්‍යාපාර විසින් අන්තර් සමාගම් ණය ලබා ගැනීම් 2022 වසරේ පළමු භාගය තුළ වැඩි වීමක් වාර්තා කළේය.

**5.4 සංඛ්‍යා සටහන**
**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය**

එ.ජ.ඩො. මිලියන

| ශීර්ෂය | 2020 (අ) | 2021 (ආ) | 2022 පළමු භාගය (ආ) |
|---|---|---|---|
| දළ විදේශීය ණය තත්ත්වය (වෙළඳපොළ අගය මත පදනම්ව) | **49,041** | **50,724** | **48,731** |
| රජය | 28,187 | 27,344 | 24,990 |
| මහ බැංකුව | 2,690 | 4,892 | 6,364 |
| තැන්පතු භාරගන්නා ආයතන | 6,657 | 7,146 | 6,112 |
| අනෙකුත් අංශ | 6,517 | 6,078 | 5,715 |
| සෘජු ආයෝජන : | | | |
| අන්තර් සමාගම් ණය | 4,990 | 5,264 | 5,550 |
| | | | |
| **විශේෂිත අයිතමයන්** | | | |
| රජයේ දළ විදේශීය ණය තත්ත්වය (මුහුණත අගය මත පදනම්ව) | 32,452 | 32,302 | 32,177 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.5 විනිමය අනුපාතිකයේ හැසිරීම

2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමකට ඉඩ දීමට පෙර, ශ්‍රී ලංකා රුපියල 2022 වසර මුල දී පුළුල් ලෙස ස්ථාවර මට්ටමක පැවතුණි. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම සහ ශිෂ්ට ප්‍රයෝග අඛණ්ඩව භාවිත කිරීම 2021 වසර අග භාගයේ සහ 2022 වසර මුල් භාගයේ දී ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගය ස්ථාවර කිරීමට උපකාරී විය. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු වල සහාය ඇතිව මහ බැංකුවේ වෙළඳපොළ මැදිහත්වීමත් සමඟ, අන්තර් බැංකු වෙළඳපොළෙහි බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය, 2021 වසරේ අග භාගයේ සහ 2022 වසරේ මුල් භාගයේ දී එ.ජ. ඩොලරයට රුපියල් 200-203ක් පමණ අගයක පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාවයේ සැලකිය යුතු හිඟය විනිමය අනුපාතිකය මත අඛණ්ඩව බලපෑම් එල්ල කළ අතර, ඒ හේතුවෙන් 2022 වසරේ මාර්තු මස මුල සිට විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමක් සඳහා ඉඩ හරින ලදී. කෙසේ වුව ද, ඉන්පසුව වෙළඳපොළ බලවේග හමුවේ විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන්, 2022 වසරේ අප්‍රේල් මස අවසානය වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 41.4%කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. ඉහළ ගිය සමපේක්ෂණ බලපෑම් මගින් ඇති වූ සැලකිය යුතු අස්ථාවරත්වය අවම කිරීම සඳහා මහ බැංකුව විසින් 2022 වසරේ මැයි මස 13වැනි දින වෙළඳපොළ හවුල්කරුවන් සමඟ සාකච්ඡා කර නව විනිමය අනුපාත විධිවිධානයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, පෙර දින අන්තර් බැංකු වෙළඳපොළෙහි තීරණය වූ බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය මත

**5.6 රූප සටහන**
**විනිමය අනුපාතිකයේ වෙනස්වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.5 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | කාලපරිච්ඡේදය අග අනුපාතිකය - විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | වෙනස (%) |
|---|---|---|---|
| | **2021** | **2022 - සැප්.** | |
| යූරෝ | 226.86 | 355.79 | -36.24 |
| ඉන්දියානු රුපියල් | 2.69 | 4.45 | -39.51 |
| ජපන් යෙන් | 1.74 | 2.51 | -30.55 |
| බ්‍රිතාන්‍ය පවුම් | 270.60 | 402.27 | -32.73 |
| එක්සත් ජනපද ඩොලර් | 200.43 | 362.90 | -44.77 |
| විශේෂ ගැනුම් හිමිකම් | 280.53 | 464.47 | -39.60 |
| **සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100)** | | | |
| නා.ස.වි.අ. මුදල් වර්ග 24 පැස අනුව | 79.65 | 48.57 | -39.02 |
| මූ.ස.වි.අ. මුදල් වර්ග 24 පැස අනුව | 83.31 | 48.07 | -42.30 |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

පදනම්ව, දෙපසටම අදාළ විචලන සීමා සහිතව එතැන් විනිමය අනුපාතිකය පිළිබඳව මහ බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දෛනික මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කරන ලදී. ඒ අනුව, 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා කාලය තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 44.8%කින් අවප්‍රමාණය වීමක් වාර්තා කළ ද 2022 වසරේ මැයි මස 13වැනි දින සිට 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සුළු අවප්‍රමාණයක් පමණක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට, ස්ටර්ලින් පවුම, යූරෝ, ජපන් යෙන් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය.

> ***වෙළඳපොළ බලවේග හමුවේ 2022 වසරේ අප්‍රේල් මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල විශාල ලෙස අවප්‍රමාණය වුව ද, ඉන්පසුව විනිමය අනුපාතිකය පිළිබඳ දෛනික මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කිරීමත් සමඟ, ශ්‍රී ලංකා රුපියල ස්ථාවර විය...***

ව්‍යවහාර මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව විදේශීය අංශයේ තරගකාරිත්වය සහ ශ්‍රී ලංකා රුපියලේ හැසිරීම් මනිනු ලබන නාමික සඵල විනිමය අනුපාතික (නා.ස.වි.අ.) සහ මූර්ත සඵල විනිමය අනුපාතික (මූ.ස.වි.අ.) දර්ශක, 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ අඩු විය. සමස්තයක් වශයෙන්, මූ.ස.වි.අ. දර්ශක, දර්ශකාංක 100 සීමාවට වඩා අඩු අගයක පැවතුණු අතර, එමගින් රටෙහි වෙළඳ තරගකාරිත්වයට සහාය වන අයුරින් විනිමය අනුපාතිකය පැවති බව පිළිබිඹු වේ.

6

# රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කටයුතු

රජය 2022 වසරේ දී, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීම අරමුණු කරගත් ප්‍රධාන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ආරම්භ කරනු ලැබුවේ, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් හරහා රාජ්‍ය ණය තිරසාරභාවය සහතික කිරීමේ කොන්දේසිය මත, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම ඔස්සේ රජයේ අයවැයට සහායක් ලබා ගැනීමට අපේක්ෂා කරන අතරතුරය. 2022 වසරේ මේ දක්වා කාලය තුළ රජය විසින් හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිලාභ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය තුළ ඉදිරි කාලයේ දී සම්පූර්ණයෙන් ම පිළිබිඹු වනු ඇත. විශේෂයෙන් ම අධිභාර බද්ද, එකතු කළ අගය මත බදු සහ විදුලි සංදේශ බදු අනුපාතික ඉහළ නැංවීම වැනි සමහර බදු ප්‍රතිපත්ති හඳුන්වා දීම හේතුවෙන් 2022 වසරේ මුල් භාගයේ දී රාජ්‍ය ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ ගියේය. වැඩි වූ දේශීය පොලී අනුපාතික, අවප්‍රමාණය වූ විනිමය අනුපාතිකය සහ ඉහළ ගිය උද්ධමනය මෙන්ම, මෙම ආර්ථික අර්බුද සමය තුළ රාජ්‍ය අංශයේ සේවකයන්, විශ්‍රාමිකයන් සහ අඩු ආදායම්ලාභීන් සඳහා සහනයක් ලබා දීමට 2022 වසරේ මුල් භාගයේ දී ගත් ඇතැම් වියදම් ක්‍රියාමාර්ග තුළින් ද රාජ්‍ය වියදම නාමික වශයෙන් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරේ මුල් භාගයට සාපේක්ෂව, 2022 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී අයවැය හිඟය නාමික වශයෙන් පුළුල් විය. කෙසේ වෙතත්, පුරෝකථනය කරන ලද ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය මූල්‍ය ශේෂයන්, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී සාධනීය වර්ධනයක් පෙන්නුම් කළේය. විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ මධ්‍යම රජයේ නොපියවූ ණය සැලකිය යුතු ආකාරයෙන් ඉහළ ගියේය. මූල්‍ය පද්ධතියෙහි පැවති දැඩි ද්‍රවශීලතා හිඟය සහ ගෝලීය මූල්‍ය වෙළඳපොළ වෙත ඇති ප්‍රවේශය සීමා වීම හමුවේ ශුද්ධ විදේශීය ණය ආපසු ගෙවීම් හේතුවෙන්, අයවැය හිඟය මූල්‍යනය කිරීම මූලිකව ම මහ බැංකුව හරහා සිදු කිරීමට රජයට සිදු විය. ඉදිරි කාලය තුළ දී, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමේ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තහවුරු කරමින්, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ඇතුළු දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක කළ යුතුව තිබූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට දැඩිව යොමු වීමට ශ්‍රී ලංකාවට සිදු වනු ඇති අතර, ඉන් ප්‍රතිසංස්කරණ කිහිපයක් දැනටමත් ආරම්භ කර ඇත.

### 6.1 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දිශානතිය හා ක්‍රියාමාර්ග

වර්තමානයේ දක්නට ලැබෙන ව්‍යසනකාරී සාර්ව ආර්ථික බලපෑම් ඇති කරමින්, අඛණ්ඩව පැවතුණ රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා හේතුවෙන්, රාජ්‍ය ණය දැරිය නොහැකි තිරසාර නොවන මට්ටමක් කරා ළඟා වී ඇත. එබැවින්, සාර්ව ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවලට විසඳුම් ලබා දෙන අතර ම, රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමේ සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මාවතකට රජය පිවිසුණි. පසුගිය දෙවසර තුළ සිදු වූ රාජ්‍ය ආදායමේ කැපී පෙනෙන අඩු වීමේ ප්‍රවණතාවය වැළැක්වීම සඳහා රජය විසින් 2022 වසරේ මේ දක්වා කාලය තුළ දී රජයේ ආදායම් වැඩි කර ගැනීම සඳහා පියවර කිහිපයක් හඳුන්වා දෙන ලදී. 2020/2021 බදු තක්සේරු කිරීමේ වසර සඳහා, බදු අය කළ හැකි ආදායම රුපියල් බිලියන 2.0ක් ඉක්මවන පුද්ගලයන්, හවුල් ව්‍යාපාර සහ සමාගම් මත අතීත කාලයට බලපාන, එක් වරක් පමණක් ගෙවිය යුතු 25%ක අධිභාර බද්දක් පනවනු ලැබූ අතර, මූල්‍ය සේවා සඳහා අදාළ වන එකතු කළ අගය මත බදු අනුපාතිකය 2022 වසරේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි 15% සිට 18%ක් දක්වා ඉහළ නැංවිණි. 2022 වසරේ මැයි මාසයේ දී, අමාත්‍ය මණ්ඩලය විසින් රජයේ ආදායම් ඉපැයීම් ඉහළ නැංවීම සඳහා බදු ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, 2022 වසරේ ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, එකතු කළ අගය මත බදු අනුපාතිකය 8%ක සිට 12%ක් දක්වා ද, විදුලි සංදේශ බද්ද 11.25%ක සිට 15%ක් දක්වා ද ඉහළ නංවන ලදී. මීට අමතරව, රටේ පවතින විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සහ ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියෙහි දැනට පවතින ගැටලු පිළිබඳ සැලකිලිමත් වෙමින්, 2022 වසරේ ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස හයක කාලයක් සඳහා ආනයනික අයිතම කිහිපයකට අධිභාරයන් රජය විසින් පනවන ලදී. තවද, ආදායම් බදු සහ එකතු කළ අගය මත බදුවලට අදාළ ප්‍රතිසංස්කරණ කිහිපයක් 2022 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, ඔට්ටු සහ සූදු බද්ද 2023 වසරේ දී සංශෝධනය කෙරෙනු ඇත. වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 120.0ක් ඉක්මවන ආනයනකරුවන්, නිෂ්පාදකයන්, සේවා සපයන්නන්, තොග වෙළෙන්දන් සහ සිල්ලර වෙළෙන්දන් සඳහා පිරිවැටුම මත 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් 2022 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක කරන ලදී. 2022 වර්ෂය සඳහා වන අතුරු අයවැය මගින්, අනෙකුත් කරුණු අතර, 2022 වසරේ සැප්තැම්බර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතිකය 12%ක සිට 15%ක් දක්වා ඉහළ නැංවීමටත්, වයස අවුරුදු 18ට වැඩි සියලු නේවාසික පුද්ගලයන් සඳහා ඔවුන්ගේ වාර්ෂික ආදායම සහ බදු නිදහස් සීමාවන් නොසලකමින්, අනිවාර්යයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවක් හඳුන්වා දීමටත් යෝජනා විය. 2022 වසරේ මැයි මාසයේ දී ලබා ගත් අමාත්‍ය මණ්ඩල තීරණය දීර්ඝ කරමින්, පුද්ගල ආදායම් බදු සඳහා වූ බදු නිදහස් සීමාව වසරකට රුපියල් මිලියන 3.0ක සිට රුපියල් මිලියන 1.2ක් දක්වා අඩු කරමින් සංශෝධනය කිරීම, අධ්‍යාපනය, සෞඛ්‍යය, විශ්‍රාම යෝජනා ක්‍රම සඳහා දරන දායකත්ව, නිවාස ණය මත ගෙවනු ලබන පොලිය යනා දී වියදම් සඳහා ලබා දුන් රුපියල් මිලියන 1.2ක වියදම් සහනය ඉවත් කිරීම, උපයන විට ගෙවීමේ බදු/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අනිවාර්ය කිරීම, පුද්ගල ආදායම් බදු අනුපාතික 4%, 8%, 12%, 16%, 20%, සහ 24% සිට, පිළිවෙලින්, 6%, 12%, 18%, 24%, 30%, සහ 36% දක්වා ඉහළට සංශෝධනය කිරීම, රුපියල් මිලියන 1.2 ඉක්මවූ පුද්ගල ආදායම සඳහා බදු අනුපාතික අය කෙරෙන බදු කාණ්ඩ රුපියල් මිලියන 0.5ක් දක්වා සංශෝධනය කිරීම, විවිධ අංශ වෙනුවෙන් විශේෂයෙන් ලබා දුන් සියලු ආයතනික ආදායම් බදු නිදහස් කිරීම් සහ සහනදායී බදු අනුපාතික ඉවත් කිරීම, එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ බදු සීමාව පහළට ගෙන එමින් එම සීමාව වසරකට රුපියල් මිලියන 80ක් දක්වා සංශෝධනය කිරීම ඇතුළු තවත් ප්‍රතිපත්ති සඳහා 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2022 වසරේ ඔක්තෝබර් මස 11 වන දින ගැසට් කරන ලදී.

රාජ්‍ය මූල්‍ය අවකාශය සීමා වූ බැවින්, රජයේ වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී. 2022 වසරේ අප්‍රේල් මාසයේ දී මහා භාණ්ඩාගාරය විසින් ඵලදායී නොවන/ අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් මෙන්ම අතිකාල ගෙවීම්, නව සේවක බඳවා ගැනීම්, ලිපිද්‍රව්‍ය, මුද්‍රණ පිරිවැය යනාදිය වෙනුවෙන් දරන පුනරාවර්තන වියදම් සීමා කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වලට අදාළව මෙවැනිම චක්‍රලේඛයක් 2022 වසරේ අගෝස්තු මාසයේ දී නිකුත් කෙරිණි. අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා වියදම් ඉහළ යෑම සැලකිල්ලට ගෙන, පවතින ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සමෘද්ධි ප්‍රතිලාභීන්, වතුකරයේ ජනතාව, විශ්‍රාමිකයන් සහ රාජ්‍ය සේවකයන් මුහුණ දෙන දුෂ්කරතා අවම කිරීමේ අරමුණ ඇතිව, 2022 වසරේ මුල් භාගයේ දී රජය විසින් හඳුන්වා දෙන ලද සහන පැකේජයට අදාළ වියදම් තවදුරටත් සිදු කර ගෙන යෑම සඳහා 2022 වසරේ ජූනි මාසයේ දී රුපියල් බිලියන 695ක පරිපූරක ප්‍රතිපාදන සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, රාජ්‍ය සේවකයන්, විශ්‍රාමිකයන් සහ ආබාධිත සොල්දාදුවන් සඳහා රුපියල් 5,000ක මාසික දීමනාවක් ගෙවන ලද අතර, සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ දීමනාව මසකට රුපියල් 1,000ක් දක්වා

ඉහළ නැංවිණි. තවද, දැනටමත් අයවැය ප්‍රතිපාදන වෙන් කර ඇති කාර්යයන් හැරුණු කොට අනෙකුත් අත්‍යවශ්‍ය කාර්යයන් වෙනුවෙන් දැරීමට සිදු වන වියදම් ඉහළ යෑම සහ අමාත්‍යාංශ ව්‍යුහය වෙනස් වීම පදනම් කරගෙන 2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා 2022 වසරේ ජූනි මාසයේ දී කැබිනට් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත සහ 2022 වසර සඳහා වන අතුරු අයවැය, පිළිවෙලින්, 2022 වසරේ අගෝස්තු මස 09 වන දින සහ 2022 වසරේ අගෝස්තු මස 30 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරිණි. රජයේ වියදම් සම්බන්ධයෙන් ගත් කල, 2022 වසර සඳහා වන අතුරු අයවැය තුළ, අනෙකුත් අංශ සඳහා ප්‍රතිපාදන වෙන් කෙරෙන අතර, සමාජ ආරක්ෂණ ජාල, සංචාරක ප්‍රවර්ධනය, කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය, කෘෂිකාර්මික අංශයේ හා සත්ත්ව නිෂ්පාදන අංශයේ නියැළී සිටින තුරුණු ව්‍යවසායකත්වය සහ බීජ හා රෝපණ ද්‍රව්‍යවලට අවශ්‍ය අතිරේක වියදම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත.

විසර්ජන පනත යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති කාර්යයන් හැර, අනෙකුත් අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා දරන්නට සිදු වූ වියදම් ඉහළ යෑම සැලකිල්ලට ගෙන, 2022 වසර සඳහා 2021 අංක 30 දරන විසර්ජන පනත මගින් අනුමත කරන ලද රුපියල් බිලියන 3,200ක දළ ණය ගැනීම් සීමාව, 2022 වසරේ සැප්තැම්බර් මස මුල් භාගයේ දී 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත මගින් රුපියල් බිලියන 3,844ක් දක්වා ඉහළ නංවමින් සංශෝධනය කෙරිණි. තවද, ඉහළ පොලී අනුපාතික පවතින පසුබිමක් තුළ රජයේ මුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා මුහුණත් අගයට අනුව දළ ණය ගැනීමේ අවශ්‍යතාව ඉහළ යෑම හේතුවෙන් 2022 වසර සඳහා දළ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 4,507ක් දක්වා තවදුරටත් ඉහළ නැංවීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී අනුමැතිය ලබා දෙන ලදී.

රටේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පහළ දැමීම හේතුවෙන්, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුවෙන් (IBRD) ණය ලබා ගැනීමට ශ්‍රී ලංකාව තවදුරටත් සුදුසුකම් නොලබන බැවින්, ඉතාමත් අවදානමට ලක්ව ඇති රටවල් සඳහා 'ගැප්' (Gap) පහසුකම යටතේ සහනදායී මූල්‍යන පහසුකම් සපයන ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) ලබා දෙන අරමුදල් සඳහා ප්‍රවේශය ලබා ගැනීමට ලෝක බැංකුව වෙත ඉල්ලීමක් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, කෙටි කාලපරිච්ඡේදයක් සඳහා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රතිලෝම ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට රජය ප්‍රයත්න දරයි.

නුදුරු අනාගතයේ දී සිදු කිරීමට තිබෙන විශාල විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් සහ එවැනි ණය සේවාකරණ ගෙවීම් පියවීමට දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව හිඟ වීමත් සැලකිල්ලට ගෙන, තෝරා ගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම සඳහා රජය විසින් 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින නිවේදනයක් නිකුත් කරන ලදී. ඉන් අනතුරුව, ශ්‍රී ලංකා රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා සහාය ලබා ගැනීමට, රජය විසින් මූල්‍ය සහ නීති උපදේශකයන් ලෙස, පිළිවෙලින්, සීමාසහිත ලසාර්ඩ් සමාගම (Lazard Ltd.) සහ ක්ලිෆර්ඩ් චාන්ස් සීමිත හවුල් ව්‍යාපාරය (Clifford Chance LLP) පත් කරන ලද අතර, මෙම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය දැනට සිදු වෙමින් පවතී. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ මුල් භාගයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ නිලධාරී මට්ටමේ එකඟතා ගිවිසුමක් සඳහා සාකච්ඡා සාර්ථකව සම්පූර්ණ කෙරුණු අතර, මැදි කාලීනව සහ දිගු කාලීනව සාර්ව ආර්ථික ස්ථායීතාව යළි ඇති කිරීමට සහ රාජ්‍ය ණය තිරසාරභාවය ස්ථාපිත කිරීමට පුළුල් සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනක් දියත් කර ඇත. සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ, රජයේ ආදායම් ඉහළ දැමීම සහ වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවක් ඇති කිරීම දැඩිව ක්‍රියාත්මක කිරීමටත්, උපයෝගිතා සැපයීම සඳහා පිරිවැය පිළිබිඹු කරන මිල යාන්ත්‍රණයක් ඇති කිරීම මෙන්ම, රාජ්‍ය ව්‍යවසායයන් තුළ ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම ඇතුළු අනෙකුත් ප්‍රතිසංස්කරණ සිදු කිරීමටත් නියමිතය.

> ***සාර්ව ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවලට විසඳුම් ලබා දෙන අතර, රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමේ සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මාවතකට රජය පිවිසුණි...***

පූර්ව දැනුම්දීමකින් යුතුව, තෝරා ගත් විදේශීය ණය සේවාකරණ වගකීම් අත්හිටුවීමේ ක්‍රියාමාර්ගයත් සමඟ, 2022 වසරේ මුල් භාගයේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් තවදුරටත් පහළ හෙළීමට ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන කටයුතු කළේය. ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් 2022 වසරේ අප්‍රේල් මස 13 වන දින ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම 'CCC (සෘණ)' සිට 'CC (සෘණ) දක්වා ද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර පොලී ගෙවීමක් මග හැරීම සැලකිල්ලට ගනිමින් 2022 වසරේ අප්‍රේල් මස 25 වන දින, අවම ශ්‍රේණිගත කිරීම වන 'SD' (Selective

Default) දක්වා ද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම තවදුරටත් පහත හෙළන ලදී. 2022 වසරේ මැයි මස 19 වන දින, ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම 'C' සිට 'RD' (Restricted Default) දක්වා පහත හෙළන ලදී. එලෙසින්ම, 2022 වසරේ අප්‍රේල් මස 18 වන දින මූඩීස් ආයෝජක සේවාව විසින් ද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම 'Ca (ස්ථාවර)' සිට 'Caa2 (ස්ථාවර)' දක්වා පහත හෙළන ලදී.

## 6.2 රජයේ අයවැය කටයුතු

### රජයේ ආදායම

බදු සහ බදු නොවන ආදායම් ඉහළ යෑමෙන් ඇති වූ ප්‍රතිලාභ අත්විඳිමින්, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 වසරේ මුල් භාගය තුළ දී රාජ්‍ය ආදායම නාමික වශයෙන් වර්ධනය විය. රාජ්‍ය ආදායම සහ ප්‍රදාන, 2021 වසරේ මුල් භාගයේ දී වාර්තා වූ රුපියල් බිලියන 715.3ක (ද.දේ.නි.යෙන් 4.0%ක) සිට 2022 වසරේ මුල් භාගය තුළ දී රුපියල් බිලියන 919.5ක් (පුරෝකථනය කරන ලද ද.දේ.නි.යෙන්[1] 4.1%ක්) දක්වා ඉහළ ගියේය. මෙම ආදායම 2022 වසර සඳහා ප්‍රකාශයට පත් කළ රාජ්‍ය අයවැයෙහි රාජ්‍ය ආදායම් සඳහා වූ ඉලක්කයෙන් 41.4%ක් සහ 2022 වසර සඳහා සම්මත වූ අතුරු අයවැයෙහි සංශෝධිත රාජ්‍ය ආදායම් සඳහා වූ ඉලක්කයෙන් 43.9%ක් වේ. 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 වසරේ මුල් භාගයේ දී බදු ආදායම රුපියල් බිලියන 798.8ක් දක්වා 24.6%කින් ඉහළ ගියේය. ආදායම් බදු, එකතු කළ අගය මත බදු, සුරා බදු, වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදුවලින් ලද ඉහළ ආදායම 2022 වසර මුල් භාගයේ දී බදු ආදායම් ලැබීම් නාමිකව වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත. 2022 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ, අධිභාර බද්දෙන් ලද ඉහළ ආදායම් ගලා ඒම් පෙන්නුම් කරමින්, ආදායම් බදුවලින් ලැබූ ආදායම, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී ලද රුපියල් බිලියන 115.9ක සිට 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 234.9ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. උද්ධමනයේ සැලකිය යුතු ඉහළ යෑම, 2022 වසරේ ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වූ පරිදි මූල්‍ය සේවා සඳහා අදාළ එකතු කළ අගය මත බදු අනුපාතිකය වැඩි වීම, වෙළඳ භාණ්ඩ මිල ගෝලීය වශයෙන් ඉහළ යෑම සහ එක්සත් ජනපද ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම යනාදියෙහි ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරමින්, එකතු කළ අගය මත බදුවලින් ලත් ආදායම, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සමාලෝචනයට ලක් කරනු ලබන කාල සීමාව තුළ දී රුපියල් බිලියන 197.8ක් දක්වා 29.9%කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් මත්පැන් නිෂ්පාදන හරහා ලද ඉහළ ආදායම හේතුවෙන්, සුරා බදුවලින් රැස් කළ සමස්ත ආදායම, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 152.4ක සිට 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 170.9ක් දක්වා ඉහළ ගියේය. 2021 වසරේ නොවැම්බර් 12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මත්පැන් නිෂ්පාදනය මත පනවන ලද සුරා බදු ඉහළ නංවමින් සිදු කළ සංශෝධන හේතුවෙන් මත්පැන්වලින් ලද සුරා බදු ආදායම ඉහළ ගියේය. 2020 වසරේ මාර්තු මාසයේ සිට මෝටර් වාහන ආනයන

1 ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන අනුව.

**6.1 සංඛ්‍යා සටහන**

**ආර්ථික වර්ගීකරණය අනුව රාජ්‍ය ආදායම**

රුපියල් බිලියන

| අයිතමය | 2020 (අ) | 2021 (ආ) | 2021 ජන - ජූනි (ආ) | 2022 ජන - ජූනි (ආ) |
|---|---|---|---|---|
| **බදු ආදායම** | **1,216.5** | **1,298.0** | **641.2** | **798.8** |
| ආදායම් බදු | 268.2 | 302.1 | 115.9 | 234.9 |
| එකතු කළ අගය මත බදු | 233.8 | 308.2 | 152.2 | 197.8 |
| නිෂ්පාදන බදු/සුරා බදු | 321.9 | 306.9 | 152.4 | 170.9 |
| ආනයන මත බදු | 114.2 | 64.3 | 40.8 | 25.4 |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද | 115.4 | 154.1 | 79.5 | 94.0 |
| සෙස් බද්ද | 82.7 | 55.8 | 28.4 | 20.4 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 49.3 | 75.5 | 39.5 | 38.9 |
| අනෙකුත් බදු | 30.9 | 31.0 | 32.6 | 16.5 |
| **බදු නොවන ආදායම** | **151.4** | **159.1** | **73.3** | **119.7** |
| **මුළු ආදායම** | **1,368.0** | **1,457.1** | **714.5** | **918.5** |


(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2020 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛනවලට ගැළපුම් සිදුකර ඇත.
(ආ) තාවකාලික

මූලය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය


**6.1 රූප සටහන**

**රාජ්‍ය ආදායමේ සංයුතිය**

**2022 (ජන-ජූනි)**




**2021 (ජන-ජූනි)**




මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

මත පැනවූ සීමාවන් හේතුවෙන්, මෝටර් වාහන මත ලැබූ නිෂ්පාදන බදු 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 12.1ක් ලෙස ඉතා පහළ අගයක පැවතිණි. මේ අතර, රටේ පවතින විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හමුවේ පෙට්‍රල් සහ ඩීසල් ආනයන අඩු වීම හේතුවෙන්, ඛනිජ තෙල් නිෂ්පාදනවලින් ලද නිෂ්පාදන බදු, 2021 වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 26.5ක් දක්වා 3.4%කින් පහළ ගියේය. මෙයට අමතරව, විදේශ විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම සහ ගෝලීය වෙළඳපොළෙහි වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම හේතුවෙන්, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදුවලින් ලද ආදායම, සමාලෝචනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 94.0ක් දක්වා ඉහළ ගියේය. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම මත සීමා පැනවීමත්, ඒ සමගම විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හේතුවෙන් ආනයන ඉල්ලුම පාලනය වීමත් සමඟ, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 වසරේ පළමු භාගයේ දී ආනයන මත බදු සහ සෙස් බදුවලින් ලද ආදායම, පිළිවෙලින්, රුපියල් බිලියන 25.4ක් සහ රුපියල් බිලියන 38.9ක් දක්වා, පිළිවෙලින්, 37.6%ක් සහ 1.4%කින් පහත වැටුණි. ප්‍රධාන වශයෙන්, අල, ලොකු ළූණු, බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු සහ රටඉඳි වැනි ඇතැම් වෙළඳ භාණ්ඩ මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතික පහළ දමමින් සිදු කළ සංශෝධන හේතුවෙන්, විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 28.4ක සිට 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 20.4ක් දක්වා පහළ ගියේය.

ප්‍රධාන වශයෙන් ගාස්තු හා අය කිරීම්වලින් ඉපැයූ ආදායම සහ මහ බැංකුව විසින් කළ ලාභ පැවරුම් සැලකිය යුතු අයුරින් ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ මුල් භාගයේ දී බදු නොවන ආදායම, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 73.3ට සාපේක්ෂව, රුපියල් බිලියන 119.7ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, සමාලෝචනයට ලක් කෙරෙන කාලපරිච්ඡේදය තුළ දී ගාස්තු සහ අය කිරීම්වලින් ලද ආදායම රුපියල් බිලියන 36.2ක් දක්වා රුපියල් බිලියන 20.4කින් ඉහළ ගිය අතර, මහ බැංකුව සිදු කළ ලාභ පැවරුම් රුපියල් බිලියන 30.0ක් දක්වා රුපියල් බිලියන 15.0කින් ඉහළ ගියේය.

> ***2022 වසරේ මුල් භාගයේ දී බදු ආදායම, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 25%කින් වර්ධනය වීම සඳහා ආදායම් බදු, එකතු කළ අගය මත බදු, සුරා බදු සහ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු මගින් රැස් කර ගත් ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් ම හේතු විය...***

### රජයේ වියදම් හා ශුද්ධ ණය දීම්

සමාලෝචනයට ලක් කෙරෙන කාලපරිච්ඡේදය අග භාගයේ දී වියදම් තාර්කිකරණය සඳහා ප්‍රයත්න දැරුව ද, ආර්ථික වර්ධනයට වැදගත් වන ආයෝජනවලින් ඉවතට සම්පත් යොමු කරවන, පහසුවෙන් අඩු කිරීමට නොහැකි අභිමතානුසාරී නොවන වියදම් හේතුවෙන් රජයේ වියදම නාමික වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පැවතිණි. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් යන දෙකම ඉහළ යෑමත් සමඟ, 2022 වසරේ මුල් භාගයේ දී සමස්ත වියදම සහ ශුද්ධ ණය දීම්, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව, නාමික වශයෙන්, රුපියල් බිලියන 1,495.5ක (ද.දේ.නි.යෙන් 8.5%) සිට රුපියල් බිලියන 1,822.1ක් (පුරෝකථනය කරන ලද ද.දේ.නි.යෙන් 8.1%) දක්වා 21.8%කින් ඉහළ ගියේය. 2022 වසරේ මුල් භාගයේ දී රාජ්‍ය වියදම, 2022 වසර සඳහා ප්‍රකාශයට පත් කළ අයවැයෙහි වියදම් ඇස්තමේන්තුවෙන් 47.3%ක් වූ අතර, 2022 වසර සඳහා සම්මත කළ අතුරු අයවැයෙහි සංශෝධිත වියදම් ඇස්තමේන්තුවලින් 41.2%ක් විය. ප්‍රධාන වශයෙන් වැටුප් හා වේතන සහ දේශීය පොලී ගෙවීම් ඉහළ යෑම සමගම වසංගතයෙන් බලපෑමට ලක් වූ කුටුම්භ සහ ව්‍යාපාර වෙත සපයන ලද ඍජු සහ වක්‍ර මූල්‍යමය සහාය සහ මහජන සෞඛ්‍ය සේවාවන් සඳහා දරන්නට සිදු වූ අතිරේක වියදම් අවශ්‍යතා හේතුවෙන්, සමාලෝචනයට ලක් කෙරෙන කාලපරිච්ඡේදය තුළ දී පුනරාවර්තන වියදම, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට වඩා 19.9%කින් ඉහළ යමින් රුපියල් බිලියන 1,571.6ක් ලෙස වාර්තා විය. 2021 වසරේ මුල් භාගයට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී වර්තන පැවරුම් සහ සහනාධාර

**6.2 සංඛ්‍යා සටහන**

**ආර්ථික වර්ගීකරණය අනුව රාජ්‍ය වියදම**

රුපියල් බිලියන


| අයිතමය | 2020 (අ) | 2021 (ආ) | 2021 ජන - ජූනි (ආ) | 2022 ජන - ජූනි (ආ) |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම** | **2,548.4** | **2,747.5** | **1,311.0** | **1,571.6** |
| භාණ්ඩ හා සේවා මත වන වියදම | 974.4 | 1,014.6 | 487.5 | 553.0 |
| එයින්, වැටුප් හා වේතන | 794.2 | 845.7 | 416.1 | 477.1 |
| පොලී ගෙවීම් | 980.3 | 1,048.4 | 507.0 | 657.8 |
| විදේශීය | 266.7 | 253.7 | 125.6 | 92.9 |
| දේශීය | 713.6 | 794.6 | 381.4 | 564.9 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 717.1 | 684.5 | 316.5 | 360.8 |
| එයින්, විශ්‍රාම වැටුප් | 257.8 | 269.8 | 130.3 | 150.0 |
| සමෘද්ධි | 52.4 | 55.4 | 30.4 | 26.1 |
| පොහොර සහනාධාර | 36.7 | 21.2 | 8.0 | 19.7 |
| **ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම්** | **492.6** | **774.2** | **184.5** | **250.5** |
| **මුළු වියදම හා ශුද්ධ ණය දීම්** | **3,041.0** | **3,521.7** | **1,495.5** | **1,822.1** |

(අ) 2020 වසරේ සිදුකළ 2019 වසරට අදාළ හිඟ ගෙවීම් පියවීම ගිණුම්ගත කිරීමේ දී, මුදල් අමාත්‍යාංශය විසින් රුපියල් බිලියන 422.6ක මුළු මුදලක් 2019 වසරට එකතු කිරීමෙන් 2020 වසර සඳහා වන රජයේ වියදම් හා ශුද්ධ ණය දීම් ගළපන ලදී. ඒ අනුව, 2020 වසරේ දී සිදුකරන ලද පුනරාවර්තන වියදම්වලින් රුපියල් බිලියන 123.4ක් 2019 වසරට එකතු කර ඇති අතර, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්වලින් රුපියල් බිලියන 299.2ක් 2019 වසරට එකතු කර ඇත.

(ආ) තාවකාලික

මූලය: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය


**6.2 රූප සටහන**
**රාජ්‍ය වියදමේ සංයුතිය**




මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සඳහා වියදම රුපියල් බිලියන 360.8ක් දක්වා 14.0%කින් ඉහළ ගිය අතර, රාජ්‍ය සේවකයන් සහ විශ්‍රාමිකයන් සඳහා 2022 වසරේ ජනවාරි මාසයේ සිට රුපියල් 5,000ක මාසික දීමනා ලබා දීමට වෙන් කළ ප්‍රතිපාදන තුළින්, වැටුප් සහ වේතන සඳහා දැරීමට සිදු වූ වියදම ද රුපියල් බිලියන 477.1ක් දක්වා 14.7%කින් ඉහළ ගියේය. සමස්ත රාජ්‍ය ආදායමෙන් 71.6%ක් අවශෝෂණය කරමින්,

**6.3 රූප සටහන**
**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ**
**(ද.දේ.නි.යෙහි % ලෙස) (අ)**




(අ) 2018-2021 වසරවලට අදාළ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කරන ලද 2015 පදනම් වර්ෂය සහිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වන අතර, 2022 වසරට අදාළ වන අගයයන් මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ.

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී පොලී ගෙවීම් රුපියල් බිලියන 657.8ක් දක්වා 29.8%කින් ඉහළ ගියේය. දේශීය පොලී අනුපාතික මෙන්ම නොපියවූ දේශීය ණය තොගයේ ඉහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින් දේශීය පොලී වියදම රුපියල් බිලියන 564.9ක් දක්වා 48.1%කින් ඉහළ ගිය ද, ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවා දැමීමේ රජයේ නිවේදනයත් සමඟ, තෝරා ගත් විදේශ ණය මත පොලී නොගෙවීම හේතුවෙන් විදේශීය පොලී ගෙවීම් රුපියල් බිලියන 92.9ක් දක්වා 26.0%කින් පහත වැටුණි. ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 184.5ක සිට 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 250.5ක් දක්වා 35.8%කින් ඉහළ ගියේය.

> ***ප්‍රධාන වශයෙන් වැටුප් හා වේතන (රාජ්‍ය ආදායමෙන් 51.9%) සහ දේශීය පොලී ගෙවීම් (රාජ්‍ය ආදායමෙන් 61.5%) ඉහළ යෑම සමඟම වසංගතයෙන් බලපෑමට ලක් වූ කුටුම්භ සහ ව්‍යාපාර වෙත සපයන ලද සෘජු සහ වක්‍ර මූල්‍යමය සහාය සහ මහජන සෞඛ්‍ය සේවාවන් සඳහා දරන්නට සිදු වූ අතිරේක වියදම් අවශ්‍යතා හේතුවෙන් රජයේ වියදම ඉහළ ගියේය...***

### ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ

පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී, ප්‍රාථමික ශේෂය හැර, ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ නාමික වශයෙන් පිරිහීමට ලක් වූ අතර, මෙම ශේෂයන් පුරෝකථනය කරන ලද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස තරමක ප්‍රගතියක් පෙන්නුම් කළේය. අයවැය හිඟය, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 780.2ක (ද.දේ.නි.යෙන් 4.4%) සිට 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 902.7ක් (පුරෝකථනය කරන ලද ද.දේ.නි.යෙන් 4.0%) දක්වා ඉහළ ගියේය. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 596.5ක (ද.දේ.නි.යෙන් 3.4%) සිට 2022 වසරේ ජූනි මාසයෙන් අවසන් වූ මාස හය තුළ දී රුපියල් බිලියන 653.1ක් (පුරෝකථනය කරන ලද ද.දේ.නි.යෙන් 2.9%) දක්වා ඉහළ ගියේය. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි අභිමතානුසාරී ආදායම් සහ වියදම් නියෝජනය වන සහ අයවැය ශේෂයෙන් පොලී වියදම් ඉවත් කිරීමෙන් ගණනය කරනු

ලබන ප්‍රාථමික ශේෂය, 2022 වසර තුළ දී හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ගවල බලපෑම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් පෙර වසරේ අනුරූපී කාලයේ දී වාර්තා වූ රුපියල් බිලියන 273.2ක (ද.දේ.නි.යෙන් 1.5%) සිට සමාලෝචනයට යටත් වන කාලපරිච්ඡේදයේ දී රුපියල් බිලියන 244.8ක් (පුරෝකථනය කරන ලද ද.දේ.නි.යෙන් 1.1%) දක්වා පහළ ගියේය.

### අයවැය හිඟය මූල්‍යනය කිරීම

තෝරා ගත් විදේශීය ණය ආපසු ගෙවීම අත්හිටුවීම සමඟ ගෝලීය මූල්‍ය වෙළඳපොළ වෙත ඇති ප්‍රවේශය සීමා වීම පිළිබිඹු කරමින්, 2022 වසර මුල් භාගයේ දී අයවැය හිඟය, ශුද්ධ පදනම මත, මුළුමනින් ම දේශීය මූලාශ්‍ර ඔස්සේ මූල්‍යනය කෙරිණි. ශුද්ධ දේශීය මූල්‍යනය, 2021 වසරේ අනුරූපී කාලයේ දී වාර්තා වූ රුපියල් බිලියන 759.0ට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා යන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 947.1ක් විය. ශුද්ධ දේශීය මූල්‍යන අතරින් භාණ්ඩාගාර බැඳුම්කර හරහා සිදු කෙරුණු මූල්‍යනය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 364.4ක (සමස්ත දේශීය ණය ගැනීම්වලින් 48.0%ක) මූල්‍යනයට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 1,034.3ක් (සමස්ත දේශීය ණය ගැනීම්වලින් 109.2%ක්) වැනි ඉහළ අගයක් ගත්තේය. මේ අතර, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය තුළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම ඔස්සේ මූල්‍යනය කළ රුපියල් බිලියන 178.4ට (සමස්ත දේශීය ණය ගැනීම්වලින් 23.5%ට) සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි මස සිට ජූනි මස දක්වා කාලපරිච්ඡේදය තුළ දී භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම ඔස්සේ රුපියල් බිලියන 660.2ක් (සමස්ත දේශීය ණය ගැනීම්වලින් 69.7%ක්) මූල්‍යනය කෙරිණි. තවද, 2022 වසරේ මුල් භාගයේ දී රජයේ අයිරා පහසුකමට අදාළව රුපියල් බිලියන 594.2ක මුදලක් ආපසු ගෙවන ලදී. මේ අතර, මහ බැංකුව මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 310.0ට සාපේක්ෂව, සමාලෝචනයට ලක් කෙරෙන කාලය තුළ දී රුපියල් බිලියන 1,000ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මහ බැංකුව මගින් සිදු කළ මූල්‍යනය ඉහළ යෑමට භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී අඩු වෙළඳපොළ දායකත්වයක් පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවට ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීමට සිදු වීම, වැටුප් ගෙවීම, ණය සේවාකරණ ගෙවීම් සහ රාජ්‍ය ව්‍යවසායයන් (උදාහරණයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වැනි) සඳහා ද්‍රවශීලතාව සැපයීම වැනි රජයේ වියදම් අවශ්‍යතා මූල්‍යනය වෙනුවෙන් මහ බැංකුව වෙත සෘජුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම යනාදී සාධක හේතු විය. මේ අතර, බැංකු නොවන අංශයෙන් ණය ගැනීම ද පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 258.8ට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 646.4ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පෙර වසරේ ජනවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ වාණිජ බැංකු පද්ධතිය හරහා සිදු කළ රුපියල් බිලියන 190.3ක ශුද්ධ මූල්‍යනයට සාපේක්ෂව, 2022 වසරේ සමාලෝචනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ දී වාණිජ බැංකු පද්ධතිය වෙත රුපියල් බිලියන 699.4ක ශුද්ධ ආපසු ගෙවීමක් සිදු කර ඇත.

> **සමහර විදේශීය ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම හමුවේ ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ වෙත ප්‍රවේශය සීමා වීම පිළිබිඹු කරමින්, 2022 වසරේ මුල් භාගයේ දී, ශුද්ධ පදනමක් මත, අයවැය හිඟය දේශීය මූලාශ්‍ර ඔස්සේ සම්පූර්ණයෙන් ම මූල්‍යනය කෙරිණ...**

සමස්ත විදේශීය මූල්‍යනය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 21.2ක ශුද්ධ ණය ගැනීම්වලට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 44.4ක ශුද්ධ ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. විදේශීය ව්‍යාපෘති ණයවලින් ලබා ගත් රුපියල් බිලියන 56.1ක ශුද්ධ ණය ගැනීම් සහ 2022 වසරේ ජනවාරි මාසයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා සිදු කළ රුපියල් බිලියන 100.5ක ශුද්ධ ණය ආපසු ගෙවීමකින් ශුද්ධ විදේශීය මූල්‍යනය සමන්විත විය. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම් මෙන්ම සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීමට රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තියත් සමඟ, සලකා බලන කාලය තුළ දී රාජ්‍ය අයවැය හිඟය මූල්‍යනයට ගෝලීය මූල්‍ය වෙළඳපොළ වෙත පිවිසීම සීමා විය.

### රාජ්‍ය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

#### රාජ්‍ය ණය[2]

2022 වසර මුල් භාගයේ දී, ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට එරෙහිව දේශීය ව්‍යවහාර මුදලෙහි ඇති වූ කැපී පෙනෙන අවප්‍රමාණය වීමේ බලපෑම සහ නාමික

2 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ දත්ත සකසා අවසන් නොමැති හෙයින් 2022 වසරේ ජූනි මාසය අවසන් වන විට පැවති මධ්‍යම රජයේ නොපියවූ ණය පිළිබඳ මෙහි සඳහන් දත්ත බොහෝදුරට තාවකාලික වේ.

වශයෙන් 2022 වසර මුල් භාගයේ දී අයවැය හිඟය සැලකිය යුතු ලෙස වැඩි වීමේ බලපෑම හේතුවෙන්, මධ්‍යම රජයේ නොපියවූ ණය 2022 වසරේ ජූනි මාසය අවසාන වන විට කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2021 වසර අවසානයේ රුපියල් බිලියන 17,589.4ක් ලෙස (ද.දේ.නි.යෙන් 99.5%ක්ව) පැවති මධ්‍යම රජයේ ණය, 2022 වසරේ ජූනි අවසානය වන විට රුපියල් බිලියන 24,264.4ක් (ද.දේ.නි.යෙන්[3] 122.4%ක්) දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, සමහර ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම සඳහා 2022 වසරේ අප්‍රේල් 12 දින සිදු කෙරුණු රජයේ නිවේදනයේ බලපෑම හේතුවෙන් මධ්‍යම රජයේ මෙම නොපියවූ ණය සඳහා වන ඇස්තමේන්තුව තාවකාලික දත්තයක් පමණි. 2021 වසරේ අවසානයට වාර්තා වූ ණය මට්ටම්වල සිට 2022 වසරේ ජූනි මාසය අවසානය වන විට සමස්ත දේශීය ණය රුපියල් බිලියන 12,738.5ක් (ද.දේ.නි.යෙන්[3] 64.3%ක්) දක්වා රුපියල් බිලියන 1,641.3කින් ඉහළ ගිය අතර, විදේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 11,525.9ක් (ද.දේ.නි.යෙන්[3] 58.1%ක්) දක්වා රුපියල් බිලියන 5,033.7කින් ඉහළ ගියේය. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම හේතුවෙන් මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණයෙහි විදේශීය ණය ප්‍රතිශතය, 2021 වසර අවසානයේ දී වාර්තා වූ 36.9%ට සාපේක්ෂව 2022 වසරේ ජූනි මාසය අවසානය වන විට 47.5%ක් දක්වා ඉහළ ගියේය.

3 2021 වසරේ දෙවන භාගයේ සහ 2022 වසරේ පළමු භාගයේ ද.දේ.නි. 2022 වසරේ ජූනි අවසානය වන විට පැවති නොපියවූ ණය, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, වාර්තා කිරීමට භාවිතා කර ඇත.

**6.3 සංඛ්‍යා සටහන**

**මධ්‍යම රජයේ නොපියවූ ණය (අ)**

රුපියල් බිලියන

| අයිතමය | 2020 | 2021 (ආ) | 2021 ජූනි අවසානයට (ආ) | 2022 ජූනි අවසානයට (ඇ) |
|---|---|---|---|---|
| **දේශීය ණය (ඈ)** | **9,065.1** | **11,097.2** | **9,931.7** | **12,738.5** |
| කල්පිරීම අනුව | | | | |
| කෙටිකාලීන | 2,197.6 | 3,139.8 | 2,702.6 | 3,355.2 |
| මැදි හා දිගුකාලීන | 6,867.5 | 7,957.4 | 7,229.1 | 9,383.3 |
| ආයතන අනුව (ඉ) | | | | |
| බැංකු | 4,731.7 | 5,467.1 | 5,214.9 | 6,071.4 |
| බැංකු නොවන අංශය | 4,333.4 | 5,630.1 | 4,716.9 | 6,667.2 |
| **විදේශීය ණය** | **6,052.2** | **6,492.2** | **6,632.8** | **11,525.9** |
| සහනදායී | 2,988.1 | 3,097.6 | 3,151.9 | 5,265.4 |
| සහනදායී නොවන | 3,064.1 | 3,394.6 | 3,480.9 | 6,260.5 |
| **රජයේ මුළු ණය** | **15,117.2** | **17,589.4** | **16,564.5** | **24,264.4** |

(අ) 2014 වසරේ දී ජා.මු. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත

(ආ) තාවකාලික

(ඇ) 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ දත්ත සකසා අවසන් නොමැති හෙයින්, 2022 වසරේ ජූනි මස අවසන් වන විට පැවති මධ්‍යම රජයේ නොපියවූ ණය පිළිබඳ දත්ත බොහෝ දුරට තාවකාලික වේ.

(ඈ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර ඇතුළත් නොවන අතර, 2012 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් සහ 2022 ජනවාරි 01 දින රුපියල් මිලියන 25,217ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 31,446කි.) ඇතුළත් වේ.

(ඉ) ව්‍යාපාර සහ පුද්ගලයින් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන සඳහා වන ගැළපීම් හේතුවෙන් බැංකු සහ බැංකු නොවන අංශ යටතේ පැවති දේශීය ණය සංයුතිය 2017 වසරේ සිට සංශෝධනය කරන ලදී.

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව


ද්විපාර්ශ්වික සහ වාණිජ විදේශීය ණයවලට අදාළව සිදු වූ ණය ආපසු ගෙවීම අත්හිටුවීමේ ක්‍රියාමාර්ගයත් සමඟ, මධ්‍යම රජයේ සමස්ත විදේශීය ණය කළඹෙහි සහනදායී නොවන ණය ප්‍රතිශතය 2021 වසර අවසානයේ දී පැවති 52.3% සිට 2022 වසරේ ජූනි මාසය අවසානය වන විට 54.3%ක් දක්වා ඉහළ ගියේය. සහනදායී නොවන නොපියවූ ණයෙහි ශේෂය, නාමික වශයෙන්, 2021 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 3,394.6ක සිට 2022 වසරේ ජූනි මාසය අවසානය වන විට රුපියල් බිලියන 6,260.5ක් දක්වා ඉහළ ගියේය. එයට ප්‍රතිවිරුද්ධව, සමස්ත විදේශීය ණය තුළ සහනදායී ණය ප්‍රතිශතය 2021 වසර අවසානයේ පැවති 47.7%ක සිට 2022 වසරේ ජූනි මාසය අවසානය වන විට 45.7%ක් දක්වා පහත වැටුණි.

### ණය සේවාකරණ ගෙවීම්

2022 වසරේ මුල් භාගයේ දී සිදු කෙරුණු සමස්ත ණය සේවාකරණ ගෙවීම්, 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 1,061.3ක සිට රුපියල් බිලියන 1,311.9ක් දක්වා ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් මධ්‍ය සහ දිගු කාලීන කල් පිරුණු විදේශීය ණය ආපසු ගෙවීම් ඉහළ යැමත් සමඟ ණය ආපසු ගෙවීම් ප්‍රමාණය, 2021 වසරේ අනුරූපී කාලයේ දී වාර්තා වූ රුපියල් බිලියන 554.3ක සිට 2022

**6.4 රූප සටහන**

**රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් සහ රජයේ ආදායම (ද.දේ.නි.යෙහි % ලෙස) (අ)**




(අ) 2018 -2021 වසරවලට අදාළ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කරන ලද 2015 පදනම් වර්ෂය සහිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වන අතර, 2022 වසරට අදාළ වන අගයයන් මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ.

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ මුල් භාගය තුළ දී රුපියල් බිලියන 654.1ක් දක්වා ඉහළ ගියේය. 2021 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ දී පැවති රුපියල් බිලියන 507.0ක් වූ පොලී ගෙවීම්, විශේෂයෙන් ම, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් දේශීය ණය සඳහා පොලී ගෙවීම් ඉහළ යෑම මූලික වශයෙන් හේතු කරගෙන, සමාලෝචනයට ලක් කෙරෙන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 657.8ක් දක්වා ඉහළ ගියේය. නොපියවූ මධ්‍යම රජයේ ණය සඳහා සිදු කළ සමස්ත දේශීය ණය සේවාකරණය, 2021 වසරෙහි අනුරූපී කාලය තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 783.6ට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 949.7ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය සඳහා සිදු කළ ණය සේවාකරණ ගෙවීම්, පෙර වසරේ අනුරූපී කාලයේ දී වාර්තා වූ රුපියල් බිලියන 277.7ක ණය සේවාකරණ ගෙවීම්වලට සාපේක්ෂව, 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 362.2ක් දක්වා වැඩි විය.

> ***විශේෂයෙන් ම, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් දේශීය ණය සඳහා සිදු කළ පොලී ගෙවීම් ඉහළ යෑම මූලික වශයෙන් හේතු කරගෙන, මධ්‍යම රජයේ ණය සඳහා කළ පොලී ගෙවීම් (රාජ්‍ය ආදායමෙන් 71.6%) 29.8%කින් වර්ධනය විය...***

# 7

# මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

උද්ධමන පීඩන ඉහළ යෑම වැළැක්වීම සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේදී මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කළේය. ඛනිජ තෙල් සහ අනෙකුත් ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, දේශීය පරිපාලිත මිල ගණන් වෙනස් කිරීම්, දේශීය සැපයුම් අංශයේ බාධා, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ මහ බැංකුව විසින් සිදු කළ ඉහළ රාජ්‍ය මූල්‍යනය මෙන්ම පැවති ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ පසු බලපෑම් උද්ධමනය වේගවත් කිරීමට සහ උද්ධමන පීඩන ඉහළ යෑමට හේතු වූ අතර ඒ හේතුවෙන් 2022 වසර තුළ මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කිරීමට සිදු විය. දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති ඉහළ ද්‍රවශීලතා හිඟය සහ දැඩි මුදල් ප්‍රතිපත්තිය වේගයෙන් වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින්, වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මුදල් සහ ණය ප්‍රසාරණය මෑතකදී සැලකිය යුතු ලෙස මන්දගාමී වීමක් පෙන්නුම් කළ අතර, ඒ අතරින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය 2022 ජූනි මාසයේ සිට මාසිකව සැලකිය යුතු ලෙස සංකෝචනය වීමක් වාර්තා කළේය. දැඩි මුදල් තත්ත්වය මධ්‍යයේ පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණයෙහි එවැනි සංකෝචනය වීමක් වසරේ ඉතිරි කාලය තුළදී ද අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය දුර්වල වීම හේතුවෙන් රාජ්‍ය මූල්‍යන විශාල ලෙස දේශීය මූලාශ්‍ර වෙතින් සපුරා ගැනීමට අවශ්‍ය වූ අතර, වෙළඳපොළ අවිනිශ්චිතතා මධ්‍යයේ රජයේ සුරැකුම්පත් සඳහා වන කැමැත්ත අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම මෙන්ම යෝජිත බදු සංශෝධන හේතුවෙන් වැය කළ හැකි ආදායම කෙරෙහි වන බලපෑම සහ අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග මගින් අහිතකර උද්ධමන අපේක්ෂා මැඩපවත්වමින් උද්ධමන පීඩන පාලනය කරනු ඇත. එමගින් 2023 වසරේ ආරම්භයේ සිට මතුපිට උද්ධමනය අපේක්ෂිත පරිදි අඛණ්ඩව පහළ යෑමේ ක්‍රියාවලිය අනුගමනය කිරීමට හැකි වනු ඇති අතර නුදුරු කාලීනව සිට මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත පරාසය තුළ ස්ථායී වනු ඇත.

## 7.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය

ඉහළ යන උද්ධමන පීඩන, ආර්ථිකයේ යටිදැරි ඉල්ලුම් තත්ත්ව වර්ධනය වීම සහ උද්ධමන අපේක්ෂා ඉහළ යෑමට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින් මහ බැංකුව 2022 වසරේදී පෙර නොවූ අන්දමින් මුදල් හා ද්‍රවශීලතා තත්ත්ව දැඩි කළේය. ඒ අනුව, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ වූ 2021 අගෝස්තු මාසයේ සිට මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ප්‍රතිශතාංක 10කින් ඉහළ නැංවූ අතර, එම ඉහළ නැංවීමෙන් වැඩි ප්‍රමාණයක් 2022 අප්‍රේල් මාසයේදී සිදු කළේය. ආර්ථිකය තුළ ඉල්ලුම හේතුවෙන් ඇති වූ උද්ධමන පීඩන ඉහළ යෑම පාලනය කිරීමට සහ අහිතකර උද්ධමන අපේක්ෂා ඇති වීම වැළැක්වීමේ අරමුණින් මෙන්ම විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට අවශ්‍ය සහාය සැපයීමට සහ වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයේ නිරීක්ෂණය වූ විෂමතා නිවැරදි කිරීමට 2022 අප්‍රේල් මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ප්‍රතිශතාංක 7කින් ඉහළ නංවන ලදී. ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල එවැනි සැලකිය යුතු ප්‍රමාණයක ගැළපීම්, 2021 සැප්තැම්බර් සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2කින් ඉහළ නැංවීමට අමතරව සිදු කළ වෙනස්කම් විය. තවද, රජයේ විදේශ විනිමය ණය සේවාකරණය සහ අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය කිරීම සඳහා අවශ්‍ය විදේශ විනිමය මහ බැංකුව විසින් ලබා දීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළෙහි රුපියල් ද්‍රවශීලතාව අඩු වීම

> **උද්ධමන අපේක්ෂා පාලනය කරමින් මිල ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන සිය කැපවීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේදී මුදල් තත්ත්ව සැලකිය යුතු ලෙස දැඩි කළේය...**

ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින්, දේශීය මුදල් වෙළඳපොළ තුළ විශාල ද්‍රවශීලතා හිඟයක් අඛණ්ඩව පැවතිණි. කෙසේ වෙතත්, 2022 අප්‍රේල් මාසයේදී දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතා හිඟය උපරිමයකට ළඟා වූ අතර, ඉන්පසුව රජයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතාවලට සහාය වීම සඳහා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීම සහ තැන්පතු පොලී අනුපාතික ඉහළ යෑමේ බලපෑම හේතුවෙන් බැංකු පද්ධතිය වෙත මුදල් නැවත ලැබීමේ බලපෑම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් ද්‍රවශීලතා හිඟයෙහි සුළු පහළ යෑමක් වාර්තා විය. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම වේගවත් වීම මෙන්ම දැඩි ද්‍රවශීලතා තත්ත්වයන්ගේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ කළ 2021 අගෝස්තු මාසයේ සිට වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල ඉහළ යෑමට වඩා වැඩි විය. ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යෑම මෙන්ම රජයේ ණය ගැනීමේ අවශ්‍යතාව වැඩි වීම සහ වෙළඳපොළ තත්ත්වයන්හි අවිනිශ්චිතතා ඉහළ යෑමත් සමග 2022 වසරේදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දැඩි මුදල් තත්ත්ව හේතුවෙන් බැංකු පද්ධතිය මගින් පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය ප්‍රමාණය අඩු වීම ආරම්භ වූ අතර, 2022 ජූනි මාසයේ සිට අඛණ්ඩව සමස්ත ණය ශේෂයෙහි සැලකිය යුතු සංකෝචනය වීමක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2022 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී රජය සතු වාණිජ ව්‍යාපාර බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය ඉහළ ගිය අතර, මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑම මුළුමනින්ම හේතු වෙමින් බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය ද මෙම කාලය තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මහ බැංකුව මගින් ලබා දුන් එවැනි මූල්‍යන රජයේ මුදල් ප්‍රවාහ කටයුතු මත ඇති වූ පීඩනය යම් ප්‍රමාණයකට ලිහිල් කිරීමට උපකාරී වූ අතර, එමගින් රාජ්‍ය ආදායම පහළ යෑම මධ්‍යයේ පුනරාවර්තන වියදම් ඇතුළු ණය ගෙවීම් පිළිබඳ වගකීම් පියවීමට රජයට හැකි විය. කෙසේ වෙතත්, අපේක්ෂිත ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩසටහන මෙන්ම රාජ්‍ය වියදම් අඩු කිරීම මගින් ඉදිරි කාලයේදී මහ බැංකුව මගින් රජය වෙත මූල්‍යන ලබා දීමේ අවශ්‍යතාව අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙමගින් ඉල්ලුම් පීඩන තවදුරටත් ඇති වීම වැළැක්වීම අපේක්ෂා කෙරෙන අතර, එමගින් අපේක්ෂිත උද්ධමනය පහළ යෑමේ ක්‍රියාවලියට සහ මැදි කාලීනව මිල සහ ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීමට සහාය වනු ඇත.


2021 වසර අවසානයේ සිට දක්නට ලද උද්ධමනය ඉහළ යෑම 2022 වසරේදීත් ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම උද්ධමන අගය වාර්තා කරමින් සැලකිය යුතු වේගයකින් අඛණ්ඩව ඉහළ ගියේය. දේශීය හා ගෝලීය වශයෙන් ඇති වූ

> **දේශීය හා ගෝලීය වශයෙන් ඇති වූ සැලකිය යුතු සැපයුම් අංශයේ බාධා, පරිපාලිත මිල ගණන් වෙනස්කිරීම්, ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ ඉල්ලුම් පීඩන ඇති වීම හේතුවෙන් 2022 වසරේදී උද්ධමනය ඉහළ ගියේය...**

සැලකිය යුතු සැපයුම් අංශයේ බාධා, පරිපාලිත මිල ගණන් වෙනස්කිරීම්, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ මුදල් ලිහිල්කරණයේ

**7.1 රූප සටහන**

**මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පසු බලපෑම හා සම්බන්ධ ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් පීඩන යන සාධක මෑතකාලීනව උද්ධමන ඉහළ යෑමට හේතු විය. ඒ අනුව, 2022 සැප්තැම්බර් මාසයේදී කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 69.8%ක් ලෙස වාර්තා විය. ඒ හා සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, දිවයින පුරා මිල විචලනයන් පිළිබිඹු කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද 2022 සැප්තැම්බර් මාසයේදී 73.7%ක් ලෙස වාර්තා විය. පාරිභෝගික භාණ්ඩ පැසෙහි සාපේක්ෂ වශයෙන් වැඩි බරක් පවතින ආහාර කාණ්ඩයේ උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, දේශීය වශයෙන් ඉන්ධන හා ගෑස් මිල ගණන් අවස්ථා කිහිපයකදී ඉහළ දැමීම මෙන්ම එමගින් අනෙකුත් අංශ සඳහා ඇති කළ බලපෑමත් සමග බලශක්ති සහ ප්‍රවාහන අංශයේ දායකත්වය ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් ආහාර නොවන උද්ධමනය ද ඉහළ ගියේය. තවද, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම සහ 2022 මාර්තු-මැයි අතර කාලය තුළ සැලකිය යුතු ලෙස ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම ආනයනික උද්ධමනය ඉහළ යෑම සඳහා හේතු විය. පසුගිය කාලය තුළ මිල ගණන් ඉහළ යෑම සඳහා සැපයුම් අංශයේ ප්‍රවණතා වැඩි වශයෙන් හේතු වූ අතර, මූලික උද්ධමනය ඉහළ යෑම මගින් බොහෝ දුරට ආර්ථිකය තුළ ඉල්ලුමෙන් ඇති වූ උද්ධමනකාරී පීඩනවල මූලිකාංග පිළිබිඹු කරයි. ආර්ථිකයේ උද්ධමන හැසිරීමට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව, ආයතනික සහ කුටුම්භ යන දෙඅංශයේම උද්ධමන අපේක්ෂා 2022 වසර තුළදී ඉහළ ගියේය. කෙසේ වෙතත්, ආයතනික අංශයේ නවතම උද්ධමන අපේක්ෂා මගින් ඉදිරි මාස 12 තුළ උද්ධමනය සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරනු ලැබේ. ආහාර සහ අනෙකුත් වෙළඳ භාණ්ඩ මිල ගණන්වල අපේක්ෂිත ගෝලීය ප්‍රවණතා සහ දේශීය සැපයුම් තත්ත්ව යථා තත්ත්වයට පත් වීමත් සමග දේශීය මිල ගණන්හි අපේක්ෂිත පහළ යෑම්, දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව හේතුවෙන් සමස්ත ඉල්ලුම් පීඩන අඩු වීම සහ හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම හේතුවෙන් මතුපිට උද්ධමනය ඉදිරි කාලය තුළදී අඩු වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

අපේක්ෂිත උද්ධමනය පහළ යෑමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා උද්ධමන අපේක්ෂා පාලනය කිරීම අත්‍යවශ්‍ය අංගයකි. මේ සඳහා, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන අතරතුර, මහ බැංකුව වත්මන් ආර්ථික තත්ත්වයන් සහ එහි ඉදිරි දැක්ම පිළිබඳ ඵලදායී හා විනිවිදභාවයෙන් යුතු සන්නිවේදන ක්‍රියාවලියක් හරහා මහජනතාව සමග අඛණ්ඩව සම්බන්ධ වෙමින් අපේක්ෂිත ආර්ථික ප්‍රවණතා පිළිබඳ නවතම තොරතුරු ලබා දුන් අතර එමගින් අවිනිශ්චිතතා මගහරවා ගැනීමට සහ අපේක්ෂිත පරිදි ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ සහාය ලබා ගැනීමට හැකි වනු ඇත.


## 7.2 මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සහ පොලී අනුපාතිකවල හැසිරීම

දැඩි මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම මධ්‍යයේ දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව විශාල හිඟ මට්ටමක අඛණ්ඩව පවතින අතර, ඒ හේතුවෙන් 2022 වසරේ මේ දක්වා කාලය තුළදී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවේ පවතියි. ශුද්ධ පදනමින්, රජයේ විදේශීය ණය ආපසු ගෙවීම්, මහජනතාව විසින් ව්‍යවහාර මුදල් බැංකු පද්ධතියෙන් ආපසු ගැනීම්, අත්‍යවශ්‍ය ආනයනය සඳහා විදේශ විනිමය ලබා දීමට මහ බැංකුව විසින් විදේශ විනිමය විකිණීම්, මහ බැංකුව විසින් විකුණුම්-ගැණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (ශුද්ධ වශයෙන් කල් පිරෙන ණය) වෙත එළඹීම සහ මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ස්ථාවර පදනම මත විකිණීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව අඩු විය. මේ අතර, වෙළඳපොළ ද්‍රවශීලතාව අසමමිතිකව ව්‍යාප්තව පවතින අතර, රජය විසින්

> **මහ බැංකුව මගින් සිදු කළ විදේශ විනිමය සම්බන්ධ මැදිහත්වීම් මූලික වශයෙන් හේතු කොටගෙන දේශීය මුදල් වෙළඳපොළෙහි රුපියල් ද්‍රවශීලතාව විශාල හිඟ මට්ටමක පැවතුණි...**

ණය ලබා ගැනීම වැඩි වීම හේතුවෙන් ඇතැම් දේශීය බැංකු සැලකිය යුතු ද්‍රවශීලතා හිඟයක් වාර්තා කළේය. ඒ අනුව, ඇතැම් බැංකුවල ද්‍රවශීලතා හිඟය අවම කිරීමේ අරමුණින් ද්‍රවශීලතාව සැපයීම සඳහා මහ බැංකුව විසින් දිගුකාලීන

**7.2 රූප සටහන**
**ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ මුදල් වෙළඳපොළෙහි එක් දින ද්‍රවශීලතාව**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ප්‍රතිවිකුණුම් වෙන්දේසි අවශ්‍යතා අනුව පවත්වන ලදී. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන්, මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් ප්‍රාථමික වෙළඳපොළ වෙතින් මිලදී ගැනීම, බැංකු පද්ධතිය වෙත ව්‍යවහාර මුදල් තැන්පතු ඉහළ යෑම සහ මහ බැංකුව විසින් ගැණුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (ශුද්ධ වශයෙන් කල් පිරෙන ණය) වෙත එළඹීම හේතුවෙන් 2022 අප්‍රේල් මස අවසානයේ සිට දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා හිඟයේ ක්‍රමානුකූල පහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, 2022 ඔක්තෝබර් මස අවසානය වන විට මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සාපේක්ෂ වශයෙන් ඉහළ හිඟ මට්ටමක අඛණ්ඩව පවතී. ද්‍රවශීලතා හිඟ තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, ප්‍රතිමිලදී ගැනීමේ වෙළඳපොළ ගනුදෙනුවල බරිත සාමාන්‍ය එලදා අනුපාතික 2022 ඔක්තෝබර් මස අවසානය වන විට 15.50%ක් ලෙස වාර්තා වූ අතර එය බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි හැසිරීම් හා සමාන හැසිරීමක් අනුගමනය කළේය. මේ අතර, අතිරික්ත ද්‍රවශීලතාවයක් සහිත ඇතැම් බැංකුවල අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගවල බලපෑම සහ බොහෝ වෙළඳපොළ සහභාගිවන්නන් අතර අතිරික්ත මුදල් නොමැතිකම පිළිබිඹු කරමින් 2022 ජූලි-ඔක්තෝබර් කාලය තුළ අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් බොහෝ දුරට අඩු විය.

වෙළඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඛණ්ඩව ඉහළ ගිය අතර, දැඩි මුදල් සහ ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් 2022 වසරේ මේ දක්වා කාලය තුළදී ඇතැම් පොලී අනුපාතික ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම අගයන් වාර්තා කළේය. සැලකිය යුතු ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම, දේශීය මුදල් වෙළඳපොළ තුළ විශාල සහ අඛණ්ඩව පවතින ද්‍රවශීලතා හිඟය සහ රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික අසමානුපාතික ලෙස වැඩිවීම හේතුවෙන් වෙළඳපොළ පොලී අනුපාතික විශාල ලෙස ඉහළ ගියේය. තවද, මුදල් වෙළඳපොළ තුළ පවතින විශාල ද්‍රවශීලතා හිඟ තත්ත්ව

> ***මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත වේගයෙන් සම්ප්‍රේෂණය වීම සහ දැඩි ද්‍රවශීලතා තත්ත්ව පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඇතැම් පොලී අනුපාතික ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම් වාර්තා කළේය...***

මධ්‍යයේ, බලපත්‍රලාභී බැංකු, විශේෂයෙන්ම කෙටි කාලසීමාවක් සඳහා ඉහළ පොලී අනුපාතික යටතේ තැන්පතු රැස් කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි. ඒ අනුව, තැන්පතු පොලී අනුපාතික, විශේෂයෙන්ම නව තැන්පතු පොලී අනුපාතික, 2021 අගෝස්තු මාසයේදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමෙන් අනතුරුව සාපේක්ෂ වශයෙන් අඩු වේගයකින් ඉහළ ගියද, 2022 වසරේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ප්‍රතිශතාංක 9.5කින් වැඩිවීමට සාපේක්ෂව 2022 වසරේ මේ දක්වා කාලය තුළදී ප්‍රතිශතාංක

**7.3 රූප සටහන**
**තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

15කින් පමණ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. බලපත්‍රලාභී බැංකු විසින් පිරිනමන ලද තරගකාරී සහ ඉහළ තැන්පතු පොලී අනුපාතික හේතුවෙන් සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් බැංකු පද්ධතිය වෙත නැවත ලැබීමක් ද මෑතකදී නිරීක්ෂණය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත තැන්පතු තොගය ඉහළ ගියේය. බලපත්‍රලාභී බැංකුවල තෝරාගත් ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කිරීමත් සමග අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික හා සමාන හැසිරීමක් අනුගමනය කරමින් එවැනි ණය උපකරණ සඳහා අදාළ පොලී අනුපාතික 2022 වසරේ මේ දක්වා කාලය තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය 2021 වසරේ අවසානයට සාපේක්ෂව 2022 වසරේ මේ දක්වා කාලය තුළදී ප්‍රතිශතාංක 15කින් පමණ ඉහළ ගිය අතර, සමාන කල් පිරීමේ කාල සීමාවක් සහිත අනෙකුත් ණය අනුපාතිකවලට සාපේක්ෂව සාමාන්‍යයෙන් පහළ මට්ටමක පවතින ප්‍රමුඛ ගනුදෙනුකරුවන් සඳහා අදාළ ණය අනුපාතිකය වන බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ මේ දක්වා කාලය තුළදී ප්‍රතිශතාංක 18කින් පමණ ඉහළ ගියේය. සමස්ත පොලී අනුපාතික ව්‍යුහයේ ගැළපීම් හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ණය පොලී අනුපාතික ද ඉහළ ගියේය. කෙසේ වෙතත්, ඉහළ මට්ටමක පවතින උද්ධමනය හේතුවෙන් සියලුම වෙළඳපොළ පොලී අනුපාතික සෘණ මූර්ත ප්‍රතිලාභ ලබා දෙයි.

ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම මෙන්ම රාජ්‍ය ආදායම පහළ යෑම හේතුවෙන් රජයේ ණය ගැනීමේ අවශ්‍යතාවය ඉහළ යෑම, ප්‍රමාණවත් විදේශීය මූල්‍යන සපයා ගැනීමට නොහැකි වීම සහ වෙළඳපොළ තත්ත්වයන්හි අවිනිශ්චිතතා ඉහළ යෑමත් සමග රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතිකවල විශාල ඉහළ යෑමක් දක්නට

> **රජයේ ණය ගැනීම් ඉහළ යෑම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා මධ්‍යයේ වෙළඳපොළ අපේක්ෂාවන්හි අවිනිශ්චිතතා ඉහළ යෑමත් සමග අනෙකුත් පොලී අනුපාතිකවල ගැළපීම්වලට සමානුපාතික නොවන ලෙස රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික ඉහළ ගියේය...**

ලැබුණි. අවිනිශ්චිතතා මෙන්ම රජයේ විශාල ණය ගැනීමේ අවශ්‍යතාව සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡා හේතුවෙන් වෙළඳපොළ සහභාගිවන්නන් විසින් රජයේ සුරැකුම්පත් සඳහා ඉහළ ප්‍රතිලාභ අඛණ්ඩව ඉල්ලුම් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රතිපත්ති පොලී අනුපාතික වැඩිවීමට සාපේක්ෂව රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික විශාල ඉහළ මට්ටම් දක්වා වැඩි විය. සමස්තයක් වශයෙන්, 2021 වසර අවසානයේ පැවති එලදා අනුපාතිකවලට සාපේක්ෂව, 2022 ඔක්තෝබර් මස අවසානය වන විට සියලු කල්පිරීම්වල ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් මත එලදා අනුපාතික ප්‍රතිශතාංක 22 සිට 25කින් පමණ ඉහළ ගියේය. ඒ හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින්, භාණ්ඩාගාර බැඳුම්කර මත එලදා අනුපාතික ද 2022 වසරේ මේ දක්වා කාලය තුළදී සැලකිය යුතු ලෙස ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ද්විතීයික වෙළඳපොළ සියලු කල්පිරීම්වල රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික ද සැලකිය යුතු ඉහළ යෑම් වාර්තා කළ ද බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් පිරිනමනු ලැබූ එලදා අනුපාතිකවලට සාපේක්ෂව ප්‍රාථමික අලෙවිකරුවන් වශයෙන් කටයුතු කරන බැංකු විසින් ගනුදෙනුකරුවන් වෙත අඩු එලදා අනුපාතික ලබා දෙන ලදී. මේ අතර, විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම සීමා ඉවත් කිරීම මෙන්ම ගෝලීය පොලී අනුපාතික ඉහළ යෑම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින ද්‍රවශීලතා හිඟය සමග 2022 වසරේ මේ දක්වා කාලය තුළදී විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතිකවල සැලකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබුණි.

## 7.3 මුදල් සහ ණය

2021 වසරේ මුල් කාලයේ සිට ක්‍රමයෙන් අඩු වූ පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල විශාල ලෙස අවප්‍රමාණය වීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී සිදු වූ බලපෑමෙන්, 2022 වසරේ මාර්තු-මැයි කාලය තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

> **රාජ්‍ය අංශයට ලබා දුන් ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ විදේශ මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා සිදු වූ බලපෑම් පැවතිය ද, පෞද්ගලික අංශයට ලබා දුන් ණය සංකෝචනය වීම සහ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් අඩු වීම හේතුවෙන් 2022 මැයි මාසයේ සිට මුදල් ප්‍රසාරණය අඩු විය...**

කෙසේ වෙතත්, බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් අඛණ්ඩව අඩු වීම සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණය සංකෝචනය වීම හේතුවෙන් 2022 මැයි මාසයේ සිට පුළුල් මුදල් සැපයුමේ

**7.1 සංඛ්‍යා සටහන**
**මුදල් සමස්තවල ප්‍රවණතා (අ)**

රුපියල් බිලියන

| | අගෝ.-22 | 2022 වසරේ මේ දක්වා වෙනස |
|---|---|---|
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 11,986.9 | 1,339.6 |
| ශුද්ධ විදේශීය වත්කම් | -2,035.1 | -1,053.1 |
| ශුද්ධ දේශීය වත්කම් | 14,022.0 | 2,392.7 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 6,990.1 | 1,157.7 |
| රජය සතු වාණිජ ව්‍යාපාර වලට ලබා දුන් ණය | 1,699.8 | 511.7 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 7,614.2 | 632.7 |


(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේ වාර්තා වූ 13.2%ක වර්ධනයට සාපේක්ෂව 2022 අගෝස්තු මස අවසානය වන විට 14.0%ක් ලෙස වාර්තා විය. එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කළ පසු පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය වසර තුළදී ක්‍රමයෙන් අඩු වූ අතර 2022 අගෝස්තු මස අවසානය වන විට 5.8%ක් විය. වත්කම් අංශය සලකා බැලීමේදී, 2022 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රසාරණය සඳහා බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩු වීම හේතුවෙන් බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස අඩු වූ අතර බලපත්‍රලාභී වාණිජ බැංකු ඇතැම් විදේශීය වගකීම් පියවීම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම්වල වර්ධනයක් වාර්තා විය. අත්‍යවශ්‍ය ආනයනවලින් කොටසක් මූල්‍යනය සඳහා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයූ අතර 2022 වසරේ මුල් කාලයේදී සිදු කළ රජයේ විදේශ ණය සේවාකරණ වගකීම් පියවීම් හේතුවෙන් දළ නිල සංචිතවල අඩු වීම පිළිබිඹු කරමින් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් සෘණ අගයක් ගන්නා ලදී. ශුද්ධ දේශීය වත්කම් සැලකීමේදී, දේශීය ණය යටතේ, 2022 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී බැංකු පද්ධතිය විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඒ සඳහා මහ බැංකුව රජය වෙත ලබා දුන් ශුද්ධ ණය මුළුමනින්ම හේතු විය. රජයේ අයිරා ශේෂයන් සැලකිය යුතු ලෙස අඩු වීම සහ භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජයට ලබා දුන් ශුද්ධ ණයෙහි අඩු වීමක් වාර්තා විය. දැඩි ද්‍රවශීලතා හිඟ තත්ත්ව මෙන්ම අවිනිශ්චිතතා ඉහළ යෑම පිළිබිඹු කරමින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල රජයේ සුරැකුම්පත් සඳහා වන කැමැත්ත 2022 වසරේ මේ දක්වා කාලය තුළදී අඩු වූ අතර, ඒ හේතුවෙන් රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසිවල මූල්‍යන පරතරය පියවීමට මහ බැංකුවට සිදු විය. රාජ්‍ය ආදායම අඩුවීම සහ විදේශීය මූල්‍යන සඳහා ප්‍රවේශය සීමිත වීම හේතුවෙන්, දේශීය මූල්‍යනය මත, විශේෂයෙන්ම මහ බැංකු මූල්‍යන සඳහා රජය අඛණ්ඩව යොමු වීම බැංකු පද්ධතියෙන් රජයට ලබා දුන් ශුද්ධ ණයෙහි සැලකිය යුතු වැඩි වීම මගින් පෙන්නුම් කරයි. මේ අතර, දුර්වල මූල්‍ය කාර්යසාධනය හේතුවෙන් බැංකු වෙතින් ලබාගත් ණය මත යැපීමට රජය සතු වාණිජ ව්‍යාපාරවලට සිදු වූ අතර විදේශීය මුදලින් නාමනය කරන ලද ණය රුපියල්වලින් ගණනය කිරීමේදී සිදු වන බලපෑම ප්‍රධාන වශයෙන් හේතුවෙමින් රජය සතු වාණිජ ව්‍යාපාර විසින් බැංකු පද්ධතියෙන් ලබා ගත් ණය මෙම කාලසීමාව තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

සැලකිය යුතු ලෙස විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම හේතුවෙන් 2022 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළදී පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ශේෂයේ සැලකිය යුතු ප්‍රසාරණයක් වාර්තා විය. කෙසේ වෙතත්, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කර ගණනය කිරීමේදී මෙම කාලය තුළදී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය සංකෝචනය වී ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, ණය ලබා දීමෙහි විශාල අඩු වීමක් මෑත මාසවලදී වාර්තා විය. පෞද්ගලික අංශයට ලබා දුන්


**7.4 රූප සටහන**
**පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා තුඩු දුන් සාධක (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


**7.5 රූප සටහන**
**බැංකු පද්ධතියෙන් රජයට ලබා දුන් ශුද්ධ ණයෙහි වාර්ෂික වෙනස (අ)**





(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.6 රූප සටහන**
**බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 වසර අවසානයේ පැවති 13.1% හා සැසඳීමේදී 2022 අගෝස්තු මස අවසානය වන විට 12.0%ක් ලෙස වාර්තා වූ අතර, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කර ගණනය කිරීමේදී 2022 අගෝස්තු මස අවසානය වන විට පෞද්ගලික අංශයට ලබා දුන් වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනය 1.9%ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමග වත්මන් දැඩි මුදල් ප්‍රතිපත්ති තත්ත්වය තුළ පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනයෙහි අඩු වීම මීත් පෙර පැවති මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ කාලපරිච්ඡේදයන්ට වඩා වැඩි මට්ටමක පවතී. ප්‍රධාන අංශවලට ලබා දුන් ණය සැලකීමේදී, ප්‍රධාන වශයෙන් උකස් පහසුකම් මත ලැබෙන ණය වැඩි වීම හේතුවෙන් පෞද්ගලික ණය සහ අත්තිකාරම් ආකාරයෙන් ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2022 දෙවන කාර්තුව අවසානය වන විට වැඩි වූ අතර, ආර්ථිකයේ ඵලදායී අංශ වෙත ලබා දුන් ණය වර්ධනය, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම ඉවත් කර ගණනය කිරීමේදී 2022 දෙවන කාර්තුව අවසානය වන විට මන්දගාමී විය. සැලකිය යුතු දැඩි මුදල් තත්ත්ව අඛණ්ඩව පැවතීමත් සමග මුදල් හා ණය සමස්ත වර්ධනයේ සැලකිය යුතු අඩුවීමක් ඉදිරි කාලය තුළදී අපේක්ෂා කෙරේ.

> **පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය සැලකිය යුතු ලෙස අඩු වෙමින් පවතින අතර මෙම ප්‍රවණතාවය 2022 වසරේ ඉතිරි කාලය තුළදී ද පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ...**

## 7.2 සංඛ්‍යා සටහන
## පොලී අනුපාතිකවල හැසිරීම

වාර්ෂික පොලී අනුපාතිකය %

| පොලී අනුපාතිකය | 2019 අවසානයට | 2020 අවසානයට | 2021 අවසානයට | 2022 සැප්. අවසානයට |
|---|---|---|---|---|
| **ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.00 | 4.50 | 5.00 | 14.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.00 | 5.50 | 6.00 | 15.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය** | 7.45 | 4.55 | 5.95 | 15.50 |
| **රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික** | | | | |
| **ප්‍රාථමික වෙළඳපොළ (අ)** | | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | | |
| දින 91 | 7.51 | 4.69 | 8.16 | 31.94 |
| දින 182 | 8.02 | 4.80 | 8.33 | 30.59 |
| දින 364 | 8.45 | 5.05 | 8.24 | 29.85 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | | |
| වසර 2 | 9.79 | 5.65 | 9.16 | 14.41 |
| වසර 3 | 9.65 | 5.99 | 9.70 | 30.95 |
| වසර 4 | - | 6.32 | 8.55 | - |
| වසර 5 | 9.87 | 6.79 | 11.14 | 31.50 |
| වසර 10 | 10.23 | 9.99 | 8.86 | 30.09 |
| **ද්විතීයික වෙළඳපොළ** | | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | | |
| දින 91 | 7.52 | 4.63 | 7.77 | 30.22 |
| දින 182 | 7.88 | 4.73 | 8.07 | 28.81 |
| දින 364 | 8.36 | 4.98 | 8.22 | 28.41 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | | |
| වසර 2 | 8.60 | 5.56 | 8.58 | 23.47 |
| වසර 3 | 9.08 | 5.96 | 9.55 | 26.10 |
| වසර 4 | 9.46 | 6.40 | 10.38 | 25.14 |
| වසර 5 | 9.67 | 6.65 | 10.66 | 25.50 |
| වසර 10 | 10.05 | 7.55 | 11.71 | 26.15 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු (ආ)** | | | | |
| ***තැන්පතු පොලී අනුපාතික*** | | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.20-7.50 | 0.10-7.00 | 0.05-6.35 | 0.05-6.00 (ඇ) |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඈ) | 3.55-15.00 | 0.25-15.00 | 0.15-15.00 | 0.15-28.00 (ඇ) |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (ඉ) | 8.20 | 5.80 | 4.94 | 11.63 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඉ) | 10.05 | 7.14 | 5.94 | 15.41 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (ඉ) | 8.89 | 4.93 | 6.45 | 21.29 (ඇ) |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඉ) | 9.17 | 5.08 | 6.67 | 21.62 (ඇ) |
| ***ණය පොලී අනුපාතික*** | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය - මාසික | 10.00 | 5.74 | 8.33 | 26.16 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 13.59 | 10.29 | 9.87 | 16.86 (ඇ) |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 12.80 | 8.38 | 9.48 | 24.18 (ඇ) |
| **අනෙකුත් මූල්‍ය ආයතන (ඊ)** | | | | |
| ***තැන්පතු පොලී අනුපාතික*** | | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.00 | 3.50 | 3.50 | 3.00 (ඇ) |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 9.83 | 5.25 | 5.50 | 12.00 (ඇ) |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (උ) | | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 5.14-7.10 | 3.40-4.74 | 3.46-4.75 | 4.69-7.49 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 10.98-11.97 | 6.56-7.21 | 9.02-10.13 | 19.60-25.11 |
| ***ණය පොලී අනුපාතික*** | | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 12.00-14.50 | 7.00-10.00 | 7.50-11.50 | 20.00-25.00 (ඇ) |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ඌ) | 10.25-18.00 | 8.73-12.50 | 7.50-12.50 | 18.00-27.25 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (උ) | | | | |
| මූල්‍ය කල්බදු | 14.75-27.40 | 14.31-28.97 | 12.77-28.33 | 19.95-35.99 |
| කුලීපිට ගැනුම් | 13.40-24.82 | 13.71-20.05 | 11.08-27.00 | 21.85-28.43 |
| ඉඩම් සහ දේපළ මත ලබාදුන් ණය (එ) | 15.53-16.71 | 19.95-22.30 | - | - |
| නිශ්චල දේපළ මත ලබාදුන් ණය (එ) | - | - | 15.77-16.77 | 20.38-25.68 |
| **සාංගමික ණය වෙළඳපොළ** | | | | |
| ණයකර | 12.30-15.50 | 9.00-13.25 | 8.00-12.00 | 15.42-15.50 |
| වාණිජ පත්‍රිකා | 13.00-16.25 | 6.50-15.50 | 6.00-12.00 | 11.00-32.00 (ඇ) |

(අ) ආසන්නතම වෙන්දේසියේදී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ඇ) 2022 අගෝස්තු මාසය අවසාන වන විට

(ඈ) ඇතැම් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.

(ඉ) 15%ක් වූ ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ ස්ථාවර තැන්පතු අනුපාතිකයෙහි බලපෑම ඉවත් කිරීම සඳහා 2018 වසරේ ජූලි මස සිට බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ වෙළඳපොළ පොලී අනුපාතික මගිනි. 2018 ජූනි මස සිට බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කිරීම සඳහා මෙම ක්‍රියාදාමයම භාවිතා වේ.

(ඊ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(උ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාල මාසයේදී තැන්පතු ලබා ගැනීම සහ ණය ලබා දීම සඳහා ඉරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2022 වසර සඳහා දත්ත තාවකාලික වේ.

(ඌ) නිවාස කටයුතු සඳහා දෙන ණය පමණි.

(එ) 2021 ජූලි මස සිට "ඉඩම් සහ දේපළ මත ලබාදුන් ණය" දර්ශකය "නිශ්චල දේපළ මත ලබාදුන් ණය" ලෙස වෙනස් කර ඇත.

*මූලයන්:* අදාළ මූල්‍ය ආයතන
කොළඹ කොටස් හුවමාරුව
ශ්‍රී ලංකා මහ බැංකුව

7.3 සංඛ්‍යා සටහන

## මුදල් සමස්තවල ප්‍රවණතා සහ තුඩු දුන් සාධක

රුපියල් බිලියන

| අයිතමය | 2019 දෙසැ. | 2020 දෙසැ. | 2021 දෙසැ. | 2022 අගෝ. (අ) |
|---|---|---|---|---|
| **1. සංචිත මුදල්** | 932.6 | 964.4 | 1,305.8 | 1,386.2 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | -3.0 | 3.4 | 35.4 | 27.3 |
| මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් | 896.0 | 526.8 | -387.3 | -1,614.9 |
| මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් | 36.6 | 437.7 | 1,693.1 | 3,001.1 |
| **2. පටු මුදල් සැපයුම ($M_1$)** | 865.5 | 1,177.2 | 1,459.9 | 1,534.1 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 4.2 | 36.0 | 24.0 | 13.2 |
| **3. පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)** | 7,624.1 | 9,405.7 | 10,647.3 | 11,986.9 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 7.0 | 23.4 | 13.2 | 14.0 |
| 3.1 ශුද්ධ විදේශීය වත්කම් | 100.7 | -209.5 | -982.0 | -2,035.1 |
| මුදල් අධිකාරීන් (ආ) | 896.0 | 526.8 | -387.3 | -1,614.9 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -795.3 | -736.2 | -594.7 | -420.2 |
| 3.2 ශුද්ධ දේශීය වත්කම් | 7,523.4 | 9,615.2 | 11,629.3 | 14,022.0 |
| දේශීය ණය | 9,410.7 | 11,721.2 | 14,002.0 | 16,304.1 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 2,795.9 | 4,548.1 | 5,832.4 | 6,990.1 |
| මහ බැංකුව | 363.0 | 868.9 | 2,094.1 | 3,311.1 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 2,432.9 | 3,679.2 | 3,738.3 | 3,679.0 |
| රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය | 818.0 | 1,002.2 | 1,188.1 | 1,699.8 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 5,796.9 | 6,170.9 | 6,981.4 | 7,614.2 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 4.2 | 6.5 | 13.1 | 12.0 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -1,887.3 | -2,106.0 | -2,372.7 | -2,282.1 |
| **4. පුළුල් මුදල් සැපයුම ($M_4$)** | 9,444.5 | 11,461.9 | 12,985.4 | 14,450.7 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 8.2 | 21.4 | 13.3 | 13.0 |
| 4.1 ශුද්ධ විදේශීය වත්කම් | 88.8 | -217.1 | -998.6 | -2,035.1 |
| මුදල් අධිකාරීන් (ආ) | 896.0 | 526.8 | -387.3 | -1,614.9 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -795.3 | -736.2 | -594.7 | -420.2 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | -11.9 | -7.6 | -16.6 | - |
| 4.2 ශුද්ධ දේශීය වත්කම් | 9,355.8 | 11,679.0 | 13,984.0 | 16,485.8 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 3,483.0 | 5,365.7 | 6,769.3 | 7,976.8 |
| මහ බැංකුව | 363.0 | 868.9 | 2,094.1 | 3,311.1 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 2,432.9 | 3,679.2 | 3,738.3 | 3,679.0 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 613.9 | 742.2 | 844.5 | 876.3 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 73.2 | 75.5 | 92.4 | 110.4 |
| රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු මගින්) | 818.0 | 1,002.2 | 1,188.1 | 1,699.8 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 7,793.3 | 8,284.5 | 9,338.9 | 10,088.6 |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 3.9 | 6.3 | 12.7 | 11.7 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 5,796.9 | 6,170.9 | 6,981.4 | 7,614.2 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 814.2 | 936.5 | 1,093.7 | 1,144.2 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,182.2 | 1,177.1 | 1,263.8 | 1,330.3 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -2,738.4 | -2,973.4 | -3,312.4 | -3,279.3 |
| විශේෂ සටහන්: | | | | |
| මුදල් ගුණකය ($M_{2b}$) | 8.18 | 9.75 | 8.15 | 8.65 |
| සංසරණ ප්‍රවේගය ($M_{2b}$ සාමාන්‍ය) (ඇ) | 2.16 | 1.86 | 1.74 | - |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.

(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද) මත පදනම් වේ.

## නිර්වචන

1 බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR), බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

2 බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR), බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

3 බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

4 බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

5 බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR), සතියක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබා දුන් කෙටි කාලීන රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම් වේ. සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකවල මාසික සාමාන්‍ය මගින් මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය ගණනය කරනු ලැබේ.

6 බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR), බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

7 බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද නව රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

8 බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය (AWNSR), ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම නව රුපියල් ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වේ.

9 බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය (AWSR), ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම රුපියල් ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වේ.

# 8

# මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාව

*2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී අහිතකර සාර්ව ආර්ථික පසුබිමක මූල්‍ය අංශයට මුහුණ පෑමට සිදුවූ පීඩාකාරී තත්ත්වයන් මධ්‍යයේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම අභියෝගාත්මක විය. දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වීම හේතුවෙන් බැංකු අංශයේ වත්කම් ඉහළ ගිය අතර ආයෝජන ද ඉහළ යෑම යන කරුණු සැලකූ විට බැංකු අංශයේ වර්ධනයක් වාර්තා විය. කෙසේ වුවද, සමස්ත ණය වලට තුන් වන අදියරේ පවතින ණය අනුපාතය ඉහළ යෑම තුළින් පිළිබිඹු වන පරිදි බැංකු අංශයේ වත්කම් වල ගුණාත්මකභාවය සලකා බලනු ලබන කාල සීමාව තුළ දී පිරිහීමට ලක් විය. මේ අතර, හානිකරණ සඳහා අය කිරීම් ඉහළ යෑමත් සමග සලකා බලනු ලබන කාල සීමාව තුළ දී බැංකු අංශයේ ලාභදායිත්වය පහත වැටුණි. 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී මුළු වත්කම් සහ ණය කළඹ අනුව ගත් කළ බලපත්‍රලාභී මුදල් සමාගම්වල කාර්යසාධනයේ වර්ධනයක් දැකිය හැක. මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා සැලකූ විට, දේශීය මුදල් වෙළඳපොළ සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ පීඩාකාරී ද්‍රවශීලතා තත්ත්වයන් වලට මුහුණ දුන් අතර අහිතකර වෙළඳපොළ ආකල්ප සහ දේශීය මූල්‍යන අවශ්‍යතා සැලකිය යුතු ලෙස ඉහළ යෑම මධ්‍යයේ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ප්‍රාථමික ඵලදා අනුපාතිකය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම අභියෝගාත්මක ආර්ථික පරිසරය මධ්‍යයේ වුවද මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම සඳහා මූල්‍ය යටිතල පහසුකම් අඛණ්ඩව උපකාරී විය. ඉදිරියේ දී මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ආර්ථිකයේ සෑම අංශයක් තුළම විචක්ෂණශීලී හා පූර්වෝපායික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වනු ඇත.*

## 8.1 මූල්‍ය ආයතන

### බැංකු අංශය

සාර්ව ආර්ථික ප්‍රවණතාවන්ගෙන් එල්ල වන අභියෝග මධ්‍යයේ වුවද 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ බැංකු අංශය ස්ථාවරව ක්‍රියාත්මක විය. ද්‍රවශීලතාව සම්බන්ධව බැංකු අංශය මුහුණ දුන් අඛණ්ඩ ආතතිය මධ්‍යයේ වුවද, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී බැංකු අංශය අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් හමුවේ ප්‍රමාණවත් තරම් ප්‍රාග්ධන හා ප්‍රතිපාදන ආවරණ අනුපාතයන් සමගින් අඛණ්ඩව ක්‍රියාත්මක විය. අඛණ්ඩ සාර්ව ආර්ථික අභියෝග හේතුවෙන් බැංකුවල ප්‍රාග්ධන තත්ත්වය තවදුරටත් ආතතියට පත් වනු ඇත. ලාභ රඳවා තබා ගැනීම මගින් ප්‍රාග්ධන අනුපාත කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති වනු ඇතැයි අපේක්ෂා කළ හැකි වුවද, ප්‍රතිපත්ති පොලී අනුපාත සැලකිය යුතු අගයකින් ඉහළ යෑම, ආර්ථික සංකෝචනය සහ ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් ඇති විය හැකි බලපෑම හේතුවෙන්, බැංකුවල ප්‍රාග්ධන අනුපාතයන් අවම නියාමන අවශ්‍යතාවන් ඉක්මවා පවත්වා ගැනීමේ අභියෝගයට මුහුණ දීම මෙන්ම ප්‍රාග්ධන ස්වාරක්ෂකයන්ගේ සැලකිය යුතු පිරිහීමක් ද අපේක්ෂා කළ හැකිය.

> ***ද්‍රවශීලතාව, ප්‍රාග්ධනය සහ වත්කම්වල ගුණාත්මකභාවය අනුව ගත් කළ දැඩි ආතති තත්ත්වයන් මධ්‍යයේ වුවද බැංකු අංශය එහි වර්ධනය පවත්වා ගැනීමට සමත් විය...***

විදේශ මුදලින් නිරූපිත වත්කම් දේශීය මුදලින් ප්‍රකාශ කිරීමේ දී දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වීම හේතුවෙන් වත්කම් වල සිදුවන වර්ධනය මූලික කර ගෙන, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ බැංකු අංශයේ වත්කම් පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ බැංකු අංශය සතු සමස්ත වත්කම් ප්‍රමාණය, 2021 වසරේ ඊට අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් ට්‍රිලියන 1.8ක වර්ධනයට, එනම් 12.1%ට සාපේක්ෂව, රුපියල් ට්‍රිලියන 2.4කින්, එනම් 14.1%කින් රුපියල් ට්‍රිලියන 19.2ක් දක්වා ප්‍රසාරණය විය.

මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීමත් සමඟ 2021 වසර අවසානය වන විට 14.5%ක පැවති වාර්ෂික ණය වර්ධනය, 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට 6.8%ක් දක්වා අඩු විය. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී මුළු ණය හා අත්තිකාරම් වල සිදු වූ රුපියල් ට්‍රිලියන 1.4ක, එනම් 14.5%ක වර්ධනයත් සමඟ සැසඳීමේ දී 2022 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී මුළු ණය හා අත්තිකාරම් රුපියල් බිලියන 712.8කින්, එනම් 6.6%කින් රුපියල් ට්‍රිලියන 11.5ක් දක්වා ඉහළ ගිය අතර විදේශ විනිමය ණය කෙරෙහි විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ බලපෑම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී බැංකු අංශයේ ආයෝජන වර්ධනයේ ඉහළ යෑමක් පෙන්නුම් කළේය. 2021 වසරේ අගෝස්තු මාසය වන විට වාර්තා කළ රුපියල් බිලියන 284.7ක, එනම් 6.7%ක වර්ධනයට සාපේක්ෂව, බැංකු අංශයේ ආයෝජන 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 873.4කින්, එනම් 17.6%කින් වර්ධනය වෙමින් රුපියල් ට්‍රිලියන 5.8ක් දක්වා ළඟා විය.

බැංකු අංශයේ ව්‍යාප්තිය සඳහා විශාල වශයෙන් අරමුදල් සපයනු ලැබුවේ තැන්පතු මගිනි. 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට මෙම අංශයේ තැන්පතු සමස්ත වත්කම් වලින් 77.1%ක් විය. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී වාර්තා කළ රුපියල් ට්‍රිලියන 1.3ක, එනම් 11.6%ක තැන්පතු වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ අදාළ කාල සීමාව තුළ දී තැන්පතු පදනම රුපියල් ට්‍රිලියන 14.8ක් දක්වා රුපියල් ට්‍රිලියන 1.9කින්, එනම් 14.9%කින් වර්ධනය වූ අතර රුපියල් තැන්පතුවල ඉහළ යෑම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

විදේශ විනිමය ණය ගැනීම් පහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ ණය ගැනීම්වල වර්ධනය තවදුරටත් පහත වැටුණි. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ බැංකු අංශයේ ණය ගැනීම්වල සිදු වූ රුපියල් බිලියන 282.1ක, එනම් 16.5%ක වර්ධනය සමඟ සසඳා බැලීමේදී, 2022 වසරේ ඊට අනුරූප කාලපරිච්ඡේදය තුළ රුපියල් බිලියන 126.5කින්, එනම් 5.8%ක අඩු වර්ධන වේගයකින් රුපියල් ට්‍රිලියන 2.3ක් දක්වා ඉහළ ගියේය.

සමස්ත ණයවලට තුන්වන අදියර යටතේ පවතින ණය අනුපාතය අනුව සලකා බලනු ලබන බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මකභාවයේ පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. තුන්වන අදියර යටතේ පවතින ණය රුපියල් බිලියන 475.1ක, එනම් 56.9%ක වර්ධනයක් වාර්තා කරමින් 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට රුපියල් ට්‍රිලියන 1.3ක් දක්වා වර්ධනය විය. තවද, සමස්ත ණය ලබා දීම් වල අඩු වර්ධනය සහ තුන්වන අදියර යටතේ පවතින ණය ඉහළ යෑම හේතුවෙන්, සමස්ත ණයවලට තුන්වන අදියර යටතේ පවතින ණය අනුපාතය,

**8.1 සංඛ්‍යා සටහන**

## බැංකු අංශයේ තෝරාගත් දර්ශක

| අයිතමය | 2020 අගෝ. අවසානයට | 2021 අගෝ. අවසානයට* | 2021 දෙසැ. අවසානයට* | 2022 අගෝ. අවසානයට*(අ) | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2021 අගෝ. (ආ) | 2022 අගෝ. (අ) |
| මුළු වත්කම් (රු. ට්‍රිලියන) | 14 | 16 | 17 | 19 | | 17.1 |
| ණය සහ අත්තිකාරම් (රු. ට්‍රිලියන) | 9 | 11 | 11 | 11 | | 6.8 |
| ආයෝජන (රු. ට්‍රිලියන) | 4 | 5 | 5 | 6 | | 28.4 |
| තැන්පතු (රු. ට්‍රිලියන) | 10 | 13 | 13 | 15 | | 16.7 |
| ණය ගැනීම් (රු. ට්‍රිලියන) | 2 | 2 | 2 | 2 | | 15.4 |
| ප්‍රාග්ධන අරමුදල් (රු. ට්‍රිලියන) | 1 | 1 | 1 | 2 | | 15.0 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) (ඇ) | 13.2 | 13.0 | 13.2 | 12.2 | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) (ඇ) | 16.5 | 16.3 | 16.5 | 15.2 | | |
| සමස්ත ණය වලට තුන්වන අදියර යටතේ පවතින ණය (තුන්වන අදියර යටතේ පවතින වෙන්කළ ණය අඩු කළ පසු සහ ලබා නොගත් ණය ඇතුළත්ව) | | 5.0 | 7.6 | 10.6 | | |
| සමස්ත ණය වලට තුන්වන අදියර යටතේ පවතින ණය (ලබා නොගත් ණය හැර) | | | ලැ.නො. | 11.4 | | |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) (%) | 1.3 | 1.3 | 1.4 | 1.1 | | |
| හිමිකරු ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%) | 10.6 | 15.0 | 13.4 | 8.9 | | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශිය බැංකු ඒකක) (%) | 38.6 | 36.1 | 33.8 | 27.3 | | |
| මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය (%) | 34.6 | 31.5 | 29.7 | 25.4 | | |

(අ) තාවකාලික
(ආ) 2020 වසරේ අගෝස්තු මස අවසන් වන විට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 මත පදනම් වූ දත්ත වාර්තා නොමැති හෙයින් 2021 වසරේ අගෝස්තු මාසය සඳහා වාර්ෂික වර්ධනය වාර්තා කළ නොහැක.
(ඇ) ජුනි මස අවසානයට
ලැ.නො.: ලැබී නොමැත
* ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 මත පදනම්ව වාර්තා කර ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසරේ දෙසැම්බර් මාසය අවසන් වන විට පැවති 7.6%ක සිට, 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට 10.6%ක් දක්වා ඉහළ යන ලදී.

ඇතැම් දේශීය බැංකුවල පැවති සැලකිය යුතු ද්‍රවශීලතා ආතතීන් මධ්‍යයේ වුවද බැංකු අංශය අවම නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළ ද්‍රවශීල වත්කම් ප්‍රමාණයක් සහිතව ක්‍රියාත්මක විය. 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට දේශීය බැංකු ඒකක (Domestic Banking Units - DBU) සහ අක්වෙරළ බැංකු ඒකක (Off-shore Banking Units - OBU) වල ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයන් පිළිවෙළින් 27.3% සහ 40.6%ක්ව පැවතුණි.

විදේශ විනිමය වගකීම් වලට සාපේක්ෂව විදේශ විනිමය වත්කම් ඉහළ යෑම හේතුවෙන් 2021 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 132.2ක් වූ බැංකු අංශය සතු ශුද්ධ විදේශ විනිමය වත්කම් ප්‍රමාණය, 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 534.6ක් දක්වා ඉහළ ගියේය. තවද, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ වාර්තා වූ රුපියල් බිලියන 21.9ක විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභයට සාපේක්ෂව, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ රුපියල් බිලියන 11.1ක විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභයක් වාර්තා විය.

2022 වසරේ දී මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම මධ්‍යයේ වෙළෙඳපොළ පොලී අනුපාත ඉහළ ගියේය. ලාභ අලාභ තුළින් සහ වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් ගණනය කරන සුරැකුම්පත් සඳහා තක්සේරුගත සාධාරණ වටිනාකම් ලාභය, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ පිළිවෙළින් රුපියල් බිලියන 2.7ක් සහ රුපියල් බිලියන 14.3ක් ලෙස වාර්තා වූ අලාභයට සාපේක්ෂව, 2022 වසරේ අදාළ කාල සීමාව තුළ පිළිවෙළින් රුපියල් බිලියන 8.7ක් සහ රුපියල් බිලියන 5.4ක් ලෙස විය. රජයේ සුරැකුම්පත් වෙත අරමුදල් යොමු කිරීම සාපේක්ෂව ඉහළ යෑම සහ පොලී අනුපාතවල සිදු වූ විශාල වෙනස්වීම් මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප පිළියම් සඳහා වන ප්‍රකාශයෙන් අවසර දී ඇති පරිදි වෙනත් විස්තීර්ණ ආදායම් කළඹ හරහා සාධාරණ වටිනාකම් වෙතින් ණය ක්‍රමක්ෂය කළ පිරිවැය කළඹ වෙත නැවත වර්ගීකරණය කිරීමෙන් පොලී අනුපාත චලනයන්ගෙන් සිදුවිය හැකි අලාභ අර්ධ වශයෙන් නිෂේධනය විය.

සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී බැංකු අංශයේ ලාභ අඩු විය. බැංකු අංශයේ බදු පෙර ලාභය 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට සඳහා රුපියල් බිලියන 126.2ක් වූ අතර, එය 2021 වසරේ අදාළ කාල සීමාව තුළ වාර්තා වූ රුපියල් බිලියන 167.5ක බදු පෙර ලාභය සමඟ සසඳන කළ රුපියල් බිලියන 41.3ක අඩුවීමකි. පසුගිය වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටට සාපේක්ෂව, මෙම වසරේ අදාළ කාල සීමාව තුළ ශුද්ධ පොලී ආදායම රුපියල් බිලියන 154.7කින් ද, පොලී නොවන ආදායම රුපියල් බිලියන 88.5කින් ද ඉහළ ගිය ද, ණය අලාභ සඳහා වෙන් කිරීම් රුපියල් බිලියන 250.6කින් වැඩි වීම හේතුවෙන් මෙම අංශයේ ලාභය පහළ යන ලදී. 2021 වසරේ අගෝස්තු මාසය අවසානයේදී පැවති වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) සහ හිමිකම් මත ප්‍රතිලාභ

පිළිවෙළින් 1.7%ක සහ 15%ක අගයන්හි සිට, 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට පිළිවෙළින් 1.1% සහ 8.9% දක්වා අඩු විය.

සමස්තයක් වශයෙන්, අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුවද, 2022 වසරේ පළමු භාගය තුළ බැංකු අංශය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට වඩා ඉහළින් පවත්වා ගෙන ගියේය. 2022 වසරේ ජූනි මාසය අවසන් වන විට, 12.2%ක් වූ පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතයක් සහ 15.2%ක් වූ සමස්ත ප්‍රාග්ධන අනුපාතයක් සමඟ බැංකු අංශය ක්‍රියාත්මක වූ අතර, එය බාසල් III අවශ්‍යතාවයන්ට වඩා ඉහළ අගයක් ගන්නා ලදී. කෙසේ වෙතත්, දැඩි ආර්ථික සංකෝචනය හේතුවෙන් ණයවල ගුණාත්මකභාවය පහත වැටීම, වැය කළ හැකි මහජන ආදායම අඩු වීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලින් ලැබෙන අදායම අඩු වීම බැංකු අංශයේ ප්‍රාග්ධන පිරිහීමකට හේතු වනු ඇත.

රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා පහසුකම් සලසාලමින්, 2022 වසරේ මුල් භාගයේ දී බැංකුවල ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත විය. ඒ අනුව, 2022 වසරේ මුල් භාගයේ දී නව බැංකු ශාඛා 04ක් විවෘත කිරීම සහ ස්වයංක්‍රීය සේවා යන්ත්‍ර (SSMs) 107ක් ස්ථාපනය කිරීම සිදු වූ අතර ස්වයංක්‍රීය සේවා යන්ත්‍ර 07ක් වසා දමන ලදී.

වත්මන් ආර්ථික පසුබැම් තත්ත්වයන්හි සෘණාත්මක බලපෑම් සහ බැංකු ක්ෂේත්‍රයෙහි මෙහෙයුම් පරිසරයේ අඛණ්ඩව හටගන්නා අභියෝග තුළින් බැංකුවල වත්කම්වල ගුණාත්මකභාවය, ද්‍රවශීලතා තත්ත්ව සහ ප්‍රාග්ධන ස්වාරක්ෂකයන්හි සිදුවිය හැකි අඩුවීම කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යවස්ථාපිත පරීක්ෂණවල විෂය පථය සැලසුම් කර ඇත. බැංකු සඳහා වන නියාමන අධීක්ෂණ යාන්ත්‍රණය පුළුල් ලෙස ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුවේ නියාමන කටයුතුවල නිරත නොවන දෙපාර්තමේන්තු ද සම්බන්ධ කර ගනිමින් ඒකාබද්ධ අධීක්ෂණ කටයුතු ද ආරම්භ කර ඇත.

අවදානම් මත පදනම් වූ බැංකු අධීක්ෂණ රාමුවක් සඳහා පහසුකම් සැලසීම සහ කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම යන අරමුණු මත පදනම්ව බැංකු සඳහා අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමේ ආකෘතියක් (බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ ආකෘතිය -BSRI) මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවා ඇත. බැංකු අංශයේ සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ ශක්තිමත් බව තහවුරු කිරීම සඳහා සංස්පර්ශිත අවදානම් වලින් බැංකු ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් බැංකු සමූහයන්ගේ ඒකාබද්ධ අධීක්ෂණ සිදු කරන ලදී. ඒ අනුව ඒකාබද්ධ අධීක්ෂණය පිළිබඳ නියාමන රාමුවක් සකස් කරමින් පවතින අතර ඒ සම්බන්ධයෙන් වන විධිවිධාන ද නව බැංකු පනතට ඇතුළත් කිරීමට නියමිතය.

### බලපත්‍රලාභී මුදල් සමාගම්

මෙම අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී රුපියල් බිලියන 121.1කින්, එනම් 8.3%කින් රුපියල් බිලියන 1,573.1ක් දක්වා වර්ධනය විය. වත්කම් ප්‍රමාණය ඉහළ නැංවීමට විශාල වශයෙන් දායක වෙමින් ණය සහ අත්තිකාරම් කළඹ 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී රුපියල් බිලියන 47කින්, එනම් 4.2%කින් ඉහළ ගිය අතර එය සමස්ත වත්කම් ප්‍රමාණයෙන් 73.7%ක් නියෝජනය කරයි. මෙම අංශය 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට බලපත්‍රලාභී මුදල් සමාගම් 37කින්[1] සමන්විත වූ අතර එයින් 35ක් සක්‍රියව ක්‍රියාත්මකව පැවතුණි.

> **සමස්ත වත්කම් සහ ප්‍රාග්ධන පදනම අනුව ගත් කළ බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය වර්ධනය වුව ද, ලාභදායිත්වය පහළ ගියේය...**

2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී 6.1%කින් වර්ධනය වෙමින් රුපියල් බිලියන 48කින් තැන්පතු ප්‍රමාණය ඉහළ යෑම තුළින් ද, 10.9%කින් වර්ධනය වෙමින් රුපියල් බිලියන 33.5කින් ණය ගැනීම් ඉහළ යෑම තුළින් ද, මෙම අංශය ප්‍රසාරණය සඳහා අරමුදල් සැපයිණි. මෙම අංශයේ තැන්පතු සහ ණය ගැනීම්, පිළිවෙළින් රුපියල් බිලියන 831.3ක් සහ රුපියල් බිලියන 340ක් විය. 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී මෙම අංශයේ සමස්ත ප්‍රාග්ධනය රුපියල් බිලියන 66.9කින්, එනම් 28.1%කින් වර්ධනය වෙමින් ඉහළ ගිය අතර, එය 2022 වසරේ අගෝස්තු මස අවසානයේ දී රුපියල් බිලියන 305.3ක් ලෙස වාර්තා විය. මෙම අංශය තුළ පවතින ද්‍රවශීල වත්කම් 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට අවශ්‍ය අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණයට සාපේක්ෂව රුපියල් බිලියන 70.9ක අතිරික්තයක් පෙන්නුම් කළේය.

මෙම අංශය 2021/22 මූල්‍ය වර්ෂය සඳහා 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස පහක කාල සීමාව තුළ වාර්තා කළ රුපියල් බිලියන 12.5ක බදු පසු ලාභයට සාපේක්ෂව 2022/23 මූල්‍ය වර්ෂයේ අදාළ කාල සීමාව තුළ

1 ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (මින් පෙර, ඇසට්ලයින් ලීසිං කම්පැණි ලිමිටඩ් ලෙස හැඳින්වූ, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද මෙම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම) වෙත 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ 2022.08.29 වන දින බලපත්‍රයක් නිකුත් කෙරිණි. කෙසේ වෙතත්, ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් හි මූල්‍ය දත්ත 2022 අගෝස්තු මාසය අවසානය වන විට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයෙහි ඇතුළත් කර ඇත.

**8.2 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ප්‍රධාන කාර්යසාධන දර්ශක**

| ප්‍රධාන කාර්යසාධන දර්ශකය | % | |
|---|---|---|
| | 2021 දෙසැ. අවසානයට | 2022 අගෝ. අවසානයට |
| තුන්වන අදියරේ දළ ණය අනුපාතය | 10.8* | 18.0 |
| තුන්වන අදියරේ ශුද්ධ ණය අනුපාතය | 2.5* | 12.8 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 15.0 | 20.3 |
| සමස්ත අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 16.6 | 21.8 |
| ශුද්ධ පොලී ආන්තිකය | 8.4 | 6.8 |
| වත්කම් මත ප්‍රතිලාභ | 4.5 | 2.4 |
| හිමිකම් මත ප්‍රතිලාභ | 17.1 | 7.4 |
| ආදායම මත පිරිවැය අනුපාතය | 73.0 | 87.3 |

** මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 1 දරන විධානය ක්‍රියාත්මක කිරීමට පෙර දළ අක්‍රීය ණය සහ ශුද්ධ අක්‍රීය ණය අනුපාත.*

*මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව*

රුපියල් බිලියන 9.6ක බදු පසු ලාභයක් වාර්තා කළේය. ශුද්ධ පොලී ආදායම රුපියල් බිලියන 3.9කින්, එනම් 7.9%කින් පහත වැටීම සහ පොලී නොවන වියදම් රුපියල් බිලියන 4.3කින් එනම් 13.3%කින් ඉහළ යෑම ලාභදායීත්වය පහත වැටීම සඳහා විශාල වශයෙන් හේතු විය. 2022/23 මූල්‍ය වර්ෂයේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස පහක කාලය තුළ බලපත්‍රලාභී මුදල් සමාගම් 13ක් ශුද්ධ අලාභ වාර්තා කර ඇත.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය පිළිබඳ විධානය අනුව, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් මින් පෙර අක්‍රීය ණය වර්ගීකරණය සඳහා කල් පිරෙන දිනය ලෙස සලකා බලනු ලැබූ දින 180 සීමාව වෙනුවට 2022.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි කල් පිරෙන දිනය ලෙස දින 120 සීමාව අනුගමනය කිරීම අවශ්‍ය විය. ඒ අනුව, 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට මෙම අංශයේ වත්කම් වල ගුණාත්මකභාවය පහළ ගිය අතර, තුන්වන අදියරේ දළ ණය අනුපාතය සහ තුන්වන අදියරේ ශුද්ධ ණය අනුපාතය (ශුද්ධ හානිකරණය) පිළිවෙළින් 18%ක් සහ 12.8%ක් විය. තුන්වන අදියරේ ණය නිරාවරණය සඳහා හානිකරණ ආවරණ අනුපාතය 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට 29.1%ක් විය. කොවිඩ්-19 වසංගතය සඳහා ලබා දී තිබූ ණය සහන අවසන් වීම හේතුවෙන් ණය සහ අත්තිකාරම් පහත හෙලීම තුන්වන අදියරේ ණය ඉහළ මට්ටමක පැවතීමට හේතු විය.

## විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්

විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී රුපියල් බිලියන 2.2කින්, එනම් 6.1%කින් රුපියල් බිලියන 37.8ක් දක්වා වර්ධනය විය.[2] ණය සහ අත්තිකාරම් රුපියල් බිලියන 1කින්, එනම් 3.2%කින් වර්ධනය වූ අතර, එය 2022 වසරේ අගෝස්තු මස අවසානයේ දී රුපියල් බිලියන 30.8ක් ලෙස වාර්තා විය. විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සමස්ත ප්‍රාග්ධනය රුපියල් බිලියන 1.3කින් ඉහළ යමින්, 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට රුපියල් බිලියන 14.5ක් වූ අතර එය 2021 වසරේ දෙසැම්බර් අවසානයට සාපේක්ෂව 9.7%ක වර්ධනයකි. මෙම අංශය, 2021/22 මූල්‍ය වර්ෂයේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස පහ තුළ වාර්තා කළ රුපියල් මිලියන 186ක බදු පසු ලාභයට සාපේක්ෂව 2022/23 මූල්‍ය වර්ෂය සඳහා 2022 වසරේ අදාළ කාල සීමාව තුළ දී රුපියල් මිලියන 50ක බදු පසු ලාභයක් වාර්තා කර ඇත. 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට, දළ සහ ශුද්ධ තුන්වන අදියරේ දළ ණය අනුපාත පිළිවෙළින් 20.8%ක් සහ 13.1%ක් විය. 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට මෙම අංශය විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 02කින්[3] සමන්විත විය.

## ප්‍රාථමික අලෙවිකාර සමාගම්

මෙම අංශය බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර සමාගම් 07කින් සමන්විත වූ අතර, ඉන් සමාගම් 05ක් පමණක් 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට සක්‍රීය තත්ත්වයෙන් පවතියි. මෙම අංශය, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අටක කාලය තුළ දී මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කළේය. 2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට ප්‍රාථමික අලෙවිකාර සමාගම් අංශයේ සමස්ත වත්කම් රුපියල් බිලියන 110.4ක් දක්වා 40.3%කින් ඉහළ ගියේය. ප්‍රාථමික අලෙවිකාර සමාගම් අංශයේ රජයේ සුරැකුම්පත්වල සමස්ත ආයෝජන කළඹ 41.3%කින් ඉහළ ගිය අතර එය, 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 108.2ක් විය. සියලුම සක්‍රීය ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් 2022 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට ඔවුන්ගේ මූලික ප්‍රාග්ධනය සහ සමස්ත අවදානම මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය, ඒ සඳහා අදාළ අවම අවශ්‍යතාවන් වන, පිළිවෙළින් රුපියල් බිලියන 2 සහ 10%ට ඉහළින් පවත්වා ගන්නා ලදී. 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී වාර්තා කරන ලද රුපියල් බිලියන 0.1ක අලාභයට සාපේක්ෂව, 2022 වසරේ එම කාලපරිච්ඡේදය සඳහා ප්‍රාථමික අලෙවිකාර සමාගම්

2 2022 අගෝස්තු මස අවසානය වන විට ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් හි සමස්ත වත්කම් පදනම රුපියල් බිලියන 31.6ක් විය.

3 ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (මින් පෙර, ඇසට්ලයින් ලීසිං කම්පැණි ලිමිටඩ් ලෙස හැඳින්වූ, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද මෙම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම) වෙත 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ 2022.08.29 වන දින බලපත්‍රයක් නිකුත් කෙරිණි. කෙසේ වෙතත්, ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් හි මූල්‍ය දත්ත 2022 අගෝස්තු මාසය අවසානය වන විට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයෙහි ඇතුළත් කර ඇත.

විසින් රුපියල් බිලියන 1.5ක අලාභයක් වාර්තා කරන ලද අතර පොලී අනුපාත ඉහළ යෑම තුළින් වෙළඳපොළ අගය මත පදනම් වූ අලාභ මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

### බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

2022 වසරේ අගෝස්තු මාසය අවසන් වන විට, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් 04කින් සමන්විත වූ මෙම අංශයෙහි සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 9.3ක් විය. බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල දළ ණය සහ අත්තිකාරම් 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අටක කාලය තුළ දී 4.8%ක පහළ යෑමක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 6.4ක් වාර්තා කළේය. 2021 වසරේ දෙසැම්බර් අවසානය වන විට 16.2%ක් වූ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල අක්‍රීය ණය අනුපාතය, 2022 වසරේ අගෝස්තු අවසානය වන විට 9.4%ක් දක්වා පහළ ගියේය. මෙම අංශය විසින් 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අටක කාලපරිච්ඡේදය තුළ දී රුපියල් මිලියන 50ක අලාභයක් වාර්තා කරන ලදී.

### රක්ෂණ අංශය

2022 වසරේ මුල් භාගයේ දී මුළු වත්කම්වල හිතකර වර්ධනයක් පෙන්නුම් කරමින් රක්ෂණ අංශයේ සමස්ත කාර්යසාධනය වැඩි දියුණු විය. රක්ෂණ අංශයේ සමස්ත වත්කම් සහ දළ ලියාහළ වාරිකය (GWP) වාර්ෂිකව පිළිවෙළින්, 7.9%කින් සහ 17.8%කින් වර්ධනය විය. 2022 වසරේ ජූනි මස අවසානය වන විට දිගු කාලීන රක්ෂණ උප අංශයේ හා සාමාන්‍ය රක්ෂණ උප අංශයේ මුළු වත්කම් පිළිවෙළින්, 6.8%කින් සහ 10.5%කින් වර්ධනය වූ අතර රක්ෂණ උප අංශ දෙකෙහිම දළ ලියාහළ වාරිකය පිළිවෙළින්, 17.9%ක සහ 17.7%ක සැලකිය යුතු වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශයේ බදු පෙර ලාභයෙහි වර්ධනයක් වාර්තා වූ අතර එය 2021 වසරේ මුල් භාගයේ දී වාර්තා කළ රුපියල් බිලියන 16.9ට සාපේක්ෂව 2022 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 22.5ක් ලෙස වර්ධනය විය.

### ඒකක භාර

2022 වසරේ මුල් භාගයේ දී ඒකක භාර අංශය ශුද්ධ වත්කම්වල වටිනාකම අනුව අඩු වීමක් පෙන්නුම් කළේය. මෙම අංශයේ ශුද්ධ වත්කම්වල වටිනාකම රුපියල් බිලියන 132.7ක් දක්වා වාර්ෂිකව 40.2%කින් පහත වැටුණි. කෙසේ වුවද, 2022 වසරේ ජූනි මස අවසානය වන විට ඒකක හිමියන්ගේ සංඛ්‍යාව 62,700ක් දක්වා වාර්ෂිකව 12.7%කින් වර්ධනය විය. මෙම අංශයේ ආයෝජනවල වටිනාකම රුපියල් බිලියන 134.9ක් දක්වා වාර්ෂිකව 39.4%ක අඩු වීමක් වාර්තා කළේය. ඒකක භාර විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජිත වටිනාකම 2021 වසරේ ජූනි මස අවසානයේ දී වාර්තා වූ 10.6%ට සාපේක්ෂව එම අංශයේ මුළු ශුද්ධ වත්කම්වල වටිනාකමින් 38.7%ක් ලෙස 2022 වසරේ ජූනි මස අවසානයේ දී වර්ධනය විය.

### කොටස් තැරැව්කාර සමාගම්

2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සසඳන විට 2022 වසරේ මුල් භාගයේ දී කොටස් තැරැව්කාර සමාගම් මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය. 2022 වසරේ ජූනි මස අවසානයේ දී මෙම අංශයේ මුළු වත්කම් සහ ශුද්ධ ප්‍රාග්ධනය වාර්ෂිකව පිළිවෙළින්, 7%කින් සහ 32.4%කින් වර්ධනය විය. කෙසේ වෙතත්, 2022 වසරේ මුල් භාගයේ දී කොටස් තැරැව්කාර සමාගම්වල සාමාන්‍ය පිරිවැටුම රුපියල් මිලියන 839ක් දක්වා 46%කින් පහළ ගිය අතර, එම අංශයේ බදු පෙර ලාභය රුපියල් මිලියන 228ක් දක්වා 74.9%කින් පහළ ගියේය.

### විශ්‍රාම අරමුදල්

2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට, සේවක අර්ථසාධක අරමුදල සිය වත්කම් පදනම රුපියල් ට්‍රිලියන 3.3 ඉක්මවිය. 2021 වසරේ දෙසැම්බර් මාසය වන විට, සේවක අර්ථසාධක අරමුදලෙහි සමස්ත සාමාජික ගිණුම් ප්‍රමාණය මිලියන 20.3ක් දක්වා ළඟා විය.

පසුගිය වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලය සමග සසඳන විට, 2022 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී සමස්ත දායක මුදල් ප්‍රමාණය සහ ප්‍රතිලාභ ආපසු ගෙවීම් පිළිවෙළින්, රුපියල් බිලියන 123.4ක් සහ රුපියල් බිලියන 101.1ක් දක්වා 21.2%කින් සහ 45.9%කින් වර්ධනය විය. ඒ අනුව, එම කාලපරිච්ඡේදයට අදාළ ශුද්ධ දායකත්ව මුදල් ලැබීම් ප්‍රමාණය (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) රුපියල් බිලියන 22.3ක් විය.

2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට, සේවක අර්ථසාධක අරමුදලේ සමස්ත ආයෝජන රුපියල් බිලියන 3,330.8ක් දක්වා 9.6%කින් වාර්ෂිකව වර්ධනය විය. 2022 වසරේ අගෝස්තු මස අවසානය වන විට, මෙම ආයෝජන 96.2%ක් රාජ්‍ය සුරැකුම්පත්වලින් ද, 2.1%ක් ව්‍යාපාර කොටස්වලින් ද, 0.9%ක් සාංගමික ණය උපකරණ සහ ප්‍රතිවිකුණුම්වලින් ද, 0.8%ක් ස්ථාවර තැන්පතුවලින් ද සමන්විත විය. 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලය තුළ අරමුදලෙහි දළ ආයෝජන

**8.3 සංඛ්‍යා සටහන**
**සේවක අර්ථසාධක අරමුදලෙහි තෝරාගත් දර්ශක**

| අයිතමය | 2021 අගෝ. අවසානයට | 2022 අගෝ. අවසානයට (අ) | වෙනස % |
|---|---|---|---|
| මුළු දායකත්වය (රු. බිලියන) (ආ) | 101.8 | 123.4 | 21.2 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) (ආ) | 69.3 | 101.1 | 45.9 |
| මුළු වත්කම් (රු. බිලියන) | 3,045.9 | 3,335.0 | 9.5 |
| මුළු ආයෝජන කළඹ (රු. බිලියන) | 3,037.9 | 3,330.8 | 9.6 |
| එයින් රජයේ සුරැකුම්පත් (%) | 93.7 | 96.2 | 2.7 |
| දළ ආයෝජන ආදායම (රු. බිලියන) (ආ) | 211.2 | 170.8 | -19.1 |

(අ) තාවකාලික
(ආ) අදාළ වසරේ පළමු මාස අට තුළ
මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආදායම රුපියල් බිලියන 170.8ක් වූ අතර, එය 2021 වසරේ අදාළ කාලපරිච්ඡේදය සමග සසඳන විට 19.1%ක අඩු වීමකි. 2021 වසර අවසානය වන විට පැවති සාමාජික ශේෂය මත 9%ක ප්‍රතිලාභ අනුපාතිකයක් සාමාජිකයින් වෙත ලබා දී ඇත.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සමස්ත වත්කම් වාර්ෂිකව 10.8%කින් වර්ධනය වූ අතර එය 2022 වසරේ ජූනි මස අවසානයේ දී රුපියල් බිලියන 441.4ක් ලෙස වාර්තා විය. පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සසඳන විට 2022 වසරේ මුල් මාස හය තුළ දී මුළු සාමාජික දායක මුදල් හා ප්‍රතිලාභ ආපසු ගෙවීම් රුපියල් බිලියන 16.8ක් හා රුපියල් බිලියන 11.5ක් දක්වා පිළිවෙළින් 17.2%කින් හා 10.6%කින් ඉහළ ගියේය. 2022 වසරේ ජූනි මස අවසානයේ දී අරමුදල විසින් සිදු කරන ලද ආයෝජන 11.1%ක යහපත් වාර්ෂික වර්ධනයක් වාර්තා කළ අතර සමස්ත ආයෝජනයෙන් 93.6%ක් රජයේ සුරැකුම්පත්වලින් සමන්විත විය.

2022 වසරේ ජූනි මස අවසානය වන විට සේවකයින් 72,633කින් සමන්විත වූ පුද්ගලිකව කළමනාකරණය කරන අනුමත අර්ථසාධක අරමුදල් (APFs) 117ක් විය. 2022 වසරේ ජූනි මස අවසානය වන විට අනුමත අර්ථසාධක අරමුදල්හි සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 207.4ක් වූ අතර එම අරමුදල් විසින් ආයෝජනය කර ඇති මුදල රුපියල් බිලියන 165ක් ලෙස වාර්තා විය. 2022 ජූනි මස අවසානයේ දී රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ (PSPF) මුළු වත්කම් රුපියල් බිලියන 84.8ක් දක්වා වාර්ෂිකව 4.7%කින් වර්ධනය විය. 2022 වසරේ ජූනි මස අවසානයේ දී එම අරමුදල විසින් කරන ලද මුළු ආයෝජන රුපියල් බිලියන 84.9ක් වූ අතර සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සාමාජික ශේෂයන් මත ගෙවූ ප්‍රතිලාභ අනුපාතිකය 8%ක් විය.

**8.4 සංඛ්‍යා සටහන**
**සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි තෝරාගත් දර්ශක**

| අයිතමය | 2021 ජූනි අවසානයට | 2022 ජූනි අවසානයට (අ) | වෙනස % |
|---|---|---|---|
| මුළු දායකත්වය (රු. බිලියන) (ආ) | 14.3 | 16.8 | 17.2 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන) (ආ) | 10.4 | 11.5 | 10.6 |
| මුළු වත්කම් (රු. බිලියන) | 398.2 | 441.4 | 10.8 |
| මුළු ආයෝජන කළඹ (රු. බිලියන) | 378.1 | 419.9 | 11.1 |
| එයින් රජයේ සුරැකුම්පත් (%) | 84.0 | 93.6 | 11.4 |
| දළ ආදායම (රු. බිලියන) (ආ) | 17.1 | 20.3 | 19.0 |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ
මූලය : සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

## 8.2 මූල්‍ය වෙළඳපොළ


### දේශීය මුදල් වෙළඳපොළ

2021 වසරේ අගෝස්තු මැද භාගයේ සිට හිඟ මට්ටමක පැවති දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, 2022 වසර තුළදී ද අඛණ්ඩව හිඟ මට්ටමක පැවතුණි. 2021 වසරේ දෙසැම්බර් මාසය අග වන විට රුපියල් බිලියන 366.2ක් ලෙස වාර්තා වූ ද්‍රවශීලතා හිඟය, 2022 වසරේ අප්‍රේල් මාසය අවසන් වන විට රුපියල් බිලියන 688.3ක් ලෙස ඉහළම අගයක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය ක්‍රමිකව අඩුවී 2022 වසරේ සැප්තැම්බර් මාසය අග වන විට රුපියල් බිලියන 433.5ක් ලෙස වාර්තා විය. රජයට තාවකාලික අත්තිකාරම් සැපයීම, මහ බැංකුවේ ලාභ පැවරුම් මෙන්ම මහ බැංකුව ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම සහ මහ බැංකුව වෙත භාණ්ඩාගාර බිල්පත් විශේෂ නිකුතු සිදු කිරීම, දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ යෑම සඳහා හේතු විය. කෙසේ වුවද, නියමිත විදේශ ණය ආපසු ගෙවීම්, ව්‍යවහාර මුදල් සංසරණය ඉහළ යෑම, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් පරිණත වීම මෙන්ම මහ බැංකුව සතුව පැවති භාණ්ඩාගාර බිල්පත් පරිණත වීම ආදී සාධක මගින් ද්‍රවශීලතාව ඉහළ යෑම සඳහා වූ බලපෑම අඩු විය.

> ***2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඛණ්ඩව හිඟ මට්ටමක පැවතුණි...***

වසරේ දෙවන භාගය තුළ දී, ඉහළ පොලී අනුපාතික හේතුවෙන් බැංකු අංශය වෙත මුදල් තැන්පතු ලැබීම ඉහළ ගිය අතර, එමගින් බැංකු අංශයේ ද්‍රවශීලතා තත්ත්වයේ වර්ධනයක් දක්නට ලැබිණි. මීට අමතරව, 2022 වසර තුළ දී, බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක පැවති දැඩි ද්‍රවශීලතා පීඩනය ලිහිල් කිරීමේ අරමුණින් මහ බැංකුව විසින් කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා ද්‍රවශීලතාව සපයන ලදී. තවද, මහ බැංකුව ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම තුළින් ද්‍රවශීලතාව

**8.1 රූප සටහන**
**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, විවට වෙළඳ කටයුතු, වෙළඳපොළ ද්‍රවශීලතාව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (2022 ජනවාරි 01 - 2022 සැප්තැම්බර් 30 )**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහළ යෑම කෙරෙහි වූ බලපෑම යම්තාක් දුරකට අවම කිරීම සඳහා 2022 වසරේ ජුනි මස මැද භාගයේ සිට භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනමින් විවට වෙළඳපොළ වෙන්දේසි හරහා විකිණීම සිදු කරන ලද අතර, 2022 වසරේ සැප්තැම්බර් මස අග වන විට රුපියල් බිලියන 23.5ක ද්‍රවශීලතාවයක් එමගින් අවශෝෂණය කරන ලදී. තවද, දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා පිළිබඳ අපේක්ෂාවන් සහ වෙළඳපොළ අවිනිශ්චිතතා ඉහළ යෑම හේතුවෙන් එක්දින ඒක්ෂණ මුදල් වෙළඳපොළ ගනුදෙනු ඉතා පහළ මට්ටමක පැවතුණි. එබැවින් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය හේතුවෙන් අරමුදල් සපයා ගැනීම සඳහා සහභාගිත්ව ආයතන මහ බැංකුව වෙත වැඩි වශයෙන් යොමු වූ අතර, අතිරික්ත ද්‍රවශීලතාවක් ඇති සහභාගිත්ව ආයතන එම අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පත් කිරීමට ද පෙළඹිණි.

දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සමගාමීව 2022 වසර තුළ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින්, 14.5% සහ 15.5%ක් දක්වා පදනම් අංක 950කින් අවස්ථා හතරක දී, ඉහළ නංවන ලදී. මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට 2022 වසරේ මේ දක්වා නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවෙහිම පැවතුණි. ඒ අනුව, 2022 වසරේ සැප්තැම්බර් මාසය මැද වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 15.5%ක් ලෙස වාර්තා වූ අතර 2022 වසරේ සැප්තැම්බර් මාසයේ අවසාන භාගයේ දී ඒක්ෂණ වෙළඳපොළ බොහෝ දුරට අක්‍රීය තත්ත්වයක පැවතුණි. බරිත සාමාන්‍ය ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය ද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ හැසිරීමට සමානව පැවති අතර, එය 2022 සැප්තැම්බර් මාසය අවසන් වන විට 15.5%ක් ලෙස වාර්තා විය. 2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ සිට ඒක්ෂණ මුදල් වෙළඳපොළ සහ ප්‍රතිමිලදීගැනුම් වෙළඳපොළෙහි ක්‍රියාකාරිත්වය අඩු මට්ටමක පැවතුණි. ඒ අනුව, 2022 වසරේ තුන්වන කාර්තුව තුළ දී ඒක්ෂණ මුදල් වෙළඳපොළ සහ ප්‍රතිමිලදීගැනුම් වෙළඳපොළෙහි දෛනික ගනුදෙනුවල සාමාන්‍යය, පිළිවෙළින්, රුපියල් බිලියන 2.9 සහ රුපියල් බිලියන 4.4ක් විය. ප්‍රතිපත්ති පොලී අනුපාතිකවලට සාපේක්ෂව සැලකිය යුතු වෙනස් වීමක් පෙන්නුම් කරමින් අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාත ද භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතිකවලට සමගාමීව ඉහළ ගියේය.

## දේශීය විදේශ විනිමය වෙළඳපොළ

2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල, 2021 වසර අවසානයේ පැවති රුපියල් 200.43 සිට 2022 සැප්තැම්බර් 30 දින පැවති රුපියල් 362.9ක් දක්වා 44.8%ක සැලකිය යුතු අවප්‍රමාණයක් වාර්තා කළේය. මහ බැංකුව විසින් 2021 වසරේ සැප්තැම්බර් මාසයේ සිට 2022 වසරේ මාර්තු මාසයේ මුල දක්වා සපයන ලද විනිමය අනුපාතික මගපෙන්වීමට අනුව, එ.ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල විනිමය අනුපාතිකය රුපියල් 200 - රුපියල් 203 මට්ටමේ පැවතුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත දැඩි ලෙස ක්ෂය වීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ඇති වූ සැලකිය යුතු පීඩනය සැලකිල්ලට ගනිමින් මහ බැංකුව විසින් 2022 මාර්තු 07 වැනි දින විනිමය අනුපාතිකයෙහි නිසි ගැලපීමක් සිදුවීමට ඉඩ හරින ලදී. පසුව, වෙළඳපොළ බලවේගයන්හි බලපෑම හේතුවෙන් විනිමය අනුපාතිකය නිසි මට්ටම ඉක්මවා අවප්‍රමාණය විය.

> ***2022 වසරේ මාර්තු - මැයි කාල සීමාව තුළ සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමෙන් අනතුරුව 2022 වසරේ මැයි මාසයේ දී විනිමය අනුපාතික මාර්ගෝපදේශයක් දිනපතා ප්‍රකාශයට පත්කිරීම ආරම්භ කිරීමත් සමඟ ශ්‍රී ලංකා රුපියල බොහෝ දුරට ස්ථාවරව පැවතුණි...***

එබැවින්, 2022 මැයි 13 දින සිට බලපැවැත්වෙන පරිදි විනිමය අනුපාතිකයේ දිනක් තුළ විචලනය සාධාරණ මට්ටමකින් කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස මහ බැංකුව, බලපත්‍රලාභී බැංකු වෙත විචල්‍ය ආන්තිකය ද සමඟ විනිමය අනුපාතික මාර්ගෝපදේශයක් දිනපතා ප්‍රකාශයට පත්කිරීම ආරම්භ කළේය. එතැන් සිට විනිමය අනුපාතිකයේ උච්චාවචනයන් ක්‍රමක්‍රමයෙන් ස්ථාවර වීම ආරම්භ වූ අතර, අන්තර් බැංකු වෙළඳපොළෙහි බර තබන ලද සාමාන්‍යය එතැන් විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයකට රුපියල් 360 - රුපියල් 363 අතර පැවතුණි.

2022 වසරේ සැප්තැම්බර් මාසය අවසානය දක්වා වූ වසර තුළ මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ශුද්ධ විකුණුම්කරුවකු ලෙස කටයුතු කරන ලදී. 2022 වසරේ ජූලි මස අවසානය දක්වා කාලය තුළ පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සහ ශ්‍රී ලංකා රුපියල් බවට අනිවාර්යයෙන් පරිවර්තනය කළ යුතු වූ භාණ්ඩ හා සේවා අපනයන ආදායමෙන් යම් ප්‍රතිශතයක් මහ බැංකුවට විකිණීමට බලපත්‍රලාභී බැංකුවලට නියම කිරීම මගින් මහ බැංකුව ණය නොවන මූලාශ්‍ර හරහා විදේශ විනිමය සපයා ගැනීම අඛණ්ඩව සිදු කළ ද, උග්‍ර වූ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි හිඟ ද්‍රවශීලතා තත්ත්වය හමුවේ ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ ගල් අඟුරු ඇතුළු අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය සඳහා එ.ජ. ඩොලර් සැපයීමට මහ බැංකුවට සිදුවිය. කෙසේ වුවද, 2022 වසරේ මැයි මාසයේ දී විවෘත ගිණුම් හරහා භාණ්ඩ ආනයනය කිරීම වැළැක්වීම සහ අත්‍යාවශ්‍ය නොවන ආනයන විශාල වශයෙන් අධෛර්යමත් කිරීම ඇතුළුව ගන්නා ලද ක්‍රියාමාර්ග ගණනාවක් සමඟ 2022 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාස තුළ දී ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් අවශෝෂණය කර ගැනීමට මහ බැංකුවට හැකියාව ලබාදෙමින්, 2022 වසරේ ජූලි මාසය අග වන විට දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වය ක්‍රමානුකූලව වැඩිදියුණු විය. ඒ අනුව, 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය අවසානය දක්වා කාලය තුළ මහ බැංකුව එ.ජ. ඩොලර් මිලියන 1,383.5ක් අවශෝෂණය කර එ.ජ. ඩොලර් මිලියන 2,058.6ක් වෙළඳපොළට සපයන ලද අතර, එමගින් එ.ජ. ඩොලර් මිලියන 675.1ක ශුද්ධ සැපයුමක් ඇති විය.

2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ, දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු පරිමා අඛණ්ඩව පහත වැටීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි. ඒ අනුව, දේශීය අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළේ දෛනික සාමාන්‍ය ගනුදෙනු පරිමාව සලකා බලනු ලබන කාල සීමාව තුළ, 2021 වසරේ එම කාල සීමාව තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 51.8ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 39.7ක් දක්වා 23.4%කින් පහත වැටී ඇත.


### රජයේ සුරැකුම්පත් වෙළඳපොළ

මෙම වසරේ මුල් භාගය තුළ දී මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම මධ්‍යයේ මධ්‍යම රජයේ සැලකිය යුතු දේශීය මූල්‍යන අවශ්‍යතා සහ පෙර නොවූ විරූ වෙළඳපොළ තත්ත්වයන් හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික ඉතිහාසගත ඉහළම අගයන් වාර්තා කළේය. 2022 වසරේ අප්‍රේල් මාසයේ ඇරඹි සමාජ ආර්ථික කැළඹීම, ඉන්පසු මාසවල දී දේශපාලන අර්බුදයක් බවට පත්වීමත් සමඟ හටගත් විචලන දේශීය වෙළඳපොළ තුළ දැඩි අවිනිශ්චිතතාවයක් නිර්මාණය කළ අතර එම තත්ත්වය ආයෝජන තීරණ කෙරෙහි ඇතිකළ බලපෑම, සැලකිය යුතු ලෙස ඉහළ ගිය රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික තුළින් පිළිඹිබු විය. මේ අතර, 2022 වසරේ අප්‍රේල් මස 12 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ විදේශීය රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය, රජයේ ඉහළ මූල්‍ය අවශ්‍යතා සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික කැපීපෙනෙන ලෙස ඉහළ දැමීම යන කරුණු මගින් 2022 වසරේ තෙවන කාර්තුව වන විට රාජ්‍ය

> ***රජයේ ඉහළ මූල්‍ය අවශ්‍යතා, ප්‍රතිපත්ති පොලී අනුපාත සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ වෙළඳපොළ අවිනිශ්චිතතා හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික ඉතිහාසගත ලෙස ඉහළ ගියේය...***

**8.2 රූප සටහන**

**රාජ්‍ය සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සුරැකුම්පත්වල එළදා අනුපාතික ඉතිහාසගත ඉහළම අගයන් කරා ළඟා වීම කෙරෙහි පීඩනයක් ඇති කළේය. ඒ අනුව, 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා කාලය තුළ ද්විතියික වෙළඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතික 20.77% සිට 22.98%ක පරාසයක් තුළ ඉහළ ගිය අතර එම කාලය තුළ වසර 3, 5, 8 සහ 10කින් කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල පොලී අනුපාතික, 15.25% සිට 17.04% දක්වා පරාසයක ඉහළ ගියේය.

## කොටස් වෙළඳපොළ

අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී මිල දර්ශකයන් විචල්‍ය කාර්යසාධනයක් වාර්තා කළේය. උග්‍ර වූ සාර්ව ආර්ථික ගැටලු සහ දේශපාලන අස්ථාවරත්වය මධ්‍යයේ ව්‍යාකූල වූ ආයෝජකයින් තම අරමුදල් ඉවත් කර ගැනීමට පටන් ගැනීමත් සමඟ 2022 වසරේ පෙබරවාරි මස මුල සිට කොටස් වෙළඳපොළ දැඩි පසුබෑමකට ලක් විය. කෙසේ වුවද, අවස්ථා කිහිපයක දී සැලකිය යුතු උච්චාවචනයන් නිරීක්ෂණය වුවද 2022 වසරේ මැයි මාසයේ සිට මෙම පහත වැටීමේ ප්‍රවණතාවය මන්දගාමී වූ අතර 2022 වසරේ ජූලි මාසයේ සිට වෙළඳපොළ වැඩිදියුණු වීමේ සලකුණු පෙන්නුම් කළේය. එසේ වුවද, 2022 වසරේ සැප්තැම්බර් අවසානය වන විට මිල දර්ශක 2021 වසර අවසානයට සාපේක්ෂව සැලකිය යුතු පහළ මට්ටමක පැවතුණි.

සමස්තයක් ලෙස, 2022 වසරේ සැප්තැම්බර් අවසානය දක්වා වසර තුළ දී සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (S&P SL20) පිළිවෙළින්, 18.8%ක සහ 25.2%ක සෘණාත්මක වර්ධනයක් වාර්තා කළේය. 2022 වසරේ සැප්තැම්බර් අවසානය වන විට වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය වාර්ෂිකව 20.9%ක සෘණාත්මක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 4,341.1ක පැවතුණි. 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට, විවිධ අංශවල මිල දර්ශකයන්හි

**8.3 රූප සටහන**
**කොටස් වෙළඳපොළ දර්ශක වල විචලනය**




මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

වර්ධනයන් සලකා බැලීමේ දී, බලශක්ති අංශය (218.2%), වාණිජ සහ වෘත්තීය සේවා අංශය (74.1%), පාරිභෝගික සේවා අංශය (8.6%), සහ ආහාර හා ආහාර ද්‍රව්‍ය සිල්ලර වෙළඳාම (4.1%) හැර අනෙකුත් සියලුම අංශවල මිල දර්ශක සෘණාත්මක වර්ධනයන් වාර්තා කර ඇත. 2022 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට විවිධාංගීකරණය වූ මූල්‍ය අංශය විසින් 73.6%ක ඉහළම සෘණාත්මක වර්ධනයක් වාර්තා කරන ලද අතර, ඉන් පසුව ප්‍රවාහන අංශය (-42%) සහ මෝටර් රථ හා උපාංග අංශය (-31.1%) විසින් ඉහළම සෘණාත්මක වර්ධනයන් වාර්තා කරන ලදී.

2022 වසරේ අගෝස්තු මස අවසානය දක්වා ශුද්ධ විදේශ ගලා ඒම් සම්බන්ධයෙන් කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. ඒ අනුව, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 181.3ක ශුද්ධ විදේශ ආයෝජන පිටතට ගලායෑමට සාපේක්ෂව 2022 වසරේ අගෝස්තු අවසානය දක්වා වසර තුළ දී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව එ.ජ. ඩොලර් මිලියන 97.2ක ශුද්ධ විදේශ ආයෝජන ගලා ඒමක් වාර්තා කළේය.

**8.5 සංඛ්‍යා සටහන**
**කොටස් වෙළඳපොළෙහි තෝරාගත් දර්ශක**

| අයිතමය | 2020 අවසානයට | 2021 සැප්. අවසානයට | 2021 අවසානයට | 2022 සැප්. අවසානයට |
|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) | 6,774.2 | 9,459.9 | 12,226.0 | 9,931.1 |
| වසර ආරම්භයේ සිට වෙනස (%) | 10.5 | 39.6 | 80.5 | -18.8 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004=1,000) | 2,638.1 | 3,534.8 | 4,233.3 | 3,165.3 |
| වසර ආරම්භයේ සිට වෙනස (%) | -10.2 | 34.0 | 60.5 | -25.2 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,960.7 | 4,215.6 | 5,489.2 | 4,341.1 |
| ද.ජා.නි.යේ. ප්‍රතිශතයක් ලෙස (%)* | 18.7 | 23.8 | 31.0 | 24.5 |
| වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතිකය | 11.3 | 11.5 | 13.6 | 5.7 |
| සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන) | 1,899.0 | 4,455.0 | 4,888.2 | 3,316.2 |
| ශුද්ධ සමුච්චිත විදේශීය මිලදී ගැණුම් (රු. මිලියන) | -51,275.7 | -44,862.0 | -52,649.4 | 13,490.4 |
| ලැයිස්තුගත කළ සමාගම් ගණන | 283 | 287 | 296 | 294 |

*2021 වසරේ ද.ජා.නි. මත පදනම්ව (රු. බිලියන 17,686)

මූලය : කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

### සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී ප්‍රධාන වශයෙන්, ඉහළ පොලී අනුපාත සහ අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සාංගමික බැඳුම්කර වෙළඳපොළෙහි ක්‍රියාකාරීත්වය අඩු මට්ටමක පැවතුණි. 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ආයතන 14ක් විසින් ණයකර නිකුත් කරමින් රුපියල් බිලියන 84.4ක් රැස් කරන ලද අතර ඒ හා සැසඳීමේ දී 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී ආයතන දෙකක් පමණක් ණයකර නිකුත් කරමින් රුපියල් බිලියන 2.6ක් රැස් කර ඇත. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ 8% සිට 12% දක්වා වූ පරාසයට සාපේක්ෂව ස්ථාවර පොලී අනුපාත 15.42% සිට 15.5% දක්වා පරාසයක පැවතුණි.

සාංගමික බැඳුම්කර වෙළඳපොළට සමානව, වාණිජ පත්‍ර වෙළඳපොළ ද 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී සාපේක්ෂව අඩු ක්‍රියාකාරී මට්ටමක පැවතුණි. 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී නිකුත් කිරීම් හරහා රැස් කළ රුපියල් බිලියන 3.6ට සාපේක්ෂව 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී බලපත්‍රලාභී බැංකුවල සහාය ද ඇතිව නිකුත් කරන ලද වාණිජ පත්‍රිකා හරහා රුපියල් බිලියන 1.7ක් රැස් කර ඇත. පෙර වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී වාර්තා වූ 6.25% සිට 11.5% දක්වා වූ පරාසයට සාපේක්ෂව වාණිජ පත්‍ර පොලී අනුපාත 11% සිට 32% දක්වා පරාසයක පැවතුණි.

## 8.3 මූල්‍ය යටිතල පහසුකම්වල වර්ධනය

### ගෙවීම් සහ පියවීම් පද්ධති

2022 වසරේ ජනවාරි මාසයේ දී, මහ බැංකුව විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවට 'ලංකාසෙට්ල්' (LankaSettle) පද්ධතියේ ප්‍රාථමික සහභාගිකරුවෙකු වශයෙන් කටයුතු කිරීමට අනුමැතිය ලබා දුන් අතර මෙය බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ප්‍රාථමික සහභාගිකරුවෙකු ලෙස පත්වූ පළමු අවස්ථාව විය. තවද, විදේශ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, 2022 වසරේ පෙබරවාරි මාසයේදී මහ බැංකුව විසින් ජාතික ප්‍රේෂණ ජංගම යෙදුම වන 'LankaRemit' දියත් කරන ලදී.

ඩිජිටල් ගෙවීම් ක්‍රමවලට අනුගතවීමක් පෙන්නුම් කරමින්, සුළු පරිමාණ ගෙවීම් පද්ධති සහ උපකරණ හරහා සිදු වූ ගනුදෙනු ප්‍රමාණයේ සහ වටිනාකමේ වර්ධනයක් වාර්තා විය. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch) සහ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (Sri Lanka Interbank Payment System) හරහා සිදු කෙරෙන ගනුදෙනුවල ක්‍රමානුකූල වර්ධනයක් මෙම කාල සීමාව තුළ දී පෙන්නුම් කළේය. තවද, භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සඳහා මහජනතාව මුදල් නොවන ක්‍රම අනුගමනය කිරීම නිසා, ණයපත් සහ හරපත් ගනුදෙනු අඛණ්ඩව ඉහළ ගියේය. මේ අතර, දැනුවත් කිරීමේ වැඩසටහන් හේතුවෙන්, LANKAQR වෙළෙඳුන්ගේ ලියාපදිංචිය 2022 වසරේ පළමු භාගයේදී වැඩි වීමක් පෙන්නුම් කළේය. එම කාල සීමාව තුළ, ගනුදෙනු වී ඇති චෙක්පත් ප්‍රමාණයෙන් පෙන්නුම් කරන පරිදි චෙක්පත් භාවිතය සුළු වශයෙන් වැඩි වී ඇති අතර චෙක්පත් ජනප්‍රිය ගෙවීම් උපකරණයක් ලෙස තවදුරටත් පැවතුණි.

> **ශ්‍රී ලංකාව තුළ ගෙවීම් සහ පියවීම් අවශ්‍යතා කාර්යක්ෂම ලෙස සපුරාලන අතරම ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම සහ ජාතික ගෙවීම් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් මහ බැංකුව විසින් පියවර කිහිපයක් ගන්නා ලදී...**

**8.6 සංඛ්‍යා සටහන**

**ගෙවීම් පද්ධති මගින් සිදු වූ ගනුදෙනු ප්‍රමාණය ('000) (අ)**

| ගෙවීම් පද්ධතිය/උපකරණය | 2017 | 2021 | වර්ධනය % | 2021 (ජන.-ජූනි) | 2022 (ජන.-ජූනි) | වර්ධනය % |
|---|---|---|---|---|---|---|
| විශාල වටිනාකමින් යුත් ගෙවීම් පද්ධති | | | | | | |
| තත්කාලීන දළ පියවීම් පද්ධතිය | 377 | 450 | 19.4 | 203 | 283 | 39.4 |
| සුළු පරිමාණයේ ගෙවීම් පද්ධති/ උපකරණ | | | | | | |
| අන්තර් බැංකු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය | 51,963 | 33,021 | -36.5 | 16,839 | 17,227 | 2.3 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) | 30,018 | 41,868 | 39.5 | 19,952 | 22,492 | 12.7 |
| ණයපත් | 36,964 | 50,689 | 37.1 | 23,349 | 29,310 | 25.5 |
| හරපත්* | 46,964 | 108,040 | 130.0 | 48,412 | 72,258 | 49.3 |
| තත්කාලීන අරමුදල් හුවමාරුව (CEFTS) | 3,163 | 54,675 | 1,628.6 | 23,205 | 39,584 | 70.6 |
| LANKAQR ** | 133 | 849 | 538.3 | 429 | 268 | -37.5 |

(අ) කාලපරිච්ඡේදය තුළ

* විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර හරහා

** 2020 තුළ ගනුදෙනු ප්‍රමාණය 2018 වසර තුළ දී LANKAQR හඳුන්වා දෙන ලදී.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**8.7 සංඛ්‍යා සටහන**

**ගෙවීම් පද්ධති මගින් සිදු වූ ගනුදෙනු වල වටිනාකම (රු.බිලියන) (අ)**

| ගෙවීම් පද්ධතිය/උපකරණය | 2017 | 2021 | වර්ධනය % | 2021 (ජන.-ජුනි) | 2022 (ජන.-ජුනි) | වර්ධනය % |
|---|---|---|---|---|---|---|
| විශාල වටිනාකමින් යුත් ගෙවීම් පද්ධති | | | | | | |
| තත්කාලීන දළ පියවීම් පද්ධතිය | 92,302.7 | 294,602.0 | 219.2 | 93,672.4 | 384,004.9 | 309.9 |
| සුළු පරිමාණයේ ගෙවීම් පද්ධති/ උපකරණ | | | | | | |
| අන්තර් බැංකු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය | 10,481.9 | 8,311.5 | -20.7 | 4,015.3 | 5,007.3 | 24.7 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) | 1,725.0 | 2,862.2 | 65.9 | 1,331.6 | 1,644.9 | 23.5 |
| ණයපත් | 198.5 | 282.6 | 42.4 | 126.2 | 191.4 | 51.7 |
| හරපත්* | 134.5 | 315.9 | 134.9 | 137.8 | 248.8 | 80.6 |
| තත්කාලීන අරමුදල් හුවමාරුව (CEFTS) | 273.7 | 4,926.6 | 1,700.0 | 1,983.5 | 3,980.9 | 100.7 |
| LANKAQR ** | 0.3 | 1.9 | 533.3 | 0.8 | 0.8 | - |

(අ) කාලපරිච්ඡේදය තුළ
* විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර හරහා
** 2020 තුළ ගනුදෙනු වල වටිනාකම. 2018 වසර තුළ දී LANKAQR හඳුන්වා දෙන ලදී.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රවාහන අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට අගය රාශිගත කළ හැකි ද්විත්ව ක්‍රියාකාරීත්වයෙන් යුතු 'LankaPay' හරපත් නිකුත් කිරීමේ නියමු ව්‍යාපෘතිය සාර්ථකව දියත් කිරීමත් සමඟ ජාතික කාඩ්පත් යෝජනා ක්‍රමය (National Card Scheme) යටතේ නිකුත් කරන ලද 'LankaPay' හරපත් භාවිතා කළ හැකි මාර්ග පුළුල් විය. තවද, බලපත්‍රලාභී සේවා සපයන්නන් (Licensed Service Providers) මගින් සපයනු ලබන සේවාවල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීමේ අරමුණින් ඔවුන් විසින් නිකුත් කර ඇති ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධතිවල ක්‍රියාකාරීත්වය මහ බැංකුව විසින් අඛණ්ඩව අධීක්ෂණය කළේය. මීට අමතරව, ඩිජිටල් ගෙවීම් උපකරණ/යාන්ත්‍රණයන්හි භාවිතය, ආරක්ෂාව සහ නව වර්ධනයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ද මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

### විදේශ විනිමය නියාමනය සහ සුපරීක්ෂණය

විදේශ විනිමය ආමුඛ ප්‍රේෂණ ඉහළ නැංවීම හා රටින් පිටතට විදේශ විනිමය ප්‍රතිමුඛ ප්‍රේෂණ අවම කිරීම සඳහා විදේශ විනිමය පනත යටතේ දැනටමත් නිකුත් කර ඇති රෙගුලාසි, විධාන හා නියමයන් වසර තුළ දී අවශ්‍යතාවය පරිදි සංශෝධනය කරන ලදී. මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති, අපනයන ඉපැයීම්වල ශේෂය නියම කර ඇති කාල සීමාව තුළ ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීම අනිවාර්ය කරමින් සංශෝධනය කරන ලදී. කෙසේ වුවද, ඉහත රීති යටතේ වන පරිවර්තන අවශ්‍යතා වලින් සේවා අංශය පසුව නිදහස් කරන ලදී. තවද, 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිසම් පනත යටතේ ලබා දුන් අනුමැතියන්ට යටත්ව අවසරලත් පුද්ගලයන් විසින් කොළඹ වරාය නගරය තුළ සිදු කරන විදේශ විනිමය ගනුදෙනු/ආයෝජන වලට පහසුකම් සැලසීම සඳහා රෙගුලාසි සහ නියමයන් විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලදී.

මීට අමතරව, රටෙහි විදේශ විනිමය සංචිත ආරක්ෂා කිරීම සහ වෙළඳපොළ තුළ විදේශ විනිමය ක්ෂණිකව පිටතට ගලා යෑම වැළැක්වීම සඳහා ප්‍රතිමුඛ ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධ ප්‍රේෂණ මත සීමාවන්/අත්හිටුවීම් පනවමින් විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව නියෝග නිකුත් කරන ලදී. විදේශ විනිමය ගලා ඒම් සහ රට තුළ විදේශ විනිමය රඳවා තබා ගැනීම දිරිමත් කිරීමේ අරමුණින් විශේෂ තැන්පතු ගිණුම් ආරම්භ කිරීමේ කාලය, 2023 වසරේ අප්‍රේල් මස 08 දක්වා තවත් මාස 12කින් දීර්ඝ කරමින් රෙගුලාසි සහ විධාන ද නිකුත් කරන ලදී.

තවද, ශ්‍රී ලංකාව තුළ සිටින හෝ එහි නේවාසික පුද්ගලයෙකු හට තමා සන්තකයේ තබා ගත හැකි විදේශ මුදල් ප්‍රමාණය එ.ජ. ඩොලර් 15,000 සිට එ.ජ. ඩොලර් 10,000 දක්වා හෝ ඊට සමාන වෙනත් විදේශ මුදල් ප්‍රමාණයක් දක්වා අඩු කරන ලදී. අක්වෙරළ බැංකු ඒකක ගනුදෙනු සඳහා "තායි බාත්" හා "ඉන්දියානු රුපියල්" නම් කිරීමට මහ බැංකුවේ තීරණය අනුගමනය කරමින්, එකී මුදල් ඒකකයන් බලයලත් වෙළඳුන්ගේ දේශීය බැංකු ඒකක තුළ විදේශ විනිමය පනත යටතේ වන අරමුණු/ ගනුදෙනු සඳහා නම් කරන ලද මුදල් ඒකක ලෙස ප්‍රකාශ කරන ලදී.

### මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් එහි ප්‍රධාන කාර්යයන් වන මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම හෝ අනෙකුත් නීතිවිරෝධී කටයුතු හා සම්බන්ධ සැක කටයුතු ගනුදෙනු වාර්තා ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ අදාළ අධිකාරීන් වෙත යොමු කිරීම 2022 වසර තුළ දී ද සිදු කරන ලදී. ඒ අනුව, 2022 වසරේ සැප්තැම්බර් මාසය අවසන් වන විට, මූල්‍ය බුද්ධි ඒකකය විසින් සැකකටයුතු ගනුදෙනු වාර්තා 303ක් වැඩිදුර විමර්ශන කටයුතු සඳහා

හෝ අදාළ ක්‍රියාමාර්ග සඳහා නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් සහ නියාමන ආයතන වෙත යොමු කරන ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ අනුකූලතාවය සහතික කිරීමට මූල්‍ය ආයතන සඳහා එතැන් පරීක්ෂණ සිදුකරන ලද අතර ඒ පිළිබඳ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධ නීති යාන්ත්‍රණය සමග එකී ආයතන නිසි පරිදි අනුකූල වීම සහතික කිරීම සඳහා ද එතැන් පරීක්ෂණ සිදු කරන ලදී. රට තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම වසරේ සැප්තැම්බර් මාසයෙන් නිම වූ මාස නවය තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් චක්‍රලේඛ 3ක් නිකුත් කරන ලදී.

තවද, මූල්‍ය බුද්ධි ඒකකය 2021 වසරේ දී මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ වන දෙවන ජාතික අවදානම් තක්සේරුව සිදු කිරීම ආරම්භ කරන ලද අතර මෙම ක්‍රියාදාමය රාජ්‍ය හා පෞද්ගලික අංශයන් නියෝජනය කරන ආයතන 66ක සහභාගීත්වය ඇතුව සිදු කරගෙන යනු ලබයි. මූල්‍ය බුද්ධි ඒකකය විසින් 'goAML' නමින් වූ නව ගනුදෙනු වාර්තා කිරීමේ ක්‍රම පද්ධතිය සිය තොරතුරු වාර්තා කරනු ලබන ආයතන වෙත හඳුන්වාදීම ආරම්භ කරන ලද අතර මූල්‍ය බුද්ධි ඒකකය හා සම්බන්ධ පාර්ශවකරුවන්ගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වන ලදී.

### මූල්‍ය අංශයට අදාළ නීති ප්‍රතිසංස්කරණ

රට තුළ පවතින මූල්‍ය නියාමන සහ අධීක්ෂණ ක්‍රමවේදය ශක්තිමත් කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ අරමුණින් යුක්තව, මහ බැංකුව විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන ප්‍රධාන අණ පනත් සඳහා නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම අඛණ්ඩව සිදු කිරීමට 2022 වසර තුළදී ද කටයුතු කරන ලදී. මහ බැංකුවෙහි තීරණාත්මක හා මෙහෙයුම් ස්වාධීනත්වය සහ වගවීම ශක්තිමත් කර ගැනීමෙහිලා ඉටු කරනු ලබන ප්‍රමුඛ පියවරක් වශයෙන් වර්තමානයෙහි පවතින මුදල් නීති පනත ප්‍රතිස්ථාපනය කිරීම උදෙසා නව මහ බැංකු පනත කෙටුම්පත් කිරීම සිදුවේ. ලියාපදිංචි බැංකු වලට අදාළව මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන නිරාකරණ බලතල සහ මූල්‍ය සුරක්ෂිතතා ආවරණ ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීමේ අරමුණින් යුක්තව නව බැංකු (විශේෂ විධිවිධාන) පනත නුදුරේදී නීතිගත කිරීමට නියමිතය. එසේම, ලියාපදිංචි බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනයන්ට, අහිතකර/ වටිනාකම නිශ්වය කිරීම අපහසු වත්කම් ඔවුන්ගේ ශේෂ පත්‍රයෙන් නීත්‍යානුකූලව ඉවත්කිරීම සඳහා අවසර ලබා දීමේ අරමුණින් යුක්තව, මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පිළිබඳව වන නව නීතියක් ද හඳුන්වා දෙනු ඇත. වර්තමාන නෛතික සන්දර්භය තුළ පවත්නා අඩු ලුහුඩුකම් ආමන්ත්‍රණය කිරීමක් වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන පනත සහ වෙළඳ නිශ්කාෂණ සහ ශේෂ කිරීමේ පනත යනාදී නව අණ පනත් සකස් කිරීමට ද මහ බැංකුව විසින් මේ අතරවාරයේදී කටයුතු කරන ලදී. මෙයට අමතරව, විදේශ විනිමය පනත, මුදල් ව්‍යාපාර පනත, මූල්‍ය කල්බදු පනත සහ ගෙවීම් සහ පියවීම් පද්ධති පනත යනාදී පනත් සඳහා සංශෝධනයන් හඳුන්වා දීම තුළින් මූල්‍ය අංශයේ වෙනස්වීම් සහ මූල්‍ය නවෝත්පාදනයන් සමග අනුගත වන පරිදි වර්තමානයේ පවත්නා නීති යාවත්කාලීන කිරීම සඳහා ද මහ බැංකුව විසින් පියවර ගන්නා ලදී.

### නිරාකරණ සහ බලගැන්වීම

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ, බලපත්‍ර අවලංගු කරන ලද/ ව්‍යාපාර අත්හිටුවන ලද මූල්‍ය සමාගම් හයක තැන්පත්කරුවන්ට මහ බැංකුව විසින් වන්දි ගෙවීම් අඛණ්ඩව සිදු කරන ලදී. කෙසේ වුවද, ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී. හි තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම, සමාගමේ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම හේතුවෙන් මෙම වසර තුළ අත්හිටුවන ලදී. තවද, සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සහ ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් හි තැන්පත්කරුවන්ට වන්දි ගෙවීම් සම්බන්ධයෙන් නව අයදුම්පත් භාරගැනීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි රෙගුලාසි වල දක්වා ඇති පරිදි අයදුම්පත් භාර දීමට ලබා දී ඇති උපරිම කාල සීමාව අවසන් වීම හේතුවෙන් අත්හිටුවා ඇත.

තවද, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා නිරාකරණ ප්‍රතිපත්ති රාමුවක් සහ තැන්පතු රක්ෂණ ක්‍රමය සඳහා වූ විධිවිධාන සහ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන ඈවර කිරීම පිළිබඳ විධිවිධාන ඇතුළත් යෝජිත බැංකුකරණ (විශේෂ විධිවිධාන) පනත කෙටුම්පත් කිරීම සිදු කරන ලදී. දත්ත වාර්තාකරණයේ ගුණාත්මකභාවය සහ නිරවද්‍යතාවය ඉහළ නැංවීම සහ දත්ත ආරක්ෂාව හා සම්බන්ධ අවදානම අවම කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සියලුම සාමාජික ආයතන සඳහා තැන්පත්කරුවන් අනුව දත්ත රැස් කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම මහ බැංකුව විසින් ආරම්භ කරන ලදී.

### සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ තනි පුද්ගල ව්‍යාපාර සඳහා අවශ්‍ය සහනදායී මූල්‍ය පහසුකම් ලබාදීමේ අරමුණින් ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර හා ණය ඇප ආවරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම මහ බැංකුව විසින් අඛණ්ඩවම සිදු කරන ලදී. 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී, ණය යෝජනා ක්‍රම 17ක් යටතේ රුපියල් මිලියන 7,407.5ක ණය මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 15,092 දෙනෙකු වෙත සහභාගීත්ව මූල්‍ය ආයතන 16ක් හරහා මුදා හරින ලදී. වෙළඳපොළ පොලී අනුපාත සැලකිය යුතු ලෙස ඉහළ යෑම සලකා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික පොලී අනුපාතිකය ඉහළ නංවන ලද අතර, අනාගතයේ දී ඇති විය හැකි ආහාර හිඟය සැලකිල්ලට ගනිමින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරනු ලබන සමස්ත ණය වලින් කෘෂි, පශු සම්පත් සහ ධීවර ක්ෂේත්‍ර සඳහා ලබාදෙනු ලබන ණය මුදල් ප්‍රමාණය 80%ක් පමණ විය යුතු බවට අදාළ උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ලබාදෙන ලදී. මීට අමතරව, වත්මන් ආර්ථික තත්ත්වය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත්ව සිටින ණය ගැනුම්කරුවන්ට සහන සැලසීම අරමුණු කරගනිමින් මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනාක්‍රම සඳහා ණය ආපසු ගෙවීමේ සහන කාලයන් ලබා දෙන ලදී.

තවද, නියමිත ඉලක්ක සපුරා ගැනීම සහතික කරනු වස් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය එහි ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියාත්මක කිරීමට අදාළ අධීක්ෂණ කටයුතු මහ බැංකුව විසින් අඛණ්ඩවම සිදු කරන ලදී. තවද, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) සහාය ද ඇතිව පළමුවරට දීප ව්‍යාප්තව පවත්වන ලද මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ සමීක්ෂණය සාර්ථකව නිම කරන ලද අතර එම සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් විය.

### මූල්‍ය පාරිභෝගික සබඳතා

මහ බැංකුව විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී. ඒ අනුව, 2022 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අටක කාලය තුළ පැමිණිලි හා දුක් ගැනවිලි 3,208ක් මහ බැංකුව වෙත ලැබී ඇත.

තවද, මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන ආයතන සඳහා වන විස්තීර්ණ මූල්‍ය පාරිභෝගික රාමුවක් සඳහා පහසුකම් සැලසීම පිණිස නව රෙගුලාසි/මාර්ගෝපදේශ නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවට අදාළ රෙගුලාසි ද කෙටුම්පත් කරන ලදී.

# ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

# ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

## මුදල් ප්‍රතිපත්තිය

| | | |
|---|---|---|
| 2022 ජනවාරි 20 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50%ක් සහ 6.50%ක් දක්වා ඉහළ නංවන ලදී. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 9.00% සිට 9.50% දක්වා වැඩි විය. |
| 2022 මාර්තු 04 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 6.50%ක් සහ 7.50%ක් දක්වා ඉහළ නැංවිණි. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 9.50% සිට 10.50%ක් දක්වා වැඩි විය. |
| 2022 මාර්තු 07 | - | විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමක් සඳහා ඉඩ හරින ලදී. |
| 2022 අප්‍රේල් 08 | - | 2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පදනම් අංක 700කින් පිළිවෙළින්, 13.50%ක් සහ 14.50%ක් දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 10.50% සිට 17.50%ක් දක්වා වැඩි විය. |
| 2022 ජූලි 07 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, 14.50%ක් සහ 15.50%ක් දක්වා පදනම් අංක 100කින් ඉහළ නංවන ලදී. බැංකු අනුපාතිකය ඊට අනුරූපීව 17.50%ක් සිට 18.50%ක් දක්වා වැඩි විය. |

## විශේෂ ණය යෝජනා ක්‍රම

| | | |
|---|---|---|
| 2022 පෙබරවාරි 15 | - | කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) ව්‍යාපෘති කාල සීමාව 2021 වසරේ නොවැම්බර් මස 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කරන ලදී. |
| 2022 මැයි 20 | - | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ අලුතින් මුදා හරිනු ලබන මුළු ණය ප්‍රමාණයෙන් අවම වශයෙන් 80%ක් කෘෂිකාර්මික, පශු සම්පත්, ධීවර කර්මාන්ත සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සඳහා මුදාහරින ලෙස සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත උපදෙස් ලබා දෙමින් එකී ණය යෝජනා ක්‍රමයේ ණය අයදුම්කරුවන්ට අදාළ වාර්ෂික පොලී අනුපාතිකය 6% සිට 9% දක්වා ඉහළ නැංවීමට අදාළව මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2022 මැයි 27 | - | 2021 නොවැම්බර් 01 දින සිට 2022 මැයි 31 දින දක්වා කාලය සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා ලබා දෙන පොලී සහනාධාර අනුපාතය 7% සිට 4% දක්වා අඩු කිරීම සහ 2022 වසරේ ජූනි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා පොලී සහනාධාර අනුපාතය 4% සිට 7% දක්වා නැවත වැඩි කිරීම සඳහා කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) ව්‍යාපෘතියේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2022 ජූනි 13 | - | රටේ පවතින ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් සහ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම, ආහාර ආනයනය සඳහා විදේශ විනිමය රටින් පිටතට ගලායාම අඩු කිරීම, ජනතාව තුළ කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි වැඩි නැඹුරුවක් ඇති කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා වන රජයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට අනුගත වෙමින් අදාළ පොලී අනුපාත සහ මූල්‍ය පරිමාණය සංශෝධනය කිරීම සඳහා නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ (NCRCS) මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2022 ජූලි 07 | - | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය, සෞභාග්‍යා කොවිඩ් 19 පුනුරුද පහසුකම අදියර I සහ II ණය යෝජනා ක්‍රම සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) යටතේ ලබා දෙන ලද ණය සඳහා 2022 ජූලි 07 සිට 2022 දෙසැම්බර් 31 දක්වා ණය සහන/පමා කාලයක් සමඟ ණය ආපසු ගෙවීමේ කාලය මාස හයකින් (06) දීර්ඝ කරන ලදී. |

2 2022 ජනවාරි 01 සිට 2022 ඔක්තෝබර් 15 දක්වා ක්‍රියාත්මක කර ඇති ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

## මූල්‍ය අංශය

### බලපත්‍රලාභී බැංකු

2022 මාර්තු 11 - මෑත කාලීන දැඩි මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ණය කාඩ්පත් අත්තිකාරම්, පෙර ගිවිසගත් තාවකාලික අයිරා සහ උකස් අත්තිකාරම් සඳහා අය කළ හැකි සංශෝධිත පොලී අනුපාත දැනුම් දෙමින් 2021 අංක 02 දරන මුදල් නීති පනත් නියෝගය සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී.

- මෑත කාලීන දැඩි මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මෙන්ම, සාර්ව ආර්ථිකයේ අපේක්ෂිත වර්ධනයන් සහ බලපත්‍රලාභී බැංකු විසින් විදේශ මුදල් තැන්පතු සඳහා දැනට ලබා දෙන පොලී අනුපාත සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාත සීමා ඉවත් කරමින් 2021 අංක 03 දරන මුදල් නීති පනත් නියෝගය සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී.

2022 මාර්තු 22 - බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විදේශ විනිමය ඉදිරි විකුණුම් සහ මිලදී ගැනීම් සම්බන්ධයෙන් නිකුත් කළ 2021 අංක 07 දරන බැංකු පනත් විධානය අවලංගු කරමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී.

2022 මාර්තු 24 - ජාතික ආර්ථික වර්ධනයට දායක විය හැකි, ශක්‍යතාවයක් සහිත ව්‍යාපාර නැවත නඟාසිටුවීම සඳහා කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ඌන ක්‍රියාකාරී සහ අක්‍රීය ණය ගනුදෙනුකරුවන් හඳුනාගෙන ඔවුන්ට සහාය වීමෙන් ණය සහන කාලයන් ක්‍රමානුකූලව අවසන් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු තුළ පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීම උදෙසා වන මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2022 අප්‍රේල් 21 - ණය කාඩ්පත් අත්තිකාරම්, පෙර ගිවිසගත් තාවකාලික අයිරා සහ උකස් අත්තිකාරම් සඳහා පැනවූ උපරිම පොලී අනුපාත අවලංගු කරමින් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන දැඩි මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සැලකිල්ලට ගෙන තැන්පතු සඳහා පිරිනමන පොලී අනුපාත ප්‍රමාණාත්මක ලෙස ඉහළ දැමීම සඳහා බලපත්‍රලාභී බැංකු වෙත අවසර ලබා දෙන ලදී.

2022 මැයි 06 - පවත්නා සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතාව සහ අනෙකුත් ප්‍රධාන කාර්ය සාධන දර්ශක මත ඇතිවිය හැකි අහිතකර බලපෑම් මෙන්ම බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතා හා ප්‍රාග්ධන ස්වාරක්ෂක සුදුසු මට්ටම්වල පවත්වා ගැනීමේ වැදගත්කම ද සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකු වල අභිමතානුසාරී ගෙවීම් සහ අත්‍යවශ්‍ය නොවන/හදිසි නොවන වියදම් සීමා කරමින්, 2022 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලීව කටයුතු කරන ලෙස දන්වමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2022 මැයි 19 - විනිමය අනුපාතිකයේ හා දේශීය විදේශ මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවයේ ස්ථායිතාව පවත්වාගෙන යැම සඳහා අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන ස්වභාවයේ භාණ්ඩ ආනයන සීමා කිරීමේ අරමුණ ඇතිව, නිශ්චිතව හඳුනාගත් සංයෝජිත වර්ගීකරණ කේත අංක සඳහා (HS Codes) ප්‍රතිග්‍රහණ ලිපි යටතේ සිදු කරනු ලබන භාණ්ඩ ආනයන සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකු වෙත නිකුත් කළ බැංකු පනත් විධාන සහ ණයවර ලිපි යටතේ භාණ්ඩ ආනයනය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කළ මුදල් නීති පනත් නියෝගයක් ඔස්සේ පොලී හිමිකම් රහිත 100%ක මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව හඳුන්වා දෙන ලදී.

2022 මැයි 23 - පවත්නා සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකු වෙත, ඇතැම් නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් බැංකු පනත් විධානයන් නිකුත් කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවල ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂ මට්ටම් ප්‍රයෝජනයට ගැනීමට, සාධාරණ අගය යටතේ මිල තබා ඇති රුපියල්වලින් නාමිත රජයේ සුරැකුම්පත්

වෙළඳපොළ අගය මත මිල කිරීමේ දී ප්‍රතිපත්ති පොලී අනුපාත වෙනස් වීම නිසා එක් වරම ඇති වූ අලාභය 2022 අප්‍රේල් 08 දින සිට 2024 දෙවන කාර්තුව දක්වා කාල පරාසය තුළ කොටස් වශයෙන් අවශෝෂණය කර ගැනීමට සහ 2022 සැප්තැම්බර් 30 දින දක්වා බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතා ආවරණය හා ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාත සඳහා අවම අවශ්‍යතා 100% සිට 90% දක්වා පහත හෙළීමට අවසර ලබා දෙන ලදී. තවද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ගණනය කිරීමේ දී වෙනත් විස්තීරණ ආදායම් නිර්ණය කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව, නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. එමෙන්ම, බලපත්‍රලාභී බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ කාලසීමාව කොන්දේසි වලට යටත්ව, 2023 දෙසැම්බර් මස 31 දක්වා දීර්ඝ කරන ලද අතර බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම් අවදානම සඳහා අවදානම මත බර තබන ලද වත්කම් ගණනය කිරීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශය හෝ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය වෙත යාමට දිරිමත් කරන ලදී.

| | | |
|---|---|---|
| 2022 ජූනි 08 | - | මැත කාලීන දැඩි මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාත සඳහා නිකුත් කළ 2021 අංක 03 දරන මුදල් නීති පනත් නියෝගයෙහි විධාන 07 හැර අනෙකුත් සියලු විධාන අවලංගු කරමින් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී. |
| 2022 ජූනි 22 | - | ශ්‍රී ලංකාව තුළ තිරසාර ආර්ථික ක්‍රියාකාරකම් සඳහා මූල්‍යනය ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසාර මූල්‍යනය පිළිබඳ වූ පෙර දැක්ම අනුව බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යහපාලන සහ අවදානම් කළමනාකරණ රාමුවක් පිහිටුවීම අරමුණු කරගනිමින් බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2022 ජූලි 04 | - | විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් සඳහා වන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ පියවර තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකුවල පාරිභෝගික ප්‍රඥප්තිය මැයෙන් නිකුත් කර ඇති 2011 අංක 08 දරන බැංකු පනත් විධානය සඳහා අතිරේකයක් නිකුත් කරන ලදී. |
| 2022 ජූලි 07 | - | වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් සහ/හෝ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සිය ආදායමට හෝ ව්‍යාපාරයන්ට අහිතකර බලපෑම් ඇති වී ඇති ණය ගනුදෙනුකරුවන්ට, බැංකු අංශයේ ස්ථායීතාව කෙරෙහි අනවශ්‍ය ආතතියක් ඇති නොවන පරිදි, මාස හයක කාලයක් සඳහා සුදුසු ණය සහන ලබා දෙන ලෙස දන්වමින් බලපත්‍රලාභී බැංකුවලට චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙම සහනයන් ඒ ඒ පුද්ගලයන්ගේ අනාගත ණය ආපසු ගෙවීමේ හැකියාව සහ ව්‍යාපාරවල/ව්‍යාපෘතිවල ශක්‍යතාව මත පදනම්ව අවස්ථානුකූලව ලබා දෙනු ඇත. |
| 2022 අගෝස්තු 26 | - | බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ඒකකවල විදේශ විනිමය ගනුදෙනු සඳහා නම් කරන ලද විදේශ මුදල් විශේෂයන් අතරට ඉන්දියානු රුපියල ඇතුළත් කරමින් බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝගයක් නිකුත් කරන ලදී. |
| 2022 අගෝස්තු 29 | - | බැංකු මගින් තැන්පතුකරුවන්ගේ අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කරමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් සියලුම ආකාරයේ නව තැන්පත්කරුවන්ගේ අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක සටහන් කිරීම 2022 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි අනිවාර්ය වන අතර දැනට සිටින තැන්පත්කරුවන්ගේ අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සිය පරිගණක පද්ධතිවල සටහන් කිරීම 2023 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කළ යුතුය. |
| අපේක්ෂිත | - | බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර මෙහෙයුම් බාහිරකරණය පිළිබඳ සංශෝධිත නියාමන රාමුවක් නිකුත් කිරීම |

- බලපත්‍රලාභී බැංකුවලට අදාළ අනුකූලතා කටයුතු සඳහා අදාළ වන නියාමන රාමුව
- නව බැංකු පනත කෙටුම්පත් කිරීම

## බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරණ සමාගම්

2022 ජනවාරි 05 - ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2022 ජනවාරි මස 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

2022 ජනවාරි 28 - බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ශක්තිමත්භාවය පිළිබඳ අවම නියාමන අවශ්‍යතා සැකසීමේ අරමුණින් තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ශක්තිමත්භාවය පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී.

2022 පෙබරවාරි 08 - සේවක ප්‍රේෂණ ගලා එන ගිණුම්වලට අදාළ ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කරමින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා දිරිදීමනාවක් ලබා දෙන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී.

2022 මාර්තු 10 - මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 05 දරන ආයතනික යහපාලනය විධානයෙහි 10 සහ 12 වගන්ති බලාත්මක කිරීම සඳහා 2022 ජූලි 01 දක්වා අන්තර් කාලසීමාවක් ලබා දීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දෙන ලදී.

2022 මාර්තු 18 - පහසු බැංකුකරණය සක්‍රීය කිරීම මගින් මූල්‍යනය සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමේ විකල්පයක් ලෙසත්, බලපත්‍රලාභී මුදල් සමාගම්වල ක්‍රියාකාරීත්වයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමටත්, ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී.

2022 මාර්තු 21 - බැංකු නොවන මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ කොටසක් ලෙස සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සමාගම, කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සමාගම වෙත මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ලද බලපත්‍රය අවලංගු කරන ලදී. තවද 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සමාගමට නිකුත් කර තිබූ ලියාපදිංචිය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවලංගු කරන ලදී.

2022 මාර්තු 31 - බැංකු නොවන මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ කොටසක් ලෙස කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම වෙත මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ලද බලපත්‍රය අවලංගු කරන ලදී. තවද 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට නිකුත් කර තිබූ ලියාපදිංචිය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවලංගු කරන ලදී.

- ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ යාම හේතුවෙන් තැන්පතු සහ ණය උපකරණ සඳහා පවත්නා උපරිම පොලී අනුපාත සංශෝධනය කරන ලදී.

| | | |
|---|---|---|
| | - | වත්මන් ආර්ථික තත්ත්වය හේතුවෙන්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය විධානයේ සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය විධානයේ 4.3.1.(i) වගන්තිය ක්‍රියාත්මක කිරීම වසර දෙකකින් කල්දැමීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත දැනුම් දෙන ලදී. |
| 2022 අප්‍රේල් 18 | - | පසුගිය භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි හතරේ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයේ චල සාමාන්‍ය මත පදනම්ව තැන්පතු සහ ණය උපකරණ සඳහා උපරිම පොලී අනුපාත තීරණය කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම්වලට අවසර ලබා දෙමින් සහ ණය උපකරණ සඳහා උපරිම පොලී අනුපාත තීරණය කිරීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට අවසර ලබා දෙමින් තැන්පතු සහ ණය උපකරණ සඳහා පවතින උපරිම පොලී අනුපාත සංශෝධනය කරන ලදී. |
| 2022 මැයි 12 | - | බැංකු නොවන මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ කොටසක් ලෙස ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී සමාගම වෙත මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ලද බලපත්‍රය අවලංගු කරන ලදී. තවද 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී සමාගමට නිකුත් කර තිබූ ලියාපදිංචිය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවලංගු කරන ලදී. |
| 2022 ජූනි 08 | - | වෙළඳපොළ පොලී අනුපාත සැලකිය යුතු ලෙස ඉහළ යාම සැලකිල්ලට ගනිමින්, ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා වන උපරිම පොලී අනුපාත ඉවත් කිරීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් වෙත දැනුම් දෙන ලදී. |
| 2022 ජූලි 05 | - | ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් සිදු කරගෙන යාමේ අරමුණින්, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් විසින් ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් අත්හිටුවීම, 2022 ජූලි 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. |
| 2022 ජූලි 20 | - | වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ආදායමට හෝ ව්‍යාපාරවලට අහිතකර බලපෑම් එල්ල වී ඇති ණය ගනුදෙනුකරුවන් සඳහා සහන ලබා දෙන ලෙස ඉල්ලමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2022 අගෝස්තු 29 | - | බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණ වැඩපිළිවෙලේ කොටසක් ලෙස ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (මින් පෙර ඇසට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් ලෙස හැඳින්වූ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි වූ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමකි) ආයතනයට මුදල් ව්‍යාපාරයේ නියැලීම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 5(7) වගන්තිය අනුව බලපත්‍රයක් නිකුත් කරන ලදී. |
| 2022 සැප්තැම්බර් 02 | - | බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කරමින් විධානයක් නිකුත් කරන ලදී. ඒ අනුව, සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්වලට නව තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක වාර්තා කිරීම 2022 ඔක්තෝම්බර් 01 දින සිට ක්‍රියාත්මක කළ යුතු අතර, ආයතනයන්හි පද්ධතිවල දැනට සිටින ගනුදෙනුකරුවන් සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක වාර්තා කිරීම 2023 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කළ යුතුය. |

## රක්ෂණය

| | | |
|---|---|---|
| 2022 ජනවාරි 26 | - | "විද්‍යුත් තැපැල හරහා ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් වාර්ෂික ප්‍රතිලාභ සහ ජීවගණකඥ සංක්ෂිප්ත නියාමන වාර්තාකරණ ආකෘති සංශෝධනය කරන ලදී" යන මාතෘකාව යටතේ සියලුම රක්ෂණ සමාගම් වෙත නිර්ණ අංක 14 සහ 15 සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී. |
| | - | කේත ලබා දීම සඳහා වන සීමාවන් සහ කේත වෙනස් කිරීම සඳහා වන සීමාවන් සම්බන්ධයෙන් 2022 අංක 01 දරන නියෝගය නිකුත් කරන ලදී. |
| | - | එකම රක්ෂණාවරණයක් සඳහා එකම රක්ෂණ ඔප්පුහිමියාට විවිධ මිල ගණන් සැපයීම (වාරික අඩුකිරීම) තහනම් කිරීමේ 2022 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2022 පෙබරවාරි 03 | - | රක්ෂණකරුවන් සඳහා ආයතනික පාලන රාමුව පිළිබඳ 2022 අංක 02 දරන නියෝගය නිකුත් කරන ලදී. |
| 2022 පෙබරවාරි 25 | - | රක්ෂණකරුවන් සඳහා නිකුත් කරන ලද ආයතනික පාලන රාමුව සංශෝධනය කිරීම පිළිබඳව දැනුම් දෙමින් 2022 අංක 02 දරන (සංශෝධිත) නියෝගය නිකුත් කරන ලදී. |
| 2022 ජූලි 01 | - | සියලුම රක්ෂණකරුවන්ට, තැරැව්කාර සමාගම්වලට සහ නියෝජිතයින්ට වෙළඳ දැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලද අතර 2022.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි ඒවාට අනුකූල වීම අවශ්‍ය වේ. |
| 2022 අගෝස්තු 24 | - | දිගු කාලීන රක්ෂණ ඔප්පු සඳහා අදාළ සිසිලන කාල පරිච්ඡේදය, සහතික කළ සහ සහතික නොකළ ප්‍රතිලාභ සහ අදාළ කාලසටහන් සම්බන්ධයෙන් 2022 අංක 03 දරන නියෝගය නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්තුමය ප්‍රතිලාභ ආකෘතිය සම්බන්ධ නීති සංශෝධනය කිරීම. |
| | - | රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව, සාමාන්‍ය රක්ෂණ ප්‍රතිපත්ති සඳහා ප්‍රතිපත්ති රාමුව පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරනු ඇත. |

## ප්‍රාග්ධන වෙළඳපොළ

| | | |
|---|---|---|
| 2022 පෙබරවාරි | - | ලාභාංශ ගෙවීමේ ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අනුමැතිය ලබා දෙන ලදී. |
| 2022 අප්‍රේල් | - | සුරැකුම්පත් ණය ගැනීම සහ ණය දීම හරහා නියාමනය කරන ලද කෙටි විකුණුම් සඳහා වන අවසාන ප්‍රතිපත්ති රාමුව සඳහා අනුමැතිය ලබා දෙන ලදී. |
| | - | සාංගමික ණය නැවත මිලදී ගැනීම සඳහා අදාළ වන ගනුදෙනු පිරිවැය සඳහා යෝජිත සංශෝධන සඳහා අනුමැතිය ලබා දෙන ලදී. |
| 2022 ජූනි | - | නිල් බැඳුම්කර (Blue bonds) හඳුන්වාදීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දුණි. |
| | - | පාරිසරික, සමාජීය සහ පාලනය (ESG) පිළිබඳ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC), වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA) ආයතනය සහ කොළඹ කොටස් හුවමාරුව (CSE) අතර අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කරන ලදී. |
| | - | මධ්‍යම ප්‍රතිපාර්ශව පියවීම් යාන්ත්‍රණයක් හඳුන්වාදීමේ ප්‍රතිපත්තිය සඳහා අනුමැතිය ලබා දුණි. |
| | - | ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ ඩිජිටල්කරණය කිරීමේ තුන්වන අදියර සම්පූර්ණ කරන ලදී. |

| | | |
|---|---|---|
| 2022 සැප්තැම්බර් | - | සුකුක් (Sukuk) නිෂ්පාදන නිකුත් කිරීම සඳහා යෝජිත නියාමන රාමුව සඳහා අනුමැතිය ලබා දෙන ලදී. |

## ගෙවීම් හා පියවීම්

| | | |
|---|---|---|
| 2022 ජනවාරි 25 | - | අවශ්‍ය සුදුසුකම් සපුරාලීමෙන් පසු ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ලංකාසෙටල් පද්ධතියේ ප්‍රාථමික සහභාගිකරුවෙකු වශයෙන් කටයුතු කිරීමට අවසර ලබා දෙන ලදී. බලපත්‍රලාභී විශේෂිත බැංකු අතර මෙම අවසරය ලබා ගත් පළමු බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි. |
| 2022 පෙබරවාරි 08 | - | විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයින්ට ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු කාඩ්පත් භාවිතයෙන් ශ්‍රී ලංකාවට මුදල් යැවීමට සහ උපයෝගිතා බිල්පත් ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාතික ප්‍රේෂණ ජංගම යෙදුම වන 'LankaRemit', 2022 පෙබරවාරි මාසයේ දී දියත් කරන ලදී. තවද, 'LankaRemit' යෙදුමෙහි ප්‍රේෂණ පිළිබඳ යාවත්කාලීනයන් ලැබීමේ පහසුකම ඇති අතර, පරිශීලකයාට දේශීය බැංකු සමග සම්බන්ධිත ගෝලීය මුදල් හුවමාරු ක්‍රියාකරුවන් වෙත ප්‍රවේශ විය හැක. |
| 2022 පෙබරවාරි 28 | - | බලපත්‍රලාභී විශේෂිත බැංකු, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිකරුවෙකු වීමෙන් පසු ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සාමාජිකත්වය ලබා ගත හැකි වන පරිදි 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත යටතේ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ පොදු විධි විධාන, සංශෝධනය කර නිකුත් කරන ලදී. |
| 2022 මාර්තු 28 | - | ජාතික කාඩ්පත් යෝජනා ක්‍රමය (NCS) යටතේ හර කාඩ්පතක් නිකුත් කිරීමේ නියමු ව්‍යාපෘතියක් මහජන බැංකුව විසින් ආරම්භ කරන ලද අතර එහිදී හර කාඩ්පතෙහි අගය ගබඩා කිරීමේ පහසුකම සමග එම කාඩ්පත සංක්‍රමණ කාඩ්පතක් (Transit Card) ලෙස ද ක්‍රියා කළ හැකිය. |
| 2022 ජූනි 20 | - | ලංකාසෙටල් පද්ධතියේ සහභාගිත්ව තත්ත්වය සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි ප්‍රාථමික සාමාජිකත්වය ලබා ගත් ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඇතුළත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා වූ බහු-ස්ථර වගකීම් කළමනාකරණ සීමා ව්‍යුහය සංශෝධනය කරන ලදී. |

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

| | | |
|---|---|---|
| 2022 ජනවාරි 10 | - | මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යයන් සඳහා සීසීටීවී (CCTV) මෙහෙයුම් පිළිබඳ 2021 අංක 02 දරන මාර්ගෝපදේශය සංශෝධනය කිරීම සඳහා 2022 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2022 මාර්තු 22 | - | සැකකටයුතු ගනුදෙනු වාර්තා සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ඉල්ලීම පිළිබඳ 2022 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2022 අගෝස්තු 25 | - | විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට කාර්යක්ෂම බැංකු සේවා සැපයීම පිළිබඳ 2022 අංක 03 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

## විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර කටයුතු

2022 ජනවාරි 19 - විදේශ ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ විධිමත් මුදල් හුවමාරු කිරීමේ මාර්ග ඔස්සේ වැඩිපුර රට තුළට ගෙන්වා ගැනීම දිරිමත් කිරීමේ අරමුණින් විදේශ ශ්‍රමිකයින් මෙරටට විදේශ මුදල් එවීමේ දී දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා වන දිරි දීමනාවට අදාළව ශ්‍රී ලංකා මහා බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2022 ජනවාරි 21 - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි බලපත්‍රලාභී හෝටල් සේවා සැපයුම්කරුවන්, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්හට සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් වන ගෙවීම් විදේශ විනිමයෙන් පමණක් භාරගනු ලැබිය යුතු බව නියෝග කරමින් මුදල් නීති පනත යටතේ අංක 2263/41 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද "2022 අංක 1 දරන හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය භාර ගැනීමේ රීති" නිකුත් කරන ලදී.

2022 ජනවාරි 31 - විධිමත් මාර්ග හරහා රටට ලැබෙන විදේශ විනිමය ගලා ඒම් වැඩිදියුණු කිරීම සහ විධිමත් බැංකු පද්ධතිය හරහා විදේශ මුදල් නෝට්ටු ගලා ඒම ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා සාමාන්‍ය ජනතාව වෙත ලබාදෙන දිරි දීමනා" යෝජනා ක්‍රමය බලපැවැත්වෙන කාලසීමාවන් නැවත දැනුම්දෙන තුරු දීර්ඝ කිරීම.

2022 පෙබරවාරි 24 - දේශීය අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින සමීපතම පවුලේ සාමාජිකයකු හට ටියුෂන් ගාස්තු ගෙවීම සඳහා පහසුකම් සැලසීමට, විදේශීය රැකියාවක නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ (විගාමිකයන් හැර) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් එකී අධ්‍යාපන ආයතනවල ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට යැවීම සඳහා මුදල් හර කිරීමට අවසර ලබා දෙමින් බලයලත් වෙළඳුන් වෙත 2022 අංක 01 දරන විධානය නිකුත් කරන ලදී.

- දේශීය අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින සමීපතම පවුලේ සාමාජිකයෙකු හට ටියුෂන් ගාස්තු ගෙවීම සඳහා පහසුකම් සැලසීමට, විදේශයේ රැකියාවක නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ (විගාමිකයන් හැර) පුද්ගලික විදේශ ව්‍යාවහාර ගිණුම්වලින් දේශීය අධ්‍යාපන ආයතනවල ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට මුදල් බැර කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබා දෙමින් බලයලත් වෙළෙඳුන් වෙත 2022 අංක 02 දරන විධානය නිකුත් කරන ලදී.

2022 මාර්තු 09 - "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා සාමාන්‍ය ජනතාව වෙත ලබාදෙන දිරි දීමනා" යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුව, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම මත ගෙවනු ලබන, එ.ජ. ඩොලරයකට රු. 8.00ක් වන අතිරේක දිරි දීමනාව සහ අතැ'ති විදේශ මුදල් නෝට්ටු පරිවර්තනය කිරීමේ දී ගෙවනු ලබන එ.ජ. ඩොලරයකට රුපියල් 10.00ක් වන අතිරේක දිරි දීමනාව, 2022 මාර්තු 09 දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවීම.

2022 මාර්තු 11 - අපනයනකරුවන් හට පහත දැක්වෙන අනිවාර්යය කොන්දේසි ද පනවමින් මුදල් නීති පනත යටතේ අංක 2270/66 දරන (අති විශෙෂ) ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති නිකුත් කරන ලදී.

- අපනයනය කරන ලද සියලු භාණ්ඩ සහ/හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවාවලට අදාළව අපනයන ඉපැයීම් අදාළ පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට, දින එකසිය අසූවක් (180) ඇතුළත ශ්‍රී ලංකාව වෙත ලබා ගැනීමට;
- සෑම අපනයන ඉපැයීමක්ම ලැබීම් සම්බන්ධයෙන් වන සියලුම ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නා වූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුව වෙත ලබා දීමට, සහ
- ශ්‍රී ලංකාවට ලැබෙන අපනයන ඉපැයීම්වලින්, දේශීය සැපයුම්කරුවන්ට කරනු ලබන ගෙවීම් ඇතුළුව අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමට.

\- 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (විදේශ විනිමය පනත) කාර්ය සඳහා "තායි බාත්" නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් ලෙස නිර්ණය කරමින් 2022 අංක 03 දරන විධානය බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලදී.

2022 මාර්තු 22 - ශ්‍රී ලංකා මහ බැංකුවට ගලා එන විදේශ විනිමය තවදුරටත් ඉහළ නැංවීම තුළින් අත්‍යවශ්‍ය ආනයනවලට සහාය ලබාදීම සඳහා, 2022 මාර්තු 21 වන දිනෙන් ආරම්භ වන සතියේ සිට 2022 ජූලි 29 දිනෙන් අවසන් වන සතිය දක්වා, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ අනිවාර්යයෙන් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ යුතු අපනයන ආදායම්වලින් බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සතිපතා සිදුකළ යුතු වන අනිවාර්ය විදේශ විනිමය විකුණුම් ප්‍රතිශතය 25% සිට 50% දක්වා තාවකාලිකව ඉහළ නැංවීම.

2022 මාර්තු 28 - දේශීය බැංකු ඒකක තුළ විශේෂ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා සහ ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුම්වලින් ඒ සඳහා අරමුදල් මාරු කිරීම සඳහා ආරම්භයේ දී දෙන ලද මාස 24ක කාලය තවත් මාස 12කින් දීර්ඝ කිරීමට අංක 2273/06 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති පරිදි විදේශ විනිමය පනත යටතේ නියෝග නිකුත් කරන ලදී. ඒ අනුව, සුදුසුකම් ඇති පුද්ගලයන් හට ශ්‍රී ලංකාවට ලැබෙන ආමුඛ ප්‍රේෂණ මඟින් හෝ ආමුඛ ආයෝජන ගිණුම්වලින් හෝ ගිණුම් හිමියන් විසින් අක්වෙරළ බැංකු ඒකකයන්හි පවත්වාගෙන යනු ලබන ගිණුම් වලින් අරමුදල් මාරු කිරීමෙන්, 2023 අප්‍රේල් 8 දක්වා විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ හැකි ය.

2022 අප්‍රේල් 07 - ගිණුම් හිමියා වෙනුවෙන් ලැබුණු ආමුඛ ප්‍රේෂණවලින් දේශීය බැංකු ඒකක තුළ විශේෂ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට සහ ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුම්වලින් ඒ සඳහා අරමුදල් මාරු කිරීමට බලයලත් වෙළෙඳුන් හට ආරම්භයේ දී ප්‍රදානය කර තිබූ මාස විසි හතරක කාලය මාස 12කින් දීර්ඝ කරමින් 2022 අංක 04 දරන විධාන නිකුත් කරන ලදී.

2022 අප්‍රේල් 11 - දේශීය විදේශ විනිමය වෙළඳපොළේ පවත්නා තත්ත්වය සහ බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය වගවීම් සැලකිල්ලට ගනිමින්, 2022 අප්‍රේල් 11 දින සිට බලපැවැත්වෙන පරිදි නැවත දැනුම්දෙන තුරු, ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ අනිවාර්යයෙන් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතු අපනයන ආදායම්වලින්, බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සතිපතා සිදු කළ යුතු අනිවාර්ය විදේශ විනිමය විකිණුම් ප්‍රතිශතය, තාවකාලිකව ඉහළ නංවන ලද ප්‍රතිශතය 50% සිට 25% දක්වා අඩු කිරීම.

2022 මැයි 12 - විදේශ විනිමය වෙළඳපොළ විධිමත්ව හැසිරීම පහසු කිරීම සහ විනිමය අනුපාතිකයෙහි දෛනිකව සිදුවන අනිසි උච්චාවචන කළමනාකරණය කිරීම සඳහා, අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු සඳහා අදාළ වන එ.ජ.ඩො./ ශ්‍රී.ලං.රු. විචල්‍ය ආන්තිකයක් ද සමඟ, දිනපතා ප්‍රකාශයට පත්කරනු ලබන එ.ජ.ඩො./ ශ්‍රී.ලං.රු. මධ්‍ය විනිමය අනුපාතිකයක් හඳුන්වා දීම.

2022 ජූනි 03 - 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවලට අනුකූලව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරවල නිරත වීම සඳහා අවසරලත් සහ බලයලත් පුද්ගලයෙකුගෙන් විදේශ විනිමය උපයනු ලබන, පහත සඳහන් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් ඇතුළුව, විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ අරමුණ සඳහා ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට ඇති සුදුසුකම් තවදුරටත් පුළුල් කරමින් අංක 2282/60 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති පරිදි 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියෝගයක් නිකුත් කරන ලදී.

- බලයලත් පුද්ගලයෙකුගේ සේවා නියුක්තිකයෙකු,
- භාණ්ඩ හෝ සේවා සැපයීමේ අරමුණ සඳහා බලයලත් පුද්ගලයෙකු සමඟ ව්‍යාපාරයෙහි නිරත වී සිටින ඕනෑම පුද්ගලයෙකු

- 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද අවසරයට යටත්ව, කොළඹ වරාය නගරය තුළ ආයෝජන මූල්‍යනය කිරීම සඳහා ආමුඛ ප්‍රේෂණ වශයෙන් විදේශවලින් ලැබෙන අරමුදල්වලින් කොළඹ වරාය නගරය තුළ ආයෝජන සිදු කිරීමට, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ඕනෑම පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන් විසින් පූර්ණ හිමිකාරීත්වය දරන ශ්‍රී ලංකාවේ සංස්ථාපිත ඕනෑම සමාගමක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද/සංස්ථාපිත බද්ධ ව්‍යාපාරයක් (එනම්, ආයෝජකයා) සඳහා අවසර ප්‍රදානය කරමින්, අංක 2282/59 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති පරිදි, 2022 අංක 01 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජනය කිරීම) නියෝග නිකුත් කරන ලදී.

2022 ජූනි 08 - දේශීය විදේශ විනිමය වෙළඳපොළේ අරමුදල් තත්ත්වය ඉහළ නැංවීම සහ බැංකුවල මූල්‍ය විනය වැඩිදියුණු කිරීම අපේක්ෂාවෙන්, වෙළඳපොළ බලවේගවලට හුවමාරු ගිවිසුම් මිල තීරණය කිරීමට ඉඩ ලබාදීම සඳහා එ.ජ.ඩො./ශ්‍රී.ලං.රු. හුවමාරු ගිවිසුම් ගනුදෙනු සඳහා අදාළ වූ එ.ජ. ඩොලර් පොලී අනුපාතිකයේ සීමාව ඉවත් කිරීම.

2022 ජූනි 15 - 2020 අංක 11 දරන විධානයෙහි දක්වා ඇති කොන්දේසිවලට අමතරව, විදේශ මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම පිළිබඳ පහත සඳහන් අමතර කොන්දේසි ඇතුළත් කරමින් 2022 අංක 05 දරන විධානය පරිසීමිත වෙළෙන්දන් වෙත නිකුත් කරන ලදි.

- මුදල් හුවමාරුකරුවන් විසින් විදේශ මුදල් තැන්පත් කිරීම සඳහා ගිණුම් පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දන් ලබාදෙන විනිමය අනුපාතවලට වඩා වැඩි විනිමය අනුපාතයන් තම ගනුදෙනුකරුවන්ට ලබා නොදිය යුතු ය.
- විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂකගේ ඉල්ලීම මත අවම වශයෙන් දින 30ක කාලයක CCTV පටිගත කිරීම් ලබාදීමට හැකිවන පරිදි CCTV පද්ධතිය බාධාවකින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුය.

2022 ජූනි 16 - හෝටල් සේවා සැපයුම්කරුවන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන් හට සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් වන ගෙවීම් විදේශ විනිමයෙන් පමණක් භාර ගනු ලැබිය යුතු බව නියෝග කරමින් අංක 2263/41 දරන අති විශෙෂ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "2022 අංක 1 දරන හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී

ලංකාව ඇතුළත විදේශ විනිමය භාර ගැනීමේ රීති" අංක 2284/40 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් අවලංගු කරන ලදී.

- පහත දැක්වෙන දෑ ක්‍රියාත්මක කිරීම සඳහා, අංක 2284/34 අති විශෙෂ ගැසට් නිවේදනය මගින් විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ වන නියමයට සංශෝධනයක් ප්‍රකාශයට පත් කරන ලදී.

  - ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික පුද්ගලයෙකු විසින් තම සන්තකයේ තබා ගත හැකි විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය එ.ජ. ඩොලර් 15,000 සිට එ.ජ. ඩොලර් ඩොලර් 10,000 හෝ ඊට සමාන වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයක් දක්වා අඩු කිරීම; සහ
  - විදේශ විනිමය අතැති ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික පුද්ගලයන් සඳහා එම මුදල් සුදුසු පරිදි පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුමකට හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීමට හෝ බලයලත් වෙළෙන්දකු හට විකිණීමට මෙම නියමය බලාත්මක වන දින සිට වැඩ කරන දින 14ක පොදු සමා කාලයක් ප්‍රදානය කිරීම.

2022 ජූනි 28 - විධානවල නියම කරන ලද කොන්දේසිවලට යටත්ව, කොළඹ වරාය නගරය තුළ ආයෝජන සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා, සුදුසුකම් ලත් පුද්ගලයන් වෙනුවෙන් "කොළඹ වරාය නගර ආයෝජන ගිණුම - ආයෝජකයා" ගිණුම විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන්ට අවසර දෙමින් 2022 අංක 06 දරන විධාන නිකුත් කරන ලදී.

- කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ බලයලත් පුද්ගලයන් සඳහා "කොළඹ වරාය නගර ආයෝජන ගිණුම - ආයෝජිතයා" ගිණුම විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන්ට අවසර දෙමින් 2022 අංක 07 දරන විධාන නිකුත් කරන ලදී.

2022 ජූනි 30 - නියමයෙහි දින සිට මාස හයක කාලයක් සඳහා, තෝරාගත් ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් වන ප්‍රතිමුඛ ප්‍රේෂණ අවලංගු/සීමා කිරීමට 2022 ජූනි 30 දිනැති අංක 2286/27 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති පරිදි 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නියමයක් නිකුත් කරන ලදී.

- කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවලට අනුකූලව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරවල නිරත වීමට අවසරලත් බලයලත් පුද්ගලයෙකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින්, ගිණුම් හිමියෙකු විදේශ විනිමයෙන් ලද ඉපැයීම්/ගෙවීම් 2021 අංක 04 දරන විධාන ප්‍රකාරව විවෘත කර පවත්වාගෙන යනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට බැර කිරීම සඳහා අවසර ලබා දීමට 2022 අංක 08 දරන විධාන නිකුත් කරන ලදී.

- කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවලට අනුකූලව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාරවල නිරත වීමට අවසරලත් බලයලත් පුද්ගලයෙකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින්, ගිණුම් හිමියෙකු විදේශ විනිමයෙන් ලද ඉපැයීම්/ගෙවීම් 2021 අංක 05 දරන විධාන ප්‍රකාරව විවෘත කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට බැර කිරීම සඳහා අවසර ලබා දීමට 2022 අංක 09 දරන විධාන නිකුත් කරන ලදී.

2022 ජූලි 05 - ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් තම සන්තකයේ ඇති විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු සුදුසු පරිදි පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට තැන්පත් කිරීමට හෝ බලයලත් වෙළෙන්දකු හට විකිණීම සඳහා, අංක 2284/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට

පත් කරන ලද විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ නියම කර තිබූ පොදු සමා කාලය ඉකුත් වීම මත අංක 2287/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් එකී පොදු සමා කාලය වැඩ කරන දින 14ක් දක්වා දීර්ඝ කරමින් විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ නව නියමයක් නිකුත් කරන ලදී.

2022 අගෝස්තු 12 - 2022 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීතිවල දක්වා ඇති පරිදි අපනයන ලැබීම් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තන අවශ්‍යතාවයෙන් සේවා අපනයනකරුවන් ඉවත් කරමින් මුදල් නීති පනත යටතේ අංක 2292/50 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 02 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති නිකුත් කරන ලදී.

2022 අගෝස්තු 15 - විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු තමා සන්තකයේ තබා ගෙන සිටින ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික පුද්ගලයන් හට එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු අදාළ පරිදි පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට තැන්පත් කිරීමට හෝ බලයලත් වෙළෙන්දකු හට විකිණීම සඳහා වූ පොදු සමා කාලය එක් මසකින් දීර්ඝ කරමින් විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ අංක 2284/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමය එහි සඳහන් කාලය ඉකුත් වීමත් සමඟ අංක 2293/07 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් නව නියමයක් ලෙස නිකුත් කරන ලදී.

2022 අගෝස්තු 25 - 2022 අගෝස්තු 12 දිනැති අංක 2292/50 දරන අති විශෙෂ ගැසට් පත්‍රයට අනුව, පරිවර්තනය කරන ලද සේවා අපනයන ආදායම්වලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අනිවාර්යයෙන්ම විදේශ විනිමය විකිණිය යුතු වන අවශ්‍යතාවය බලපැවැත්වීම සඳහා, 2022 අගෝස්තු 12 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද සේවා අපනයන ලැබීම්/ ආදායම්වලින් 25% ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකුණන ලෙස සියලුම බැංකු වලට උපදෙස් ලබා දෙන ලදී.

2022 අගෝස්තු 26 - විදේශ විනිමය පනතේ කාර්යය සඳහා "ඉන්දියානු රුපියල් (INR)" නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයක් ලෙස නිර්ණය කරමින් බලයලත් වෙළෙඳුන් වෙත 2022 අංක 10 දරන විධානය නිකුත් කරන ලදී.

2022 අගෝස්තු 31 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් බැංකු පද්ධතිය හරහා විදේශ විනිමය මෙරටට ප්‍රේෂණය කරන එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට අවසර ලබා දීම සඳහා වන අංක 02/2022 චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2022 සැප්තැම්බර් 08 - තැන්පතු තැබීමේ ආරම්භක දිනයේ සිට මාස තිස් හයක උපරිම කාලයක් සඳහා, දැනටමත් විවෘත කර ඇති විශේෂ තැන්පතු ගිණුම් නැවත ආයෝජනය කිරීම සඳහා අවසර ප්‍රදානය කරමින්, විදේශ විනිමය පනත යටතේ අංක 2296/12 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් නියෝග නිකුත් කරන ලදී.

2022 සැප්තැම්බර් 09 - විදේශ රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 02/2022 දරන චක්‍රලේඛයේ, සමහර කොන්දේසි පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.

- ආනයනය කරනු ලබන වාහනයේ පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන වටිනාකමෙහි (CIF Value) උපරිම සීමාව ඉවත් කිරීම.

- සංක්‍රමණික සේවකයින්ට වාහනයේ පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන වටිනාකමෙන් (CIF Value) 10% ට සමාන හුවමාරු බද්දක් ගෙවා වසර දෙකක (02) කාල සීමාව අවසන් වීමට පෙර වාහනය තෙවන පාර්ශවයකට පැවරීමට ඉඩ ලබා දීම.

2022 සැප්තැම්බර් 16 - ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වාහන නිෂ්පාදකයාගේ බලයලත් නියෝජිතවරයෙකුට / බලයලත් බෙදාහරින්නෙකුට වෙනස් මාදිලි තුනකින් (3කින්) යුත් නවීනතම පූර්ණ විද්‍යුත් වාහන තුනක් ආනයනය කිරීමට අවසර ලබා දෙමින්, විදේශ රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 02/2022 දරන චක්‍රලේඛය සංශෝධනය කරන ලදී.

## ආනයන සහ අපනයන පාලන රෙගුලාසි

2022 ජනවාරි 12 - 2022 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2262/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරමින්,

- බාස්මතී සහල් ආනයන මත පනවා තිබූ තාවකාලික අත්හිටුවීම ඉවත් කරන ලදී.
- කටු ගැල වූ මසුන් ආනයන මත පනවා තිබූ ආනයන සීමා නව සංයෝජිත වර්ගීකරණ (HS) කේත යටතේ අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

2022 මාර්තු 09 - ආනයන පාලන බලපත්‍රයක් මත ආනයන කළ යුතු භාණ්ඩ ලැයිස්තුවක් දක්වමින්, 2022 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2270/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2022 අප්‍රේල් 09 - ආනයන පාලන බලපත්‍රයක් මත ආනයන කළ යුතු භාණ්ඩ ලැයිස්තුවක් දක්වමින්, 2022 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2274/42 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2022 මැයි 06 - 2012 වසරේ ජනවාරි 02 දිනැති අංක 1739/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත, 2011 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම රෙගුලාසි සංශෝධනය කරමින්, ඇතැම් භාණ්ඩ සඳහා විවෘත ගිණුම් ක්‍රමය සහ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම මත යන ගෙවීම් ක්‍රම යටතේ ආනයන කිරීම මත සීමා කිරීම් පනවමින්, 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (අංක 2278/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2022 මැයි 31 - අංක 2270/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත, 2022 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සහ අංක 2274/42 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත, 2022 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් පනවන ලද බලපත්‍රයක අවශ්‍යතාවය ඉවත් කරමින්, 2022 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2282/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

- අංක 2278/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත, 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි බලාත්මක වන දිනය දීර්ඝ කරමින්, 2022 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2282/22 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2022 ජූනි 24 - 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (අංක 2278/21 අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) මගින් නිකුත් කරන ලද සීමා කිරීම් ලිහිල් කිරීම සහ කරවල, කිරිපිටි, අර්තාපල්, ළූණු, මෑ වර්ගයේ ඇට, මයිසූර් පරිප්පු, මිරිස්, සහල්, තිරිඟු පිටි සහ සීනි සඳහා විවෘත ගිණුම් ක්‍රමය සහ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීම් පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙමින්, 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (අංක 2285/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2022 අගෝස්තු 05 - ග්ලයිෆොසේට් ආනයනය කිරීම "තහනම්" කාණ්ඩයෙන් ඉවත් කර, "ආනයන පාලන බලපත්‍ර" අවශ්‍යතාවය යටතට ගෙන යමින්, 2022 අංක 11 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2291/44 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2022 අගෝස්තු 23 - 2022 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2294/29 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරමින්,

- විදුලි මෝටර් සහිත යතුරු පැදි සහ පාපැදි ආනයනය කිරීම් "තාවකාලිකව අත්හිටුවීමේ" කාණ්ඩය යටතේ සිට "ආනයන පාලන බලපත්‍ර" කාණ්ඩයට ගෙන යන ලදී.
- සකේ, සෝවු සහ උමේෂු හැර පැස වූ පාන වර්ග සහ ප්ලාස්ටික් කූඩ සහ ප්ලාස්ටික් පැලට් හැර බඩු ගෙන යාම හෝ ඇසිරීම සඳහා වූ ප්ලාස්ටික්වලින් නිම කළ භාණ්ඩ ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී.
- විවෘත ගිණුම් ක්‍රමය සහ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනයට අවසර දුන් සීනි වර්ග සංශෝධනය කරන ලදී.

- තාවකාලිකව අත්හිටුවීම් යටතේ වන ආනයන ලැයිස්තුව සංශෝධනය කරමින්, 2022 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2294/30 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2022 සැප්තැම්බර් 09 - 2022 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2296/30 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරමින්,

- තෝරාගත් භාණ්ඩ වර්ග ආනයනය තාවකාලිකව අත්හිටුවීම හෝ ආනයන පාලන බලපත්‍රයක් පැනවීම සිදු කරන ලදී.
- ඇතැම් භාණ්ඩ වර්ග ආනයනය කිරීම මත වූ තාවකාලික අත්හිටුවීම ඉවත් කරන ලද අතර අදාළ බලධාරීන්ගේ අනුමැතියට යටත්ව ආනයන නිදහස් කිරීම් සඳහා අදාළ කොන්දේසි හඳුන්වා දෙන ලදී.

2022 සැප්තැම්බර් 16 - 2022 අංක 15 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (අංක 2297/79 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරමින්,

- 2022 වසරේ ඔක්තෝබර් මස 31 දින දක්වා විවෘත ගිණුම් සහ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ කිරිපිටි හා මයිසූර් පරිප්පු (රතු පරිප්පු - සම්පූර්ණ) සහ ලියාපදිංචි කුකුළු ආහාර නිෂ්පාදකයන්ට බඩඉරිඟු හා සෝයා බෝංචි ආහාර ආනයනය කිරීම සඳහා ඉඩ ලබා දෙන ලදී.
- 2022 වසරේ සැප්තැම්බර් මස 30 දින දක්වා විවෘත ගිණුම් සහ භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම යන ගෙවීම් ක්‍රම යටතේ තෝරාගත් ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමට ඉඩ ලබා දෙන ලදී.

2022 සැප්තැම්බර් 23 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ 2022 අගෝස්තු 31 දිනැති චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව "වාහන ආනයන බලපත්‍රයක්" ලබා ගෙන ඇති ඕනෑම සුදුසුකම් ලත් පුද්ගලයන්/ආයතන හට විද්‍යුත් මෝටර් වාහන ආනයනය කිරීමට ඉඩ ලබා දෙමින්, 2022 අංක 16 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2298/55 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. මෙම රෙගුලාසි 2023 වසරේ දෙසැම්බර් මස 31 දින දක්වා පමණක් වලංගු වේ.

2022 ඔක්තෝබර් 05 - කෘෂිකාර්මික බීජ, කෘෂි රසායන සහ රසායනික පොහොර ආනයනය කිරීමට ශ්‍රී ලංකා රුපියල් ගිණුමකින් කරන අත්තිකාරම් ගෙවීමේ සීමාව එ.ජ. ඩොලර් 250,000 හෝ ඊට සමාන වෙනත් යම් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදලක් දක්වා ඉහළ දමමින්, 2022 අංක 17 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (අංක 2300/12 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

## රාජ්‍ය ණය කළමනාකරණය

2022 පෙබරවාරි 01 - ඍජු නිකුතු කවුළුව හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා ආයෝජන රැගෙන එනු ලබන, ආයෝජන සැකසුම්කරුවන් ද ඇතුළු පත් කළ නියෝජිතයන් සඳහා දිරි දීමනාවක් ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා එ.ජ. ඩොලර්වලින් කරන ලද ආයෝජන ප්‍රමාණය පදනම් අංක 50කින් (0.5%) ගුණ කර, එම අගය පියවීමේ දිනයෙහි එ.ජ.ඩොලර් සඳහා පවතින විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට හැරවීමෙන් පසු ලැබෙන මුදල, දිරිදීමනාවක් වශයෙන් ගෙවනු ලබයි. එම දිරිදීමනාව, පත්කළ නියෝජිතයන් මාර්ගයෙන්, අදාළ ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද බැංකු ගිණුම්වලට මුදා හරිනු ලබයි.

2022 අප්‍රේල් 12 - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් සහාය දක්වනු ලබන ආර්ථික ගැළපුම් වැඩසටහනට අනුකූල වන පරිදි, විධිමත්ව හා එකඟතාවයෙන් යුක්තව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේක්ෂාවෙන් මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ අන්තර්වාර ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කරන ලදී. එහිදී, ප්‍රතිපත්ති ප්‍රකාශයේ දක්වා ඇති පරිදි, බලපෑමට ලක් වූ සියලුම කාණ්ඩයන්ට අයත් ණය සඳහා සාමාන්‍ය ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීම රජයේ ප්‍රතිපත්තිය වනු ඇත.

2022 අප්‍රේල් 29 - 2022 අප්‍රේල් 12 දින ප්‍රකාශයට පත් කළ පරිදි, ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ අන්තර්වාර ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDBs) 'බලපෑමට ලක් වූ ණයවලින්' බැහැර කොට ඇත. කෙසේ වෙතත්, ද්‍රවශීල විදේශ ව්‍යවහාර සම්පත්වල පවත්නා සීමා මත පදනම්ව ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ගෙවීම් සඳහා විකල්ප යාන්ත්‍රණයක් හඳුන්වාදෙන ලදී.

1. මුදල් ප්‍රතිපත්ති සීමාවන්ට යටත්ව ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් සිදුකිරීම (ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් කරන දිනය මහා භාණ්ඩාගාරයේ අරමුදල් පවතින ප්‍රමාණය මත පදනම් වනු ඇත).

   ආරම්භයේ දී, ඉතා අඩු වටිනාකමක් සහිත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කල්පිරීම් හා පොලී ගෙවීම් එ.ජ. ඩොලර් මගින් සිදු කළ අතර පසුව එය අත්හිටුවන ලදී.

2. මූලික නිකුතුවේ එක් එක් ලන්සු සඳහා අදාළ වන පොලී අනුපාතික වැනි මූලික නියමයන් සහ කොන්දේසි සහිතව, අදාළ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත වූ ආයෝජන (පොලී ගෙවීම් ද ඇතුළුව) නියමිත ගෙවීම් දිනයේ සිට අවම වශයෙන් මාස හයක කාලයක් දක්වා කල් පිරිම දීර්ඝ කිරීම.

3. ආසන්නතම ප්‍රාථමික වෙළෙඳපොළ නිකුතුවේ දී වෙන්දේසි කරන ලද රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර) එම වෙන්දේසියේ දී තීරණය කරන ලද බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය යටතේ සැපයීම. තවද, ආසන්නතම ප්‍රාථමික වෙළෙඳපොළ නිකුතුවේ දී වෙන්දේසි කරන ලද පරිණතීන්ගෙන් පරිබාහිර විවිධ පරිණත කාලයන් ඉල්ලා ඇති අවස්ථාවක දී ඉතිරි පරිණත කාලය සඳහා බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය අන්තර් නිවේශනය හෝ බහිර් නිවේශනය වශයෙන් (interpolated or extrapolated) ගණනය කරනු ලැබේ.

   රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම තුළින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පියවීමේ යෝජිත වැඩපිළිවෙළ සඳහා මේ වන විට භාණ්ඩාගාර බැඳුම්කර පමණක් භාවිත කරනු ලැබේ.

2022 ජූනි 07 - භාණ්ඩාගාර බිල්පත් සඳහා පවතින මූල්‍ය සීමාව රු. බිලියන 3,000 සිට රු. බිලියන 4,000 දක්වා ඉහළ නැංවීමට කරන ලද යෝජනාව සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමැතිය ලබා දෙන ලදී (පාර්ලිමේන්තු අංක 36 දරන න්‍යාය පත්‍රය).

2022 ජූනි 22 - භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියකට පසුව, භාණ්ඩාගාර බිල්පත් සඳහා තවදුරටත් ලංසු ඉදිරිපත් කිරීමට දෙවන අදියරක්, අදාළ වෙන්දේසියේ ගෙවීම් කළ යුතු දිනට පෙර ව්‍යාපාරික දිනයේ ප.ව. 3.30 දක්වා විවෘත කරන ලදී. භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දී

ඇතිවන හිඟය සහ වෙන්දේසියේ දී පිරිනමන ලද සමස්ත මුදලින් 25%ක් අදියර II සඳහා පිරිනමන උපරිම මුදල වේ. භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දී එක් එක් පරිණතයන් සඳහා තීරණය වන බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයන්ට යටත්ව මෙම නිකුතුව සිදු වේ. ඉදිරිපත් කරන ලද ප්‍රමාණය අභිබවා ලංසු ලැබුණහොත්, වෙන්දේසියට සහභාගී වූ පාර්ශ්වයන්ගේ සමස්ත සාර්ථකත්වයට සමානුපාතිකව වෙන් කිරීම් සිදු කෙරෙනු ඇත.

## මිල සංශෝධන

**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අයිතම කිහිපයක් සඳහා පනවන ලද උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී.**

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2022.01.28 | දේශීයව ඇසුරුම් කළ/බෝතල් කළ පානීය ජලය | උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී (අංක 2264/68 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.02.28 | පැරසිටමෝල් පෙති/කරල් (මිලි ග්‍රෑම් 500) | පෙත්තක/කරලක උපරිම සිල්ලර මිල රුපියල් 1.71 සිට රුපියල් 2.30 දක්වා ඉහළ නංවන ලදී (අංක 2269/11 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2022.03.15 | පැරසිටමෝල් පෙති/කරල් (මි.ග්‍රෑ.500) ඇතුළුව තෝරා ගත් ඖෂධ | උපරිම සිල්ලර මිල ගණන් ඉහළ නංවන ලදී (අංක 2271/23 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.03.28 | අක්ෂි කාච/ඩිලිවරි සිස්ටම් සමග අක්ෂි කාච, ලෝහමය වටනේය, ඖෂධ මුදා හරින වටනේය, රුධිර ග්ලුකෝස් මාපක, පල්ස් ඔක්සිමීටරය ඇතුළු තෝරාගත් වෛද්‍ය උපකරණ. | උපරිම සිල්ලර මිල ගණන් ඉහළ නංවන ලදී (අංක 2273/04 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.04.29 | පෙති/කරල්, එන්නත් සහ ආශ්වාසය සඳහා යොදා ගන්නා ඖෂධ ඇතුළුව තෝරා ගත් ඖෂධ | උපරිම සිල්ලර මිල ගණන් ඉහළ නංවන ලදී (අංක 2277/55 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.05.02 | සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය (මොට්ටෙයිකරුප්පන් සහ අට්ටික්කාරි හැර) | කිලෝග්‍රෑමයකට රු. 220ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී (අංක 2278/02 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද - දේශීය (සුදුරු සම්බා හැර) | කිලෝග්‍රෑමයකට රු. 230ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී (අංක 2278/02 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | කීරි සම්බා (දේශීය) | කිලෝග්‍රෑමයකට රු. 260ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී (අංක 2278/02 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.06.10 | සුදු/රතු කැකුලු සහල් (දේශීය) | කිලෝග්‍රෑමයකට රු. 210ක උපරිම මිලක් පනවන ලදී (අංක 2283/43 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.08.19 | බිත්තර (සුදු) | බිත්තරයකට රු. 43ක උපරිම මිලක් පනවන ලදී (අංක 2293/69 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | බිත්තර (දුඹුරු/රතු) | බිත්තරයකට රු. 45ක උපරිම මිලක් පනවන ලදී (අංක 2293/69 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.09.01 | අක්ෂි කාච/ඩිලිවරි සිස්ටම් සමග අක්ෂි කාච, ලෝහමය වටනේය, ඖෂධ මුදා හරින වටනේය, රුධිර ග්ලුකෝස් මාපක, පල්ස් ඔක්සිමීටරය ඇතුළු තෝරා ගත් වෛද්‍ය උපකරණ | උපරිම සිල්ලර මිල ගණන් ඉහළ නංවන ලදී (අංක 2295/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |

# බදු සංශෝධන

## ආදායම් බදු

2022 ඔක්තෝබර් 11 - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත ගැසට් කරන ලදී. පනත් කෙටුම්පතෙහි ප්‍රධාන සංශෝධන පහත පරිදි දැක්විය හැකිය.

- පුද්ගල ආදායම් බදු සඳහා වන බදු නිදහස් සීමාව රුපියල් මිලියන 3.0 සිට රුපියල් 1.2ක් දක්වා සංශෝධනය කිරීම,
- පුද්ගල ආදායම් බදු සඳහා වන බදු අනුපාතික 6% - 18% පරාසයේ සිට 6% - 36% පරාසය දක්වා සංශෝධනය කිරීම,
- පුද්ගල ආදායම් බදු සඳහා වන බදු කාණ්ඩ රුපියල් මිලියන 3.0 සිට රුපියල් මිලියන 0.5ක් දක්වා අඩු කිරීම,
- පුද්ගල ආදායම් බදු සඳහා අදාළ වන බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේ දී වියදම් සඳහා වන රුපියල් මිලියන 1.2ක බදු සහනය ඉවත් කිරීම,
- සේවකයාගේ කැමැත්ත නොතකා අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කිරීම සේවා යෝජකයාට අනිවාර්ය කිරීම,
- සම්මත සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය 24% සිට 30% දක්වා වැඩි කිරීම.
- සංස්ථාපිත ආදායම් බදුවලට අදාළ සියලුම සහනදායී බදු අනුපාතික ඉවත් කිරීම.

## එකතු කළ අගය මත බදු

2022 මාර්තු 31 - 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මූල්‍ය ආයතනයන් විසින් සපයන මූල්‍ය සේවාවන් මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය 15% සිට 18% දක්වා ඉහළ නැංවීම සහ සමහර භාණ්ඩ හා සේවා එකතු කළ අගය මත බදුවලින් නිදහස් කිරීම සඳහා 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කරන ලදී.

2022 මැයි 31 - භාණ්ඩ හා සේවා සැපයුම මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය 8% සිට 12% දක්වා වැඩි කරන ලදී (අංක 2282/26 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 අගෝස්තු 31 - 2022 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, භාණ්ඩ හා සේවා සැපයුම මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය 12% සිට 15% දක්වා වැඩි කරන ලදී (අංක 2295/08 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 සැප්තැම්බර් 27 - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගැසට් කරන ලදී.

- භාණ්ඩ හා සේවා සැපයුම හෝ භාණ්ඩ ආනයනය මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය වැඩි කිරීම නීතිමය වශයෙන් බලාත්මක කිරීම සඳහා:
  - 2022 ජූනි 01 දින සිට 2022 අගෝස්තු 31 වන දින දක්වා කාලය සඳහා බලපැවැත්වෙන පරිදි 8% සිට 12% දක්වා වැඩි කිරීම.
  - 2022 සැප්තැම්බර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි 12% සිට 15% දක්වා වැඩි කිරීම.
- එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව 2022 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි වාර්ෂිකව රුපියල් මිලියන 300 සිට වාර්ෂිකව රුපියල් මිලියන 80 දක්වා අඩු කිරීම.

- සභාධිපත්‍ය මහල් නිවාස සඳහා වන එකතු කළ අගය මත බදු සහනය 2022 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කිරීම.

2022 ඔක්තෝබර් 06 - සනීපාරක්ෂක තුවා සහ ටැම්පොන් ආනයනය සහ/හෝ සැපයුම මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය 2022 ඔක්තෝබර් 07 දින සිට බලපැවැත්වෙන පරිදි 0% දක්වා අඩු කරන ලදී (අංක 2300/25 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

## නිෂ්පාදන/සුරා බදු

2022 ජනවාරි 01 - තරු 3 සහ තරු 4 හෝටල්, තරු 5 සහ ඊට ඉහළ ගණයේ තරු හෝටල්/බුටික් හෝටල් වැනි සමහර හෝටල්, 2022 මාර්තු 31 දින දක්වා මද්‍යසාර භාවිත කිරීම සඳහා අදාළ වන ගාස්තුවෙන් නිදහස් කරන ලදී (අංක 2260/78 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

- සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ සහ සංචාරක මණ්ඩල අනුමැතිය රහිත කාමර 5 හෝ ඊට වැඩි හෝටල් බලපත්‍රය (ර.බී.7), හෝටල් පීඨිකා බලපත්‍රය (ර.බී.8), භෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලයේ අනුමැතිය සහිත/අනුමැතිය රහිත) (ර.බී.11), තානායම් බලපත්‍රය (ර.බී.12) සහ ස්ථානීය පරිභෝජනය (ර.බී.22බී) (සංචාරක මණ්ඩලය විසින් අනුමැතිය සහිත/අනුමැතිය රහිත), 2022 මාර්තු 31 වන දින දක්වා වාර්ෂික මද්‍යසාර බලපත්‍ර ගාස්තුවලින් නිදහස් කරන ලදී (අංක 2260/79 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 අප්‍රේල් 29 - ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලාභී යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් සඳහා වන සුරා බද්ද රුපියල් 25 සිට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. එසේ වුවද, බෝතල් කරන ලද රා අපනයනය කරනු ලබන කවර ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද එකී බද්ද අය නොකළ යුතුය (අංක 2277/62 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

## ආනයන තීරු බදු

2022 මාර්තු 09 - තෝරාගත් ආහාර ද්‍රව්‍ය මත වන ආනයන තීරු බදු වැඩි කරන ලදී (අංක 2270/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 මැයි 31 - 2022 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, 25%, 50%, 75%, 100% සහ 200% යන අනුපාත යටතේ මාස හයක කාලයක් සඳහා තෝරාගත් භාණ්ඩ ආනයනය මත අධිභාරයක් පනවන ලදී (අති විශෙෂ ගැසට් නිවේදනය අංක 2282/25).

## සෙස් බද්ද

2022 ජනවාරි 11 - සහල්, ධීවර නිෂ්පාදන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව හුවමාරු කිරීමට යොදා ගන්නා උපාංගවලට අදාළ නව සංයෝජිත වර්ගීකරණ කේත හා අනුරූපීව, පවතින සෙස් බද්ද දීර්ඝ කරන ලදී (අංක 2262/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 මාර්තු 10 - රෙදිපිළි සහ ඇඟලුම් සඳහා සෙස් බදු අනුපාත වැඩි කරන ලදී (අංක 2270/59 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 අගෝස්තු 09 - සහනදායි පියවර වශයෙන් ලබාදීමට හෝ අත්‍යාවශ්‍ය මහජන සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපාරික ආයතන, ස්වෙච්ඡා සංවිධාන හා හිතෛෂීන් ද ඇතුළුව යම් විදේශ රාජ්‍යයන් (රජයන්), සංවිධාන වෙතින් යම් රාජ්‍ය ආයතනවලට, රජය මගින් අනුමත ආයතනවලට හා යම් රාජ්‍ය ආයතන සමඟ ඍජු සහයෝගීතාවයෙන් සහන ක්‍රියාකාරකම්වල නියුක්ත ආයතනවලට ආධාර/ පරිත්‍යාග වශයෙන් ලැබීමට නියමිත අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය, එක් එක් අවස්ථාව මත පදනම්ව, පරිත්‍යාග සහ සහන පියවර සමඟ සම්බන්ධිත රාජ්‍ය ආයතනය හෝ රජය විසින් අනුමත

ආයතනය හෝ සෘජුව සම්බන්ධීකරණ කටයුතු කරන රජයේ ආයතන භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ (ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා) නිර්දේශය අනුව, සෙස් බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2292/32 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

## විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2022.01.11 | සහල් සහ සීනි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2262/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2022.03.03 | බඩඉරිඟු | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 10 දක්වා අඩු කරන ලදී (අංක 2269/48 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | | 'ත්‍රිපෝෂ' නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය විසින් බඩඉරිඟු ආනයනය කිරීමේ දී, බඩඉරිඟු ආනයනය කිරීම සඳහා අදාළ වන කිලෝග්‍රෑමයකට රුපියල් 10 වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයකට රුපියල් 01 අය කරගෙන, ඉතිරි වටිනාකම, අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2269/48 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | ඉදල් ඉරිඟු (අනෙකුත්) | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට රුපියල් 10 විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී (අංක 2269/48 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| | මැකරල්, උඳු, කව්පි, කුරක්කන් සහ මෙනේරි | වර්ෂයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වෙළඳ භාණ්ඩ බද්දක් පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2269/56 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2022.03.09 | යෝගට්, බටර්, කිරිවලින් නිපදවූ තැවරුම්, පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද චීස්, රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත්), මිදි (අලුත් සහ වියළි) සහ ඇපල් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ නංවන ලදී (අංක 2270/19 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |
| 2022.03.28 | රටඉඳි (අලුත් හා වියළි) | රටඉඳි ආනයනය සඳහා කිලෝග්‍රෑමයකට රු. 200 වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයකට රුපියල් 1 අයකරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස පහක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2273/01 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2022.04.13 | මසුන් (අලුත්, ශීත කළ හෝ හිමායිත), උම්බලකඩ, මුං ඇට (මුං), රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ හා පියළි කළ), මැංගුස්ටීන්, සහ කිවි ෆෘට් | 2022 අප්‍රේල් 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී (අංක 2275/02 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.05.18 | රතු ළූණු, සුදු ළූණු, මෑ වර්ගයේ ඇට (සම්පූර්ණ හා පියළි කළ), කඩල (සම්පූර්ණ හා පියළි කළ) දොඩම් (වියළි), ලෙමන් (අළුත් හා වියළි), ක්වීන්සස්, මිරිස් (වියළි, කුඩු නොකළ හා නොඇඹරූ), මිරිස් (කුඩු කළ හෝ ඇඹුරූ), සූදුරූ බීජ (කුඩු නොකළ හා නොඇඹරූ), සූදුරූ බීජ (කුඩු කළ හෝ ඇඹුරූ), මහදුරූ බීජ, රටකජු (පොතු හරින ලද), මාජරින්, ටින් කළ මාළු, සහ මුහුණු ආවරණ | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී (අංක 2280/31 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.05.31 | යෝගට්, වෙඬරු, කිරිවලින් නිපදවූ තැවරුම්, සියලුම වර්ගවල පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු, රට ඉඳි (අලුත් හා වියළි), දොඩම් (අලුත්), මිදි (අලුත් හා වියළි) සහ ඇපල් | 2022 ජූනි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා ඉහළ නංවන ලදී (අංක 2282/23 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.06.15 | අර්තාපල්, බොම්බයි ළූණු, ක්ලෙමන්ටයින් (අළුත් සහ වියළි), පොමෙලෝස් ඇතුළුව මහසිදරන් (අලුත් සහ වියළි), පෙයාර්ස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරිස් (ප්‍රූනුස් සෙරාසස්), චෙරිස් (අනෙකුත්), නෙක්ටාරින්ස් ඇතුළු පීච්, ප්ලම්ස් සහ ස්ලෝස්, කොත්තමල්ලි බීජ (කුඩු නොකළ හා නොඇඹරූ සහ කුඩුකළ හා ඇඹරූ), කහ (කුඩු නොකළ හා නොඇඹරූ සහ අනෙකුත්), සහල්, උඳු පිටි, එළවළු තෙල්, සහ සීනි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී (අංක 2284/03 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.08.09 | සහනදායි පියවර වශයෙන් ලබා දීමට හෝ අත්‍යවශ්‍ය මහජන සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපාරික ආයතන, ස්වෙච්ඡා සංවිධාන හා හිතෛෂීන් ද ඇතුළුව යම් විදේශ රාජ්‍යයන් (රජයන්), සංවිධාන වෙතින් යම් රාජ්‍ය ආයතනවලට, රජය මගින් අනුමත ආයතනවලට හා යම් රාජ්‍ය ආයතන සමග සෘජු සහයෝගීතාවයෙන් සහන ක්‍රියාකාරකම්වල නියුක්ත ආයතනවලට ආධාර/පරිත්‍යාග වශයෙන් ලැබීමට නියමිත අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය | 2022 අගෝස්තු 10 වැනි දිනෙන් ආරම්භ වන වසරක කාලයක් සඳහා, එක් එක් අවස්ථාව මත පදනම්ව, පරිත්‍යාග සහ සහන පියවර සමග සම්බන්ධිත රාජ්‍ය ආයතනය හෝ රජය විසින් අනුමත ආයතනය හෝ සෘජුව සම්බන්ධීකරණ කටයුතු කරන රජයේ ආයතන භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ (ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා) නිර්දේශය අනුව, අදාළ වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අත්හරිනු ලැබිණි (අංක 2292/29 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.08.10 | හාල්මැස්සන්, කරවල, උළුහාල් ඇට, කුරක්කන් පිටි, අබ ඇට සහ ලුණු | 2022 අගෝස්තු 12 වැනි දිනෙන් ආරම්භ වන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී (අංක 2292/41 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | ලුණු | ඖෂධ නිෂ්පාදනය, සැපයීම සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි, වාණිජ පරමාර්ථයෙන් තොරව ඖෂධ නිෂ්පාදනය කරන ඕනෑම ඖෂධ නිෂ්පාදන ආයතනයක් විසින් ලුණු ආනයනය කිරීමේ දී, ලුණු ආනයනය සඳහා අදාළ වන කිලෝග්‍රෑමයකට රු. 40 වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයකට රු. 10 අයකරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි, 2022 අගෝස්තු 12 වැනි දිනෙන් ආරම්භ වන වසරක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2292/41 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) |

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2022.09.03 | බඩඉරිඟු (අනෙකුත්) සහ ඉදල් ඉරිඟු (අනෙකුත්) | 2022 දෙසැම්බර් 31 වන දින දක්වා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2295/44 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | බඩඉරිඟු | 'ත්‍රිපෝෂ' නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය විසින් බඩඉරිඟු ආනයන කිරීමේ දී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 10 වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 1 අය කරගෙන, ඉතිරි වටිනාකම, අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2295/44 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.09.22 | බොම්බායි ළූණු | 2022 සැප්තැම්බර් 23 දින සිට මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා ඉහළ නංවන ලදී (අංක 2298/51 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | ලූණු | සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි, වාණිජ පරමාර්ථයෙන් තොරව ඖෂධ නිෂ්පාදනය කරන ඕනෑම ඖෂධ නිෂ්පාදන ආයතනයක් විසින් ලූණු ආනයනය කිරීමේ දී, ලූණු ආනයනය සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 40 වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝග්‍රෑමයට රුපියල් 10 අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි 2022 සැප්තැම්බර් 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2023 අගෝස්තු 11 වන දින දක්වා වන කාලය සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2298/51 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2022.10.13 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) | වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, කිලෝග්‍රෑමයට 10% හෝ රුපියල් 200 සිට කිලෝග්‍රෑමයට 10% හෝ රුපියල් 400, යන දෙකෙන් වැඩි අගය, දක්වා ඉහළ නංවන ලදී (අංක 2301/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | උම්බලකඩ, මුං ඇට (මුං), රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියළි කළ), මැංගුස්ටීන් සහ කිවි ෆෘට් | 2022 ඔක්තෝබර් 14 වන දින සිට වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2301/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | මැකරල්, ජැක් හෝ හෝස් මැකරල් මාළු | ධීවර විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය මත, දේශීය ටින් මාළු නිෂ්පාදකයන් විසින් ටින් මාළු නිෂ්පාදනය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.03 යටතේ වන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතේ වර්ගීකරණය වන මැකරල් සහ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.55 යටතේ වර්ගීකරණය වන ජැක් සහ හෝස් මැකරල් ආනයනය කිරීමේ දී අදාළ වන කිලෝග්‍රෑමයට 10% හෝ රුපියල් 400 වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 6 අයකරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2301/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |

## වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

2022 ජනවාරි 06 - සෞඛ්‍ය විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිර්දේශ කර, මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද පරිදි, යම් වසංගත තත්ත්වයක් හෝ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන හදිසි තත්ත්වයක් හමුවේ කටයුතු කිරීමට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය වන්නා වූ ද, යම් රජයේ රෝහලකට හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයට ප්‍රදාන කරන ලද්දා වූ ද, වෛද්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර, තාක්ෂණික උපකරණ, උපාංග සහ ඒවායේ කොටස්, රෝහල් ගෘහ භාණ්ඩ, ඖෂධ හෝ රසායනික ද්‍රව්‍ය, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2261/58 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 ජනවාරි 11 - නව සංයෝජිත වර්ගීකරණ අනු අංශ යටතේ අයිතම කිහිපයක් සඳහා නිදහස් කිරීම් සහ සහනදායී අනුපාතික ලබා දෙන ලදී (අංක 2262/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 අගෝස්තු 22 - සහනදායී පියවර වශයෙන් ලබා දීමට හෝ අත්‍යාවශ්‍ය මහජන සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ව්‍යාපාරික ආයතන, ස්වේච්ඡා සංවිධාන හා හිතෛෂීන් ද ඇතුළුව යම් විදේශ රාජ්‍යයන් (රජයන්), සංවිධාන වෙතින් යම් රාජ්‍ය ආයතනවලට, රජය මගින් අනුමත ආයතනවලට හා යම් රාජ්‍ය ආයතන සමග ඍජු සහයෝගීතාවයෙන් සහන ක්‍රියාකාරකම්වල නියුක්ත ආයතනවලට ආධාර/ පරිත්‍යාග වශයෙන් ලැබීමට නියමිත අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය, එක් එක් අවස්ථාව මත පදනම්ව, පරිත්‍යාග සහ සහන පියවර සමඟ සම්බන්ධිත රාජ්‍ය ආයතනය හෝ රජය විසින් අනුමත ආයතනය හෝ ඍජුව සම්බන්ධීකරණ කටයුතු කරන රජයේ ආයතන භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ (ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා) නිර්දේශය අනුව, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කර ඇත (අංක 2294/26 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

| | | |
|---|---|---|
| 2022 ඔක්තෝබර් 05 | - | කර්මාන්ත විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, දේශීය සනීපාරක්ෂක තුවා නිෂ්පාදකයන් විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3920.10.20, 3920.10.90, 3926.90.99, 4811.59.10 සහ 5603.11.00 යටතේ වර්ගීකරණය වන අමුද්‍රව්‍ය හෝ අන්තර් භාණ්ඩ ආනයනය 2022 ඔක්තෝබර් මස 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2300/13 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |

## අනෙකුත් බදු සහ අයබදු

| | | |
|---|---|---|
| 2022 මාර්තු 27 | - | 2022 මාර්තු 27 සිට 2023 මාර්තු 26 දක්වා කාලසීමාව සඳහා කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ රත්මලාන සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක් සඳහාම අය කරන නැව් නැගීමේ/ගුවන්ගත වීමේ බද්ද එක් මගියෙකු සඳහා එ.ජ. ඩොලර් 30 දක්වා සියයට 50කින් අඩු කරන ලදී (අංක 2272/53 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022 අප්‍රේල් 08 | - | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අය කළ හැකි ආදායම රුපියල් බිලියන 2ක් ඉක්මවනු ලබන යම් පුද්ගලයෙකුගේ, හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක, බදු අය කළ හැකි ආදායම මත 25% අධිභාර බද්දක් පැනවීම සඳහා 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත බලාත්මක කරන ලදී. |
| 2022 අප්‍රේල් 29 | - | මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි සිට නව ජාත්‍යන්තර ගුවන් සමාගම් විසින් මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර දෙකක කාලයක් සඳහා අය කළ නැව් නැගීමේ/ ගුවන්ගත වීමේ බද්ද දීර්ඝ කරන ලදී. |
| 2022 ජූනි 04 | - | විදුලි සංදේශ බද්ද 11.25% සිට 15% දක්වා වැඩි කරන ලදී. |
| 2022 සැප්තැම්බර් 20 | - | වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 120ට වැඩි ආනයනකරුවන්, නිෂ්පාදකයින්, සේවා සපයන්නන්, තොග වෙළඳුන් සහ සිල්ලර වෙළඳුන් සඳහා පිරිවැටුම මත 2.5% අනුපාතයක් යටතේ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් පැනවීම. |
| අපේක්ෂිත | - | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත, 2022 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත, 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත, 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතට සංශෝධන සිදු කිරීමට නියමිතය (2022 මැයි 30 වැනි දින පවත්වන ලද කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුව). |

## රාජ්‍ය වියදම

| | | |
|---|---|---|
| 2022 ජනවාරි 05 | - | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ, ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා 2022 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (IV). |
| 2022 ජනවාරි 06 | - | රාජ්‍ය සේවකයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස් සීමාව අවුරුදු 65ක් දක්වා දීර්ඝ කරන ලදී (අංක 2022/02 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය). |
| 2022 ජනවාරි 13 | - | 2022 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, රාජ්‍ය සේවකයන් සහ විශ්‍රාමික තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී සැලකිල්ලට ගනු නොලබන, රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දෙන ලදී (අංක 2022/03 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය). |
| 2022 මාර්තු 08 | - | විදුලිය සහ ඉන්ධන පරිභරණය අවම කිරීම සඳහා රාජ්‍ය අංශය වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී (අංක 2022/04 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය). |
| 2022 අප්‍රේල් 26 | - | ඵලදායී නොවන/අත්‍යාවශ්‍ය නොවන වියදම් සීමා කිරීම සඳහා රාජ්‍ය අංශය වෙත |

| | | |
|---|---|---|
| | | මාර්ගෝපදේශ නිකුත් කරන ලදී (ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022). |
| 2022 අගෝස්තු 08 | - | එලදායි නොවන/අත්‍යවශ්‍ය නොවන වියදම් සීමා කිරීම සඳහා වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී (රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 04/2022). |
| | - | කාන්තාවන් රාත්‍රී කාලයේ දී සේවයේ නියුක්ත කරවීම පිළිබඳ දැනට පවතින සීමාකාරී නෛතික ප්‍රතිපාදන සංශෝධනය කිරීම සඳහා 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. |
| 2022 සැප්තැම්බර් 02 | - | රාජ්‍ය වියදම් තාර්කිකරණය දැඩි ලෙස ක්‍රියාත්මක කළ යුතු බවට විධානය කරමින් 2023 අයවැය ප්‍රකාශය සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ, වියදම් දැරීමේ ආයතන වෙත නිකුත් කරන ලදී (ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2022). |
| 2022 සැප්තැම්බර් 09 | - | 2022 අංක 21 දරන විසර්ජන (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.<br>• මුළු වියදම රුපියල් බිලියන 5,426 සිට රුපියල් බිලියන 6,237ක් දක්වා ඉහළ නංවන ලදී.<br>• ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 3,200 සිට රුපියල් බිලියන 3,844ක් දක්වා ඉහළ නංවන ලදී.[2] |
| 2022 සැප්තැම්බර් 14 | - | 2023 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 60 දක්වා අඩු කරන ලදී (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2022). |
| 2022 ඔක්තෝබර් 06 | - | රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයින්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 60 දක්වා අඩු කරන ලදී (රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 06/2022). |

2 තව ද, අමාත්‍ය මණ්ඩලය විසින් 2022 වසර සඳහා ණය ගැනීම් සීමාව තවත් රුපියල් බිලියන 663කින් ඉහළ නැංවීමට 2022 ඔක්තෝබර් 17 වන දින අනුමැතිය ලබා දී ඇති අතර, එමගින් මෙම සීමාව රුපියල් බිලියන 4,507ක් දක්වා ඉහළ නැංවෙනු ඇත.

# සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

# සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

## නිර්වචන සහ විස්තර සටහන්

පහත දැක්වෙන පොදු සටහන් එක් එක් සංඛ්‍යා සටහනෙහි පාදක සටහන් සඳහා අදාළ වේ.

1. තොරතුරුවල සම්පූර්ණත්වය සඳහා ඇතැම් සංඛ්‍යා සටහන්වල තාවකාලික සංඛ්‍යා ඇතුළත් කොට ඇත.
2. ඇතැම් සංඛ්‍යා සටහන්වල සංඛ්‍යා ආසන්න පූර්ණ සංඛ්‍යාවට දක්වා ඇත. එබැවින් දක්වා ඇති එකතුවෙහිත්, සංඛ්‍යා එකතු කළ විට ලැබෙන මුළු එකතුවෙහිත් සුළු වෙනස්කම් පැවතිය හැකිය.
3. කලින් පළකොට ඇති සංඛ්‍යාවලින් වෙනස් වන්නේ, පසුව කළ සංශෝධන හේතුවෙනි.
4. පහත සඳහන් සංකේත යොදා ඇත.

| | | |
|---|---|---|
| ... | = | සැලකිය යුතු නොවේ |
| - | = | නැත / ලැබී නොමැත / සම්පාදනය නොකෙරේ |

**I වන සංඛ්‍යා සටහන**

## කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)

රුපියල් මිලියන

| ආර්ථික කටයුතු | 2019 | 2020 (ආ) | 2021 (ආ) | 2022 පළමු භාගය (ආ) | ප්‍රතිශත වෙනස | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2020/19 (ආ) | 2021/20 (ආ) | 2022/21 පළමු භාගය (ආ) |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **1,154,540** | **1,290,688** | **1,539,521** | **982,919** | **11.8** | **19.3** | **33.5** |
| 1. ධාන්‍ය වගාව (වී හැර) | 18,186 | 35,108 | 49,132 | 24,827 | 93.1 | 39.9 | -5.4 |
| 2. වී වගාව | 132,031 | 179,453 | 229,093 | 158,523 | 35.9 | 27.7 | 43.6 |
| 3. එළවළු වගාව | 118,117 | 147,502 | 171,774 | 114,734 | 24.9 | 16.5 | 48.4 |
| 4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 3,930 | 5,263 | 4,953 | 2,753 | 33.9 | -5.9 | 13.5 |
| 5. පළතුරු වගාව | 118,920 | 126,588 | 119,825 | 65,349 | 6.4 | -5.3 | 18.8 |
| 6. තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 90,050 | 117,443 | 176,646 | 102,835 | 30.4 | 50.4 | 15.7 |
| 7. තේ වගාව | 103,060 | 111,739 | 116,932 | 88,457 | 8.4 | 4.6 | 38.0 |
| 8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී.) | 2,121 | 3,808 | 4,580 | 2,424 | 79.5 | 20.3 | 14.7 |
| 9. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 87,816 | 98,436 | 131,809 | 88,006 | 12.1 | 33.9 | 35.0 |
| 10. රබර් වගාව | 24,914 | 29,363 | 49,239 | 34,274 | 17.9 | 67.7 | 35.4 |
| 11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 35,404 | 41,000 | 38,417 | 24,763 | 15.8 | -6.3 | 46.2 |
| 12. සත්ත්ව නිෂ්පාදනයන් | 132,978 | 138,275 | 175,287 | 113,729 | 4.0 | 26.8 | 44.7 |
| 13. පැල බෝකිරීම | 868 | 779 | 1,037 | 421 | -10.2 | 33.1 | 15.6 |
| 14. කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 26,139 | 27,197 | 29,360 | 15,332 | 4.0 | 8.0 | 3.2 |
| 15. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 55,415 | 56,127 | 53,429 | 23,872 | 1.3 | -4.8 | -6.7 |
| 16. කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 176,421 | 140,588 | 154,681 | 103,843 | -20.3 | 10.0 | 53.3 |
| 17. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 28,170 | 32,018 | 33,327 | 18,777 | 13.7 | 4.1 | 25.5 |
| **කර්මාන්ත** | **4,644,574** | **4,418,896** | **5,268,820** | **3,387,239** | **-4.9** | **19.2** | **34.1** |
| 18. පතල් හා කැණීම් කර්මාන්තය | 366,638 | 317,949 | 354,250 | 227,688 | -13.3 | 11.4 | 34.1 |
| 19. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 905,062 | 951,961 | 1,097,573 | 737,689 | 5.2 | 15.3 | 41.2 |
| 20. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය | 740,054 | 697,055 | 953,274 | 682,826 | -5.8 | 36.8 | 43.9 |
| 21. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 30,340 | 28,253 | 28,785 | 14,349 | -6.9 | 1.9 | 8.6 |
| 22. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 79,846 | 76,555 | 84,358 | 52,032 | -4.1 | 10.2 | 14.6 |
| 23. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 78,430 | 61,084 | 62,754 | 10,403 | -22.1 | 2.7 | -70.4 |
| 24. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 116,243 | 115,622 | 149,555 | 118,067 | -0.5 | 29.3 | 74.2 |
| 25. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 112,302 | 105,789 | 146,604 | 74,600 | -5.8 | 38.6 | 20.9 |
| 26. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 168,971 | 158,007 | 200,825 | 137,050 | -6.5 | 27.1 | 44.7 |
| 27. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන | 87,436 | 84,430 | 113,642 | 53,739 | -3.4 | 34.6 | 8.2 |
| 28. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 78,271 | 87,190 | 109,379 | 45,657 | 11.4 | 25.4 | 3.8 |
| 29. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 74,223 | 75,188 | 81,599 | 44,250 | 1.3 | 8.5 | -2.8 |
| 30. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම | 100,163 | 107,009 | 135,927 | 91,266 | 6.8 | 27.0 | 29.4 |
| 31. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 99,421 | 127,609 | 143,088 | 67,689 | 28.4 | 12.1 | -2.2 |
| 32. ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 15,818 | 16,386 | 11,166 | 5,763 | 3.6 | -31.9 | 3.5 |
| 33. මළාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 29,078 | 27,886 | 26,900 | 13,230 | -4.1 | -3.5 | 0.0 |
| 34. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 1,562,278 | 1,380,923 | 1,569,141 | 1,010,942 | -11.6 | 13.6 | 36.0 |
| **සේවාවන්** | **8,869,710** | **9,048,368** | **9,746,645** | **5,641,372** | **2.0** | **7.7** | **20.0** |
| 35. තොග හා සිල්ලර වෙළඳාම | 1,941,394 | 2,081,177 | 2,255,860 | 1,460,411 | 7.2 | 8.4 | 34.4 |
| 36. මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් (ගොඩබිම, ජලය සහ ගුවන්) සහ ගබඩා පහසුකම් සැපයීම | 1,662,077 | 1,551,372 | 1,608,508 | 945,904 | -6.7 | 3.7 | 20.1 |
| 37. තැපැල් සහ කුරියර් සේවාවන් | 18,558 | 19,746 | 21,385 | 10,924 | 6.4 | 8.3 | 8.7 |
| 38. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 246,728 | 149,678 | 164,217 | 146,030 | -39.3 | 9.7 | 84.5 |
| 39. ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 38,972 | 38,477 | 40,417 | 20,992 | -1.3 | 5.0 | -8.5 |
| 40. විදුලි සංදේශ සේවාවන් | 97,850 | 108,286 | 123,857 | 47,376 | 10.7 | 14.4 | -32.2 |
| 41. පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් | 212,369 | 239,218 | 309,878 | 190,653 | 12.6 | 29.5 | 26.9 |
| 42. මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන් | 599,130 | 722,084 | 880,342 | 398,546 | 20.5 | 21.9 | -12.8 |
| 43. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය | 141,381 | 167,793 | 181,279 | 121,532 | 18.7 | 8.0 | 29.4 |
| 44. නිවාස අයිතිය සහ දේපොළ වෙළඳාම | 737,948 | 741,750 | 800,839 | 455,163 | 0.5 | 8.0 | 20.7 |
| 45. වෘත්තීයමය සේවාවන් | 365,255 | 352,460 | 382,833 | 181,684 | -3.5 | 8.6 | 10.5 |
| 46. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය | 835,910 | 903,348 | 948,050 | 511,712 | 8.1 | 4.9 | 10.4 |
| 47. අධ්‍යාපනය | 358,734 | 381,342 | 390,176 | 223,937 | 6.3 | 2.3 | 16.8 |
| 48. සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 335,800 | 381,273 | 432,015 | 273,322 | 13.5 | 13.3 | 32.6 |
| 49. වෙනත් පුද්ගලික සේවාවන් | 1,277,604 | 1,210,362 | 1,206,988 | 653,187 | -5.3 | -0.3 | 20.6 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතුකළ අගය** | **14,668,824** | **14,757,952** | **16,554,986** | **10,011,530** | **0.6** | **12.2** | **25.7** |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 1,242,152 | 1,082,212 | 1,130,868 | 731,650 | -12.9 | 4.5 | 14.0 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **15,910,976** | **15,840,164** | **17,685,854** | **10,743,180** | **-0.4** | **11.7** | **24.8** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ

(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2 වන සංඛ්‍යා සටහන**

## කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) (අ)

රුපියල් මිලියන

| ආර්ථික කටයුතු | 2019 | 2020 (ආ) | 2021 (ආ) | 2022 පළමු භාගය (ආ) | ප්‍රතිශත වෙනස 2020/19 (ආ) | 2021/20 (ආ) | 2022/21 පළමු භාගය (ආ) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **949,582** | **936,020** | **959,434** | **437,937** | **-1.4** | **2.5** | **-7.6** |
| 1. ධාන්‍ය වගාව (වී හැර) | 13,355 | 21,342 | 23,138 | 9,681 | 59.8 | 8.4 | -19.7 |
| 2. වී වගාව | 112,919 | 121,663 | 115,242 | 44,539 | 7.7 | -5.3 | -24.0 |
| 3. එළවළු වගාව | 102,037 | 111,088 | 109,180 | 47,809 | 8.9 | -1.7 | -11.1 |
| 4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 3,275 | 4,021 | 3,728 | 1,844 | 22.8 | -7.3 | -1.6 |
| 5. පළතුරු වගාව | 77,200 | 81,823 | 75,485 | 34,140 | 6.0 | -7.7 | -6.1 |
| 6. තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 102,800 | 92,066 | 102,202 | 55,586 | -10.4 | 11.0 | 13.5 |
| 7. තේ වගාව | 72,733 | 67,971 | 73,743 | 32,793 | -6.5 | 8.5 | -17.5 |
| 8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී.) | 1,302 | 1,613 | 1,457 | 765 | 23.9 | -9.7 | 6.5 |
| 9. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 90,880 | 93,776 | 97,956 | 46,938 | 3.2 | 4.5 | 2.6 |
| 10. රබර් වගාව | 24,029 | 24,081 | 25,570 | 12,065 | 0.2 | 6.2 | -13.4 |
| 11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 28,751 | 29,900 | 26,809 | 13,497 | 4.0 | -10.3 | 0.3 |
| 12. සත්ත්ව නිෂ්පාදනයන් | 90,284 | 86,907 | 98,339 | 44,570 | -3.7 | 13.2 | -6.5 |
| 13. පැල බෝකිරීම | 772 | 625 | 792 | 362 | -19.0 | 26.6 | 18.8 |
| 14. කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 22,969 | 21,313 | 26,303 | 10,674 | -7.2 | 23.4 | -19.5 |
| 15. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 43,133 | 42,361 | 41,924 | 19,515 | -1.8 | -1.0 | -3.5 |
| 16. කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 141,700 | 111,307 | 112,825 | 51,752 | -21.4 | 1.4 | -7.5 |
| 17. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 21,444 | 24,166 | 24,742 | 11,406 | 12.7 | 2.4 | 1.4 |
| **කර්මාන්ත** | **3,933,728** | **3,724,314** | **3,933,782** | **1,835,491** | **-5.3** | **5.6** | **-7.1** |
| 18. පතල් හා කැණීම් කර්මාන්තය | 318,658 | 284,079 | 288,061 | 125,075 | -10.9 | 1.4 | -13.1 |
| 19. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 929,371 | 980,863 | 1,015,085 | 453,628 | 5.5 | 3.5 | -9.9 |
| 20. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය | 469,028 | 416,312 | 475,377 | 266,632 | -11.2 | 14.2 | 9.1 |
| 21. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 36,321 | 32,831 | 35,580 | 14,726 | -9.6 | 8.4 | -12.0 |
| 22. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 54,064 | 51,896 | 56,812 | 30,003 | -4.0 | 9.5 | -4.2 |
| 23. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 24,630 | 22,108 | 15,492 | 3,450 | -10.2 | -29.9 | -56.6 |
| 24. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 90,144 | 92,157 | 95,794 | 43,488 | 2.2 | 3.9 | -11.1 |
| 25. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 98,429 | 81,182 | 97,439 | 37,307 | -17.5 | 20.0 | -14.1 |
| 26. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 107,062 | 102,685 | 119,988 | 50,690 | -4.1 | 16.9 | -15.0 |
| 27. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන | 80,312 | 77,859 | 81,174 | 32,482 | -3.1 | 4.3 | -16.9 |
| 28. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 66,114 | 65,187 | 73,090 | 27,640 | -1.4 | 12.1 | -2.8 |
| 29. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 95,470 | 81,651 | 82,696 | 44,751 | -14.5 | 1.3 | -6.7 |
| 30. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම | 96,432 | 87,586 | 101,050 | 48,028 | -9.2 | 15.4 | -6.4 |
| 31. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 184,041 | 180,176 | 187,763 | 92,870 | -2.1 | 4.2 | 2.5 |
| 32. ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 14,701 | 15,431 | 11,332 | 6,368 | 5.0 | -26.6 | 9.6 |
| 33. මළාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 29,253 | 28,960 | 27,992 | 12,794 | -1.0 | -3.3 | -1.1 |
| 34. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 1,239,700 | 1,123,351 | 1,169,059 | 545,559 | -9.4 | 4.1 | -8.9 |
| **සේවාවන්** | **7,307,036** | **7,165,986** | **7,405,262** | **3,559,173** | **-1.9** | **3.3** | **-0.6** |
| 35. තොග හා සිල්ලර වෙළඳාම | 1,636,752 | 1,650,889 | 1,678,813 | 847,013 | 0.9 | 1.7 | 1.3 |
| 36. මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් (ගොඩබිම, ජලය සහ ගුවන්) සහ ගබඩා පහසුකම් සැපයීම | 1,398,230 | 1,313,312 | 1,324,646 | 656,318 | -6.1 | 0.9 | -0.9 |
| 37. තැපැල් සහ කුරියර් සේවාවන් | 17,099 | 17,620 | 18,714 | 9,614 | 3.0 | 6.2 | 7.4 |
| 38. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 216,976 | 128,556 | 130,474 | 84,955 | -40.8 | 1.5 | 28.4 |
| 39. ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 42,752 | 43,841 | 42,161 | 21,579 | 2.5 | -3.8 | -8.6 |
| 40. විදුලි සංදේශ සේවාවන් | 103,325 | 118,845 | 138,238 | 73,952 | 15.0 | 16.3 | 8.3 |
| 41. පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් | 175,634 | 194,893 | 243,971 | 124,751 | 11.0 | 25.2 | 3.7 |
| 42. මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන් | 510,367 | 557,357 | 597,267 | 258,452 | 9.2 | 7.2 | -12.0 |
| 43. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය | 120,550 | 117,075 | 125,326 | 51,739 | -2.9 | 7.0 | -10.5 |
| 44. නිවාස අයිතිය සහ දේපොළ වෙළඳාම | 610,231 | 604,259 | 630,619 | 300,914 | -1.0 | 4.4 | -0.5 |
| 45. වෘත්තීයමය සේවාවන් | 297,462 | 287,781 | 301,890 | 118,616 | -3.3 | 4.9 | -7.5 |
| 46. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය | 605,938 | 616,176 | 626,013 | 299,444 | 1.7 | 1.6 | 2.9 |
| 47. අධ්‍යාපනය | 283,605 | 284,751 | 290,487 | 153,772 | 0.4 | 2.0 | 2.9 |
| 48. සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 235,136 | 246,735 | 260,499 | 109,246 | 4.9 | 5.6 | -4.3 |
| 49. වෙනත් පුද්ගලික සේවාවන් | 1,052,980 | 983,900 | 996,144 | 448,808 | -6.6 | 1.2 | -2.0 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතුකළ අගය** | **12,190,346** | **11,826,320** | **12,298,479** | **5,832,601** | **-3.0** | **4.0** | **-3.3** |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 1,015,930 | 921,395 | 873,323 | 412,614 | -9.3 | -5.2 | -22.0 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **13,206,276** | **12,747,715** | **13,171,802** | **6,245,215** | **-3.5** | **3.3** | **-4.8** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ

(ආ) තාවකාලික

මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**3 වන සංඛ්‍යා සටහන**

## ප්‍රධාන කෘෂිකාර්මික භෝගවල ප්‍රවණතා

| අංශය | ඒකකය | 2018 | 2019 | 2020 (අ) | 2021 (ආ) | පළමු භාගය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2021 (ආ) | 2022 (ආ) |
| **1. තේ** | | | | | | | |
| 1.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 304 | 300 | 279 | 299 | 162 | 133 |
| 1.2 වගා බිම් ප්‍රමාණය (ඇ) | හෙක්ටයාර '000 | 200 | 200 | 266 | 267 | 267 | 267 |
| 1.3 මිලෙහි සාමාන්‍යය | | | | | | | |
| කොළඹ වෙන්දේසිය | කි.ග්‍රෑ./රුපියල් | 581.58 | 546.67 | 633.85 | 619.15 | 629.70 | 1,041.34 |
| අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 820.75 | 822.25 | 866.70 | 920.76 | 933.18 | 1,310.74 |
| **2. රබර්** | | | | | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 83 | 75 | 78 | 77 | 44 | 37 |
| 2.2 වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර '000 | 137 | 138 | 138 | 139 | - | - |
| 2.3 මිලෙහි සාමාන්‍යය | | | | | | | |
| කොළඹ වෙන්දේසිය (RSS 1) | කි.ග්‍රෑ./රුපියල් | 281.36 | 288.51 | 351.46 | 460.78 | 446.31 | 607.60 |
| අපනයන (නැ.වි.ස.) | කි.ග්‍රෑ./රුපියල් | 363.93 | 332.29 | 353.84 | 540.77 | 495.09 | 719.72 |
| **3. පොල්** | | | | | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 2,623 | 3,086 | 2,792 | 3,120 | 1,491 | 1,706 |
| 3.2 වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර '000 | 499 | 503 | 505 | 505 | 504 | 505 |
| 3.3 අපනයන මිලෙහි සාමාන්‍යය (නැ.වි.ස.) (ඈ) | ගෙඩියකට රුපියල් | 68.29 | 37.47 | 52.61 | 65.36 | 65.86 | 83.87 |
| **4. වී (ඉ)** | | | | | | | |
| 4.1 නිෂ්පාදනය | මෙ.ටො. '000 | 3,930 | 4,592 | 5,121 | 5,150 | 3,061 | 1,931 |
| මහ | මෙ.ටො. '000 | 2,397 | 3,073 | 3,197 | 3,061 | 3,061 | 1,931 |
| යල | මෙ.ටො. '000 | 1,533 | 1,519 | 1,924 | 2,088 | - | - |
| 4.2 බිම් ප්‍රමාණය | | | | | | | |
| වගා කළ | හෙක්ටයාර '000 | 1,041 | 1,117 | 1,208 | 1,272 | 770 | 776 |
| අස්වැන්න නෙළාගත් | හෙක්ටයාර '000 | 885 | 958 | 1,066 | 1,127 | 682 | 685 |
| 4.3 පොහොර භාවිතය (ඊ) (උ) | මෙ.ටො. '000 | 111 | 299 | 402 | 165 | 251 | 16 |
| 4.4 හෙක්ටයාරයකට එලදාව (ඌ) | හෙක්ටයාරයකට කි.ග්‍රෑ. | 4,443 | 4,795 | 4,802 | 4,571 | 4,492 | 2,819 |

(නැ.වි.ස. = නැව තෙක් වියදම් සහිත)

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් ප්‍රකාශිත වැවිලි භෝග පිළිබඳ තොරතුරු සටහනට අනුව සංශෝධනය කර ඇත

(ඈ) පොල් මද ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන තුන සඳහා පමණි

(ඉ) වගා වර්ෂය මත පදනම්ව (මහ අස්වැන්න නෙළීම වසරේ පළමු භාගයට අයත් වේ)

(ඊ) පොහොර සහනාධාරය වෙනුවට 2016 යල කන්නයේ සිට මූල්‍යමය ප්‍රදානයක් ලබාදෙන ලදී. ඒ අනුව, 2017/18 මහ කන්නය සඳහා රුපියල් මිලියන 8,002ක් ලබාදී ඇත. 2018 යල කන්නයේ සිට මූල්‍යමය ප්‍රදානයක් ලබාදීමේ ක්‍රමය අත්හිටුවන ලදී. එමනිසා 2018 වර්ෂය සඳහා ඇති අගය 2018 යල කන්නය සඳහා පමණක් අදාළ වේ

(උ) කාබනික පොහොර නිකුත් කිරීම පිළිබඳ දත්ත ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් ලබා ගන්නා ලදී

(ඌ) හෙක්ටයාරයක එලදාව ගණනය කර ඇත්තේ මුළු නිෂ්පාදනය ශුද්ධ අස්වැන්න නෙළා ගත් බිම් ප්‍රමාණය මගින් බෙදීමෙනි

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ජාතික පොහොර ලේකම් කාර්යාලය
කොළඹ තේ තැරැව්කරුවන්ගේ සංගමය
ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**4 වන සංඛ්‍යා සටහන**

## ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායයන්හි ආංශික විදේශීය සෘජු ආයෝජන (අ)

එ.ජ.ඩොලර් මිලියන

| අංශය | 2018 | 2019 | 2020 | 2021 (ආ) | පළමු භාගය | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2021 (ආ) | 2022 (ආ) |
| **නිෂ්පාදන කර්මාන්ත** | | | | | | |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 22.3 | 26.1 | 6.6 | 8.7 | 5.3 | 0.9 |
| රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදිත | 90.6 | 104.9 | 78.1 | 101.6 | 49.1 | 35.2 |
| දැව හා දැව නිෂ්පාදිත | 4.9 | 7.2 | 9.0 | 9.5 | 8.2 | 2.0 |
| කඩදාසි, කඩදාසි නිෂ්පාදිත, මුද්‍රණය කිරීම සහ ප්‍රකාශනය | 9.0 | 1.3 | 1.2 | 1.1 | 0.6 | 0.2 |
| රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 97.3 | 108.4 | 61.2 | 68.4 | 24.8 | 80.9 |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 21.0 | 7.5 | 2.6 | 4.6 | 2.6 | 0.3 |
| සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 7.8 | 9.5 | 3.4 | 6.5 | 2.3 | 1.9 |
| අන් තැනක සඳහන් නොවූ කාර්මික නිෂ්පාදිත | 38.6 | 54.6 | 29.7 | 22.7 | 9.7 | 9.2 |
| **කෘෂිකාර්මික** | 0.5 | 1.3 | 0.8 | 0.5 | 0.1 | 0.1 |
| **සේවා** | | | | | | |
| හෝටල් සහ ආපනශාලා | 223.4 | 153.9 | 66.0 | 69.8 | 40.8 | 27.4 |
| තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම | 58.7 | 40.0 | 26.4 | 43.9 | 15.9 | 2.7 |
| වෙනත් සේවා | 19.2 | 30.3 | 18.6 | 9.4 | 3.2 | 1.3 |
| **යටිතල පහසුකම්** | | | | | | |
| නිවාස, දේපොළ සංවර්ධනය සහ කඩසාප්පු කාර්යාල | 397.8 | 455.3 | 256.1 | 201.5 | 108.5 | 134.1 |
| දුරකථන හා විදුලි සංදේශ ජාල | 522.2 | 138.1 | 117.6 | 223.2 | 114.5 | 203.5 |
| බලශක්ති උත්පාදනය, ඉන්ධන, ගෑස්, පෙට්‍රෝලියම් සහ වෙනත් | 3.7 | 3.1 | 1.5 | 1.4 | 0.4 | 0.3 |
| වරාය බහලු පර්යන්ත | 850.0 | 47.2 | 8.2 | 7.4 | 3.1 | 22.7 |
| **එකතුව** | **2,366.9** | **1,188.7** | **687.0** | **780.2** | **389.0** | **522.9** |

(අ) ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් සඳහා ණය ලැබීම් ඇතුළත් වන අතර, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ සමාගම් වෙත ලැබීම් සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල සෘජු ආයෝජන ඇතුළත් නොවේ.

(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**5 වන සංඛ්‍යා සටහන**

## ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

| කාණ්ඩය | 2018 | 2019 | 2020 (අ) | 2021 (ආ) | 2021 (ආ) කාලසීමාව සඳහා | 2022 (ආ) කාලසීමාව සඳහා |
|---|---|---|---|---|---|---|
| **1. විදුලිබලය** | | | | | **ජන-අගෝ** | **ජන-අගෝ** |
| ස්ථාපිත ධාරිතාව (මෙ.වො. - කාලපරිච්ඡේදය අවසානයට) | 4,046 | 4,217 | 4,265 | 4,187 | 4,199 | 4,354 |
| සමස්ත විදුලිබල උත්පාදනය (ගි.වො.පැය) (ඇ) | 15,374(අ) | 15,922 | 15,714 | 16,716 | 11,107 | 10,744 |
| සමස්ත විදුලිබල උත්පාදනයට ජල විදුලිබලයේ දායකත්වය (%) (ඈ) | 33 | 24 | 25 | 34 | 29 | 29 |
| **2. ප්‍රවාහන** | | | | | **ජන-ජුනි** | **ජන-ජුනි** |
| **2.1 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය** | | | | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 446 | 431 | 309 | 248 | 136 | 174 |
| මගී කිලෝමීටර් (මිලියන) | 15,541 | 14,346(අ) | 8,623 | 6,175 | 3,393 | 6,322 |
| ධාවනය වූ බස් රථ සංඛ්‍යාවේ සාමාන්‍යය | 5,227 | 5,011 | 3,971 | 3,706 | 1,353 | 3,966 |
| මුළු ආදායම (රුපියල් මිලියන) | 44,103 | 43,490 | 31,233 | 26,948 | 14,119 | 24,822 |
| මෙහෙයුම් පිරිවැය (රුපියල් මිලියන) | 41,935 | 41,933 | 33,437 | 30,386 | 15,737 | 26,791 |
| මෙහෙයුම් ලාභය/(අලාභය) (රුපියල් මිලියන) | 2,168 | 1,557 | (2,204 ) | (3,438) | (1,619) | (1,968) |
| **2.2 ශ්‍රී ලංකා දුම්රිය සේවය** | | | | | | |
| ධාවන කිලෝමීටර් ('000) | 11,640 | 11,230(අ) | 7,990 | - | 4,202 | - |
| මගී කිලෝමීටර් (මිලියන) | 7,710 | 7,310 | 3,906 | - | 1,211 | 2,887 |
| භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන) | 120 | 116 | 114 | - | 78 | 73 |
| මුළු ආදායම (රුපියල් මිලියන) | 7,413 | 7,901 | 4,567 | 2,679 | - | - |
| මෙහෙයුම් පිරිවැය (රුපියල් මිලියන) | 14,381 | 15,464 | 14,618 | 12,979 | - | - |
| මෙහෙයුම් ලාභය/(අලාභය) (රුපියල් මිලියන) | (6,968) | (7,562) | (10,051) | (10,300) | - | - |
| **2.3 රථවාහන නව ලියාපදිංචි කිරීම** | | | | | **ජන-සැප්** | **ජන-සැප්** |
| බස් රථ | 2,957 | 1,613 | 578 | 281 | 237 | 270 |
| මෝටර් රථ | 80,776 | 38,232 | 21,021 | 3,495 | 2,905 | 1,141 |
| ත්‍රිරෝද රථ | 20,063 | 15,490 | 7,150 | 2,093 | 2,080 | 32 |
| ද්විත්ව කාර්ය වාහන | 16,931 | 13,459 | 9,532 | 771 | 594 | 676 |
| යතුරු පැදි | 339,763 | 284,301 | 151,634 | 8,011 | 6,031 | 7,067 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 9,371 | 5,223 | 3,941 | 4,432 | 3,241 | 1,663 |
| ඉඩම් වාහන | 10,282 | 7,666 | 8,302 | 14,764 | 10,415 | 5,841 |
| රෝද හතරේ සයිකල් සහ මෝටර් නිවාස | 656 | 1,319 | 470 | 3 | 2 | - |
| මුළු වාහන සංඛ්‍යාව | 480,799 | 367,303 | 202,628 | 33,850 | 25,505 | 16,690 |
| **3. වරාය සේවා** | | | | | **ජන-සැප්** | **ජන-සැප්** |
| පැමිණි නැව් සංඛ්‍යාව (ඉ) | 4,874 | 4,697(අ) | 4,337 | 4,180 | 3,143 | 2,964 |
| මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) (ඉ) | 104,934 | 106,979 | 102,908 | 109,369 | 82,235 | 78,411 |
| බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ඊ) | 7,047 | 7,228 | 6,855 | 7,249 | 5,370 | 5,235 |
| බහලු ප්‍රතිනැව්ගත කිරීම් ප්‍රමාණය (TEUs '000) (ඊ)(උ) | 5,704 | 5,955 | 5,765 | 6,050 | 4,475 | 4,439 |
| **4. විදුලි සංදේශ සේවා** | | | | | **ජුනි අවසානය** | **ජුනි අවසානය** |
| ස්ථාවර දුරකථන සංඛ්‍යාව | 2,484,616 | 2,299,767 | 2,613,140 | 2,851,589 | 2,870,036 | 3,030,685 |
| ජංගම දුරකථන සංඛ්‍යාව | 32,528,104 | 32,884,099 | 28,739,277 | 29,958,852 | 29,048,708 | 29,560,988 |
| අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව | 10,562,675 | 13,408,403 | 17,524,048 | 22,235,833 | 20,628,897 | 22,516,350 |
| ස්ථාවර දුරකථන ඝනත්වය (ඌ) | 11 | 11 | 12 | 13 | 13 | 14 |
| ජංගම දුරකථන ඝනත්වය (ඌ) | 150 | 151 | 131 | 135 | 131 | 133 |

(TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක)
(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පියැසි මත සිදුකරන සූර්ය බලශක්තිය ද ඇතුළත් වේ
(ඈ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත් නොවේ
(ඉ) කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය වරායයන්හි දත්ත පමණක් ඇතුළත් වේ
(ඊ) කොළඹ වරායේ දත්ත පමණක් ඇතුළත් වේ
(උ) නැවත ඇසිරීම් ද ඇතුළුව
(ඌ) පුද්ගලයන් 100කට ඇති දුරකථන සංඛ්‍යාව
සටහන : මුළු දුරකථන ඝනත්වය = ස්ථාවර දුරකථන ඝනත්වය + ජංගම දුරකථන ඝනත්වය

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා දුම්රිය සේවය
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා වරාය අධිකාරිය
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**6 වන සංඛ්‍යා සටහන**

## පාරිභෝගික මිල දර්ශක - ජාතික පාරිභෝගික මිල දර්ශකය

2013 = 100

| කාලපරිච්ඡේදය | | දර්ශකය | | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (%) | | වාර්ෂික සාමාන්‍ය වෙනස (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | මූලික ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. | මූලික ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. | මූලික ජා.පා.මි.ද. |
| 2018 | දෙසැම්බර් | 127.1 | 127.6 | 0.4 | 3.1 | 2.1 | 2.4 |
| 2019 | දෙසැම්බර් | 135.0 | 134.2 | 6.2 | 5.2 | 3.5 | 5.7 |
| 2020 | දෙසැම්බර් | 141.2 | 140.5 | 4.6 | 4.7 | 6.2 | 4.1 |
| 2021 | ජනවාරි | 142.1 | 141.0 | 3.7 | 4.2 | 5.8 | 4.2 |
| | පෙබරවාරි | 142.8 | 141.3 | 4.2 | 4.1 | 5.5 | 4.2 |
| | මාර්තු | 142.1 | 141.8 | 5.1 | 4.3 | 5.3 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 142.5 | 5.5 | 4.1 | 5.3 | 4.4 |
| | මැයි | 143.6 | 143.7 | 6.1 | 4.2 | 5.4 | 4.4 |
| | ජුනි | 145.7 | 144.6 | 6.1 | 4.1 | 5.4 | 4.4 |
| | ජූලි | 146.6 | 145.6 | 6.8 | 4.4 | 5.4 | 4.4 |
| | අගෝස්තු | 147.1 | 146.5 | 6.7 | 4.7 | 5.5 | 4.4 |
| | සැප්තැම්බර් | 147.5 | 147.2 | 6.2 | 4.8 | 5.5 | 4.4 |
| | ඔක්තෝබර් | 150.6 | 150.6 | 8.3 | 7.2 | 5.7 | 4.6 |
| | නොවැම්බර් | 155.3 | 153.0 | 11.1 | 8.8 | 6.2 | 5.0 |
| | දෙසැම්බර් | 161.0 | 155.7 | 14.0 | 10.8 | 7.0 | 5.5 |
| 2022 | ජනවාරි | 166.0 | 159.2 | 16.8 | 12.9 | 8.1 | 6.2 |
| | පෙබරවාරි | 167.8 | 161.2 | 17.5 | 14.1 | 9.3 | 7.1 |
| | මාර්තු | 172.7 | 166.3 | 21.5 | 17.3 | 10.6 | 8.2 |
| | අප්‍රේල් | 190.3 | 182.3 | 33.8 | 27.9 | 13.0 | 10.2 |
| | මැයි | 208.7 | 197.9 | 45.3 | 37.7 | 16.3 | 13.0 |
| | ජුනි | 231.5 | 215.9 | 58.9 | 49.3 | 20.8 | 16.8 |
| | ජූලි | 244.4 | 229.0 | 66.7 | 57.3 | 25.9 | 21.3 |
| | අගෝස්තු | 250.4 | 235.1 | 70.2 | 60.5 | 31.3 | 26.0 |
| | සැප්තැම්බර් | 256.2 | 241.5 | 73.7 | 64.1 | 36.9 | 31.0 |

ජා.පා.මි.ද. - ජාතික පාරිභෝගික මිල දර්ශකය
මූලික ජා.පා.මි.ද. - මූලික ජාතික පාරිභෝගික මිල දර්ශකය

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**7 වන සංඛ්‍යා සටහන**

## පාරිභෝගික මිල දර්ශක - කොළඹ පාරිභෝගික මිල දර්ශකය

2013 = 100

| කාලපරිච්ඡේදය | | දර්ශකය | | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (%) | | වාර්ෂික සාමාන්‍ය වෙනස (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | මූලික කො.පා.මි.ද. | කො.පා.මි.ද. | මූලික කො.පා.මි.ද. | කො.පා.මි.ද. | මූලික කො.පා.මි.ද. |
| 2018 | දෙසැම්බර් | 126.3 | 128.8 | 2.8 | 3.1 | 4.3 | 3.5 |
| 2019 | දෙසැම්බර් | 132.4 | 135.0 | 4.8 | 4.8 | 4.3 | 5.5 |
| 2020 | දෙසැම්බර් | 138.0 | 139.7 | 4.2 | 3.5 | 4.6 | 3.1 |
| 2021 | ජනවාරි | 138.7 | 140.2 | 3.0 | 2.7 | 4.3 | 3.1 |
| | පෙබරවාරි | 139.1 | 140.4 | 3.3 | 2.6 | 4.1 | 3.0 |
| | මාර්තු | 138.9 | 141.1 | 4.1 | 3.1 | 4.0 | 3.0 |
| | අප්‍රේල් | 138.8 | 141.3 | 3.9 | 3.0 | 3.9 | 3.0 |
| | මැයි | 140.3 | 142.5 | 4.5 | 3.2 | 3.9 | 3.0 |
| | ජුනි | 142.4 | 143.1 | 5.2 | 3.2 | 4.1 | 3.0 |
| | ජූලි | 143.1 | 144.1 | 5.7 | 3.7 | 4.2 | 3.1 |
| | අගෝස්තු | 143.5 | 144.6 | 6.0 | 4.1 | 4.3 | 3.2 |
| | සැප්තැම්බර් | 144.1 | 146.0 | 5.7 | 5.0 | 4.5 | 3.3 |
| | ඔක්තෝබර් | 146.9 | 147.9 | 7.6 | 6.3 | 4.8 | 3.6 |
| | නොවැම්බර් | 150.7 | 149.4 | 9.9 | 7.0 | 5.3 | 4.0 |
| | දෙසැම්බර් | 154.7 | 151.3 | 12.1 | 8.3 | 6.0 | 4.4 |
| 2022 | ජනවාරි | 158.4 | 154.1 | 14.2 | 9.9 | 6.9 | 5.0 |
| | පෙබරවාරි | 160.1 | 155.7 | 15.1 | 10.9 | 7.9 | 5.7 |
| | මාර්තු | 164.9 | 159.4 | 18.7 | 13.0 | 9.1 | 6.5 |
| | අප්‍රේල් | 180.2 | 172.4 | 29.8 | 22.0 | 11.3 | 8.1 |
| | මැයි | 195.2 | 182.9 | 39.1 | 28.4 | 14.2 | 10.2 |
| | ජුනි | 220.2 | 200.2 | 54.6 | 39.9 | 18.4 | 13.3 |
| | ජූලි | 230.1 | 208.0 | 60.8 | 44.3 | 23.1 | 16.7 |
| | අගෝස්තු | 235.8 | 212.0 | 64.3 | 46.6 | 28.0 | 20.3 |
| | සැප්තැම්බර් | 244.7 | 219.3 | 69.8 | 50.2 | 33.4 | 24.1 |

කො.පා.මි.ද. - කොළඹ පාරිභෝගික මිල දර්ශකය
මූලික කො.පා.මි.ද. - මූලික කොළඹ පාරිභෝගික මිල දර්ශකය

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**8 වන සංඛ්‍යා සටහන**

## වැටුප් ප්‍රමාණ දර්ශක

| කාලපරිච්ඡේදය | | දර්ශකය | | | | වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (%) | | | | වාර්ෂික සාමාන්‍ය වෙනස (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නියමිත පෞද්ගලික අංශයේ සේවකයන් (1978 දෙසැම්බර් = 100) (අ) | රජයේ සේවකයන් (2016=100) (ආ) | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012=100) (ඇ) | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2018=100) (ඈ) | නියමිත පෞද්ගලික අංශයේ සේවකයන් (1978 දෙසැම්බර් = 100) | රජයේ සේවකයන් (2016=100) | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012=100) | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2018=100) | නියමිත පෞද්ගලික අංශයේ සේවකයන් (1978 දෙසැම්බර් = 100) | රජයේ සේවකයන් (2016=100) | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012=100) | අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2018=100) |
| 2018 | දෙසැම්බර් | 4,213.9 | 100.2 | 176.4 | - | 2.1 | 0.2 | 10.1 | - | 0.6 | 0.2 | 13.2 | - |
| 2019 | දෙසැම්බර් | 4,281.5 | 108.4 | 184.6 | 109.8 | 1.6 | 8.2 | 4.6 | - | 2.9 | 4.7 | 6.2 | - |
| 2020 | දෙසැම්බර් | 4,282.2 | 114.6 | 188.6 | 115.8 | 0.0 | 5.7 | 2.1 | 5.4 | 0.2 | 9.2 | 3.3 | 6.4 |
| 2021 | දෙසැම්බර් | 8,193.8 | 114.6 | 220.7 | 134.2 | 91.3 | 0.0 | 17.0 | 15.9 | 74.4 | 0.0 | 9.2 | 9.2 |
| 2022 | ජනවාරි | 8,194.4 | 133.1 | 225.5 | 136.9 | 91.4 | 16.1 | 18.8 | 17.0 | 82.1 | 1.3 | 10.3 | 10.3 |
| | පෙබරවාරි | 8,194.8 | 133.1 | 227.2 | 136.9 | 91.4 | 16.1 | 17.7 | 17.2 | 89.7 | 2.7 | 11.5 | 11.3 |
| | මාර්තු | 8,194.9 | 133.1 | 236.3 | 143.5 | 2.2 | 16.1 | 21.1 | 22.3 | 77.1 | 4.0 | 13.0 | 12.7 |
| | අප්‍රේල් | 8,195.3 | 133.1 | 244.8 | 147.5 | 2.2 | 16.1 | 25.8 | 23.6 | 66.2 | 5.4 | 14.8 | 14.1 |
| | මැයි | 8,196.7 | 133.1 | 250.6 | 150.1 | 2.2 | 16.1 | 28.2 | 26.4 | 56.5 | 6.7 | 16.5 | 15.7 |
| | ජූනි | 8,198.2 | 133.1 | 255.6 | 152.1 | 2.2 | 16.1 | 28.3 | 26.8 | 48.0 | 8.1 | 18.2 | 17.4 |
| | ජූලි | 8,200.1 | 133.1 | 263.1 | 156.0 | 2.2 | 16.1 | 31.8 | 29.4 | 40.3 | 9.4 | 20.3 | 19.3 |
| | අගෝස්තු | 8,201.1 | 133.1 | 269.7 | 160.3 | 0.1 | 16.1 | 34.1 | 32.1 | 32.9 | 10.8 | 22.5 | 21.3 |

(අ) 1978 දෙසැ. 31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව පදනම් කොටගත් බර තැබුම් මත කම්කරු දෙපාර්තමේන්තුව විසින් දර්ශක අංක ගණනය කරනු ලැබේ. දර්ශක අංකය ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත්තේ පඩිපාලක සභා මගින් අනුමත කළ විවිධ කර්මාන්තවල අවම වැටුප්ය.

(ආ) රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2016 පෙබරවාරි මස 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මගින් රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යුහයට සිදුකරන ලද වෙනස්කම් ග්‍රහණය කර ගැනීම සඳහා රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2012 වසරේ සිට 2016 වසරට යාවත්කාලීන කරන ලදී. පදනම් කාලපරිච්ඡේදයේ සේවා නියුක්තිය පිළිබඳ දත්ත, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ නොවැම්බර් මාසයේ දී පවත්වන ලද රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශවල සේවා නියුක්තිය පිළිබඳ සංගණනයෙන් ලබා ගන්නා ලදී

(ඇ) දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ පද්ධතිය මගින් රැස් කරනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් දත්ත භාවිතා කරමින් දර්ශක අංක ගණනය කරනු ලැබේ. පදනම් කාලපරිච්ඡේදයේ සේවා නියුක්ති ව්‍යුහය පිළිබඳ දත්ත, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේ දී පවත්වන ලද කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණවලින් ලබා ගන්නා ලදී.

(ඈ) අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් හා රැකියා ව්‍යුහයෙහි මෑතකාලීනව සිදුවූ වෙනස්කම් නිරූපණය කිරීමේ අරමුණින් අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2012 සිට 2018 දක්වා යාවත්කාලීන කරන ලදි. දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ පද්ධතිය මගින් රැස් කරනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් දත්ත භාවිතා කරමින් දර්ශක අගය ගණනය කරනු ලැබේ. පදනම් කාලපරිච්ඡේදයේ සේවා නියුක්ති ව්‍යුහය පිළිබඳ දත්ත, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේ දී පවත්වන ලද කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණවලින් ලබාගන්නා ලදි.

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**9 වන සංඛ්‍යා සටහන**

**සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට අනුව විදේශ වෙළඳාමේ ප්‍රවණතා (අ)**

එ.ජ.ඩොලර් මිලියන

| කාණ්ඩය | 2018 | 2019 | 2020 | 2021 (ආ) | 2021 ජන-අගෝ (ආ) | 2022 ජන-අගෝ (ආ) | වාර්ෂික වෙනස්වීම % 2021/22 ජන-අගෝ |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| 0. ආහාර හා සජීවී සතුන් | 2,633.2 | 2,541.9 | 2,409.3 | 2,846.0 | 1,795.6 | 1,786.5 | -0.5 |
| 1. පාන වර්ග හා දුම්කොළ | 164.8 | 162.3 | 116.6 | 145.2 | 89.9 | 93.4 | 3.9 |
| 2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය | 348.4 | 343.1 | 368.6 | 433.2 | 284.5 | 303.7 | 6.8 |
| 3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 622.1 | 521.1 | 373.6 | 506.4 | 294.9 | 409.8 | 39.0 |
| 4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි | 88.8 | 73.9 | 96.6 | 128.9 | 83.0 | 68.9 | -17.1 |
| 5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 214.6 | 223.5 | 224.0 | 291.7 | 187.8 | 184.5 | -1.7 |
| 6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ | 1,599.2 | 1,627.9 | 1,344.0 | 1,700.7 | 1,096.3 | 1,261.8 | 15.1 |
| 7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ | 541.1 | 531.9 | 396.1 | 631.8 | 392.8 | 452.7 | 15.2 |
| 8. විවිධ නිෂ්පාදන උපාංග | 5,677.4 | 5,914.3 | 4,718.6 | 5,813.1 | 3,678.9 | 4,340.0 | 18.0 |
| 9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු | ... | ... | 0.1 | 1.5 | 0.3 | 0.8 | 144.0 |
| **සමස්ත අපනයන** | **11,889.6** | **11,940.0** | **10,047.4** | **12,498.6** | **7,904.0** | **8,902.2** | **12.6** |
| **ආනයන** | | | | | | | |
| 0. ආහාර හා සජීවී සතුන් | 2,173.4 | 1,958.2 | 2,107.6 | 2,275.2 | 1,534.0 | 1,446.6 | -5.7 |
| 1. පාන වර්ග හා දුම්කොළ | 161.2 | 147.0 | 93.8 | 76.8 | 51.0 | 65.3 | 28.0 |
| 2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය | 487.5 | 465.7 | 436.2 | 584.7 | 380.5 | 347.0 | -8.8 |
| 3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 4,151.9 | 3,891.6 | 2,542.6 | 3,742.9 | 2,395.9 | 3,317.9 | 38.5 |
| 4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි | 184.6 | 111.2 | 195.4 | 285.2 | 211.3 | 62.0 | -70.6 |
| 5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 2,372.4 | 2,210.5 | 2,192.4 | 2,847.9 | 1,860.4 | 1,571.0 | -15.6 |
| 6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ | 5,896.2 | 5,828.8 | 4,474.3 | 5,976.8 | 3,787.3 | 3,707.1 | -2.1 |
| 7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ | 5,232.7 | 4,292.3 | 3,204.4 | 3,876.2 | 2,563.1 | 1,713.8 | -33.1 |
| 8. විවිධ නිෂ්පාදන උපාංග | 1,111.7 | 1,011.8 | 790.2 | 953.3 | 619.3 | 560.8 | -9.5 |
| 9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු | 461.0 | 19.9 | 18.5 | 18.4 | 8.7 | 9.2 | 5.5 |
| **සමස්ත ආනයන** | **22,232.7** | **19,937.1** | **16,055.3** | **20,637.4** | **13,411.5** | **12,800.9** | **-4.6** |

(අ) 2006 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි නවතම සිව්වන සංස්කරණයට අනුව සකස් කර ඇත.
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

**10 වන සංඛ්‍යා සටහන**

## ගෙවුම් තුලනය (අ)

එ.ජ. ඩොලර් මිලියන

| අයිතමය | 2020 (ආ) | 2021 (ඇ) | පළමු භාගය | |
|---|---|---|---|---|
| | | | 2021 (ඇ) | 2022 (ඇ) |
| **ජංගම ගිණුමේ ශේෂය** | **-1,187** | **-3,343** | **-1,437** | **-1,828** |
| **වෙළඳ ශේෂය** | **-6,008** | **-8,139** | **-4,316** | **-3,514** |
| අපනයන | 10,047 | 12,499 | 5,699 | 6,514 |
| ආනයන | 16,055 | 20,637 | 10,015 | 10,028 |
| **සේවා (ශුද්ධ)** | **819** | **1,586** | **597** | **1,336** |
| ලැබීම් | 3,035 | 2,475 | 985 | 1,766 |
| ගෙවීම් | 2,216 | 889 | 387 | 430 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-2,205** | **-2,018** | **-918** | **-1,111** |
| ලැබීම් | 198 | 116 | 69 | 109 |
| ගෙවීම් | 2,404 | 2,134 | 987 | 1,220 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **6,207** | **5,228** | **3,199** | **1,461** |
| ද්විතීයික ආදායම් : බැර | 7,117 | 5,498 | 3,328 | 1,612 |
| ද්විතීයික ආදායම් : හර | 910 | 270 | 129 | 151 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **28** | **25** | **12** | **7** |
| ප්‍රාග්ධන ගිණුම : බැර | 51 | 50 | 25 | 24 |
| ප්‍රාග්ධන ගිණුම : හර | 23 | 24 | 14 | 17 |
| **ජංගම හා ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,159** | **-3,318** | **-1,425** | **-1,821** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ) (ඈ)** | **-394** | **-4,816** | **-1,802** | **-1,840** |
| **සෘජු ආයෝජන : වත්කම්** | **15** | **17** | **9** | **8** |
| **සෘජු ආයෝජන : වගකීම්** | **434** | **598** | **258** | **297** |
| **විවිධ ආයෝජන : වත්කම්** | - | - | - | - |
| **විවිධ ආයෝජන : වගකීම්** | **-2,383** | **-906** | **-89** | **-62** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | -217 | -236 | -127 | 135 |
| ණය සුරැකුම්පත් | -2,166 | -670 | 37 | -197 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **-136** | **387** | **37** | **813** |
| මුදල් සහ තැන්පතු | 64 | 306 | -52 | 488 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -224 | 257 | 100 | 132 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 24 | -176 | -11 | 193 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **231** | **3,003** | **99** | **1,250** |
| මුදල් සහ තැන්පතු | -15 | 4,016 | -177 | 455 |
| ණය | 174 | -1,552 | 25 | -340 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 185 | -428 | 133 | -302 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | -114 | 180 | 118 | 1,398 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | 787 | - | - |
| **සංචිත වත්කම්** | **-1,992** | **-2,526** | **-1,581** | **-1,176** |
| **ශුද්ධ වැරදීම් සහ අත්හැරීම්** | **765** | **-1,498** | **-377** | **-19** |
| **සමස්ත ශේෂය** | **-2,328** | **-3,967** | **-1,261** | **-2,814** |

(අ) මෙම ඉදිරිපත් කිරීම ජා.මූ. අරමුදලේ 'ගෙවුම් තුලන සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය' අත්පොතෙහි නවතම (හයවන) සංස්කරණය (BPM6) ට අනුකූල වන අතර, BPM6 ඉදිරිපත් කිරීමේ සාරාංශයක් මෙහි වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) වත්කම් - වගකීම්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 11 වන සංඛ්‍යා සටහන

## අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| අයිතමය | 2021 (අ) | | 2022 ජූනි (අ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ආ)** | **1,522** | **17,891** | **1,528** | **13,529** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 1,482 | 12,626 | 1,485 | 7,979 |
| ණය උපකරණ | 40 | 5,264 | 43 | 5,550 |
| **විවිධ ආයෝජන** | **0.1** | **7,508** | **0.1** | **4,407** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | - | 1,148 | - | 485 |
| ණය සුරැකුම්පත් (ඇ) | 0.1 | 6,360 | 0.1 | 3,922 |
| තැන්පතු භාරගන්නා ආයතන | 0.1 | - | 0.1 | - |
| රජය | - | 6,266 | - | 3,836 |
| අනෙකුත් අංශ | - | 94 | - | 86 |
| **අනෙකුත් ආයෝජන** | **4,096** | **39,100** | **4,910** | **39,259** |
| **මුදල් සහ තැන්පතු** | **1,142** | **5,749** | **1,630** | **6,101** |
| මහ බැංකුව | - | 1,775 | - | 2,037 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,142 | 3,974 | 1,630 | 4,065 |
| **ණය** | - | **29,585** | - | **28,358** |
| මහ බැංකුව | - | 1,265 | - | 1,139 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 3,172 | - | 2,047 |
| රජය | - | 21,077 | - | 21,154 |
| අනෙකුත් අංශ (ඈ) | - | 4,071 | - | 4,018 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **1,211** | **1,913** | **1,343** | **1,611** |
| තැන්පතු භාරගන්නා ආයතන | 98 | - | 100 | - |
| අනෙකුත් අංශ (ඉ) | 1,113 | 1,913 | 1,243 | 1,611 |
| **අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ගෙවිය යුතු** | **1,744** | **523** | **1,937** | **1,917** |
| මහ බැංකුව (ඊ) | - | 523 | - | 1,917 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,744 | - | 1,937 | - |
| **විශේෂ ගැනුම් හිමිකම්** | **-** | **1,330** | **-** | **1,272** |
| **සංචිත වත්කම්** | **3,139** | **-** | **1,854** | **-** |
| මූල්‍ය රත්‍රන් | 175 | - | 27 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | 124 | - | 16 | - |
| ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 67 | - | 64 | - |
| අනෙකුත් සංචිත වත්කම් | 2,773 | - | 1,747 | - |
| මුදල් සහ තැන්පතු | 2,729 | - | 1,716 | - |
| ණය සුරැකුම්පත් | 44 | - | 31 | - |
| **මුළු වත්කම්/වගකීම්** | **8,758** | **64,498** | **8,292** | **57,195** |
| **ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | **-** | **-55,740** | **-** | **-48,903** |
| **පරිණත කාලය අනුව ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | | | | |
| කෙටිකාලීන | 6,804 | 9,564 | 6,568 | 9,092 |
| දිගුකාලීන | 1,954 | 54,934 | 1,724 | 48,103 |

(අ) තාවකාලික

(ආ) ආයෝජන මණ්ඩලය, කොළඹ කොටස් වෙළඳපොළ සහ අනෙකුත් පෞද්ගලික සමාගම් වෙත ලැබුණු සෘජු ආයෝජනවල තත්ත්වය ඇතුළත් වේ

(ඇ) විදේශීය මුදල් ණය සුරැකුම්පත් නිකුතු වෙළඳපොළ අගය මත පදනම් වන අතර, දේශීය මුදල් ණය සුරැකුම්පත් නිකුතු පොත් අගය මත පදනම් වේ

(ඈ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික සමාගම් ලබාගත් ව්‍යාපෘති ණය මුදල්වල නොපියවා ඇති ණය මට්ටම ඇතුළත් වේ

(ඉ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය තත්ත්වය ඇතුළත් වේ

(ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 12 වන සංඛ්‍යා සටහන

## නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| අයිතමය | 2020 (අ) | 2021 (ආ) | 2022 ජූනි (ආ) |
|---|---|---|---|
| **රජය** | **28,187** | **27,344** | **24,990** |
| **කෙටිකාලීන** | **4** | **1** | **6** |
| ණය සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත්) (ඇ) | 4 | 1 | 6 |
| **දිගුකාලීන** | **28,183** | **27,343** | **24,985** |
| ණය සුරැකුම්පත් | 7,613 | 6,265 | 3,830 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 31 | 8 | 4 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඈ) | 27 | 24 | 26 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ) | 7,555 | 6,233 | 3,801 |
| ණය | 20,570 | 21,077 | 21,154 |
| **මහ බැංකුව** | **2,690** | **4,892** | **6,364** |
| **කෙටිකාලීන** | **343** | **524** | **1,920** |
| මුදල් සහ තැන්පතු | 0.3 | 1 | 3 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්) | 343 | 523 | 1,917 |
| **දිගුකාලීන** | **2,348** | **4,368** | **4,444** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 570 | 1,330 | 1,272 |
| මුදල් සහ තැන්පතු | 400 | 1,774 | 2,033 |
| ණය (ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම) | 1,378 | 1,265 | 1,139 |
| **තැන්පතු භාරගන්නා ආයතන** | **6,657** | **7,146** | **6,112** |
| **කෙටිකාලීන** | **5,507** | **5,979** | **5,070** |
| මුදල් සහ තැන්පතු (ඊ) | 1,333 | 3,974 | 4,065 |
| ණය | 4,174 | 2,005 | 1,006 |
| **දිගුකාලීන** | **1,150** | **1,167** | **1,042** |
| ණය | 1,150 | 1,167 | 1,042 |
| **අනෙකුත් අංශ (උ)** | **6,517** | **6,078** | **5,715** |
| **කෙටිකාලීන** | **2,341** | **1,913** | **1,611** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ) | 2,341 | 1,913 | 1,611 |
| **දිගුකාලීන** | **4,176** | **4,165** | **4,104** |
| ණය සුරැකුම්පත් (ඉ) | 96 | 94 | 86 |
| ණය | 4,081 | 4,071 | 4,018 |
| පෞද්ගලික අංශය | 2,315 | 2,425 | 2,432 |
| රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා | 1,766 | 1,646 | 1,587 |
| **සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (එ)** | **4,990** | **5,264** | **5,550** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **49,041** | **50,724** | **48,731** |
| **ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන්** | | | |
| දළ විදේශීය ණය | 60.5 | 60.0 | 57.4 |
| කෙටිකාලීන ණය | 10.1 | 10.0 | 10.1 |
| දිගුකාලීන ණය | 50.4 | 50.0 | 47.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව ඇත
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව ඇත
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව ඇත. රජයේ විදේශීය ණයවල මුහුණත වටිනාකම මෙම වාර්තාවේ 5වන පරිච්ඡේදයේ 5.4 සංඛ්‍යා සටහනෙහි වාර්තාකර ඇති අතර, මෙම වාර්තාවේ 6වන පරිච්ඡේදයේ 6.3 සංඛ්‍යා සටහනෙහි වාර්තාකර ඇති මධ්‍යම රජයේ නොපියවා ඉතිරිව ඇති ණය, මුහුණත අගය මත පදනම් වේ.
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික අංශයේ සමාගම්වල නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

**13 වන සංඛ්‍යා සටහන**

## විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම් (විදේශීය මුදල් ඒකකයක වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින්)

| කාලපරිච්ඡේදය | | කාලපරිච්ඡේදය අවසානයේ පැවති අනුපාතික | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | එ.ජ. ඩොලරය | ස්ටර්ලින් පවුම | යූරෝ | ජපන් යෙන් | ඉන්දියානු රුපියල | වි.ගැ.හි. (අ) |
| | 2017 | 152.8548 | 205.5362 | 182.4857 | 1.3559 | 2.3854 | 217.6860 |
| | 2018 | 182.7499 | 231.8639 | 208.9928 | 1.6547 | 2.6132 | 253.5110 |
| | 2019 | 181.6340 | 238.4582 | 203.6662 | 1.6717 | 2.5467 | 251.1689 |
| | 2020 | 186.4082 | 254.3540 | 229.4219 | 1.8081 | 2.5467 | 268.4781 |
| | 2021 | 200.4338 | 270.5957 | 226.8610 | 1.7415 | 2.6935 | 280.5251 |
| 2021 | ජනවාරි | 194.3948 | 266.5444 | 235.3343 | 1.8609 | 2.6636 | 280.0840 |
| | පෙබරවාරි | 194.0119 | 274.3037 | 235.9476 | 1.8300 | 2.6827 | 280.6673 |
| | මාර්තු | 199.0377 | 273.2290 | 233.0931 | 1.7987 | 2.6103 | 282.0782 |
| | අප්‍රේල් | 199.5437 | 278.3136 | 241.8270 | 1.8348 | 2.6929 | 286.5428 |
| | මැයි | 199.5000 | 283.2800 | 243.3900 | 1.8194 | 2.7551 | 288.2117 |
| | ජූනි | 201.1381 | 278.7372 | 239.4851 | 1.8204 | 2.7071 | 286.9074 |
| | ජූලි | 199.9000 | 278.9505 | 237.5312 | 1.8257 | 2.6910 | 285.6111 |
| | අගෝස්තු | 210.0000 | 289.0650 | 247.9470 | 1.9116 | 2.8606 | 299.0946 |
| | සැප්තැම්බර් | 199.9857 | 268.9608 | 232.1034 | 1.7884 | 2.6897 | 281.7539 |
| | ඔක්තෝබර් | 201.8705 | 278.3895 | 235.6737 | 1.7780 | 2.6992 | 285.7235 |
| | නොවැම්බර් | 202.0474 | 269.2383 | 228.3338 | 1.7776 | 2.6920 | 283.0280 |
| | දෙසැම්බර් | 200.4338 | 270.5957 | 226.8610 | 1.7415 | 2.6935 | 280.5251 |
| 2022 | ජනවාරි | 201.1910 | 269.8374 | 224.4990 | 1.7412 | 2.6805 | 280.0136 |
| | පෙබරවාරි | 201.0571 | 268.6223 | 224.5004 | 1.7405 | 2.6781 | 280.4465 |
| | මාර්තු | 299.0000 | 392.5272 | 334.0279 | 2.4497 | 3.9432 | 413.3376 |
| | අප්‍රේල් | 341.8500 | 426.4579 | 359.4553 | 2.6140 | 4.4617 | 459.5490 |
| | මැයි | 360.7600 | 455.2791 | 387.7448 | 2.8179 | 4.6458 | 486.9178 |
| | ජූනි | 359.8782 | 436.8741 | 376.2707 | 2.6350 | 4.5623 | 477.8391 |
| | ජූලි | 360.8000 | 439.0936 | 367.7995 | 2.6854 | 4.5305 | 477.5549 |
| | අගෝස්තු | 361.1480 | 421.3153 | 361.9786 | 2.6067 | 4.5413 | 469.9763 |
| | සැප්තැම්බර් | 362.9000 | 402.2747 | 355.7872 | 2.5077 | 4.4529 | 464.4685 |

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිණුම් ඒකකය වන විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**14 වන සංඛ්‍යා සටහන**

## රාජ්‍ය මූල්‍ය කටයුතු

| අයිතමය | 2018 | 2019 (අ) | 2020 (අ) | 2021 (ආ) | 2021 ජන-ජුනි (ආ) | 2022 ජන-ජුනි (ආ) |
|---|---|---|---|---|---|---|
| **රුපියල් මිලියන** | | | | | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **1,932,459** | **1,898,808** | **1,373,308** | **1,463,810** | **715,272** | **919,468** |
| මුළු ආදායම | 1,919,973 | 1,890,899 | 1,367,960 | 1,457,071 | 714,537 | 918,493 |
| බදු ආදායම | 1,712,318 | 1,734,925 | 1,216,542 | 1,298,019 | 641,207 | 798,796 |
| බදු නොවන ආදායම | 207,656 | 155,974 | 151,417 | 159,052 | 73,330 | 119,698 |
| ප්‍රදාන | 12,486 | 7,909 | 5,348 | 6,740 | 735 | 974 |
| **වියදම් සහ ශුද්ධ ණය දීම්** | **2,693,228** | **3,337,896** | **3,040,996** | **3,521,735** | **1,495,457** | **1,822,144** |
| පුනරාවර්තන | 2,089,713 | 2,424,582 | 2,548,359 | 2,747,512 | 1,310,986 | 1,571,637 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 603,515 | 913,314 | 492,638 | 774,223 | 184,471 | 250,508 |
| එයින්, රාජ්‍ය ආයෝජන | 624,970 | 631,235 | 811,773 | 789,636 | 189,445 | 259,432 |
| **වර්තන ගිණුමේ ශේෂය** | **-169,740** | **-533,683** | **-1,180,399** | **-1,290,441** | **-596,449** | **-653,143** |
| **ප්‍රාථමික ශේෂය** | **91,421** | **-537,736** | **-687,386** | **-1,009,542** | **-273,193** | **-244,847** |
| **සමස්ත අයවැය ශේෂය** | **-760,769** | **-1,439,088** | **-1,667,688** | **-2,057,925** | **-780,185** | **-902,676** |
| **මූල්‍යනය** | 760,769 | 1,439,088 | 1,667,688 | 2,057,925 | 780,185 | 902,676 |
| විදේශීය මූල්‍යනය | 323,535 | 542,641 | -83,199 | -13,901 | 21,184 | -44,383 |
| ව්‍යාපෘති ණය | 7,672 | - | - | 39,316 | -74,651 | 56,107 |
| වාණිජ ණය | 456,921 | - | - | -53,217 | 99,955 | -100,490 |
| දේශීය මූල්‍යනය | 437,234 | 896,448 | 1,750,887 | 2,071,826 | 759,001 | 947,060 |
| වෙළඳපොළ ණය ගැනීම් | 329,351 | - | - | 2,058,986 | 764,890 | 948,899 |
| බැංකු නොවන | 219,885 | - | - | 754,699 | 264,650 | 648,268 |
| බැංකු | 109,466 | - | - | 1,304,287 | 500,240 | 300,631 |
| වෙළඳපොළ නොවන මූලාශ්‍ර | 107,883 | - | - | 12,840 | -5,889 | -1,839 |
| **ද.දේ.නි.යෙහි % ලෙස (ඇ)** | | | | | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **12.6** | **11.9** | **8.7** | **8.3** | **4.0** | **4.1** |
| මුළු ආදායම | 12.5 | 11.9 | 8.6 | 8.2 | 4.0 | 4.1 |
| බදු ආදායම | 11.2 | 10.9 | 7.7 | 7.3 | 3.6 | 3.5 |
| බදු නොවන ආදායම | 1.4 | 1.0 | 1.0 | 0.9 | 0.4 | 0.5 |
| ප්‍රදාන | 0.1 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| **වියදම් සහ ශුද්ධ ණය දීම්** | **17.5** | **21.0** | **19.2** | **19.9** | **8.5** | **8.1** |
| පුනරාවර්තන | 13.6 | 15.2 | 16.1 | 15.5 | 7.4 | 7.0 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 3.9 | 5.7 | 3.1 | 4.4 | 1.0 | 1.1 |
| එයින්, රාජ්‍ය ආයෝජන | 4.1 | 4.0 | 5.1 | 4.5 | 1.1 | 1.2 |
| **වර්තන ගිණුමේ ශේෂය** | **-1.1** | **-3.4** | **-7.5** | **-7.3** | **-3.4** | **-2.9** |
| **ප්‍රාථමික ශේෂය** | **0.6** | **-3.4** | **-4.3** | **-5.7** | **-1.5** | **-1.1** |
| **සමස්ත අයවැය ශේෂය** | **-5.0** | **-9.0** | **-10.5** | **-11.6** | **-4.4** | **-4.0** |
| **මූල්‍යනය** | **5.0** | **9.0** | **10.5** | **11.6** | **4.4** | **4.0** |
| විදේශීය මූල්‍යනය | 2.1 | 3.4 | -0.5 | -0.1 | 0.1 | -0.2 |
| ව්‍යාපෘති ණය | 0.0 | - | - | 0.2 | -0.4 | 0.2 |
| වාණිජ ණය | 3.0 | - | - | -0.3 | 0.6 | -0.4 |
| දේශීය මූල්‍යනය | 2.8 | 5.6 | 11.1 | 11.7 | 4.3 | 4.2 |
| වෙළඳපොළ ණය ගැනීම් | 2.1 | - | - | 11.6 | 4.3 | 4.2 |
| බැංකු නොවන | 1.4 | - | - | 4.3 | 1.5 | 2.9 |
| බැංකු | 0.7 | - | - | 7.4 | 2.8 | 1.3 |
| වෙළඳපොළ නොවන මූලාශ්‍ර | 0.7 | - | - | 0.1 | 0.0 | 0.0 |

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන කිහිපයක් සංශෝධනය කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) 2018-2021 වසරවලට අදාළ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් යාවත්කාලීන කරන ලද 2015 පදනම් වර්ෂය සහිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වන අතර, 2022 වසරට අදාළ වන අගයයන් මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකතන මත පදනම් වේ.

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

15 වන සංඛ්‍යා සටහන

## වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් (අ) (ආ)

| කාණ්ඩය | 2021 ජූනි අවසානය | | 2022 ජූනි අවසානය (ඇ) | | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (රුපියල් මිලියන) | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය (රුපියල් මිලියන) | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | |
| **1. කෘෂිකාර්මික සහ ධීවර** | **529,706** | **7.7** | **607,535** | **7.5** | **14.7** |
| එයින්, | | | | | |
| තේ | 107,890 | 1.6 | 108,856 | 1.3 | 0.9 |
| රබර් | 36,564 | 0.5 | 57,670 | 0.7 | 57.7 |
| පොල් | 32,439 | 0.5 | 36,102 | 0.4 | 11.3 |
| වී | 42,710 | 0.6 | 42,642 | 0.5 | -0.2 |
| එළවළු, පළතුරු සහ සුළු ආහාර භෝග | 29,784 | 0.4 | 37,389 | 0.5 | 25.5 |
| පශු සම්පත් සහ කිරි ගව පාලනය | 28,870 | 0.4 | 30,723 | 0.4 | 6.4 |
| ධීවර | 21,154 | 0.3 | 22,464 | 0.3 | 6.2 |
| **2. කර්මාන්ත** | **2,768,377** | **40.4** | **3,312,279** | **40.6** | **19.6** |
| එයින්, | | | | | |
| ඉදිකිරීම් | 1,449,403 | 21.1 | 1,604,165 | 19.7 | 10.7 |
| එයින්, | | | | | |
| පෞද්ගලික නිවාස ඉදිකිරීම් ඇතුළු නිවාස මිලදී ගැනීම් සහ අලුත්වැඩියා කිරීම | 681,061 | 9.9 | 708,698 | 8.7 | 4.1 |
| කාර්ය මණ්ඩල නිවාස | 95,924 | 1.4 | 107,731 | 1.3 | 12.3 |
| ආහාර සහ පාන වර්ග | 173,753 | 2.5 | 233,192 | 2.9 | 34.2 |
| රෙදිපිළි සහ ඇඟලුම් | 265,743 | 3.9 | 346,313 | 4.2 | 30.3 |
| දැව, ගෘහ භාණ්ඩ සහ දැව ආශ්‍රිත නිෂ්පාදිත | 24,001 | 0.3 | 21,999 | 0.3 | -8.3 |
| කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 20,907 | 0.3 | 23,560 | 0.3 | 12.7 |
| රසායනික, ඛනිජතෙල්, ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ, සහ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 147,145 | 2.1 | 277,409 | 3.4 | 88.5 |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 13,553 | 0.2 | 7,686 | 0.1 | -43.3 |
| මූලික ලෝහ නිෂ්පාදිත | 53,988 | 0.8 | 55,119 | 0.7 | 2.1 |
| සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 145,337 | 2.1 | 170,318 | 2.1 | 17.2 |
| අනෙකුත් නිෂ්පාදිත | 26,522 | 0.4 | 26,362 | 0.3 | -0.6 |
| **3. සේවා** | **1,882,564** | **27.5** | **2,269,769** | **27.8** | **20.6** |
| එයින්, | | | | | |
| තොග සහ සිල්ලර වෙළඳාම | 558,006 | 8.1 | 628,841 | 7.7 | 12.7 |
| සංචාරක ව්‍යාපාරය | 284,610 | 4.2 | 416,117 | 5.1 | 46.2 |
| මූල්‍ය සහ ව්‍යාපාරික සේවා | 366,473 | 5.3 | 497,958 | 6.1 | 35.9 |
| ප්‍රවාහන | 79,906 | 1.2 | 74,209 | 0.9 | -7.1 |
| සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණය | 73,517 | 1.1 | 92,942 | 1.1 | 26.4 |
| මුද්‍රණය සහ ප්‍රකාශනය | 29,082 | 0.4 | 28,320 | 0.3 | -2.6 |
| අධ්‍යාපනය | 20,900 | 0.3 | 30,794 | 0.4 | 47.3 |
| සෞඛ්‍යය | 59,719 | 0.9 | 53,114 | 0.7 | -11.1 |
| නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය | 23,875 | 0.3 | 33,138 | 0.4 | 38.8 |
| **4. පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඈ)** | **1,677,224** | **24.5** | **1,962,513** | **24.1** | **17.0** |
| එයින්, | | | | | |
| කල් පවතින පාරිභෝගික භාණ්ඩ | 348,013 | 5.1 | 380,540 | 4.7 | 9.3 |
| උකස් කිරීම් | 268,402 | 3.9 | 341,990 | 4.2 | 27.4 |
| ණය කාඩ්පත් | 128,820 | 1.9 | 147,467 | 1.8 | 14.5 |
| පෞද්ගලික අධ්‍යාපන කටයුතු | 11,366 | 0.2 | 12,510 | 0.2 | 10.1 |
| පෞද්ගලික සෞඛ්‍ය ආරක්ෂණ | 1,996 | 0.0 | 2,491 | 0.0 | 24.8 |
| **5. එකතුව (ඉ)** | **6,857,871** | **100.0** | **8,152,096** | **100.0** | **18.9** |

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වී ඇති අතර, මෙයට වාණිජ බැංකුවල, දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකකවල ණය සහ අත්තිකාරම් ඇතුළත් වේ

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) ණය, අයිරා සහ වට්ටම් කළ සහ මිලට ගත් බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් නොවේ

(ඇ) තාවකාලික

(ඈ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' කාණ්ඩයට අයත්වන පෞද්ගලික නිවාස ණය ඉවත් කර ඇති අතර, සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධිත ණය මෙම කාණ්ඩයේ ඇතුළත් වේ

(ඉ) ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙන් කාර්තුමය සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය, මුදල් සමීක්ෂණයේ එම ණයවලට වඩා වෙනස් වේ

## 16 වන සංඛ්‍යා සටහන

### බැංකු කටයුතුවල ව්‍යාප්තිය (අ)

| කාණ්ඩය | 2018 | 2019 | 2020 | 2021 (ආ) | 2022 ජන-ජුනි (ආ) |
|---|---|---|---|---|---|
| 1. බැංකු සංඛ්‍යාව | 33 | 32 | 30 | 30 | 30 |
| 2. බැංකු ශාඛා සංඛ්‍යාව (ඇ) | 3,576 | 3,607 | 3,619 | 3,624 | 3,628 |
| 3. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 4,618 | 5,023 | 4,252 | 4,142 | 4,073 |
| 4. නිකුත් කළ ණය කාඩ්පත් සංඛ්‍යාව (ඈ) | 338,692 | 353,826 | 235,310 | 285,888 | 146,195 |
| 5. භාවිතයේ පවතින ණය කාඩ්පත් සංඛ්‍යාව | 1,710,671 | 1,854,103 | 1,984,525 | 2,054,985 | 2,082,685 |
| 6. නිකුත් කළ හර කාඩ්පත් සංඛ්‍යාව (ඈ) | 3,371,536 | 4,773,541 | 3,673,644 | 4,867,230 | 2,222,647 |
| 7. භාවිතයේ පවතින හර කාඩ්පත් සංඛ්‍යාව | 22,329,928 | 23,068,813 | 17,803,673 | 18,069,812 | 18,679,013 |
| 8. අන්තර්ජාලය පදනම් කරගත් ගනුදෙනු සංඛ්‍යාව (ඈ) | 26,930,397 | 36,674,832 | 57,860,661 | 135,386,876 | 87,582,706 |
| 9. බැංකු ඝනත්වය (ඉ) | 16.5 | 16.5 | 16.5 | 16.4 | 16.4 |

(අ) කාලපරිච්ඡේදය අවසානයේදී
(ආ) තාවකාලික
(ඇ) ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර
(ඈ) කාලපරිච්ඡේදය තුළ
(ඉ) පුද්ගලයින් 100,000 කට බැංකු ශාඛා ගණන

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 17 වන සංඛ්‍යා සටහන

### මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රවණතා

රුපියල් මිලියන

| කාණ්ඩය | 2018 | 2019 | 2020 | 2021 | 2022 ජන-සැප් (අ) |
|---|---|---|---|---|---|
| **මුදල් වෙළඳපොළ** | | | | | |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | | | |
| මුළු පිරිවැටුම | 4,196,244 | 4,755,160 | 3,234,306 | 7,934,874 | 3,687,725 |
| **භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ** | | | | | |
| නිකුත් කරන ලද මුළු ප්‍රමාණය (ආ) | 1,653,259 | 1,719,327 | 2,590,539 | 3,821,419 | 6,754,963 |
| පියවීමට ඇති මුළු ශේෂය (ආ) (ඇ) (ඈ) | 758,796 | 897,670 | 1,621,375 | 2,270,712 | 3,643,219 |
| **ප්‍රාග්ධන වෙළඳපොළ** | | | | | |
| **භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ** | | | | | |
| නිකුත් කරන ලද මුළු ප්‍රමාණය (ආ) | 763,020 | 798,000 | 1,332,069 | 1,761,979 | 1,769,798 |
| පියවීමට ඇති මුළු ශේෂය (ආ) (ඇ) (ඈ) | 4,344,238 | 4,686,526 | 5,719,504 | 6,967,928 | 8,451,191 |
| **ලැයිස්තුගත සමාගම් බැඳුම්කර වෙළඳපොළ** | | | | | |
| නිකුත් කරන ලද මුළු ප්‍රමාණය | 55,918 | 57,914 | 21,940 | 84,383 | 2,611 |
| මුළු නිකුතු (සංඛ්‍යාව) | 11 | 15 | 8 | 14 | 2 |
| මුළු පිරිවැටුම (ද්විතියික වෙළඳපොළ) | 4,541 | 5,677 | 5,856 | 1,245 | 3,845 |
| ලැයිස්තුගත සමාගම් බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම (ඇ) | 288,558 | 284,926 | 243,220 | 274,260 | 265,980 (ඉ) |
| **කොටස් වෙළඳපොළ** | | | | | |
| සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) (ඇ) | 6,052 | 6,129 | 6,774 | 12,226 | 9,931 |
| එස්. ඇන්ඩ් පී. එස්. එල්20 (S&P SL20) මිල දර්ශකය (2004 = 1,000) (ඇ) | 3,135 | 2,937 | 2,638 | 4,233 | 3,165 |
| අලෙවි කළ කොටස් වටිනාකම | 200,069 | 171,408 | 396,882 | 1,173,157 | 567,082 |
| ශුද්ධ විදේශීය මිලදී ගැනුම් | (23,239) | (11,735) | (51,356) | (52,649) | 15,271 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (ඇ) | 2,839,450 | 2,851,310 | 2,960,648 | 5,489,168 | 4,341,126 |

(අ) තාවකාලික
(ආ) මුහුණත අගය
(ඇ) කාලපරිච්ඡේදය අවසානයට
(ඈ) විදේශිකයන් සතු රාජ්‍ය සුරැකුම්පත් ද ඇතුළුව
(ඉ) 2022 අගෝස්තු අවසානයට

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව

**18 වන සංඛ්‍යා සටහන**

## රක්ෂණ අංශය, ඒකක භාර අංශය සහ කොටස් තැරැව්කාර සමාගම් අංශය - තෝරාගත් දර්ශක

| අයිතමය | 2020 ජුනි අවසානයට | 2021 ජුනි අවසානයට | 2021 දෙසැම්බර් අවසානයට | 2022 ජුනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2021ජුනි | 2022 ජුනි (අ) |
| **රක්ෂණ අංශය** | | | | | | |
| මුළු වත්කම් (රු. බිලියන) | 755.2 | 836.9 | 879.8 | 902.7 | 10.8 | 7.9 |
| මුළු ආදායම (රු. බිලියන) (ආ) | 120.9 | 136.9 | 298.6 | 153.7 | 13.2 | 12.3 |
| දළ වාරික ආදායම (රු. බිලියන) (ආ) | 95.2 | 108.4 | 233.8 | 127.7 | 13.9 | 17.8 |
| ආයෝජන ආදායම (රු. බිලියන) (ආ) | 25.8 | 28.5 | 64.9 | 26.1 | 10.7 | -8.6 |
| බදු පෙර ලාභය (රු. බිලියන) (ආ) | 18.2 | 16.9 | 38.4 | 22.5 | -7.2 | 33.3 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 308.0 | 351.0 | 384.0 | 282.0 | - | - |
| සාමාන්‍ය රක්ෂණය | 238.0 | 293.0 | 224.0 | 209.0 | - | - |
| **රඳවා ගැනීමේ අනුපාතය (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 95.1 | 95.5 | 96.0 | 95.3 | - | - |
| සාමාන්‍ය රක්ෂණය | 75.9 | 74.8 | 76.2 | 75.1 | - | - |
| **හිමිකම් අනුපාතය (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 40.6 | 38.7 | 38.7 | 40.2 | - | - |
| සාමාන්‍ය රක්ෂණය | 47.2 | 55.3 | 55.8 | 67.9 | - | - |
| **ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 88.2 | 82.1 | 81.2 | 79.9 | - | - |
| සාමාන්‍ය රක්ෂණය | 87.3 | 94.1 | 94.9 | 106.4 | - | - |
| **වත්කම් මත ප්‍රතිලාභ (%)** | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 3.2 | 3.0 | 3.4 | 3.2 | - | - |
| සාමාන්‍ය රක්ෂණය | 7.7 | 9.4 | 7.8 | 9.7 | - | - |
| **හිමිකම් මත ප්‍රතිලාභ (%)** | | | | | | |
| සාමාන්‍ය රක්ෂණය | 16.2 | 19.3 | 15.5 | 19.9 | - | - |
| ප්‍රාරක්ෂණ අනුපාතය (%) - සාමාන්‍ය රක්ෂණය | 33.3 | 25.8 | 25.3 | 13.5 | - | - |
| **ඒකක භාර අංශය** | | | | | | |
| සමස්ත වත්කම් (රු. බිලියන) | 114.4 | 222.7 | 196.9 | 134.9 | 94.6 | -39.4 |
| ශුද්ධ වත්කම් වටිනාකම (රු. බිලියන) | 113.4 | 222.0 | 193.8 | 132.7 | 95.7 | -40.2 |
| ආයෝජන (රු. බිලියන) | 114.4 | 222.8 | 196.9 | 134.9 | 94.8 | -39.4 |
| කොටස්වල | 8.1 | 15.6 | 17.6 | 9.2 | 92.6 | -41.0 |
| රජයේ සුරැකුම්පත්වල | 8.6 | 23.6 | 23.4 | 51.3 | 174.4 | 117.5 |
| වෙනත් (උදා: වාණිජ පත්‍ර, ණයකර, භාරකාර සහතික පත්‍ර සහ බැංකු තැන්පතු) | 97.7 | 183.5 | 155.9 | 74.4 | 87.8 | -59.5 |
| කොටස්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 7.2 | 7.0 | 9.1 | 6.9 | - | - |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 7.5 | 10.6 | 12.1 | 38.7 | - | - |
| වෙනත් ආයෝජන ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 86.1 | 82.7 | 80.4 | 56.1 | - | - |
| මුළු ඒකක හිමිකරුවන්ගේ සංඛ්‍යාව | 47,903 | 55,651 | 59,426 | 62,700 | - | - |
| ඒකක නිකුතුන් ගණන ( බිලියන) | 5.4 | 7.0 | 7.8 | 6.6 | - | - |
| ඒකක භාර සංඛ්‍යාව | 72 | 76 | 75 | 75 | - | - |
| **කොටස් තැරැව්කාර සමාගම් අංශය** | | | | | | |
| මුළු වත්කම් (රුපියල් බිලියන) | 13.5 | 21.0 | 36.5 | 22.5 | 55.9 | 7.0 |
| මුළු වගකීම් (රුපියල් බිලියන) | 8.4 | 12.1 | 24.0 | 10.0 | 44.8 | -17.5 |
| ශුද්ධ ප්‍රාග්ධනය (රුපියල් බිලියන) | 5.1 | 7.7 | 11.3 | 10.2 | 51.2 | 32.4 |
| ආදායම (රුපියල් මිලියන) (ආ) | 443.0 | 1,553.0 | 4,483.0 | 839.0 | 250.6 | -46.0 |
| බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය) (රුපියල් මිලියන) (ආ) | 158.0 | 910.0 | 2,514.0 | 228.0 | 475.9 | -74.9 |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලයන්: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
ශ්‍රී ලංකා ඒකක භාර සංගමය

**19 වන සංඛ්‍යා සටහන**

**සංචාරක අංශයට ලබාදුන් සහන (අ)**

| ණය සහනය (2022.06.30 දිනට) | සක්‍රිය | | | අක්‍රිය | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ලැබුණු අයදුම්පත් ගණන | අනුමත කරන ලද ණය පහසුකම් | | ලැබුණු අයදුම්පත් ගණන | අනුමත කරන ලද ණය පහසුකම් | | ලැබුණු අයදුම්පත් ගණන | අනුමත කරන ලද ණය පහසුකම් | |
| | | අයදුම්පත් ගණන | නොපියවා ඉතිරිව ඇති ප්‍රාග්ධනය (රු. බිලියන) | | අයදුම්පත් ගණන | නොපියවා ඉතිරිව ඇති ප්‍රාග්ධනය (රු. බිලියන) | | අයදුම්පත් ගණන | නොපියවා ඉතිරිව ඇති ප්‍රාග්ධනය (රු. බිලියන) |
| බලපත්‍රලාභී බැංකු | 7,814 | 7,098 | 157.12 | 876 | 683 | 24.87 | 8,690 | 7,781 | 182.00 |
| බැංකු නොවන මූල්‍ය ආයතන | 1,067 | 871 | 0.58 | 117 | 72 | 0.05 | 1,184 | 943 | 0.63 |

(අ) සංචාරක ක්ෂේත්‍රය සඳහා ලබා දී ඇති ණය සහනවල අවසන් අදියර 2022.06.30 දිනෙන් අවසන් විය

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**20 වන සංඛ්‍යා සටහන**

**පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්ව හමුවේ බලපෑමට ලක් වූ ණය ගැතියන් සඳහා ලබාදුන් සහන (අ)**

| ණය සහනය (2022.08.31 දිනට) | සක්‍රිය | | | අක්‍රිය | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ලැබුණු අයදුම්පත් ගණන | අනුමත කරන ලද ණය පහසුකම් | | ලැබුණු අයදුම්පත් ගණන | අනුමත කරන ලද ණය පහසුකම් | | ලැබුණු අයදුම්පත් ගණන | අනුමත කරන ලද ණය පහසුකම් | |
| | | අයදුම්පත් ගණන | නොපියවා ඉතිරිව ඇති ප්‍රාග්ධනය (රු. බිලියන) | | අයදුම්පත් ගණන | නොපියවා ඉතිරිව ඇති ප්‍රාග්ධනය (රු. බිලියන) | | අයදුම්පත් ගණන | නොපියවා ඉතිරිව ඇති ප්‍රාග්ධනය (රු. බිලියන) |
| බලපත්‍රලාභී බැංකු | 29,521 | 22,409 | 224.03 | 1,600 | 1,332 | 0.44 | 31,121 | 23,741 | 224.47 |
| බැංකු නොවන මූල්‍ය ආයතන | 47,977 | 40,770 | 18.56 | 20,411 | 17,067 | 10.47 | 68,388 | 57,837 | 29.03 |

(අ) 2022 ජූලි මාසයේ සිට මාස හයක කාලයක් සඳහා ලබා දී ඇති සහන

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ISBN 978-624-5917-20-4

ISBN 978-624-5917-20-4

ප්‍රකාශනය - ශ්‍රී ලංකා මහ බැංකුව